# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ දුරුතු පුර පසළොස්වක පෝද 2023 ජනවාරි 06 සිකුරාද BUDUSARANA FRIDAY JANUARY 06, 2023

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 29 පත්‍රය, පිටු 36 ආරම්භය 1965-06-13 මිල රු. 70.00



බෙලිඅත්ත කහවත්ත පුරාණ රාජමහා විහාරයේ
බුද්ධ ප්‍රතිමා වහන්සේ

ඡායාරූපය - සේන වී ගමගේ



# ආයු වර්ණාදියෙන් සකල විපුලත්වයන් හසරැල් මතින් ලබන්නට ...

**වාසනාව යනු පෙර කළ පින් ඇති බවයි. පින්බල ලැබෙන විට ජීවිතය හැම අතින්ම වාසනාවන්ත වේ. ප්‍රීතිපූර්ණ වේ. ලෞකික මෙන්ම ලෝකෝත්තර සුව සහනයන් ලැබෙන්නේ ද පුරාකෘත පුණ්‍ය ශක්තියක් හිමි පුද්ගලයාට පමණි.**

මෙලොවින් ආයු වර්ණාදියත්, පරලොවින් සුගතියත්, අවසන නිර්වාණ ශාන්තියත් අපේක්ෂා කරන ඥානවන්තයා මොහොතින් මොහොත ජීවිතය පිනෙන් පුරවාගත යුතු ය.

මනබඳින රූපය, මිහිරි කටහඬ, දැකුම්කලු දේහ විලාසය, උසස් කුලයක ජන්ම ලාභය, ආදරණීය හා කීකරු ස්වාමි භාර්යාවන්, දූ දරුවන් ලැබීම, පිරිස් බලය හා ධන බලය, නිදුක් නීරෝගි බව හා දිගාසිරි ලැබීම, බහුශ්‍රැත භාවය හා ශාස්ත්‍ර ඤාණය ආදිය පින්පල පිළිඹිබු කරන අවස්ථාවන් ය.

ධ්‍යාන, විමෝක්ස, සමාධි, සමාපත්ති හා නිර්වාණාවබෝධය කළ පින් ඇති වාසනාවන්තයාට ලැබෙන අලෞකික සුවයන් ය. එකී නොකී ලොව්තුරා ඉහළම භාග්‍යය ද, මහා ගෞතම බුදුරජාණන් වහන්සේ තරම් ගිහි සුව හා පැවිදි සුව ඉහළින් ම වින්දනය කළ අන් කිසිවකු මිහිපිට හෝ දෙව්බඹලොව නැත්ම ය.

දුකෙහි බිහිසුණු බව හා සුවයෙහි මිහිර මනාව අවබෝධ කළ බුදුරජාණන් වහන්සේ සැප කැමැති මිනිසාට ආයු ආරෝග්‍යාදී මෙලොව සුවය පිණිසත්, ස්වර්ගමෝක්ෂ සම්පත්තිය පිණිසත් නොවරදින මාවත පෙන්වා වදාළහ.

මිනිසත් භාවයෙහි දුර්ලභ භාවය පෙන්වා, ලැබූ ජීවිතය රෝග පීඩාදියෙන් හා අකල් මරණයෙන් මුදාගෙන සැනසිල්ලේ දිවි ගෙවීමට හේතුවන කරුණු මනාව උගන්වා වදාළහ. ඒ අනුව අඩු වයසින් නොමැරෙනු කැමති පුද්ගලයා තමා කෙරෙහි පිහිටුවා ගත යුතු කරුණු කිහිපයක් අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ වදාරා ඇත.

සප්පායකාරී වීම එහිලා පළමුවන කාරණයයි. එනම් අපත්‍ය වූ ආහාරපානාදියෙන් වෙන් වීමයි. තමාගේ ශරීරයට යෝග්‍ය වූ ආහාර රටාවකට පුරුදුවීම මඟින් නීරෝගි සුවය පවත්වා ගත හැකි ය.

බොහෝ දෙනාට වැළඳී ඇති රෝගාබාධවලින් බොහොමයකට ප්‍රධාන හේතුව රසගේධය හා අහිතකර භෝජන අනුභවයයි. ගුණාත්මක හා යෝග්‍ය බවට මුල්තැන දී තෝරාගත් ආහාරපානවලට හුරුවීම මඟින් අතුරු ආබාධ සෑහෙන ප්‍රමාණයක් අවම කරගත හැකි ය. කන බොන දෑ විසම වීමෙන් රූපකාය ජරාජීර්ණ වීම ඉක්මන් වේ. එවිට අකල් මරණයට ගොදුරු වී ජීවිතය අහිමි වී යයි.

ආහාරපාන විෂයයෙහි පමණක් නොව ගමන බිමන, නවාතැන, ඍතුව ආදියෙහිත් යෝග්‍ය භාවය දත යුතු ය. අනවශ්‍ය ගමන් බිමන්, නොහොබිනා ක්‍රියා ආදිය අනතුරු බහුල වීමට හේතු වේ. හඳින පළඳින වස්ත්‍රාභරණ පිළිබඳව ද එකී සප්පායකාරී භාවය තිබිය යුතු ය. වටිනා කනකර ආභරණ පැළඳ මඟතොටේ ඇවිද යාම් ආදිය මෙවන් කාලයක ජීවිතාන්තරායන්ට පවා හේතු වේ. ආහාරය, ඇඳුම්, වාසස්ථානය හා ඖෂධය යන මූලික මිනිස් අවශ්‍යතා විෂයෙහි ම සප්පායකාරී භාවය රඳවා ගැනීමෙන් ජීවිතය වඩාත් පහසු හා සුඛනම්‍ය වේ.

යම් ආහාරපානාදියක් කොතරම් ගුණදායක හා සප්පාය වුව ද පමණ දැන පරිභෝග කිරීම දීර්ඝායුෂ ලැබීමට හේතුවන බව බුදුරජාණන් වහන්සේ විසින් වදාරා ඇත.

තම ජීවිතය හා ප්‍රතිබද්ධ ඕනෑම දෙයක් පිළිබඳ පමණ දැන කටයුතු කිරීම දුර්ලභව ලද මනුෂ්‍ය ජීවිතයේ සුරක්ෂිත භාවයට හේතු වේ. මධ්‍යම ප්‍රතිපදාව තුළ පුහුණු කළ ජීවිතය ඇත්තහුට ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා ආදී සියල්ලම හිමි වේ. කාමුක සන්තර්පණයන්ගෙන් ලැබෙන මොහොතක සුවයට වඩා මැදුම් පිළිවෙතින් ලැබෙන සහනය ලෞකිකත්වය විනිවිද ලෝකෝත්තර භූමිය කරා පැතිර යයි.

දිගාසිරි ලැබෙන තෙවන කාරණය ලෙස භාග්‍යවතුන් වහන්සේ වදාරා ඇත්තේ පරිණත භෝ භාවය යි. එනම් අනුභව කළ ආහාරය මනාව ජීර්ණය වූ පසු නැවත ආහාර අනුභව කිරීම යි. රසරාගයෙන් කෑදර වී පාලනයකින් තොරව නිතර නිතර නොයෙක් කෑම බීම අනුභවය විවිධ රෝග බහුල වීමට හේතුවන බව ප්‍රසිද්ධ කාරණයකි. ආහාර ජීර්ණය වීම සඳහා තේජෝ ධාතුව උපකාර වේ.

පරිපාචක තේජස යනු ආහාර දිරවන උෂ්ණයට නමකි. අනුභව කළ දේ මනාව දිරවා යාමට ප්‍රමාණවත් වේලාවක් නොතබා නැවත නැවත අනුභවය නිසා අතොරක් නොමැතිව කර්මජ තේජස උපදියි. තේජෝ ධාතුව අධික වන විට මුළු රූපයම අකාලයේ ජරාවට පත්වේ. තරුණ වියේදී ම කෙස් රැවුල් ඉදී යාම, සම රැළි වැටීම, දුර්වර්ණ වීම, තොල කට වියළී යාම වැනි තත්ත්වයන් පහළ වන්නේ තේජෝ ධාතුව බලවත් වීමෙනි.

හැකි නම් විකාල භෝජනයෙන් වෙන්වීම ද නිදුක්ව නීරෝගිව දීර්ඝායුෂ ලැබීමට හේතු වේ. විකාලය යනු දහවල් දොළහේ සිට පසුදා අරුණෝදාව දක්වා කාලයයි. බුදුරජාණන් වහන්සේ විසින් විකාල භෝජනයෙන් වෙන් වීමේ සික පදය පනවන අවස්ථාවේ එමඟින් ලැබෙන ආනිසංස පහක් වදාරා ඇත.

එනම්, නිරෝග බව (අප්පාබාධ), නිදුක් බව (අප්පාතංක), සැහැල්ලු බව (ලහුට්ඨාන), ශරීර ශක්තිය (බල), පහසු විහරණය (ඵාසුවිහාර) යන මේවා ය. ඒ අනුව නීරෝගිව දීර්ඝායුෂ වින්දනය කිරීම අපේක්ෂා කරන්නා විකාල භෝජනයෙන් වෙන් වීමට පුරුදු විය යුතු ය. එසේ කළ නොහැකි නම් පරිණතභෝජී භාවයට හා අල්පාහාර භාවයට හුරු විය යුතු ය.

අකාලචාරී නොවී කාලචාරී වීම ද ආයු වර්ධනයට හේතු වන කාරණයක් ලෙස පෙන්වා වදාරා ඇත. නොකල්හි ගමන් යාම නිසා නොයෙක් කරදරවලට පැටලේ. ජීවිත පවා ඇතැම්විට අහිමි වේ.

ගිහි පැවිදි දෙපාර්ශ්වය ම කිසියම් කටයුත්තක් සඳහා තම නවාතැනින් පිටත්ව යාමට ප්‍රථම ගමනේ උපයෝගීතාව හා සුදුසු කාලය අවශ්‍යයෙන් ම හඳුනාගත යුතු ය. කාලගුණික තත්ත්වය, ආරක්ෂක, දේශපාලන සහ සමාජ පසුබිම ආදිය පිළිබඳ සවිඤ්ඤාණික වී ගමන් බිමන් සැලසුම් කරගත යුතු අතර, සිල් ගුණ දම් පිරිහී යන කිසිදු ගමනක් නොයා යුතු ය.

සිල්වත්කම ද ආයු වර්ධනය සඳහා හේතු වන බව භාග්‍යවතුන් වහන්සේ විසින් පෙන්වා වදාරා ඇත. සිල්වතා සියලු අශිෂ්ට ක්‍රියාවන්ගෙන් ඉඳුරාම වෙන් වන නිසා අශිෂ්ට හැසිරීම් හරහා පැමිණිය හැකි සියලු අනතුරුවලින් අත්මිදේ.

සීලය නිසා කය වචනය සංවර වේ. එවිට ඔහු සාහසිකකම්වලින් අත්මිදෙන අතර, ජීවිතයේ දෛනික හැසිරීම් ස්වයං පාලනයකට නතු කරයි. ඉවසීම හා දරාගැනීමට ද සිල්වත්කම ඍජුවම හේතු වේ.

පුද්ගලයාට පැමිණෙන දුක්විපත්වලින් වැඩිහරියක් ම නොඉවසීම හා හදිසි වීම නිසා පැමිණෙන බැවින් ඕනෑම තත්ත්වයක් ඉවසා විඳදරා ගැනීමට පුරුදු වීමෙන් තමන්ගේ ද අන්‍යයන්ගේ ද ජීවිතවලට සුවිසල් ආරක්ෂාවක් සැලසේ.

සිල්වතා ගුණවතෙකි. ගුණවතා ධනවතෙකි. ගුණයෙන් ධනී වූ පුද්ගලයා උපනූපන් ජීවිතවල ආයුෂයෙන් හා සැප බල පරාක්‍රමයෙන් විපුල වේ.

සිල්වතා ගුණවතෙකි. ගුණවතා ධනවතෙකි. ගුණයෙන් ධනී වූ පුද්ගලයා උපනූපන් ජීවිතවල ආයුෂයෙන් හා සැප බල පරාක්‍රමයෙන් විපුල වේ.

බුදුරජාණන් වහන්සේ වදාළ ආයු වර්ධනයට හේතු වන තවත් කාරණයක් නම් බ්‍රහ්මචාරී වීමයි. සියලු ආකාරයෙන්ම මෛථුනයෙන් වෙන් වීම ඉන් අදහස් කරයි.


බ්‍රහ්මචාරී පුද්ගලයා සිල්වතෙකි. නොකල්හි වීථිසංචාරයෙන් වෙන් වූ කාලාචාරියෙකි. අසප්පාය දේ නොකරන අතර, සප්පාය දැයෙහි මාත්‍රාව දන්නෙකි. විකාල භෝජනයෙන් මුළුමනින් ම වෙන් වූවෙකි. දීර්ඝායුෂ ලැබීමේ සියලු පුරුදු බ්‍රහ්මචාරියා කෙරෙහි පිහිටන නිසා බ්‍රහ්මචාරී භාවය නිදුක් වූ දිගාසිරි ඇති සහන් දිවියකට හේතු වේ.

කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන බව ආයු වර්ධනයට බලපාන ප්‍රධාන කාරණයක් ලෙස භාග්‍යවතුන් වහන්සේ පෙන්වා වදාළහ. දයාබර වූ, අනුකම්පා සහගත, මෛත්‍රියෙන් පිරි හදවතක් ඇති, සිල්වත් වූ ධර්මධාරියා කල්‍යාණ මිත්‍රයෙකි. ඔහු දුගියකුට රුවන් නිධානයක් පෙන්වන්නාක් මෙන් දෙව් මිනිසුන්ට සාසන නිධානය පෙන්වයි.

කුරිරු ලෝකයේ නපුරු කුහකකම්, සැහැසි රුදුරුකම් කරුණාවෙන් ඉවසා අසීමාන්තික ක්ෂාන්තියත්, නිර්වාණාන්තික විමුක්තියත් දායාද කරන්නේ කල්‍යාණ මිත්‍රයා ම පමණි. එවන් කලණ මිතුරු ඇසුරක් ඇති පුද්ගලයාට ආයු වර්ණාදියෙන් සකල විපුලත්වයන් අත්‍යන්තයෙන් හිමි වේ.

බුදුරජාණන් වහන්සේ නම් වූ අසහාය කල්‍යාණ මිත්‍රයාණෝ අප ලද අසමසම සම්පත යි. අමරණීය ශාන්තිය යි. සදාකාලික ත්‍රාණය යි. අසරණ සරණ වූ ඒ අනාථ නාථයන් වහන්සේ වදාළ ශාන්තිකර ධර්මයේ පිහිටා මුනිපුත් මහා සඟනගේ ඇසුර ලබා මෙලොව ආයු ආරෝග්‍යාදී සියල්ලත්, පරලොව සුගති සුවයත්, අග්‍ර අමා මහ නිවන් සුවයත් හසරැල් මතින් ලබන්නට මං පෙත් විවර වේවා.

සියලු සත්ත්වයෝ ආයුෂයෙන් වර්ණ සැප බල ප්‍රඥාවෙන් වැඩෙත්වා.




බෙලිහුල්ඔය සීලසමාහිත යෝගාශ්‍රමවාසී
ත්‍රිපිටකාචාර්ය ත්‍රිපිටක විශාරද
අභිධර්මය පිළිබඳ කථිකාචාර්ය
ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
**බලංගොඩ රාධ හිමි**

පාණදුර - ගොරකාන
ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරස්ථ පුණ්‍ය භූමියේ ඉදිකෙරෙන
ගර්භය තුළට පිවිසිය හැකි චෛතිහාසික

ගොරකාන "සීවලි මහා සෑයට" ඔබත් දයක වන්න

පින්වත් ඔබගේ පුණ්‍යාධාර "සීවලි මහා සෑය අරමුදල" නමින් දක්වා ඇති බැංකු ගිණුමකට බැර කළ හැකිය. එලෙස බැංකු ගිණුමකට ඔබේ පුණ්‍යාධාරය බැර කොට ඇති බව සනාත කිරීම පිණිස එම බැංකු ලදුපත හෝ එහි පැහැදිළි පිටපතක් සමග, ඔබේ නම, ලිපිනය සහ දුරකථන අංකය පැහැදිළි අකුරින් ලියා පහත ලිපිනයට තැපැල් කරන්න. එහි විනිවිදභාවය සඳහා පුණ්‍යානුමෝදනා පතක් තැපැල් මගින් ඔබ වෙත එවනු ලැබේ. විහාරස්ථානයට පැමිණෙන පින්වතුන් හට "සීවලි මහා සෑය අරමුදල - කායභාලයය" ට පුණ්‍යාධාර ලබාදිය හැක. *තෙරුවන් සරණයි !*

| ගිණුමේ නම : සීවලි මහා සෑය අරමුදල | |
|---|---|
| සම්පත් බැංකුව ගිණුම<br>1151 6100 4890 | ලංකා බැංකුව ගිණුම<br>8 5 5 7 7 4 3 9 |
| මහජන බැංකුව ගිණුම<br>148-2-001-6-0038551 | සෙලාන් බැංකුව ගිණුම<br>0400-13126762-101 |




විශේෂ සුමධුර සදහම් දේශනාව
සහ අෂ්ඨපරිෂ්කාර පූජා පෙරහර

දේශකයාණෝ :
පූජ්‍ය වැලිමඩ සද්ධාසීල ස්වාමින්වහන්සේ



ස්ථානය : ගොරකාන - ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරස්ථානයේ සීවලි මහා සෑය ඉදිවන පුණ්‍ය භූමිය

දිනය : 2023 පෙබරවාරි 25 වන ද සෙනසුරාදා

වේලාව : සවස 5.00 ට

පිං කැමති ඔබත්, අෂ්ඨපරිෂ්කාරයක බරපැන දයකත්වය ලබා ගෙන, මියගිය සියලු ඥාතීන්ට පිං පමුණුවන්න. පවුලේ උපන්දිනයක් සමරා ආශිර්වාද කරන්න, සැමට නීරෝගි සුව ප්‍රාර්ථනා කරන්න. සුදුවතින් පෙරහරට එකතු වන්න.

අෂ්ඨපරිෂ්කාර පුද පූජා ආශිර්වාද පෙරහර පිටත්වීම :
ප.ව. 3.30 ට, ගොරකාන සොහොන් බිමේ සිට

සැ.යු. :-
★ ඔබේ අටපිරිකර පූජාවේ බරපැන මුදල සීවලි මහා සෑය අරමුදලේ බැංකු ගිණුමකට බැර කර බැංකු කුවිතාන්සිය පන්සලට භාරදී තමාගේ පූජාව වෙන් කරගන්න.
★ කැමතිනම් පන්සලේ කායභාලයට ද පැමිණ භාරදීමට පුළුවන.

ඔබ සැමට ආරාධනා !!!

සියලු විමසීම් :

සැදැහැති දායකත්වය

ගොරකාන සීවලි මහා සෑය
සීවලි මහා සෑය අරමුදල
ආරම්භය : ශ්‍රී බු.ව. 2563 / ව්‍ය.ව. 2020

ගරු සභාපති,
පූජ්‍ය ලියන්ගහවත්තේ නන්ද ස්ථවිර,
සීවලි මහා සෑය අරමුදල,
ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරය,
ශ්‍රී ධම්මානන්ද මාවත,
ගොරකාන,
කෙහෙල්වත්ත 12550.

විහාරස්ථානය :
038 22 97 914
සභාපති හිමි :
071 250 44 46

ස්වාමින්වහන්සේ පමණක් (බොහෝවිට) පන්සලේ වැඩවසන බැවින් බැහැරට වැඩසිටින අවස්ථාවලදී දුරකථන ඇමතුම් ලබාදීමේ දී සැලකිලිමත් වීමට කාරුණික වන්න.

# මුනි සිරිපා පහසින් ලක්දෙරණ සුපූජිත වූ වගයි

**ගෞතම බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිහිකරනු වස් දුරුතු පොහොය දාන, සීල, භාවනාම ය වශයෙන් ත්‍රිවිධ පුණ්‍ය කර්මයන්හි නියැළීමට සිව්වනක් පිරිසටම උදාවන වටිනා දිනයෙකි.**

**බෝධිතො නවමෙ මාසෙ**
**ඵුස්සපුණ්ණමියං ජිනො**
**ලංකාදීපං විසොධෙතුං**
**ලංකාදීප මුපාගමි**

යනුවෙන් මහාවංසයේ කියැවෙන පරිදි බුද්ධත්වයෙන් නව වැනි මස බුදුරජාණන් වහන්සේ ලක්දිව පවිත්‍ර කරනු පිණිස මෙරටට වැඩමවා තිබේ.

තථාගතයන් වහන්සේගේ බුද්ධත්වයෙන් වර්ෂයක් සම්පූර්ණ වීමටත් පෙර එනම්, බුද්ධත්වයෙන් නව වැනි මාසයේ උරුවෙල් කාශ්‍යප, නදී කාශ්‍යප හා ගයා කාශ්‍යප යන තුන් බෑ ජටිලයන් සහ දහසක් වූ අනුගාමික පිරිස යහමඟෙහි පිහිටුවන අතර, ලද ඇසිල්ලකින් ලක්දිව මහියංගනයේ යක්ෂ සමුළුවකට පැමිණ එම යක්ෂ පිරිස් දමනය කර ගිරි නම් දිවයිනට පළවා හැරියහ.

උතුරුකුරු දිවයිනෙන් පිණ්ඩපාතය රැගෙන විත්, අනවතප්ත විල සමීපයේ දී එය වළඳා සවස් කල මතු කාලයේ සම්බුදු සසුන බබළන ලක්දිවින් යක්ෂ ගෝත්‍රිකයන් බැහැර කිරීමට සිතූහ. ඒ අනුව මනෝරම්‍ය ගංතෙර යොදුන් තුනක් දිගු වූ, යොදුනක් පුළුල් වූ මහා නාග වන උයනෙහි රාත්‍රී කාලයේ යක්ෂයන් එක් රැස් වී සිටි භූමියට වැඩමවූහ. මහියංගන සෑ රදුන් පිහිටි ස්ථානයේ අහසෙහි වැඩ හිඳිමින් යක්ෂයන් බිය වන අන්දමට වර්ෂා, වාත අන්ධකාර මවා පෑහ. මේ යක්ෂයන් බිය වද්දා ගිරි දිවයිනට පළවා හැරි බව මහාවංසයේ සඳහන් වෙයි.

මෙම සමාගමය යක්ෂ ගෝත්‍රිකයන්ගේ යුද්ධයක් පිණිස එක් වූ බව ඇතැමුන්ගේ මතයයි. රැස්වීමක් හෝ ප්‍රීති උත්සවයක් ලෙස ඇතැමුන් සලකයි.

මහා වංසයට අනුව යක්ෂයන් පළවා හැරීමෙන් පසු දෙවියන් ඇතුළු පැමිණි පිරිසට බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළහ. ධර්ම ශ්‍රවණය කළ විශාල පිරිසක් සෝවාන් ආදී මාර්ගඵලවලට පැමිණියහ. ගණන් කළ නොහැකි අන්දමේ විශාල පිරිසක් තිසරණ සරණ ගියහ.

සෝවාන් ඵලයට පැමිණි සමන්තකූඨයේ වාසය කළ සුමන දේවේන්ද්‍රයා බුදුරජාණන් වහන්සේගෙන් පූජනීය වස්තුවක් ඉල්ලා සිටි කල්හි බුදුරදුන් හිස පිරිමැද කේශධාතු මිටක් පිරිනැමීය. එම කේශ ධාතුන් වහන්සේ සහ නන් වැදෑරුම් වටිනා වස්තු තැන්පත් කොට සුමන සමන් දෙවියන් ඉන්ද්‍රනීල මාණික්‍යයෙන් සත් රියන් උස් වූ මහියංගන සෑය ගොඩනැංවීය.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ශ්‍රී දේහය ආදාහනය කළ අවස්ථාවෙහි සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය වූ සරභූ මහ රහතන් වහන්සේ දැල්වෙන දර සෑයෙන් බුදුරදුන්ගේ ග්‍රීවා ධාතූන් වහන්සේ රැගෙන ලක්දිවට පැමිණ මහියංගන දාගැබෙහි නිධන් කළහ.

මේදෝවර්ණ පාෂාණයෙන් දොළොස් රියන් උසට දාගැබ විශාල කොට බැඳවීය. මින් පසු විවිධ රජ දරුවන් යුගයෙන් යුගය මහියංගන සෑය කඤ්චුක සෑයක් වශයෙන් ප්‍රතිසංස්කරණය කරවා තිබේ.

මහියංගනයේ සිට නැවත උරුවෙල් දනව්විට වැඩි බුදුරජාණන් වහන්සේ බුදු වීමට පෙර බිම්බිසාර මහ රජතුමා සිදු කළ ඉල්ලීමට අනුව එතුමන් දැකීම පිණිස ජටිල හිමිවරුන් සමඟ රජගහනුවරට වැඩම කළහ. දුරුතු පුර පොහොය පසු වී නමුත් දුරුතු මාසයේ සිදුවුණු වැදගත් සිදුවීම් වශයෙන් බිම්බිසාර රජතුමා විසින් බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව වූ වේළුවනාරාමය පූජා කිරීම, මිය ගිය නෑයින් සඳහා සාංඝික දාන පිරිනමා පින් දීම ආරම්භ වීම වැනි සිදුවීම් සැලකිය හැකි ය.

විසිවැනි සියවස මුල් භාගයේ දී හෙලේනා විජයවර්ධන මැතිණියගේ ප්‍රධානත්වයෙන් කැලණි විහාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කෙරුණු පසු වාර්ෂික කැලණි පෙරහර පවත්වනු ලබන්නේ ද දුරුතු පුර පසළොස්වක දින වීම ද විශේෂ සිදුවීමකි.



රාජකීය පණ්ඩිත
**දෙදියගල නන්දරතන හිමි**

බුදුසරණ

# සැහැල්ලු ජීවිතයක සැබෑ ස්වරූපය


## බාහිරින් මනින්න එපා

**බුදුපියාණන් වහන්සේ සල්ලහුකවුත්ති යන සංකල්පයෙන් අපට පෙන්වා දී ඇත්තේ සැහැල්ලු දිවි පැවැත්ම යි. මේ කරුණත් විශේෂයෙන් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේගේ සාර්ථක භික්ෂු ජීවිතයේ ඵල නෙළා ගැනීම අරමුණ කොට දේශනා කර තිබෙන අර්ථයක්.**

ගිහිගෙයි සියලු බන්ධනවලින් ඇලීම්, බැඳීම්වලින් වෙන්ව, විවෙකී ජීවිතයක් අරමුණු කොට වඩාත් පහසුවෙන් ඉක්මනින් නිවන් මඟ සාදා ගැනීම අරමුණු කොට කටයුතු කරන භික්ෂුව හැම විටම සැහැල්ලු, චාම් සරල දිවි පැවත්මක් ඇත්තකු බවට පත් විය යුතු වෙනවා.

ඉතින් ගේ දොර හෝ, තමන් සතුව හෝ තමන්ට පරපුරෙන් අයත් වන්නට තිබුණු හෝ හැම දෙයක්ම අත්හැර පැමිණි භික්ෂුව නැවත ඊට වඩා වැඩි දෙයක් එසේත් නැත්නම් යාන වාහන, ඇඳපුටු, ගෘහභාණ්ඩ, වෙනත් විසිතුරු මන පිනවන, කන් පිනවන, ඇස පිනවන නොයෙක් නොයෙක් උපභෝග පරිභෝග වස්තූන් කෙරේ හඹා යන චරියක් ඇත්තකු බවට පත් නො වීමේ වැදගත්කමයි මේ කරුණින් බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත්තේ.

තවදුරටත් පැහැදිලි කරනවා නම්, එයින් ප්‍රකාශ වන්නේ බහුභාණ්ඩික විය යුතු නොවන බවයි. එසේ තමන්ට ලැබෙන දෙය හෝ ලැබුණ දෙය පිළිබඳ සුහර වන තත්වයෙන් ජීවිතය පවත්වා ගෙන යනවා වගේ ම වැඩි වැඩියෙන් තමන්ට යම් යම් දේ දායක පක්ෂයෙන් ලැබුණත් ඒවා කෙරෙහි ගිජු බවක් දක්වා වැඩි වැඩියෙන් එයට රුචි වෙමින් කල් ගෙවන්නේ නම්, එයින් තමන් වහන්සේ බොහෝ භාණ්ඩ රැස්කරගත් අයකු බවට පත් වී ඇති බවයි පෙනෙන්නේ.



එතකොට භික්ෂුව වෙතින් තමන් කරන්නට අරමුණු කර ගත් මඟ ඉබේ ම තම සන්තානයෙන් ගිලිහී යන තත්වයක් ඇති වෙනවා . එපමණක් නොව කහවස්ත්‍ර පොරවා ගත් සිවුරු දරන්නකු පමණක් බවට පත්වෙනවා. එය භික්ෂු ජීවිතය නොවන බවයි බුදුරජාණන් වහන්සේ මෙම අර්ථයෙන් පෙන්වා දෙන්නේ.

ඒ මොකද භික්ෂුවට තිබෙන එකම බර තමන්ගේ ශරීරකූඩුව පමණ යි. කුරුල්ලාට තිබෙන පියාපත් බර වැනි සුළු බරක් පමණයි. ඉතින් එවැනි භික්ෂුව හරිම සැහැල්ලුවෙන් තමයි කල් ගෙවන්නේ.

උන්වහන්සේ සිව්පසය පරිභෝග කරන්නේ සුඛෝපභෝගී දිවි පැවත්මක් අරමුණු කරගෙන නොවෙයි. උන්වහන්සේ බඩු පොදි ගහගෙන යන ජීවිතයක් ගත කරන්නේ නැහැ.

එහෙත් යම් පමණකට කාලයේ ගෙවීයාමත් සමඟ භික්ෂු ජීවිතය මේ සැහැල්ලු බවෙන් තොර වී ඇති සෙයක් පෙනෙනවා. ඇත්තෙන් ම භවභෝග සම්පත් එක්රැස් වූ විට ඒකාන්තයෙන් ම එසේ සැහැල්ලු බව ගිලිහෙන බව අමුතුවෙන් කිව යුත්තක් නොවෙයි. බාහිර ආටෝප සහිත ජීවිතයට, විවිධ විලාසිතාවන්ට ඇබ්බැහි වීම මේ සැහැල්ලු බව දුරුවීමට හේතු වෙනවා. මේ නිසාම ආධ්‍යාත්මික ගුණවගාවෙන් ද පිරිහෙනවා. මොකද තම චිත්තසන්තානයේ නිරන්තරයෙන් රාගාදි කෙලෙස් බහුල වීම නිසයි. මේ අභ්‍යන්තර තත්වය පිරිහී ගියහම වන්නේ බාහිර වශයෙන් අමුතුම ආකාරයෙන් ආටෝප සහිත, නැති ගුණ මෙන්ම, නැති සිල් පෙනෙන ආකාරයෙන් බොහෝ පිරිස් පිරිවරාගෙන සමාජය ඉදිරියේ අමුතුම විලාසිතාවක් ඉදිරිපත් කර ගෙන, අනිත් අය මුළාවන තත්වයෙන් කටයුතු කර තමන් අන් අයට වඩා ශීලාදී ගුණ දහමෙන් පෝෂණය වී ඇති තත්වයක් සමාජය ඉදිරියේ දිගහැර පාමින් කටයුතු කිරීම යි.

බුදුරජාණන් වහන්සේ මේ බව වරක් කොසොල් මහ රජතුමාට පැහැදිලි කර දුන් බවක් සූත්‍ර පිටකයේ එන සත්තජටිල සූත්‍රයෙන් ප්‍රකට වෙනවා.

එනම්, දිනක් අපේ බුදුරජාණන් වහන්සේ හමුවීමට කොසොල් මහ රජතුමා සිරිත් පරිදි දෙව්රම් වෙහෙරට පැමිණ සතුටුසාමිචි කථාබහක යෙදී සිටියා ඒ අවස්ථාවේ ඒ අසලින් වැටි තිබුණ මාර්ගයේ සත්තජටිලයන් මහපිරිස් පිරිවරාගෙන ගමන් කරමින් සිටියා. එක්වරම රජතුමා එම මහපිරිස් පිරිවරා යන සත්තජටිලයන් දැක බුදුරජාණන් වහන්සේගෙන් වහා ඉවත් වී අර මහමඟ යන පිරිස් පිරිවරාගත් සත්තජටිලයන් ඉදිරියට ගොස් දෙපාමුල වැඳ වැටී තමන් පසේනදි කොසොල් රජු බව පවසමින් මහත් ගරුබුහුමන් දක්වමින් කියා සිටියා.

මේ පිරිස් එතැනින් නික්මුණු පසු නැවතත් බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණ තමන් ඒ ගරුබුහුමන් කළේ බොහොම සිල්වත්, ගුණවත්, කෙලෙස් නැසූ පිරිසකට බව පවසමින් බුදුරජාණන් වහන්සේට ප්‍රකාශ කර සිටියා. මේ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ රජතුමා අමතා ප්‍රකාශ කර සිටියේ බාහිර පෙනුමෙන්, සැරසුමෙන් කෙනකුගේ ආධ්‍යාත්මය කිරා මැන බැලීමට නොහැකි බවත්, ආධ්‍යාත්මයෙන් අපිරිසුදු බොහෝ පිරිස් තමන්ගේ නැති සීලාදි ගුණ පෙන්වීමට මේ ආකාරයෙන් තමන්ගේ පරිවාර සම්පත්තිය ද පෙන්වමින් ක්‍රියා කරන බවයි.

ඇත්තෙන් ම මෙයින් පැහැදිලි කර දී තිබෙන්නේ මේ ආධ්‍යාත්මික වශයෙන් සැහැල්ලු ජිවන ප්‍රතිපදාවක සැබෑ තත්වය මේ ආකාරයෙන් බාහිර කරුණු මත තේරුම් ගැනීමට අපොහොසත් බව වගේම, යම් යම් අයගේ සැහැල්ලු ජීවන ප්‍රතිපදාවේ තරම දැක්ක දුටුව තරමින් මැනීම, ඇගයීම නොකළ යුතු බවයි.

ඉතින් මේ භික්ෂු ජිවිතයට අදාළ වන මේ සැහැල්ලු ජිවන පැවැත්ම ගිහිජීවිත ගතකරන උදවියට ද සැබවින්ම අදාළ වන කරුණක්. සැහැල්ලුවෙන් කල් ගෙවන ගිහි ජනතාවට කිසිදු බරක් දැනෙන්නේ නැහැ.

අද රූපවාහිණී හා වෙනත් ජනමාධ්‍ය තුළින් මේ මිනිස් සිත ඇද බැඳගෙන එක් එක් නිෂ්පාදන සම්බන්ධයෙන් ජනතාවගේ ආකර්ෂණය ලබා ගන්නට මොනතරම් උත්සාහවත් වෙනවා ද කියන එක රහසක් නොවේ. එදාවේල බොහොම අපහසුවෙන් වුණත් සපයා ගන්නා ජීවිතයක් ගත කළත් ණයතුරුස් වී හෝ මේ ආකර්ෂණය කර ගන්නා විලාසිතා විවිධ ආකාරයෙන් ඉදිරිපත්වන විට එවැනි බඩුමුට්ටු එක්රැස් කර ගැනීමට වෙර දරන පිරිස් නම් කොපමණ ඉන්නවාද කියන එක අමුතු කරුණක් නොවෙයි. අපි එක නිදසුනක් වශයෙන් ගත්තොත් අප භාවිත කරන ජංගම දුරකථනය දැන් බැලුවොත් සාමාන්‍යයෙන් ලංකාවේ ජනගහනය ලක්ෂ 220 ක් පමණ වුවත් දුරකථන භාවිතය ලක්ෂ 350 ඉක්මවා තිබෙන බවයි සමීක්ෂණ මඟින් පෙන්වා දී ඇත්තේ.



ඒ විතරක් නොවේ වෙළඳපොළට අලුතෙන් මාධ්‍ය මඟින් හඳුන්වා දෙන විවිධ මාදිලියේ දුරකථන මිල දී ගැනීමටත් නොකා නොබී හරිහරියට උනන්දු වෙනවා. මේ තත්වය ඇඳුම් පැළඳුම්, පාවහන්' විශේෂයෙන් සුවඳ විලවුන්', රූපවාහිනී යන්ත්‍ර ආදි විවිධ අංශ කෙරෙහි තදින් බලපානවා. ඉතින් මේ සැහැල්ලු දිවි පැවැත්මට අවශ්‍ය දේ ද? නැහැ. අද තාක්ෂණික වශයෙන් දියුණු ලෝකයේ ජිවිතය පහසු කරන අත්‍යවශ්‍ය උපකරණ තිබෙනවා. ඒ ගැන නොවේ මේ පවසන්නේ.

සැහැල්ලු දිවි පැවැත්මට අවශ්‍ය මූලික කරුණු හැටියට බදුරජාණන් වහන්සේ විසින් පෙන්වා දුන් අංග හතරමයි ගිහි ජනතාවටත් අදාළ වන්නේ. ඒවා ජීවත්වීමේ මූලික අවශ්‍යතාවන්. එනම් ඇඳුම් පැළඳුම්(චීවර) ආහාර(පිණ්ඩපාත) වාසස්ථානය(සේනාසන) බේත්හේත්(ගිලානප්‍රත්‍යය) යන හතර. ඉතින් මේ කරුණු හතර ගිහි ජිවිතයට ගළපා පිරිමසාගන්න ආකාරයෙන් සැහැල්ලු වීම තමා වැදගත් වන්නේ.



මහනුවර අස්ගිරි මහා විහාරයේ
කාරක සංඝසභික හා උපාධ්‍යාය ධූරන්ධර
වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක මහාචාර්ය
**තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**

# සම්බුදු දහම විමසා බලන්න පිළිවෙත් මඟට එකතු වන්න

**ධර්මය හෝ දහම නම් වූ වචනය ඕනෑම ඉගැන්වීමක් වෙනුවෙන් යොදාගත හැකි වචනයකි.**

බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට අප විසින් දහම නම් වූ පරියාය වචනය භාවිත කරන්නේ කුමන අදහසින් ද? මිනිස් සන්තානයේ සකස් වෙන්නා වූ ලෝභ, ද්වේෂ, මෝහ නම් ප්‍රධාන වූ, මෙලොව, පරලොව අනර්ථකාරී බව නිර්මාණය වන කෙලෙස් බැහැර කරවන, පාරිශුද්ධ වූ චිත්ත සන්තානයක සන්සිඳීමක් හෙවත් සමාධියක් ඇතිකරවන නම් වූ අදහසිනි.

මෙම දහම, ධර්ම පරියායක් ලෙස සීල, සමාධි, ප්‍රඥා නම් වූ ත්‍රිශික්ෂාව ඔස්සේ ක්‍රියාවට නැංවෙයි. දර්ශනයක් යනු යම් සිද්ධාන්තයක් ඔස්සේ චින්තන මාර්ගයක් ඉදිරිපත් කිරීමයි. එය පූර්ව නිගමනවලින් බැහැරව සහ ඉන්ද්‍රිය ගෝචර නොවන විශ්වාසවලින් සහ සංකල්පවලින් තොර වූවකි.

බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වල, ශාස්තෘවරයෙක් ලෙස මඟ පෙන්වීම සිදු කෙරේ. එනමුත් එය දේව විශ්වාසයක මෙන් මිනිස් සිතට බලපැවැත්මක් නොකෙරේ. ලෝභ, ද්වේෂ, මෝහයන්ගෙන් බැහැරව සිතීමේ සහ විමසීමේ නිදහසක් කැමත්තෙන් අනුගමනය කරන්නන්ට ලබා දෙයි. මේ බව කාලාම සූත්‍ර දේශනාවෙන් ප්‍රකට කෙරේ.

එමඟින් තමාගේ ම අත්දැකීම්වලින් මෙන්ම බාහිර ලෝකය ද ඇසුරු කරගෙන දැක්ම හෙවත් දර්ශනය සකස් විය යුත්තේ ය. මේ අනුව බෞද්ධ ඉගැන්වීම් වඩාත්ම දර්ශනයක් ලෙස ද සැලකිය හැක්කේ ය. කෙසේ වෙතත් බෞද්ධ ඉගැන්වීම් යථාභූත ඥාන දර්ශනයකි. එය අසවල් කොටසට පමණක් අයත් ය යනුවෙන් අවසාන නිගමනයකට පැමිණිය නොහැක්කේ ය.

වර්තමානයේ යම් පිරිස් පවසන පරිදි බුදුදහම ද ආගමකට සීමා කොට, බෞද්ධ ඉගැන්වීම්වලින් ද බැහැරව නිදහස්ව සිතන්නට, කියන්නට, ක්‍රියා කරන්නට සුදුසු ය යන්න ය. එසේ පවසන පිරිස් අඩුම තරමේ තථාගතයාණන් වහන්සේ ලොවට වදාළ "මෙත්තා" නම් මෛත්‍රිය පිළිබඳවත් සිත සිහිය යොමු කළ යුතු වන්නේ ය. ලෝකයේ "යහපත් ය" නම් වූ බොහෝ පිරිස් මනුෂ්‍යයන් පමණක් ගැන සිතද්දී බුදුදහම මනුෂ්‍යයන් ද ඇතුළුව සියලු සත්ත්වයන් කෙරේම හිතවන්ත බව පුරුදු කිරීමට ඉගැන්වීය. මානව අයිතිවාසිකම් පමණක් නොව සියලු සත්වයින්ට ම ජීවත්වීමේ අයිතිය තහවුරු කළේ ය. තමා තමාට දක්වන හිතවන්ත බව මෙන්ම සියලු සත්ත්වයෝම ඔවුන්ට හිතවන්ත බව උපමාකොට ගෙන කිසිදු මනුෂ්‍යයකුට හෝ වේවා සත්ත්වයකුට හිංසා නොකළ යුතු බව සහ ජීවිත හානි නොකළ යුතු බව අවධාරණය කළේ ය. දැඩි වූ තෘෂ්ණාවෙන් ඔවුනොවුන් මරණයට පත් කරන්නට අවි ආයුධ නිෂ්පාදනය කරමින්, භෞතික ලෝකයේ වස්තූන් වෙනුවෙන් දැඩි තරගයක නිරතව සිටින ලෝකයාට සියලු සවිඤ්ඤාණක සහ අවිඤ්ඤාණක වස්තුන්ගේ ඇති අස්ථිර බව පෙන්වාදී මනුෂ්‍ය ජීවිතයේ වටිනාකමද, මිනිස් සංහතියේ යහපත වෙනුවෙන් ක්‍රියා කළ යුතු ආකාරය ද පෙන්වා දුන්හ. මෙය මූලික පියවරේ දී දානාදී පාරමී ධර්ම සම්පූර්ණ කිරීමක් ලෙස ඉගැන්වෙයි. අනිච්ච, දුක්ඛ, අනන්ත නම් වූ තිලක්ඛණය ඉදිරිපත් කළේ ලෞකික ජීවිත, සාමාන්‍ය ලෝකයා සිතන පරිදි දුකට හෝ අකර්මණ්‍යය කරන්නට හෝ මෙලොව දියුණුව නැති කරන්නට නොව, මනුෂ්‍යත්වයේ හැබෑ තේරුම, උතුම් සැනසිල්ල තමා වෙතින් ම අවබෝධයෙන් යුතුව මතු කර ගන්නට ය.



බුදුදහම මෙත්තා, කරුණා, මුදිතා සහ උපේක්ඛා නම් වූ සතර ආකාරයක උතුම් වූ හැසිරීම් නම් වූ සතර බ්‍රහ්ම විහරණ ඔස්සේ සියලු දෙනාම සමගියට පරෝපකාරයට සමීප කරයි. සියලු දෙනාටම සාමානාත්මතාවයෙන් යුතුව දිළිඳු අයට පරිත්‍යාග කරමින්, වචනයෙන් පමණක් නොව පිරිසුදු සිතින් ම මවුපිය, දූ, දරු, සොහොයුරු, සොහොයුරියන් සේ ගරු කරන්නට උගන්වන ප්‍රතිපදා මාර්ගයක බුදුදහම පිළිපදින බොහෝ පිරිසක් සාමාන්‍ය ජන ජීවිතයේ සතුට සහ යහපත ද දියුණුව සහ ස්වයං සන්තුෂ්ඨිය පිණිස ද උගන්වන මංගල, සිඟාලෝවාද, ව්‍යග්ඝපජ්ජ, වසල පරාභව වැනි සූත්‍ර පිළිබඳ දැනුම්වත් වී ඇත.

මේ මඟින් මිනිස් සිතේ අති කරගත යුතු ගුණාංගත්, මනුෂ්‍ය ප්‍රජාවට විපත් ගෙන දෙන කායික, මානසික සහ වාචසික ක්‍රියාදාමයන් බැහැර කරගත යුතු ආකාරයත් මැනවින් පෙන්වා දෙයි.

පඤ්ච සීලයෙන් මූලිකව මනුෂ්‍යත්වය පිරිසුදු කොට, සතර සතිපට්ඨානයෙන් දුක් දොම්නස් බැහැර කොට සියලු දුකින් නිදහස් වන සදාකාලික විමුක්තියට කැඳවාගෙන යන අසිරිමත් වූ ද, සුන්දර වූ ද මානුෂීය ප්‍රතිපදා මාර්ගයකි. බිය ගන්වා බලයෙන් ඇදහීමට හෝ විශ්වාස කිරීමට යොමුකරන මඟක් ද නොවේ.

භාග්‍යවතුන් වහන්සේ මනුෂ්‍යයෙකි. එනමුත් සාමාන්‍ය පෘථග්ජන මනුෂ්‍යයන් කෙරේ පවත්නා වූ රාග, ද්වේෂ, මෝහ මුළුමනින් ම බැහැර කළ ආශ්චර්යවත් වූ, උතුම් වූ මනුෂ්‍ය රත්නයකි. එය සංකේතවත් කළේ චතුරාර්ය සත්‍ය ධර්ම අවබෝධය නම් වූ "බුද්ධ" නම් වූ වචනයෙනි.


එය ද දක්වන්නේ ඇවිත් නුවණින් යුතුව පරීක්ෂා කොට බලන්නට මිස අන්ධ භක්තියෙන් යුතුව අදහන්නට නොවේ. භාග්‍යවතුන් වහන්සේට හැබෑවටම ගරු කරන්නා නම් මේ ප්‍රතිපදා මාර්ගය අවබෝධයෙන් යුතුව අනුගමනය කොට ඵල ලබන්නා මිස අනවබෝධයෙන් වැඳුම් පිඳුම් හෝ පුද පූජාවල නිරත වෙන්නා නොවේ. සතිපට්ඨානයේ උගන්වන "සති - සම්පජඤ්ඤය" අවබෝධයෙන් යුතුව මේ මොහොතෙහි සිත සිහිය පිහිටුවා ගැනීම, අධ්‍යාපනික, ආර්ථික, සාමාජික සහ පවුල් පාරිසරික ආදී කුමන රටාවකට ද යොමු කර ගැනීමෙන් එහි නැණවත්, සත්පුරුෂයන් බලාපොරොත්තු වන සාර්ථකත්වයක් ඇති කරගත හැකි ය. වර්තමානයේ බොහෝ සමාජ කණ්ඩායම් අතර පවත්නා ආතතිය (Stress) දොම්නස (Depression) දුරු කර ගැනීමට කදිම මානසික ඖෂධයකි. මෙය නොදත් හෝ නොසලකා හරින්නෝ දුර්ලභ වූ ලැබූ මනුෂ්‍ය ජීවිතයට වටිනාකමක් නොදෙති.

බෞද්ධ නමින් පෙනී සිටින යම් අයෙක් ප්‍රතිපදාව අනුගමනය නොකොට ලාභ, අලාභ ආදී අෂ්ඨ ලෝක ධර්මයට ජීවිතාබෝධයෙන් යුතුව මුහුණ දී ගත නොහැකිව දහමින් ඉවත්වෙනවා යැයි පැවසීම හෝ දහමට ගැරහීම නියමාකාර පිළිතුර දැයි විමසිය යුතු වන්නේ ය.

ශ්‍රී ලාංකික පරිසරයේද මව්පිය, දූ දරු, ස්වාමි භාර්යා, ගිහි පැවිදි මනා වූ සම්බන්ධයක් ගොඩනඟා මනුෂ්‍යත්වයේ හැබෑ අරුත කියා දුන්නේ බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වලිනි.

මෙය මනා ලෙස අවබෝධ නොකර ගන්නා වූ පුද්ගලයෝ සර්පයාගේ වලිගයෙන් අල්ලා ගත්තාක් මෙන් චාරිත්‍ර වාරිත්‍රවල පමණක් මූලික තැනක් දී ක්‍රියා කොට ගැටුම් ඇතිකර ගනිති. කලින් කල සිදුවන සාමාජික හෝ ආර්ථික ගැටලුවට විසඳුම් සෙවීමේ දී දහම වරදවා පලිහක් කර ගැනීමට උත්සාහ ගනිති. තම පුද්ගලික අභිමතාර්ථ ඉටු නොවන අවස්ථාවේ දී දහමෙහි වරදක් බව සිතති. වර්තමානයේ ලෙඩ සනීප කරනවා ය නම් වූ ඇදහිලි සංකල්පය ද එවැන්නකි. පරමාර්ථ ධර්මයම ප්‍රධාන කොට බුදුදහම විමසා බලන්නට පිළිවෙත් මඟට එකතු වන්නට ද ආරාධනා කරමි.

> *කෙනෙක් අමිහිරි, රළු වචන කතා කරන මොහොතක ඒ පුද්ගලයා ගැන ඔබගේ සිතෙහි ඇතිවන අප්‍රියජනක බව මොනතරම් ද? ඔබ ද අයහපත් රළු වචන කියනවා නම් ඒ හා සමානව ඔබත් අනුන්ගේ පිළිකුලට, අප්‍රසාදයට ලක්වන බව අමතක නොකරන්න*



බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුනෙහි ප්‍රධාන අනුශාසක ආචාර්ය
**මිරිස්සේ ධම්මික නා හිමි**

## සිරි සදහම් පැන විසඳුම්

**සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුර ලියා එවා ගුණසේන සහ සමාගමෙන් "මහ පිරිත් පොත් වහන්සේ" ධර්ම ග්‍රන්ථය හිමිකර ගන්න.**

**සතිපතා ජයග්‍රාහකයින් පස් දෙනකුට ත්‍යාග තිළිණ කෙරේ**

බුදුසරණ

මේවර ප්‍රශ්නය - 91

**මහියංගන දගැබ ඉදිකළේ කවුරුන් විසින් ද?**

ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

පිළිතුර : ..............................

නම : ..............................

නිවසේ ලිපිනය : ..............................

..............................

දුරකතන අංකය : ..............................

ඇම්. ඩී. ගුණසේන - බුදුසරණ සිරි සදහම් පැන විසඳුම් , බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10

# පිරුවානා පොත් වහන්සේ සාමණේර බණ දහම් පොතට ආදේශනයක් ද ?



**අප භාවිත කරන පිරුවානා පොත් වහන්සේ බුදුරජාණන් වහන්සේ විසින් වදාළ සූත්‍ර විසි හතරකින් හා බණවාර හතරකින් සමන්විත වූවකි. එනිසා එය මුල් යුගයේ හඳුන්වනු ලැබුවේ චතුබණවර පාලිය යන නමිනි.**

එහෙත් එහි ඇති ඇතැම් කරුණු අනුව මුල් යුගයේ සාමණේර බණදහම් පොතක් ලෙස ද පිරුවානා පොත් වහන්සේ භාවිත වන්නට ඇතැයි විද්වත් මතයයි.

සාමණේරවරුන් ලෙස හඳුන්වන්නේ සංඝ සමාජයට ඇතුළුවනු පිණිස පැවිදි වූ එහෙත් උපසපන් නොවූ පිරිස ය. මෙකී සාමණේර හිමිවරු පිරුවනා පොත් වහන්සේ සම්පූර්ණයෙන් ම පාඩම් නොකළ හැකි නම් පැවිදි නොකරන ලෙස පැරැණි කතිකාවත් හි නියමයක් ද මුල්කාලයේ දී විය.

එය තවදුරටත් සනාථ කරන සාධකයක් වන්නේ චතුබණවාරපාලිය සසුන්වත් කුල දරුවනට වන පොත් කිරීම සඳහා ඇති පොතක් බව සතරබණවර පාලි අටුවාවේ හා සෙල් ලිපිවල සඳහන් වීමයි.

චතුබණවර පාලියේ මුලින් සඳහන් වන සරණාගමන, දස සික්ඛාපද, සාමණේර පඤ්හ, ද්වත්තිංසාකාරය, පච්චවෙක්ඛණ හා දසධම්ම සූත්‍රය සසුන්වත් තෙරුණුන් විසින් සාමණේර බණ දහම් පොතක් ලෙසට පරිහරණය කරන්නට ඇති බවට සාධක වේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි කෙසග සිට යටිපතුල දක්වා ඇති නන් අයුරින් අසුචියෙන් පිරි කුණුප කොටස් 32 කින් අප ශරීරය නිර්මාණය වී ඇත. එම ඉන්ද්‍රියන් සාමණේරවරුන් වහන්සේලා පිළිකුල් භාවනාව සඳහා යොදා ගත යුතු යැයි බුද්ධ නියමයකි.

එසේම පිරිවානා පොත් වහන්සේ තුළ දැක්වෙන දසසිල්, සාමණේර හිමි නමක් සමාදන් විය යුතු ශික්ෂා පද ලෙස භාවිත වනු ඇත. පිරිවානා පොත් වහන්සේ තුළ දැක්වෙන සාමණේර පඤ්හ යනු සාමණේර භික්ෂුවක් විසින් ප්‍රශ්න 10 කට ලබා දුන් ධර්මානුකූල පිළිතුරු ය. එයම උන්වහන්සේට උපසම්පදාව ලැබීමට හේතු වෙති.

බුදු දහමේ සඳහන් සංඛ්‍යාත්මක ධර්මයක් වන එය "ඒක නාම කිං?" " එක නම් කිම?" "ද්වේ නාම කිං?" "දෙක නම් කිම" ආදි ලෙසට පිළිවෙළින් අසන ලද ප්‍රශ්න දහයකට දෙන පිළිතුරු ය. ඒවා පිරුවානා පොත් වහන්සේ තුළ අන්තර්ගත වන්නේ, එක නම් සියලු සතුන් ආහාරය නිසා ජීවත්වෙයි,

දෙක නම් නාම, රූප ධර්මතා යි,

තුන නම් සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ යන වේදනාවෝ ය,

හතර නම් චතුරාර්ය සත්‍යය යි,

පහ නම් උපාදානස්කන්ධ පහ යි,

හය නම් ආධ්‍යාත්මික ආයතන හය යි,

සත නම් සප්ත බොජ්ඣංග ධර්මයෝ ය,

අට නම් ආර්ය අෂ්ඨාංගික මාර්ගය යි,

නවය නම් සත්තා වාස නමය යි.

දහය නම් රහතන් වහන්සේ සතු අංග 10 යි.

මේ සියල්ල සාමණේර හිමිවරුන් ප්‍රගුණ කළ යුතු යැයි සඳහන් වන ධර්ම කාරණා ය.

ගිහියා හා පැවිද්දා ඔවුනොවුන්ට වෙනස් වූ ආකල්පවලින් යුතු ජීවිත ගත කළ යුතු ය. ගිහිගෙය හැර සාමණේර කෙනකු වශයෙන් පැවිදි වන ප්‍රව්‍රජ්ජාපේක්ෂකයාට මුලින්ම සිවුරු කට්ටලය ලබා දී එහි ඇති සිවුරු පටිය ගෙල වට පළඳවමින් උපාධ්‍යායන් වහන්සේ චීවරය පිළිබඳ ප්‍රත්‍යවේක්ෂාව කියවති.

එකී ප්‍රත්‍යවේක්ෂාව පච්චවෙක්ඛණ යටතේ පිරිවාණා පොත් වහන්සේ තුළ අන්තර්ගතව ඇත. "පටිසංඛා සොනිසො චීවරං පටිසේවාමි" ආදි ලෙසට හුදෙක් ශීත නැති කිරීම පිණිස, උෂ්ණ නැති කිරීම පිණිස, මැසි - මදුරු - සුළඟ - අව්ව හා සර්පයන්ගේ ස්පර්ශය නැති කිරීම පිණිසත්, විලි වසා ගැනීම පිණිස, පමණක් සිවුරු පරිහණය කෙරේ ය යනු එහි අදහසයි.

මේ අනුව භික්ෂුවක් ප්‍රගුණ කළයුතු අල්පේච්ඡතාව එයින් මනාව පැහැදිලි වේ.

මෙලෙස පැවිදි භාවයට පත්වන ප්‍රව්‍රජ්ජාපේක්ෂකයාට සාමණේර බණදහම් පොතෙහි සඳහන් වන දෙතිස් කුණුප කොටස් තිස්දෙක ද, පිරිවානා පොත් වහන්සේ තුළ අන්තර්ගතව ඇත.

පිළිකුල් භාවනාව සඳහා මෙම ශරීරාංග යොදා ගැනුණත් දෙතිස් කුණුප කොටස් අතරින් "කෙසා, ලොමා, නඛා, දන්තා, තචෝ, නචො, දන්තා, නඛා, ලොමා, කෙසා යනුවෙන් තච පඤ්චකය නම් වූ ඉහත කොටස් අනුලෝම ප්‍රතිලෝම වශයෙන් උපාධ්‍යායන් වහන්සේ උතුම් පැවිදි බව ලබන අවස්ථාවේ දී පැවිදි බව ලබන්නාගේ



බෙල්ලන්විල රාජමහා විහාරාධිකාරී, ශාස්ත්‍රපති
**බොරලැස්ගමුවේ පේමරතන හිමි**

බද්ධාංජලය අල්වගෙන කියවති, එසේ කියවීමෙන් පසුව පිරිවානා පොත් වහන්සේ තුළ සඳහන් වන සරණාගමණය නම් වූ බුද්ධං සරණං ගච්ඡාමි ලෙසින් උපාධ්‍යායන් වහන්සේ සම්පූර්ණයෙන් ම සරණාගමන වාක්‍යය කියවා සාමණේර දස ශීලයෙහි පිහිටුවනු ලැබේ.

සාමණේර භාවයට පත්වුණු සාමණේරයන් වහන්සේ දිවිහිමියෙන් නිතර සිහිපත් කළ යුතු ප්‍රත්‍යයන් එනම් ආහාර, ඇඳුම් පැළඳුම්, සේනාසන, බෙහෙත් ද්‍රව්‍ය හෙවත් ගිලන්පස උන්වහන්සේලාගේ මූලික අවශ්‍යතාවලට පමණක් භාවිත කරති.

චතුබණවරපාලියෙහි හෙවත් පිරිවානා පොත් වහන්සේ තුළ ඇතුළත් පළමුවන බණවර හි පළමු

සූත්‍රය වන දසධම්ම සූත්‍රයේ ද අන්තර්ගත වන්නේ පැවිද්දකු විසින් නිතර සිහිපත් කළ යුතු ධර්ම දහයකි.

ගිහියාට වඩා පැවිද්දා තුළ ඇති ආකල්පමය වෙනසන්, නුවණැත්තන් විසින් ගර්හා කරනු ලබන ඉතා කුඩා වරදක්වත් නොකළ යුතු බවත්, සියලු ප්‍රියමනාප දේවලින් කවදා නමුත් තමන්ට වෙන්වන්නට සිදුවන බවත් ආදී වූ කරුණු දහයක් සිහිය තබාගෙන කටයුතු කළ යුතු ය යන්න මෙහි අන්තර්ගත යයි.

මෙලෙස ඉහත දක්වන ලද තිසරණය, දසසිල්, ප්‍රත්‍යවේක්ෂා, ආදියත් දසධම්ම සූත්‍රයෙන් දැක්වෙන භික්ෂුවක විසින් නිතර සිහි කළ යුතු කරුණු දහය ආදී කොටස් සලකා බලා ඇතැම් විද්වතුන් ප්‍රකාශ කරන්නේ ආරම්භක යුගයේ මෙම පිරුවාණා පොත් වහන්සේ සාමණේර භික්ෂූන්ගේ ප්‍රයෝජනය පිණිස රචනා කරන්නට ඇති බවයි. වර්තමානයේ ඒ සඳහා භාවිත වන සාමණේර දහම් පොත නොතිබුනු බැවින් මෙය භාවිතයට ගන්නට ඇත. "සාමනේර බණ පොත" රචනා වීමෙන් පසුව මෙය පිරිත් දේශනා සඳහා යොදා ගන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

# හොඳම දේ දරුවන්ටයි



මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
**කොටනෙළුවේ පුඤ්ඤනන්ද හිමි**

දරුවෝ යනු අනාගත ලෝකය බාර ගැනීමට සිටින පිරිසයි. එනිසා ම "හොඳම දේ දරුවන්ටයි" යන කියමන ඔස්සේ කටයුතු කළයුතු ව ඇත. අද වන විට දරුවන් පිළිබඳ ජනමාධ්‍ය ඔස්සේ මෙන් ම සමාජ මාධ්‍ය ඔස්සේ වැඩි වැඩියෙන් කතා කරන යුගයක් වී ඇත. එසේ සාකච්ඡාවට බඳුන්වන්නේ දරුවන් පිළිබඳ සුබදායක ලෙස නොවීම කනගාටුවට කරුණකි.

මත්වතුර, මත්කුඩු, මත්පෙති, දුම්වැටි පමණක් නොව මත්වන ආහාර පිළිබඳ ව ද අද අසන්නට ලැබේ. මහින්දාගමනයෙන් පසු ලංකාවාසී බෞද්ධයෝ බුදු දහම අනුව සුචරිතවත් ජීවිකාවක් ගෙවූහ. ජනතාව අතර සිටි සුළු පිරිසක් සුරාමේරය ශික්ෂාපදය කඩ නොකළා නොවේ. එහෙත් බහුතර පිරිසක් පන්සිල් රැකීමට උත්සාහ ගත්හ. එදා වැඩිහිටියෝ මත්ද්‍රව්‍ය භාවිත කළ ද දරුවන් ඒ සඳහා යොමුවූයේ නැත. වැඩිහිටියෝ දරුවන් ආරක්ෂා කළහ.

එහෙත් අද ඒ තත්ත්වය ඉතා බරපතළ ලෙස වෙනස් වී ඇත. පිරිමි දරුවන් පමණක් නොව ගැහැණු දරුවන් පවා "අයිස්" නැමැති මත් රකුසාට ගොදුරුවී හමාර ය. වෙනත් මත් ද්‍රව්‍ය භාවිත කළ අය හඳුනාගැනීමට හැකි වුවත් "අයිස්" භාවිත කළ අය හඳුනා ගැනීමට බොහෝ කාලයක් ගත වේ. එසේ හඳුනාගන්නා විට සියල්ල සිදු වී අවසන් ය.

පාසල් දරුවාගේ පොත් බෑගය පරීක්ෂාකර පාසලට දරුවන් ගැනීමට තරම් අද තත්ත්වය ශෝචනීය වී ඇත.

හොඳ ම දේ දරුවන්ට දුන් වැඩිහිටියෝ ම අද නරක ම දේ දරුවන්ට දීමට පෙළඹී ඇති නිසා මවුපියෝ ඉතා වගකීමෙන් දරුවන් රැකබලා ගතයුතු ය. දරුවන් දහමට යොමු කොට ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමට කටයුතු කිරීම අද මවුපියන්ගේ මෙන් ම සියලු වැඩි හිටියන්ගේ වගකීමකි.



# දහම් පාසල් දරුවන්ට

## පස් වැදෑරුම් පිළිවෙත් පෙහෙළිය

**1958 වසරෙහි දී භික්ෂූන් වහන්සේ පුහුණු කිරීම සඳහා ආරම්භ කළ මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයෙහි ගිහි බෞද්ධ ජනතාවට ධර්මානුකූලව ජීවිත පුහුණුවක් ලබාදීමේ ආධ්‍යාශයෙන් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතින් අතර 1971 දී ආරම්භ කළ සිරි වජිරඤාණ දහම් පාසල විශේෂ තැනක් ගනී.**

ධර්මායතනය ආරම්භ කළ අවදියේ පටන් ගිහි - පැවිදි දෙපාර්ශවය ම අළලා පැවැත් වූ සියලු සංවිධාන ව්‍යාපෘති, වැඩසටහන්වල මූලික තේමාව වූයේ අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහා නායක මාහිමිපාණන් වහන්සේගේ විශිෂ්ට සංකල්පයක් වූ


"මිනිහා නො හදා රට හදන්නට බැහැ. මිනිහාත් හදා ගනිමින් රටත් හදාගනිමු." යන්නයි. මෙහි මිනිසා හැදීම යන්නෙන් අරුත්වත් කළේ මිනිසාගේ මනස හැදීම යි.

සිරි වජිරඤාණ දහම් පාසලේ ද මූලික පදනම වූයේ යථෝක්ත තේමා වදන සක්‍රිය ව අර්ථ ගැන්වීම යි. ඒ සඳහා අතිපූජනීය මහා නායක මාහිමිපාණන් වහන්සේ විසින් දහම් පාසලේ මෙහෙවර සඳහා ප්‍රතිපත්ති පහක් හඳුන්වා දෙනු ලැබිණි.

අනාගතයෙහි රටේ වගකීම භාර ගන්නා ළමා පරපුර වෙතින් ජාතියට, රටට ධර්මානුකූල නියාමනයක් සලසා දීම සඳහා මෙම පිළිවෙත් පහෙන් ලද හැකි ආලෝකය කොතරම් ද යන්න ඒ පිළිබඳ ගැඹුරින් විමසා බලන්නකුට වැටැහෙනු ඇත.

එකල ලංකාවේ සියලු දහම් පාසල්වල ශ්‍රේණි විභාග පැවැත් වූ බොරැල්ලේ තරුණ බෞද්ධ සංගමය ලක්දිව සියලු දහම් පාසල්වල අවධානය යොමු කිරීම සඳහා මේ පිළිවෙත් පස අවධාරණය කැර යැවීමෙන් ඒ කරුණ පැහැදිලි වේ.

සුපිළිපන් සමාජයකට අත්‍යවශ්‍ය වන එම පිළිවෙත් ගැන විවරණයකි මේ.



බම්බලපිටිය
සිරි වජිරාරාමාධිපති, රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති
**තිරිකුණාමලේ ආනන්ද මහා නාහිමි**

- **නිති පන්සිල් හා පොහොය අටසිල් රැකීමට උත්සාහවත් කිරීම.**

බෞද්ධ ජීවිතයක පදනම වන්නේ ශීලය යි.

කෙනකුගේ කතාවෙන්, ක්‍රියාවෙන් හැදුණුකම්, මැදුණුකම්, මුදු මොළොක්කම්, කරුණා දයා ගුණ ස්වභාව දියුණු වන්නේ ශීලයෙන් ලැබෙන හික්මීම හේතු කොට ගෙන ය. දරුවනට කුඩා කල සිට ම ගිහියාගේ නිත්‍ය ශීලය වන පංච ශීලයෙහි අගය පෙන්වා දී එහි හික්මැවීම දෙමවුපියනට ද, වැඩිහිටියනට ද, ගුරුවරුනට ද අයත් වගකීමෙකි.

දහම් පාසල් අධ්‍යාපනයෙහි මතු නො ව දිනපතා පාසල් අධ්‍යාපනයෙහි ද මෙහිලා හුරුවක්, ඇගැයීමක් ඇති කරවිය යුතු ය. පන්සිල් යනු මුල් තැන්හි සැලකෙන මිනිස් දහම් පහක් හෙයින් ආචාර විද්‍යාත්මක ව ද එහි වෙසෙස් අගයක් පවතී.

පින් - පව් පිළිබඳ දෘෂ ්ටිය අපේ සංස්කෘතිය හා බද්ධ වූයේ මෙම සුසිරිත් දහම් පහ පසුබිම් කරගෙන ය. පොහොය දා ලැබෙන නිවාඩුව උපකාරක පන්ති, ක්‍රීඩා හෝ වෙනත් කටයුතුවලට හෝ යෙදවීම මේ ශික්ෂා මාර්ගය අවතක්සේරු කිරීමෙකි.

එහෙයින් දහම් පාසල්වල පසළොස්වක පොහෝ දා ළමයින් උදෙසා ම වෙසෙස් වැඩසටහන් සකස් කොට ඔවුන් ඉහළ ශීලයෙහි පිහිටුවා දැහැමියාව තෙදවත් කරන්නට උත්සාහ දැරිය යුතු ය.

- **කුල දෙවි - මාපිය - ගුරුවර - වැඩිහිටියන් පිදීමට යොමු කිරීම**

කුල දෙවියෝ නම් පූජ්‍යයෝ ය. ගරු කටයුතු මහ සඟරුවන ය. උන්වහන්සේ ගිහියනට, සැදැහැවතුනට යහ මඟ ම දක්වමින් මෙලොව පරලොව දියුණුව හා ලොවුතුරු සුවය සලසන්නෝ ය.

සමාජය දිසා සයකින් දැක්වුවහොත් එහි මුදුනින් ම වැඩ සිටින්නේ එතුමෝ ය.

දරුවනට ආදරයෙන් සියලු රැකවරණ පහසුව සලසමින් ලොව එළි කැර දෙන්නෝ දෙමවුපියෝ ය. පූර්වාචාර්යවරුන් වන ඔවුහු හිරු - සඳු උදා වන නැඟෙනහිර දිසාව හා සම වෙති.

ගුරුවරු දකුණු දිසාවට උපමා වෙති. දරුවන් මැනැවින් හික්මවා ශිල්ප ශාස්ත්‍ර හදාරවා ඔවුන්ගේ පැවැත්මට නිසි මංපෙත් පහයා සමාජයට ඔසොවා තබන්නෝ ඔවුහු ය.

මේ හැම කෙනකුන් සේ ම සිය පරපුරේ හා ඇසුරු කරන, ගුණෙන් නුවණින් වයසින් මුහුකුරා ගිය වැඩිහිටියෝ දරුවනට නොයෙක් අයුරින් පිහිට සලසති.

ඉහත සඳහන් කළ සියලු දෙනනාට ගරු සරු බුහුමන් දැක්වීම දරුවන්ගේ යහපතට දියුණුවට ම හේතු වේ.

***සුපිළිපන් සමාජයකට ඇවැසි තවත් පිළිවෙත් තුනක් ගැන එළඹෙන නවම් පුන් පෝ ද බුදුසරණින් කියවමු.***




# උතුම් පැවිදි දිවියේ උසස්තම සම්භාව්‍යයට පත් වූ

## අතිපූජ්‍ය දවුල්දෙන ඤාණිස්සර මහා නාහිමිපාණන් වහන්සේ

*(සංස්කෘත භාෂා චක්‍රවර්ති ෂඩ් භාෂා පරමේශ්වර දවුල්දෙණ ඤාණිස්සර උත්තරීතර මහා නා හිමි ගේ 107 වන ජන්ම දිනය සිහිපත් කරමින් ලියැවෙන ගුණානුස්මරණ ලිපියකි)*



අපගේ සංඝ නේතෘ අතිපූජ්‍ය දවුල්දෙණ ඤාණිස්සරාභිධාන ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 1917 අප්‍රේල් 03 දින අපවත් වී වදාරන්නේ සංඝ ශෝභන පැවිදි උතුමකු ලෙස වසර 90 කල් ගෙවීමෙන් අනතුරු ව ය.

එය ද සිදුවූයේ වසර 102 කාලයකට සමීපව ජීවත් වෙමින් ආයු- කම්ම යන උභයක්ඛය ම අවසන් කොට නීරෝගිභාවයෙන් ම ය. මෙදිනට දින 05ට පෙර ද බුද්ධශාසන අමාත්‍යාංශයේ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් සිදු කෙරෙන සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයේ සභාපති අසුන හොබවමින් දහම් පද විශ්ලේෂණ කාර්යයෙහි යෙදුනේ අනතිමානි සිනහවෙන් යුතුව ම ය.

අප කථානායකයාණෝ තමන් වහන්සේ වැඩ විසූ මුළු ජීවිත කාලය තුළම පැවිද්ද තුළ ලැබිය හැකි උසස්ම සම්භාව්‍යයට පත්වූහ. සම්භාවනා ලැබූහ. සියල්ල භාවිත නොකළත් සමීප ඇසුරෙන් දන්නා පරිදි භාෂාමය, සාහිත්‍යමය, රට දැය, සමය වෙනුවෙන් ලැබූ නිපුණත්ව පදවිලාභී තනතුරු 18 ක් පමණ ලබා තිබුණේ සුදුසුකම් ඇත්තකු ලෙසින්ම ය.

මහා නාහිමිගේ ජන්මදිනය නිමිතිකොට උන්වහන්සේ වැඩ විසූ නුගේගොඩ පාගොඩ විද්‍යා විජයාරාමාධිපති දර්ශනපති පූජ්‍ය කරගහ උල්පත සුගතානන්ද අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, පාගොඩ දවුල්දෙණ ඤාණිස්සර නාහිමි මාවතේ භාවනා මධ්‍යස්ථානාධිපති ශාස්ත්‍රපති පූජ්‍ය බණ්ඩාරවෙල නන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ ජයවර්ධනපුර රෝහල පාරේ සිළුමිණ සෑය ආරාමයේ අධිපති කෘතවේදී ශිෂ්‍ය මහමෙව්නාවේ මංගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා මහා නාහිමිගේ සමීපතම ඤාතීන් කීපදෙනෙක් ද ගුණානුස්මරණ පින්කම් රැසක් ඉකුත්දා සිදු කරන ලදී.

"නාම ගොත්තං න ජීරති"

**කේ.කේ. සුගතපාල**

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## දුරුතු පුර පසළොස්වක 2023-01-06

## යහපත පිණිස

තවත් නව වසරක් උදාවුණි. කෙනෙක් තම නිවෙස් පිරිසුදු කොට සුණු පිරියම් කරමින් ඇරඹුණු වසරට නවමු බවක් එක් කළහ. තවත් කෙනෙක් සිය කාර්යාලයේ, වැඩබිමේ ආදි ලෙස තමන්ගේ ජීවිතය හා සම්බන්ධ සෑම ස්ථානයක් ම පිරිසුදු කළහ. ජීවිතයේ දහසකුත් එකක් දුක් කම්කටොලු මොහොතකට අමතක කරමින් ඇසිල්ලකින් හෝ සුබවාදීව දකිමින් වැඩ ආරම්භ කළහ. එය අගය කළ යුත්තකි.

එහෙත් බෞද්ධයන් ලෙස අප භෞතිකත්වයට එහා ගිය අර්ථවත් බවකින් ජීවිතයට නවමු බවක් එක්කරගත යුතු ය. එහිදී මූලිකත්වය දිය යුතු සිත පිරිසුදු කර ගන්නට ය.

එය ද වසරේ සුවිශේෂී දිනයකට සීමා විය යුතු නොවූවකි. ජීවත්වන මොහොතක් පාසා ඒ වෙනුවෙන් උත්සාහවත් විය යුතු ය. එවිට ගොඩනැඟෙන ආධ්‍යාත්මික පිරිසුදු බව තුළ භෞතික පරිසරයෙහි ද පිරිසුදු බව නිසැකයෙන් ම සුරැකෙනු ඇත.

අනෙක් අතට මේ සමාජයට, ලෝකයට ඇවැසි දිනයකට, මොහොතකට පමණක් පිවිතුරු බව ගැන, අලුත්වීමක් ගැන සිතන මිනිසුන් නොවේ. ගත වෙන හැම මොහොතක් ම අර්ථචර්යාවෙන් ගත කරන මිනිසුන් ය.

සම්බුදු දහමේ අර්ථචර්යාව යන්නෙහි සරල අර්ථය නම් තම ජීවිතය වැඩදායක ලෙස ගත කිරීම ය. එනම් යහපත් හැසිරීම ය. ලෞකික අරුතට එහා ගිය ආධ්‍යාත්මික විවරණයක් එහි ගැබ් ව තිබේ. යහපත් හැසිරීම උතුම් ය. උදාර ය. හරවත් ය. ගැඹුරු ය. පරහිත කාමී ය. සාමකාමී ය. ගෞරවණීය වන්නේ ය. නිරහංකාර ය. ඒ ගුණාංග ඉස්මතුවීම තුළ තමන්ට සේ ම අනුන්ට ද වන යහපතෙහි තරම ප්‍රමාණවත් කළ නොහැකි ය.


අප සරණ ගිය ශාස්තෘන් වහන්සේ අපට අර්ථ චර්යාවෙහි හැසිරෙන ලෙස ධර්ම මාර්ගය පෙන්වා වදාළේ උන්වහන්සේ පළමුකොට ආදර්ශවත් වීමෙනි. උතුම් සම්බුදු පදවිය වෙනුවෙන් පාරමී දම් පුරණය කළ බෝධි සත්ව අවධියේ පමණක් නොව සම්මා සම්බුද්ධත්වය ලැබ පන්සාළිස් වසක් පුරා උන්වහන්සේ ලෝකාර්ථ චර්යාවෙහි නියැළුණහ. එහිදී රජ, මැති, සිටු, කුලීන, කුලහීන ආදී කිසිදු භේදයකින් තොරව උන්වහන්සේ සම මෙතින්, කරුණා දයාවෙන් ලෝ සතට ජීවිතයේ යථාර්ථය වටහා දෙන්නට, දහම් දෙසු සේක. ඒ දහම් මඟ අනුගමනය කරන්නා ම ය බෞද්ධ යන උතුම් නාමයට හිමිකම් කියන්නේ.

අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙහි දී උන්වහන්සේ දේශනා කොට වදාළ උපදේශය අර්ථ චර්යාවෙන් ජීවිතය වර්ණවත් කර ගන්නට උත්සාහ කරන්නකුට මහඟු මිණකි.

එහිදී උන්වහන්සේ අවධාරණය කොට වදාළේ තමන් යම් දෙයක් කිරීමට පෙර එය තමාට අහිත පිණිස පවතින්නේ ද, අනුන්ට අහිත පිණිස පවතින්නේ ද, තමන්ටත්, අනුන්ටත් දෙපිරිසට ම අහිත පිණිස පවතින්නේ ද යන්න හොඳින් විමසා බලා එහිදී තමන්ටත්, අනුන්ටත් අහිත නොවේ නම්, හිත සුව පිණිසම වේ නම් එබඳු දෑ කිරීම යහපත් බව ය.

මෙය වචනාර්ථයට නොව හොඳින් අවබෝධයට ගෙන, සිතෙහි ධාරණය කොටගෙන, ජීවිතයට ප්‍රායෝගික කරගන්නේ නම්, මේ ධර්මතාවට අනුවම කටයුතු කරන්නේ නම් කිසිදු විටෙක තමන්ටවත්, තමන් නිසා අනුන්ටවත් තමන් කරන ක්‍රියාවක විපාකය කඳුළු පිරුණු දෙනෙතින් වින්දනය කරන්නට සිදු නොවන්නේ ය. එය මෙලොවට සේ ම මරණින් මතු ජීවිතයට ද අර්ථසම්පන්න ය.

සම්බුදු මඟ යමින්, ඉවසීම, මෛත්‍රිය, කරුණාව, දයාව ආදී ගුණ වර්ධනය කර ගනිමින් යහපත් ජීවිතයක් ගත කිරීමටත්, ඒ සඳහා, සිත අපිරිසුදු කරන වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, අධික තණ්හාව ආදී කිළිටි කාරක ධර්ම සෝදා හරින්නටත් බෞද්ධයන් ලෙස උත්සාහවත් විය යුතු ය. එවිට ප්‍රාර්ථනා කළ ද, නොකළ ද ජීවිතයට යහපත ම ළඟා වනු නියත ය.



# කඳුළු කතාවක් නොවන යුගදිවියක පදනම සැළමුතු ප්‍රේමයයි

**රූපෙන භික්ඛවෙ ඉත්ථි පුරිසං බන්ධති - හසිතෙන භික්ඛවෙ ඉත්ථි පුරිසං බන්ධති**
**භණිතෙන භික්ඛවෙ ඉත්ථි පුරිසං බන්ධති - ගීතෙන භික්ඛවෙ ඉත්ථි පුරිසං බන්ධති**
**රුණ්ණේන භික්ඛවෙ ඉත්ථි පුරිසං බන්ධති - ආකප්පෙන භික්ඛවෙ ඉත්ථි පුරිසං බන්ධති**
**එස්සෙන භික්ඛවෙ ඉත්ථි පුරිසං බන්ධති**

***ඉත්ථි බන්ධන සූත්‍රය***

**බුදුවරු ලොවට පහළ වන්නේ මිනිසුන් විඳින අතෘප්තිය හෙවත් දුක සංසිඳුවාලීම සඳහායි. සියලු ආකාරයේ අතෘප්තීන් වෙතින් මිදෙන මඟ බුදුපියාණන් ලොවට වදළා.**

ඒ අනුව යුග දිවියෙහි අතෘප්තීන් දුරු කර නොගත'හොත් මුළු දිවියක් පුරා කඳුළු පෙර පෙරා අසහනයෙන්, ක්‍රෝධයෙන් සහ එකිනෙකාට වෛර කර ගනිමින් ජීවත් වන්නට සිදු වේවි.

ඔබ වුවමනාවෙන් ම ඒ අතෘප්තිය කරා ගමන් කරන්නේ ඔබේ නොදැනීම නිසා. සමහර කෙනෙක් අකුසල කර්ම හේතුවෙන් යුගදිවිය අපායක් කර ගෙන තිබෙනවා. ඒත් ඒ අම්හිරි අකුසලයන් පරාජය කරන්නත් අවබෝධයෙන් ජීවත්වන ප්‍රඥාවන්ත මනුෂ්‍යයාට හැකි වෙනවා.

විශේෂයෙන් යුගදිවියට පිවිස ඉතාම ඉක්මනින් දික්කසාදය ඉල්ලා උසාවි ගානේ පෙළ ගැසෙන තරුණ පරම්පරාව එන්න එන්නම වැඩි වෙලා තිබෙනවා. බෞද්ධ රටක එය ඉතා අවාසනාවන්ත තත්ත්වයක්.

### කඳුළු ගඟක ඇරඹුම

සාර්ථක විවාහයක් සඳහා සටකපට බවින් තොර ප්‍රේමයක් අවශ්‍ය වෙනවා. අපේ සාහිත්‍යකරුවන් එය හැඳින්වූයේ සැළමුතු පෙම (කවිසිළුමිණ) වශයෙන්. ප්‍රේමය, අව්‍යාජ වෙන්න ඕනෑ. ප්‍රේමයේ ව්‍යාජත්වය පසුකාලීනව විවාහ ජීවිත බිඳ වැටීමට හේතු වෙනවා. ප්‍රේමවන්තයන්, ප්‍රේමවන්තියන් එය විනෝදයට, ආවට ගියාට නැත්නම් යෞවනත්වයේ අංගයක් ලෙස කිරීම හෝ කරන්නට යාම අවසානයේ කඳුළු ගංගා බවට පෙරළෙනවා.

### බිඳෙන බන්ධන

මේ නිසා හොඳ ප්‍රේමයක් ගොඩනඟා ගන්නට යාමේ දී සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණු රාශියක් ම බුදුපියාණන් වහන්සේ ඉත්ථි බන්ධන සූත්‍රයෙහි වදාළා.

යහපත් යුග දිවියක පදනම ප්‍රේමය වන බැවින් එය අර්ථවත් ලෙස සකසා ගන්නට මේ සූත්‍රයෙන් ඉතා වැදගත් මඟ පෙන්වීමක් අපට ලබා දෙනවා. මේ අනුව බුදුරජාණන් වහන්සේ ස්ත්‍රී පුරුෂයන් වහා බන්ධනයට පත් කෙරෙන කාරණා අටක් පෙන්වා වදාළා. එම කාරණා වන්නේ,

රූපෙන – රූපය,
හසිතෙන – සිනහව,
ගීතෙන – කටහඬ,
රුණ්ණේන – හැඬීම,
භණිතෙන –කථාව, ආකප්පේන – ඇවතුම් පැවතුම්, වනභංගෙන – ප්‍රියමනාප දේ (ආහාර) එස්සේන – ස්පර්ශය .

මේ කාරණා අට හැම කල්හිම ස්ත්‍රී පුරුෂයන් එකිනෙකා වහාම බන්ධනයට ලක් කරවන ඒවායි. එහෙත් මේ කිසිවක් ස්ථාවර විවාහයකට එතරම් අදාළ කරුණු නොවෙයි. රූපය යුගදිවියට අත්‍යවශ්‍ය කාරණාවක් වන්නේ නැහැ.

රූප සෞන්දර්ය සදාකල් පවතින්නේ නැහැ. රූපය මායාවක්. වහා ම වෙනස් වෙනවා. රූපයට හෙවත් රූමත් බවට ආදරය කරන කෙනෙක් ඔහුගේ හෝ ඇයගේ ගුණවත් බව නොවිමසා ප්‍රේමයක් ගොඩනඟා ගැනීමෙන් පසුකාලීනවයි අර්බුද ඇති කර ගන්නේ. එබැවින් රූපයට මුළා නොවිය යුතු වෙනවා.

*එකම දරුවෙක් ඇති මවක් ජීවිත පරිත්‍යාගයෙන් වුව සිය දරුවා රැක ගනියි. ඒ දරුවා කෙරෙහි ඇය වෙත වූ සෙනෙහස බෙහෙවින් හිතෛෂී ය. අවංක ය. අප සියලු සතුන් කෙරෙහි දැක්විය යුතු මෙත් සිත ද එසේ අවංක විය යුතු ය. හෘදයාංගම වූවක් ම විය යුතු ය.*

### හලාහල විෂ

හිනාවත් ඉතාම ආකර්ෂණීය දෙයක්. හිනාවම කෙනකුගේ සිත් ගන්න හේතු වෙනවා. ඒත් මතුපිට සිනහවේ නොපෙනෙන හලාහල විෂ හදවතේ තිබෙන්න පුළුවන්. ඒ නිසයි බුදු හිමියන් හිනාවට මුළා නොවන්නැයි වදාළේ.

කථාව තුළ බොහෝ පොරොන්දු තිබෙන්න පුළුවන්. සිත් ගන්නා පරිදි කතා කරන්න පුළුවන්. ඒත් ඒ කතාවන්ට මුළා නොවිය යුත්තේ තමන්ගේ කථාවන් ඔස්සේ ව්‍යාජ ලෝකයන් මවා පෙන්වන නිසයි. ඇතැම් විට තමන්ගේ දුබලතා, නොහැකියා තර්කයන් බිඳින්න පුළුවන් ඇතැම් කටකාර තරුණ තරුණියන් සමාජයේ දී අපට දැකිය හැකි යි.

කියන සියල්ල සත්‍ය ලෙස සිතා කිසිවක් නොසොයා ප්‍රේමය ගොඩනඟා ගැනීමෙන් එය ස්ථාවර විවාහයකට බාධා ඇති කළ හැකියි.

***නොබිඳෙන ප්‍රේමයකට මුල් වන තවත් කරුණු පිළිබඳ නවම් පුර පසළොස්වක පෝද පුවත්පතින් කියවමු.***



මොරටුව ලුනාව උයන පාරේ
බෝධිරාජාරාමාධිපති
කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය
**අගලකඩ සිරිසුමන හිමි**

ආරණ්‍යගතව
පැවිදි දම් පුරන්නට හෝ
පැවිදිව අධ්‍යාපනය
ලබන්නට විමසන්න.
0778836872

දැන උගත් හිමි නමක්
පන්සලක් සොයයි.
076-9496615
077-1972277

ස්වාමීන් වහන්සේ
නමකට
විහාරස්ථානයක්
සොයයි.
අමතන්න :
074-3429363

**තායිලන්තයෙන් ගෙන්වන ලද**
අඩි 3 ක් උස, අඩි 2 ක් පළල පිත්තල ඉදිපිළිමය හා අඩි 1 1/2 ක් උස, අඩියක් පළල, පිත්තල පිළිමය හා අඩි 4 1/2 ක් දිග අඩි 2 1/2ක් පළල පිත්තල ශ්‍රී පතුල විකිණීමට හා තායිලන්ත චාරිකා සඳහා.
0718071009

**විහාරස්ථානයක
නැවතී සේවය
කළ හැකි
උපස්ථායක/ පැවිදි
වීමට කැමති මැදිවියේ
පසුවන අය අවශ්‍යයි.**
විමසීම් : 0714393544

**ආරණ්‍යවාසීව සිට
සැත්කම් 2 ට භාජනය වී**
දැනට භික්ෂු ගිලන්හලක
නේවාසිකව සිටිමි.
**මා හට වෛද්‍ය කටයුතු සඳහා
මාසිකව ලොකු මුදලක් වැයවේ.**
මේ සඳහා මට උදව්වක් කරන
ලෙස කාරුණිකව ඉල්ලමි.
බැංකු ගිණුම් අංකය :
100030139530 NSB බැංකුව
දුරකථන අංක : 077-0358741

# අසිරිමත් දඹදිව චාරිකා 2023

**දඹදිව චාරිකාවේදී ඔබට විශේෂ පිංකම් රාශියකට සහභාගි වීමට අවස්ථාව උදා වේ**

සංකස්ස /සැවැත්නුවර ජේතවනාරාමය/කපිලවස්තුව /ලුම්බිණිය / කුසිනාරාව/විශාලා මහනුවර
බුද්ධගයාව/ රජගහනුවර නාලන්දා / බරණැස / සාංචි/ ප්‍රධාන ස්ථාන වල දී සිල් සමාදම් වීම
කිරි ආහාර පූජාව සාංඝික දානය පිරිනැමීම /ධාතුන් වහන්සේලා වන්දනාමාන කර ගැනීම
ආනන්ද බෝසමිඳුන් අභියස මල් පූජාව පැවැත්වීම

- නවාතැන් සුඛෝපභෝගී හෝටල්වල
- ශ්‍රී ලාංකික ආහාරපාන බීමට වතුර බෝතල්
- වායු සමනය කරන ලද බස් රථ පහසුකම්
- අත් බෑගයක් සහ ගමන් බෑගයක් නොමිලේ

**දින 13 චාරිකාව**
පිටත්වීම පෙබරවාරි 09 / පෙබරවාරි 22
කොළඹ සිට නව දිල්ලි දක්වා ගුවන් මගින්

**දින 17 චාරිකාව**
පිටත්වීම මාර්තු 15 / අප්‍රේල් 01
කොළඹ සිට චෙන්නායි දක්වා ගුවන් මගින්
දුම්රිය ගමන් ඇත

SL PROMO



**කොලොන්නාව දඹදිව චාරිකා සංවිධානය**
70/1/6 Y.M.B.A ගොඩනැගිල්ල, බොරැල්ල, කොළඹ 08.
දුරකථන අංක 011 2684470 /070 4080037 / 071 4807268
E-mail: kolonnawa.tours@gmail.com

# මනෝ විද්‍යා මෝහන ප්‍රතිකාර



මනෝ විද්‍යා මෝහන ප්‍රතිකාර - ඔබගේ කායික, මානසික හා ශාරීරික රෝග එක් ප්‍රතිකාර ක්‍රමයකින් නිට්ටාවටම සුවය.
**බස්නාහිර පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක
මුළු දිවයිනටම සාම විනිසුරු, හෝමියෝපති වෛද්‍ය, මහාචාර්ය,
මහාධම්ම රාජාධිරාජ ගුරු සිරිසුමන වංශාලංකාර කාරක සංඝ සභික**
**කැටියපේ ඤාණවිමල නාහිමි**
0716908746/ 0716908749

පුරා වසර 32ක අමිල සේවාවක් තුළින් ලක්දිව බොදු බැති හදවත් සදහම් සිසිලෙන් නැහැවූ
ශ්‍රී ලංකාවේ අතිශය ජනප්‍රිය චාරිකා සංවිධානයක් වූ

කෑගල්ලේ

# සාම චාරිකා



සංවිධානය සමඟ දඹදිව හා තායිලන්ත සංචාරයේ යෙදෙමු!
අපගේ ඉදිරි දඹදිව චාරිකා - අය කිරීම් රු.210,000/- සිට

**නොමිලේ !!!**
කාර්යාලයේ සිට ගුවන්තොටුපල දක්වා ප්‍රවාහනය
කිලෝ 20 ලොකු බෑගය
අත් බෑගය + කුඩය
රු. ලක්ෂ පහක රක්ෂණාවරණය
ඇතුල්වීමේ ප්‍රවේශපත් (බෞද්ධ ස්ථානවලට)

★ 2023 පෙ.ව. 10 (දින 17) විශේෂ චාරිකාව
කොළඹ/ දිල්ලි/කොළඹ කෙලින්ම ගුවනින්
හිමාචල්(ශිම්ලා) + චන්දිගාර් (පංජාබ්/හර්යානා) + රාජස්ථාන් (ජායිපූර්/සංගනාර්/අමේර්)
සමඟ දඹදිව චාරිකාව

★ 2023 මාර්තු 7 /අගෝස්තු 6 (දින 18) දඹදිව චාරිකා
කොළඹ/ චෙන්නායි/කොළඹ ගුවනින් (සාංචි+කොසඹෑනුවර ඇතුලත් වේ.)

★ 2023 මාර්තු 10 / අගෝස්තු 9 (දින 14 දඹදිව චාරිකා)
කොළඹ / දිල්ලි කෙලින්ම ගුවනින්
ආපසු සාංචි + කොසඹෑනුවර වන්දනා කරගෙන චෙන්නායි/කොළඹ ගුවනින් ශ්‍රී ලංකාවට

අපගේ සුවිශේෂත්වය
- දැනට දඹදිව චාරිකා 169ක් අතිසාර්ථකව නිමකර තිබීම
- බුරුම චාරිකා 42ක් සහ තායි චාරිකා 62ක් නිමවා තිබීම
- එකම ස්ථානයක් හෝ අත් නොහැර (දඹදිව) වන්දනා කිරීම
- දඹදිවදී කෙරෙන සියළු පිංකම් සඳහා දායකත්වය ලබා දීම

ආසන සීමිතයි
වහාම විමසන්න

**එකම ස්ථානයක් හෝ අත් නොහැර වන්දනා කිරීමට
අපත් සමඟ යා යුතුමය**

තායි චාරිකා...තායි චාරිකා ...තායි චාරිකා ... තායි චාරිකා
ඉතා කෙටිකලක් තුල ශ්‍රී ලංකාවේ සිට වැඩිම තායි සංචාරයන් මෙහෙය වූ අප ආයතනයෙන් දැන් දින 5 (රාත්‍රී 4) තායි චාරිකා සංවිධානය කරනු ලැබේ.

- 2023 අප්‍රේල් 20
- 2023 ජුනි 22
- 2023 දෙසැම්බර් 15

} කොළඹ/බැංකොක්/කොළඹ ගුවන් ගමන් වීසා ගාස්තු ඇතුල්වීමේ ගාස්තු, තරු පංතියේ හෝටල් කාමර A/C ප්‍රවාහන පහසුකම් සියළු කෑම/බීම ඇතුලත්ව මුළු අයකිරීම - රු. 295,000/- පමණි

චාරිකාවට ඇතුලත් ස්ථාන
- දින ½ පන්සල් චාරිකාව (ටොං 5½ රත්‍රං බුදු පිළිමය සහිත වට් ට්‍රැමිට් + වට් සාකේට් + වට් අරුන් + ගෝල්ඩන් මවුන්ටන්)
- සෆාරි වර්ල්ඩ් + මැරින් වර්ල්ඩ් (සතුන්ගේ ලෝකය) හෝ Dream World ඩ්‍රීම් වර්ල්ඩ්
- කංචනාබුරි + Death Railway + ක්වායි ගඟ (2 වැනි ලෝක යුද්ධයේදී වැඩිම පිරිසකට බෝම්බ හෙලූ ස්ථානය)
- බුද්ධා මැංතෝන් (ලෝකඩ ප්‍රතිමාව සහිත විහාරය)
  ලොව විශාලතම භාවනා මධ්‍යස්ථානය වන Wat Dhammakai (පැතුම්තානි ප්‍රදේශය)
- විශ්මිත ඉටිරූ කෞතුකාගාරය (Wax Museum)
- ප්‍රා පතොම් චෛත්‍ය (නකොන් පතොම්) සමග
- ඡාඕ - ප්‍රායා ප්‍රින්සස් නැවේ සුමයුරු සංගීතය හා ජාත්‍යන්තර භෝජන වේලක් සමඟ පැය 2ක නාවික සංචාරය (Dinner Cruise)

ඉහත සියළු ස්ථාන සඳහා ප්‍රවාහන පහසුකම් සහ ඇතුල්වීමේ ටිකට්පත් අප ආයතනයෙනි.

Optional Tour (තෝරාගත හැකි ස්ථාන)
Pattaya (පතයා) } Scuba Diving, Banana Boating, Para Sailing
ටිකට්පත් ඔබ මිළදී ගත යුතුයි.

තායි වීසා ලබා ගැනීම සඳහා
1.) All Countries Passport තිබිය යුතුය.
2.) සෙ.මී. 3 ½ X 4 ½ ප්‍රමානයේ (පසුබිම සුදු) වර්ණ ඡායාරූප 2ක්.
3.) පිළිගත් බැංකුවක අවම රු. 250,000/- සහිත (අඛණ්ඩව ගණුදෙනු කළ) ගිණුමක මාස 6ක ගණුදෙනු සහිත බැංකු පොතක් හා වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.
4.) 4 කින් යුත් පවුලක උදවියට රු.500,000/-ක අවම තැන්පතු සහිත ගිණුමක් තිබිය යුතුය.





**සාම චාරිකා**
සංවිධානය
No : 142A/3, රෝයල් ගොඩනැගිල්ල
කෙලින් වීදිය, කෑගල්ල
කාර්යාලය : 035 2222041
ලි.ප අංකය : ආ.ක/සේ02/වන්දනා/35
(රජයේ හා බුද්ධ ශාසන අමාත්‍යංශයේ ලියාපදිංචි කර ඇත)
facebook.com/sama.charika/
samacharik@yahoo.com
විමසීම් | අනුර (අධ්‍යක්ෂක) : 071 042 3343 | වසන්ති (අධ්‍යක්ෂිකා) : 077 322 7188 | රුවන් (කළමණාකරු) : 071 181 3113
සිත්සේ - සුවසේ - නිදහසේ සාම චාරිකා සමඟ ලොව වටා ඇවිදිමු



# පසිඳුරන් භාවිතයට මිස අවභාවිතයට නොවේ

**අරමුණු, ඉලක්ක ජය ගැනීම උදෙසා උත්සාහය මෙන්ම උත්තේජනය අවශ්‍ය ය. බොහෝවිට උත්තේජනය ඇති වන්නේ ලෝභය සහ ද්වේෂය නිසා ය. මෙහිදී ලෝභය යනු එකතු කරගැනීම, ගොඩනඟාගැනීම, ජයග්‍රහණය වැනි දෑ ය.**

ද්වේෂය යනු අනෙකා පරයා කටයුතු කිරීම, ඉස්මතුවීම වැනි කටයුතු ය.

ලෞකික ජීවිත තුළ මේ තත්ත්වයන් දැකිය හැකිවීම සාමාන්‍ය තත්ත්වයකි. වැඩිහිටි දෙමාපිය ගුරුවරුන් මේ තත්ත්වය මනාව තේරුම්ගෙන බාල, ළමා පරපුර දෙලොව අනාථ නොවන ලෙස මෙහෙයවීම කාලීන අවශ්‍යතාවක් ව පවතී.

ළමා හා තරුණ වයස කුතුහලය බහුල කාලයකි. මෙවන් තත්ත්වයක දී ඔවුන්ව නොමඟට යැවීම පහසුවේ. පෙර පින් ඇති යහපත් ධර්මය ජීවිතවලට එකතු කර ගත් බෝසත් දරුවන් අතර සරු දේ නිසරු ලෙස දකින දරුවන් ද නැත්තේ ම නොවේ. මෙහිදී වැඩහිටියන් වශයෙන් මහත් වගකීමෙන් කටයුතු කළ යුතු ය.

ජීවිතයක් සාර්ථකවීම සඳහා ඉලක්කයක් මෙන් ම සංයමය, වීර්ය, සතිය තිබිය යුතු ය. මෙහිදී මතක තබා ගත යුතු ප්‍රධාන කාරණය වන්නේ ලෝකය විඳපු සියල්ලෝ ම එම තත්ත්වය අත්පත් කර ගත්තේ සිහියෙන් හා බුද්ධියෙනි. එයින් මිදුණු කෙනකුට මේ තත්ත්වය අත්පත් කර ගත නොහැකි වේ යන්නයි.

මංගල සුබ දේ වෙනුවට අවමංගල අසුබ දේ ජීවිතවලට එක්කර ගැනීම තුළ මුළු ජීවිතයම මළගෙයක් වීම නොවැළැක්විය හැකි දෙයකි.

මව්පියන් ලෙස දරුවන්ට වඩා සමීපවීම වර්තමානයේ දී බොහෝ සෙයින් අවශ්‍ය වේ. එසේ වූ විට දරුවන් ලෙස ද නිරන්තරව කල්පනා කළ යුත්තේ තමන්ගේ හොඳම මිතුරා තම මව සහ පියා ලෙස ය.

කරණීයමෙත්ත සූත්‍රයෙහි දක්වන පරිදි 'දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ යන ඔවදනට අනුව දර්ශනයක්, දැක්මක් ඇති කර ගැනීම මෙන්ම, මිථ්‍යා වැරැදි දැක්මෙන් ඉවත්වීම ඉතා වැදගත් වේ.

එමෙන්ම දරුවන්ගේ දුබලතා හමුවේ දී "එයාට අපලයි" වැනි ඍණාත්මක සිතිවිලි ඇතිකිරීමට කටයුතු නොකළ යුතු ය. අපල යනු ඵල නැති බවයි. ග්‍රහයන්ගේ බලපෑම් අවමකර ගැනීමට පුද්ගල ශක්තියට හැකියාව පවතී.

තමාගේ ස්වාමියා තමා මිස වෙනකෙනකු නොවේ. අවශ්‍ය වන්නේ ධෛර්යය, සංයමය, සිහිය පමණි.

පෙනෙන බලවේගයන් දහසක් තිබියදී නොපෙනෙන බලයන් සම්බන්ධයෙන් අනවශ්‍ය බියක් ඇති කර ගැනීම තරම් අඥානකමක් තවත් ඇත්තේ නැත.

අප සිදුකරන ක්‍රියා නැවත සිහිපත් කරද්දී ඇහැට කඳුළක් නොඑන ක්‍රියා විය යුතු ම ය. කිසි විටෙක මම මට ඕන පළියට ජීවත් වනවා යන ආකල්පයෙන් කටයුතු නොකළ යුතු වේ. තමා හා බැඳුණු සමාජයක් හරපද්ධතියක් සහ බලාපොරොත්තු ගොන්නක් ඇත. අපට නිදහස ඇතිමුත් එය අනෙකාගේ නිදහසට, ගෞරවයට බලාපොරොත්තුවලට හානි නොවිය යුතු ම ය.

අජාන් චා හිමියන් වරක් පැවසුවේ ගමන දුරයි හෙමින් යන්න යනුවෙනි. මෙය වර්තමාන තරුණ පරම්පරාව තේරුම් ගැනීම ඉතා අවශ්‍ය ය. අනවශ්‍ය අධික වේගය සෑම කටයුත්තකට ම බාධාවකි. ගමන යා යුත්තේ වැරැදි නිවැරැදි කොට ගෙන ය. එය සෑම අතින්ම සුබඵල ගෙනදීමට සමත් වේ.



කොළඹ මහානාම විද්‍යාලයේ
ආචාර්ය කොලොන්නාව පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**

# තනතුර අනතුරක් කර නොගන්නට නම්

**එකිනෙකාගේ දක්ෂතාව හා කැමැත්ත මත විවිධ වෘත්තීන්හි නිරතවීම මෙලොව උපන් බොහෝ දෙනාට අයත් අනිවාර්ය වූ කාර්යයකි.**

එම වෘත්තිකයාගේ ජීවනෝපාය වන්නේ ද අන් කිසිවක් නොව එම වෘත්තියයි. තවද එම වෘත්තියෙන් වෘත්තිකයා පමණක් නොව සිය පවුල් සංස්ථාව ම යැපෙමින් පෝෂණය වේ.

එලෙස මිනිසා රකින, පෝෂණය කරන වෘත්තීන් අනේකාකාරයෙන් විවිධ වන අතර සමාජයේ ඇතැම් වෘත්තීන් උසස් හා පහත් වශයෙන් බෙදා සලකන බව දක්නට ලැබේ. එහෙත් ශාන්තිනායක බුදුපියාණන් වහන්සේට අනුව වෘත්තීය විවිධත්වය පිළිගැනෙන මුත් ඒවාහි උසස් හෝ පහත් භේදයක් නැත.

තවද යමක විවිධත්වය එහි උසස් හෝ පහත් බව සැලකීමේ නිර්ණායක් ද නොවේ. එසේම විවිධ වෘත්තීන් මගින් සිදුවන සියලු කාර්යයන් මානව සංහතියේ උන්නතියටත්, සුභසිද්ධියටත් ඉවහල් වන බව සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ නිර්දේශයයි.

කෙසේ වෙතත් ඇතැම් වෘත්තිකයන් තම වෘත්තියෙන් ලද තනතුරු තාන්න මාන්න පිළිබඳ උඩඟුවෙන් හා අහංකාරයෙන් පෙළෙනු දක්නට ලැබේ. එලෙස තනතුරෙන් උඩඟු වූවෝ තම තනතුරු ශක්තිය හා බලය අනෙකා පෙළීමටත්, පීඩනයට ලක්කිරීමටත්, පළිගැනීමටත් යොදාගනිති. එවැනි ක්‍රියා උසස් මානව ගුණ ධර්මයන්ගෙන් හෙබි සත්පුරුෂ සමාජයේ පැසසුමට ලක් නොවන අතර, එලෙසින් තනතුරු බලයෙන් අනිකා පෙළීම අඥාන අමනෝඥ අඳ බාල අසත්පුරුෂයන්ගේ පාපි මුග්ධ ස්වභාවයකි.

මොනම දහමකවත් එය අනුමත නොකරන ඉතා පහත් හා නීච ක්‍රියාවක් ලෙස සැලකේ. එනිසා විවිධ වෘත්තීන්හි යෙදෙන්නන් තනතුරු මාන්නය හා උඩඟු බව මුලිනුපුටා දමා නිහතමානීව තම වෘත්තියේ තනතුරෙන් අනිකාට උපරිමයෙන් සේවය කිරීම බෙහෙවින් යහපත් ය.

ඊට හේතුව නම් 'සබ්බං පහාය ගමනීයං' 'සියල්ල අත්හැර යා යුතු ය' යන බුද්ධ භාෂිතය දක්වන පරිදි සත්‍ය වශයෙන් ම රැගෙන යන දෙයක් ඇත්තේ ම නැත. එනිසා සදාකාලික වූ කිසිවක් ද මෙලොව ඇත්තේම නැත. අපට හිමි සියල්ලට උරුම වූයේ අහිමිවීම පමණි. එසේ නම් වෘත්තියෙන් ලද තනතුරු තාන්න මාන්න සැමදා පවතින්නේ කෙසේද? එනිසා ඒ ලද තනතුරෙන් අනෙකාගේ සුභසිද්ධිය උදෙසා ක්‍රියා කළ යුතු ය. මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීම බව බුදු දහම බෝහෝ තැන්හි පෙන්වා දී තිබේ. පින්වත් ඔබට ඒ තනතුරු තාන්න මාන්න ලැබී ඇත්තේ ඒ සඳහා ය. එනිසා අනෙකා වෙනුවෙන් උපරිමයෙන් සේවය කරන්න. එවිට ඔබ කරන වෘත්තිය සැබැවින් ම සාර්ථක වේ. එයයි තෘප්තිමත් වෘත්තියේ සැබෑ සාර්ථකත්වය.

එලෙස වෘත්තිය සාර්ථක වූ පමණින් ජීවිතය සාර්ථක වන්නේ නැත. සාර්ථක ජීවිතයකට වෘත්තිය ඉවහල් වන බව සැබෑ ය. ඊට හේතුව නම් ජීවිතය යනු වෘත්තිය පමණක් ම නොවන නිසා ය.

මානව සමාජයේ සාමාජිකයකු ලෙස අපි සියලු දෙනාට උපතේ දී ම උරුම වූ අනේක විධ භූමිකා රැසක් ලැබී තිබේ. එම භූමිකා අපේ ජීවිතය හා නිරන්තරයෙන් බැඳී පවතින අතර, ජීවිතය සාර්ථක වීමට නම් ඒ භූමිකාවන්හි වගකීම හා යුතුකම අනිවාර්යයෙන් ම ඉටු කළ යුතු ය.

වෘත්තියෙන් ලද තනතුර අනුව ඔබ කිසියම් ආයතනයක අධ්‍යක්ෂකවරයෙක් හෝ අධ්‍යක්ෂවරියක් වියහැක. එහෙත් ඔබේ දෙමාපියන් ඉදිරියේ ඔබ ඔවුන්ගේ දරුවා ය. ඒ ඔබේ දරු භූමිකාවයි. එහි කෙතරම් වගකීම් හා යුතුකම් පින්වත් ඔබට තිබේද?

වෘත්තිය නිසා හෝ නොසැලකිල්ල නිසා හෝ දරු භූමිකාවේ යුතුකම් හා වගකීම් පැහැර හැරිය නොහැක. පැහැර හරින්නේ නම්, දරු භූමිකාව අසාර්ථක ය. එවන් තැනැත්තන්ගේ ජීවිතය සාර්ථක වේ ද?

එලෙසින් සහෝදර සහෝදරි භූමිකාව, ස්වාමි භාර්යා භූමිකාව, දෙමාපිය භූමිකාව වශයෙන් භූමිකා රාශියකි. මේ හැම භූමිකාවකට ම යුතුකම් හා වගකීම් ද රාශියකි. ඒ වගකීම් හා යුතුකම් ඉටුනොකරන්නේ නම් ජීවිතයේ බොහෝ තැන් අසාර්ථක වූ හිස් පුද්ලයෙක් වනු ඇත.

මේ භූමිකාවන් අතර ඥාති භූමිකාව, අසල්වැසි භූමිකාව හා රටවැසි භූමිකාව ආදිය ද අතිශයින් වැදගත් වේ. ඥාති හා අසල්වැසි භූමිකාවන්හි ද අනේක විධ යුතුකම් හා වගකීම් පවතින අතර, සත්පුරුෂ යහපත් මානවයා තම ඥාතීන් හා අසල්වැසියන් වෙනුවෙන් තම භූමිකාව තුළ පැවරී ඇති යුතුකම් සපුරා ඉටුකරන්නේ ය.


එසේම තමා උපන් දේශයේ උන්නතිය වෙනුවෙන් ද ඉටුකළ යුතු යුතුකම් හා වගකීම් රැසක් රටවැසි භූමිකාවේ අන්තර්ගත වේ. මේ සියලු භූමිකා සාර්ථක වූ කල්හි ජීවිතය සාර්ථක වේ. නිහතමානීව අනෙකාට සේවය කිරීමෙන් වෘත්තියේ සාර්ථකත්වයත්, භූමිකාවන්හි යුතුකම් හා වගකීම් ඉටුකිරීමෙන් ජීවිතයේ සාර්ථකත්වත් සැලසේ.





ත්‍රිකුණාමලය ජයසුමනාරාමාධිපති
කැලණිය විශ්වවිද්‍යාලයේ
වාග්විද්‍යා අධ්‍යයන අංශයේ
**ආචාර්ය කපුගොල්ලෑවේ ආනන්දකිත්ති හිමි**

# ශ්‍රාවකයකුගේ අභිමානය සීලානුස්සති භාවනාවයි ...



**තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයකු තමන්ගේ ජීවිතයට එකතු කරගත යුතු උදර ගුණාංගයක් වන්නේ සීලානුස්සතියයි. සීලානුස්සති භාවනාව කියන්නේ තමන්ගේ වචනයත්, කයත් සංවර කර ගැනීම තුළ තමන් අත්විඳින සැනසිල්ල සිහිකිරීමයි.**

තමන් අත්විඳින සැනසිල්ල සිහිකිරීමේ දී තමන්ගේ වචනයෙන් සිදුවුණ අඩුපාඩු, කයින් සිදුවූ අඩුපාඩු හඳුනාගෙන එයින් අත්මිදෙන්නට ඕනේ.

ඉන්පසු තමන් කය හසුරුවන ආකාරය ගැන සිහියෙන් ඉඳල, උදෑසන ම අවදිවෙලා අධිෂ්ඨාන කරන්නට ඕනෙ මම මගේ ශරීරය මුල් කරගෙන වරදක් වෙන්න දෙන්නෙ නෑ. මම මගේ වචනය මුල් කරගෙන වරදක් වෙන්න දෙන්නෙ නෑ කියලා.

තමන්ගේ කයත්, වචනයත් පිළිබඳ ශාන්ත බවක්, සංවරබවක් ඇති කර ගැනීම පිණිස වෙහෙස මහන්සි වෙන කොට තමන් නොදැනීම උදාර ගුණාංගවලට තමන් හිමිකාරයෙක් බවට පත් වෙනවා. ඒ තුළින් තමන්ට පුළුවන් වෙනවා සියලු දෙනා කෙරෙහි තමන් ගැන විශ්වසනීයත්වයක් ගොඩනඟන්න.

මම අද මගේ කය මුල්කරගෙන කාටවත් හිංසාවක් පීඩාවක් කළේ නෑ. සොරකමක් කළේ නෑ. වැරැදි ජීවිතයක් ගෙවුවේ නෑ. යහපත් ජීවිතයක් ගෙවුවා. මත්පැන් පානයට යොමු වුණේ නෑ. කිසි කෙනෙක් බොරුවෙන් රැවටුවේ නෑ. කේළමක් කිවුවෙ නෑ. පරුෂ වචනයක් කිවුවෙ නෑ. හිස් වචන කියමින් කාලය කා දැම්මෙ නෑ.

මේ විදිහට තමන්ගේ සීලය ගැන සිහිකිරීමේ දී, පිරිසුදු වස්ත්‍රයක් දෙස බැලීමේ දී ඒ පිරිසුදු වස්ත්‍රයේ අඩුපාඩු ටික හොඳින් පේනවා වගේ තමන්ගේ ජීවිතයේ, තමන්ගේ සීලයේ අඩුපාඩු පැත්ත පේන්න පටන් ගන්නවා. අන්න ඒ විදිහට පේන නිසා තමන්ගේ සිල්වත් බව භාවනාවක් හැටියට දියුණු කර ගන්නවා.

මේ සීලානුස්සති භාවනාව බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයන් නිරතුරුව ම සිදු කරන භාවනාවක්. සීලානුස්සති භාවනාව සිහි කරන්න සිහිකරන්න සිත ශාන්ත වෙනවා. හිතේ තියෙන පසුතැවිල්ල, විපිළිසරබව කලබලකාරී බව නැතිවෙලා යනවා.

මේ සංසිඳීමත් එක්ක සිත සමාධිගත වෙනවා. තම තමන්ගේ ගුණාත්මක ජීවිතය යළි යළි සිහිකරන්න පුළුවන්කම කෙනකුට ලැබෙන උතුම්ම ලාභයක්. ඔබ තුළ ඇති උතුම් ගුණාංග නිරන්තරයෙන් ම මනසිකාරයේ යෙදෙමින් භාවනාමය වශයෙන් දියුණුවක් කරා යන්න පුළුවන් වෙනවා.

## සීලානුස්සති භාවනාව

මාගේ ස්වාමී වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සිල්වත් වන සේක. බුදුරජාණන් වහන්සේ කය සංවර කළ සේක. වචනය සංවර කළ සේක. පිරිසුදු ජීවිතයක් ගත කළ සේක. කයින් සිදුවන සියලුම අකුසල් අවබෝධයෙන් යුතුව ම ප්‍රහාණය කළ සේක. වචනයෙන් සිදුවන සියලුම අකුසල් අවබෝධයෙන් යුතුව ම ප්‍රහාණය කළ සේක. මිථ්‍යා ආජීවය බැහැර කොට සම්මා ආජීවයෙන් ජීවිතය ගත කළ සේක. සීලය පරිපූර්ණ කළ සේක.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ පරිපූර්ණ සීලයෙන් යුතුව සියලු දෙවි මිනිසුන් හට මහා කරුණාවෙන් සීලය පිළිබඳ දේශනා කොට වදාළ සේක. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ඒ උතුම් සීලය නිරතුරුව ම මම ආරක්ෂා කරමි. සංසාර දුකින් මිදීම පිණිසම අවබෝධයෙන් ම තෙරුවන් සරණ ගිය මා සංසාර දුකින් මිදීම පිණිසම අවබෝධයෙන් යුතුව ම සිල් පද ආරක්ෂා කරමි.

මම සංසාර දුකින් මිදීම පිණිසම සතුන් මැරීමෙන් වැළකීම නම් වූ සිල් පදය සමාදන් වූයෙමි. මම බලවත් වීරියෙන් යුතුව, බලවත් සිහි නුවණින් යුතුව, ඉතා ගෞරවයෙන් යුතුව මේ සිල්පද ආරක්ෂා කරමි.

මම සියලු සතුන් කෙරෙහි මෙත් සිත පතුරවමි. ලොකු කුඩා කිසිම සතකුට දැන දැන කිසිම හිංසා පීඩාවක් නොකරමි. මේ සීලය ආරක්ෂා කිරීම නිසා මා තුළ භය, තැතිගැනීමක් නැත. අන් සියලු සත්වයෝ ද බියෙන් හා තැතිගැනීමෙන් වළකින්නේ ය. සුව සේ ජීවත් වන්නේ ය.

මම සතුන් මැරීමෙන් වැළකී අන් සියලු දෙනා ද සතුන් මැරීමෙන් වැළකීමෙහි සමාදන් කරවමි. එහි ගුණ කියමි. මම සතුන් මැරීමෙන් වැළකීම නිසා ද, අන් අය සමාදන් කරවීමෙන් ද, ගුණ ප්‍රකාශ කිරීමෙන් ද අප්‍රමාණ සතුටක් ලබමි. ඒ සතුට මාගේ චිත්ත සමාධිය පිණිස මට උපකාර වන්නේ ය.

මම සංසාර දුකින් මිදීම පිණිසම සොරකමින් වැළකීම නම් වූ සිල් පදය සමාදන් වූයෙමි. මම බලවත් වීරියෙන් යුතුව, බලවත් සිහි නුවණින් යුතුව ඉතා ගෞරවයෙන් යුතුව මේ සිල්පද ආරක්ෂා කරමි. මම කිසිම තැනක දී, කිසිම අයුරකින් අනුන් සතු දෙයක් සොර සිතින් නොගනිමි. ඉතා කුඩා වූ දෙයක් පවා සොර සිතින් ගැනීමෙන් වළකිමි. මා මෙන් ම අන් සියලු දෙනා ද තම තමන්ගේ ධනයට හා වස්තුවට ආශා කරති. මම කිසිවකුගේ කිසිම දෙයක් සොර සිතින් හෝ වංචාවෙන් රවටා පැහැර නොගනිමි.

මම සංසාර දුකින් මිදීම පිණිසම වැරැදි කාම සේවනයෙන් වැළකීම නම් වූ සිල් පදය සමාදන් වූයෙමි. මම බලවත් සිහි නුවණින් යුතුව, ඉතා ගෞරවයෙන් යුතුව මෙම සිල් පද ආරක්ෂා කරමි. මම මාගේ බිරිඳ කෙරෙහි, (ස්වාමියා කෙරෙහි) ඉතා විශ්වාසවන්ත ලෙස කටයුතු කරමි. මාගේ දරුවන් කෙරෙහි ද ඉතා විශ්වාසවන්ත ලෙස කටයුතු කරමි. පිරිසුදු චරිතයක් ඇත්තෙක් වෙමි.

මම සංසාර දුකින් මිදීම පිණිසම බොරු කීමෙන් වැළකීම නම් වූ සිල් පදය සමාදන් වූයෙමි. මම බලවත් වීරියෙන් යුතුව, බලවත් සිහි නුවණින් යුතුව, ඉතා ගෞරවයෙන් යුතුව මේ සිල්පද ආරක්ෂා කරමි. මම කිසි තැනකදී. කිසිම අයුරකින් බොරුවෙන් අන් අය රැවටීම නොකරමි. බොරු කීමෙන් පීඩාවට පත් නොකරමි. සත්‍ය වූ වචනම කතා කරමි. සත්‍යයෙහි පිහිටා කතා කරමි. සියලු දෙනාට ඇසීමට ප්‍රිය වූ, මිහිරි වචනම කතා කරමි.

මම සංසාර දුකින් මිදීම පිණිස ම මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම නම් වූ සිල් පදය සමාදන් වූයෙමි. මම බලවත් වීරියෙන් යුතුව සිහි නුවණින් යුතුව, ඉතා ගෞරවයෙන් යුතුව මේ සිල්පද ආරක්ෂා කරමි.

බලවත් වීරියෙන් හා සිහි නුවණින් යුතුව, ඉතා ගෞරවයෙන් මා ආරක්ෂා කරන මේ සීලය සිහි නුවණ දියුණුවීම පිණිසම උපකාර වන්නේ ය. වීරිය පිණිසම උපකාර වන්නේ ය. සමාධිය දියුණුවීම පිණිසම උපකාර වන්නේ ය. චතුරාර්ය සත්‍යය අවබෝධය පිණිසම උපකාර වන්නේ ය.

මාගේ මේ සීලය නිරතුරුව ම ආරක්ෂා කර ගනිමි. මේ සීලානුස්සති භාවනාව සතුට පිණිස ම, ප්‍රමෝදය පිණිස ම, සමාධිය පිණිස ම, චතුරාර්ය සත්‍යය අවබෝධ වීම පිණිසම උපකාර වේවා!



පොල්ගහවෙල මහමෙව්නා භාවනා අසපු සංචිතයේ නිර්මාතෘ සහ අනුශාසක

**කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි**

---

අප
මහ බෝසතාණන්
වහන්සේ සම්බුද්ධත්වයට
පත් වීමෙන් පසු මනුෂ්‍යත්වයේ
ශ්‍රේෂ්ඨත්වය නැංවීමට අසීමිත
සේවයක් කළ සේක.
බුද්ධි ප්‍රභාවයෙන්, ගුණධර්මයන්ගෙන්
පූර්ණ මිනිසා දෙවියකුට වඩා
ශ්‍රේෂ්ඨ වන බව ලොවට හෙළි කළ
එකම ශාස්තෘන් වහන්සේ
තථාගත බුදුපියාණන්
වහන්සේ ය.

---



## බුදුපියාණෙනි වඳිමි පා පියුම්

ලොවේ ඉපදී නැවත මැරී මැරී
සියලු සත දුක්භවය මත්තේ
භවේ මහ දුක් අඳුර මත්තේ
හිමි දෙසුව චතුදහම ගත්තේ
නිවේ හැම සිත් කෙලෙස් පළවා
මැදි මඟෙහි හැම ගමන් ගත්තේ
සුවේ ලැබුවා සසර දුක දුරැර
සැනසුම ලබා ඇත්තේ

**විමලසේන හෙට්ටිආරච්චි**
**උඩුගම්පොල**

---

## දැමුණු සිත

නොදැමුණු සිත
ඉවත දමයි බණ පද
දැමුණු සිත
හදා දෙයි – යහපත
දමනය කළා වූ සිත
හදා දෙයි – ලොවට වැඩ

සම්මා දිට්ඨියට
නැඹුරු වූ සිත
ලොවටම බෙදයි
යහපත් වූ අර්ථය

මේ බණ කරුණු ටික වුව
අවිදු අන්ධකාර පහකොට
සතට ගෙනැවිත් දෙයි
ප්‍රඥ – ප්‍රභා ආලෝකය

**කෝට්ටපිටියේ පඤ්ඤසිරි හිමි**
**අශෝකාරාමය**
**දම්සෝපුර**

# කඳුළින් තොර දිවියකට දහමින් දෙන උපදෙස්



**තම තමන්ගේ ජීවිත පිළිබඳ නැවත හැරී බැලීමේ දී තම ජීවිත කාලය තුළ සිදුකරන ලද ක්‍රියාවන්ගෙන් කොතරම් සංඛ්‍යාවක් කඳුළින් තොරව සිහිපත් කළ හැකි දැයි ගණනය කර ගත හැකි වේ. එසේම කඳුළු බර මුවින් වේදනාකාරීව සිහිපත් කෙරෙන ක්‍රියා පිළිබඳව ද සිතා බැලිය හැකි ය.**

බොහෝවිට බොහෝ දෙනා සිදුකරන ක්‍රියා සියල්ලම සෞම්‍යවූත්, සුන්දරවූත් නොවන්නේ ය. කරනු ලබන අසුන්දර වූ, කඨෝර වූ ක්‍රියාවන් ම බහුල වේ. ධර්මයෙන් අපට උපදෙස් දී ඇත්තේ එබඳු වේදනාකාරීව සිහිකළ යුතු ක්‍රියාවන් සංඛ්‍යාත්මක වශයෙන් අඩු කර ගැනීම පමණක් නොව, එබඳු දෑ සිදු නොකර සිටීම සඳහා ශික්ෂණයක් ඇතිකරලීම සඳහා ය.

බෞද්ධ ශික්ෂා මාර්ගය තුළ මනාව දැකිය හැකි වන්නේ එබඳු අනුපූර්ව ක්‍රියාමාර්ගයක් බව ඉතා ප්‍රකට කරුණකි.

එම ආගමික මඟ නොසලකා හරිමින් අශික්ෂිතව සිතින් සිතා වචනය හා කය මෙහෙයවමින් සිදුකරන කඨෝර ක්‍රියා නිසා පසුතැවීමට සිදුවන්නේ ය. එම ක්‍රියා පාප ක්‍රියා නමින් නම් කෙරේ. එබඳු වූ අයහපත් ක්‍රියාවන් පිළිබඳ පුද්ගල මනසට දැනෙනුයේ සිසිලක් හෝ සහනයක් නොවේ. එහි ස්වභාවය වන්නේ ගිනියම් බව, අසහනය හා අසංතෝෂයි. ඒ මතුනොව දැවීම හා තැවීම යි.

එබඳු වූ පීඩාකාරි ස්වභාවය තමන්ගේ ජීවිත අපේක්ෂා අවුල් කරන්නේ ය. සදාකාලික රෝගීන් බවට පත්වීමේ මානසික ප්‍රවණතාවක් ද ඇති කරන අයුරු ඉතා ප්‍රායෝගික ය. එම පීඩාකාරි කායික මානසික ස්වභාවය සංසාරගත ජීවිතය සමඟ එක්ව ගමන් කරමින් දුක් විපාක ලබාදීමේ ස්වභාවය බුදු දහමෙන් ප්‍රකාශ වේ.

එසේම පුද්ගලයා විසින් වඩවඩාත් ප්‍රවර්ධනය කර ගත යුතු සුන්දර සුඛාස්වාදනීය වූ, කඳුළින් තොර යහපත් ක්‍රියාදාමයන්ගේ සංඛ්‍යාව වැඩිකර ගැනීමේ වගකීම තම තමන් සතු වේ.

සංඛ්‍යාත්මකව එසේ සිදුකිරීම නිසා ලැබෙන මානසික සුවය ඉහලෝක වශයෙන් ඉතා නිරෝගීසම්පන්න ජීවිත ලබාදීමේ හැකියාව ඇති කරයි. සාංසාරිකව ද එබඳු පුද්ගලයන් පුණ්‍යවන්තවූත්, සැනසිලිදායිවූත් පාරලෞකික ජීවිතයකට ද උරුමකම් ලබන බව දහමින් ප්‍රකාශිත ය.

සියල්ලෝ ම වසරක් නිමවා නව වසරකට එළඹ ඇති මෙම මොහොතේ ගෙවී ගිය වසරෙහි සිදු වූ කඳුළින් බර වූ වේදනාත්මක ක්‍රියාවන්ට තිත තබා නව වසරෙහි එබඳු අයහපත් චර්යාවන්ගෙන් ඈත්ව ක්‍රියා කිරීම සඳහා සුදුසු අවස්ථාවක් ලෙස අධිෂ්ඨානශීලී වීමද අද දවසෙහි සිදු කළ හැකිව ඇත.

තථාගතයන් වහන්සේ විසින් දේශිත මෙම දේශනය තම ශ්‍රාවක ශ්‍රාවිකාවන් පවින් වළක්වා පුණ්‍ය ධර්මයන්හි යෙදවීම සඳහා උත්සුක කිරීමේ තවත් අවස්ථාවක් ලෙස දැක්විය හැකිව තිබේ. යහපත්ව යමක් කරන්නා යහපත් පුද්ගලයකු වන්නේ ය. එම ක්‍රියාව පුණ්‍ය ක්‍රියාවක් හෙවත් කුසල ධර්මයක් ලෙස අපි හඳුනාගෙන සිටිමු. තම ජීවිතය තුළ එබඳු ක්‍රියා සපුරා ගත් පුද්ගලයා කෙසේවත් පසුතැවීමකට ලක්නොවේ. එම පුණ්‍යකර්මය සඳහා හේතුවූයේ කුසල මූලයක් ය. එසේ නම් ඉන් ලැබෙනුයේ ද යහපත් ප්‍රතිඵලයකි.


දුර්ලභව ලබන ලද මිනිසත් බව සඳහා නිසි අගයක් ලබා නොදෙමින් අවසන දුක්මුසු මුහුණින් ජීවතයට සමුදීමේ ඛේදනීය ස්වභාවය ධර්මයෙන් දක්වා ඇත්තේ හද සසල කරන ආකාරයෙනි.

'අචරිත්වා බ්‍රහ්ම චරියං අලද්ධා යොබ්බනේ ධනං' .....
යනාදී ලෙසින් ගෙවාලූ දිවිගමන උසස් හැසිරීම්වලින් තොරවූයේ ය. තම යොවුන්විය ද උපයාගත් කිසිවකින් තොරව අපතේ හැරීම පිළිබඳ සඳහන් කර ඇත්තේ දිය සිඳීගිය විල්තෙරක තනිව පසුතැවිලි වන වියපත් කොස්වාලිහිණියෙකු උපමාකොට දක්වමිනි.

මෙහි දැක්වෙන 'අනුතප්පති' යන පාලි වචනයේ අදහස ලෙස දැක්වෙන්නේ අනුව පසුතැවිලිවීම යන්න ය. එනම් තමන් විසින් සිදුකරන ලද භයානකවූත්, දරුණුවූත්, කඨෝරවූත් පාප ක්‍රියාවන් පිළිබඳ සිහිකරමින් කනස්සල්ලට පත්වීම ය.

මෙම මානසික පීඩනය පුද්ගල මනසට ප්‍රථමයෙන් ම දැනෙනුයේ පමණක් නොව ශාරීරිකව ද මහත් සේ පීඩාකාරි බවක් ඇතිකරනු ලැබේ. එසේවීම සඳහා සිදුකරන ලද අයහපත් ක්‍රියා නිසා පසුතැවිලි සහගත වූ දූෂිත මනසෙහි පීඩනය ශරීරයෙහි මූලික ජීවාංගයක් වූ රුධිරය අපිරිසුදු කිරීමට සමත්වන අතර, එය මුළු සිරුරම රෝගී තත්වයට පත්කිරීම සඳහා හේතුවේ.

***කඳුළින් තොර දිවියකට අදළ තවත් ධර්මෝපදේශ නවම් පුරපෝද පුවත්පතින් කියවමු***



කොළඹ 06, හැව්ලොක් සිටි සාමවිහාරාධිපති

**අතපත්තුකන්දේ ආනන්ද හිමි**

*උපතින් කිසිවෙක් වසලයකු නොවන්නේ ය. උපතින් බ්‍රාහ්මණයකු ද නොවන්නේ ය. අපිරිසුදු ක්‍රියා නිසා ම වසලයෙක් වන්නේ ය. පිරිසුදු ක්‍රියා නිසා ම බ්‍රාහ්මණයෙක් වන්නේ ය.*

# මෙත් ගඟ ගලයි සතහට සිසිලස පතුරා

***ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ අඹගහපිටිය පාර්ශ්වයේ වැඩබලන මහා නායක, ජාඇළ, උදම්මිට උත්තමාරාම පුරාණ විහාරයේ විහාරාධිපති, අතිගෞරවාර්හ උදම්මිට අස්සජිතිස්ස මහ නාහිමිපාණන් වහන්සේගේ 82 වැනි ජන්ම දිනය නිමිත්තෙනි.***



විසල් සඳුන් රුක සමිඳුයි උදම්මිට
සිසිල් සෙවණ හද දුක් රැඳි දනන් හට
සුසිල් ගුණැති ඔපගුණ මිහිරකි ලොවට
ළකල් සමිඳු සුදුසුයි නිති වඳින්නට

අසරණ දනගෙ හදෙ වැඩි දේවතාණෝ
එඩිතර හදින් පිරිපුන් සිහ රදාණෝ
ගනඳුර නැසූ ගගනත සොමි සඳාණෝ
පියදසුනකි ය පැණසර සඟරජාණෝ

සසුන් පොකුණ බැබළු බුදුපුත් රුවන
කසුන් මෙහෙය පවතියි අප හද අරණ
දැකුමෙන් පැවැතුමෙන් සඟ පෙළපත පොරණ
සතතින් සිහිකළා අප නා තෙරපාණ

පින්සිත වඩාගෙන පින්කම් කරන්නට
බුදුබණ අසා දැන දහමේ යෙදෙන්නට
හරිමඟ උගෙන පව්කම් හැම හරින්නට
මඟ පෙන්නුවෝ නා සමිඳුය උදම්මිට

සම්බුදු සසුන සුරකින දෙව් කැළ පවර
දිවනෙත් යොමනු මැන නාසමිඳුට නිතර
ගත සිත පෙළන රෝදුක් හඳුනා කවර
නාහිමි රකිත්වා දිව රෑ මඟ නොහැර

අප මඟ ඇති සැම දොරගුලු අසුරා
බුදුබණ දෙසුවෙ දන හද ගුණදම් වපුරා
වියපත් වුව ද හද කරුණාවෙන් උතුරා
මෙත් ගඟ ගලයි සතහට සිසිලස පතුරා

**මොරටුවේ ආනන්ද හිමි**

# දයාභාරත දඹදිව චාරිකා - මොරටුව

ඉන්දියාව, නේපාලය, තායිලන්තය, බුරුම, සිංගප්පූරුව, මැලේසියාව, වියට්නාමය, ඩුබායි

**දඹදිව චාරිකා පිටත්වීම**

**2023 පෙබරවාරි, මාර්තු, අගෝස්තු, ඔක්තෝම්බර්, නොවැම්බර්**

බුද්ධගයාව, බරණැස, රජගහනුවර, විශාලාමහනුවර, කුසිනාරානුවර, ලුම්බිණිය කපිලවස්තු, කොසබෑ නුවර, සැවැත්නුවර, සංකස්ස, දිල්ලි ඇතුළු අනු ස්ථාන 100 වැඩි ප්‍රමාණයක් වන්දනා කෙරේ.

- දින 13 චාරිකාව රු. 235000.00 (දුම්රියේ ගමන් නැත)
- දින 16 චාරිකාව රු. 210000.00 (දුම්රියේ ගමන් වාර 2ක් සහ සාංචි ඇතුලත්ව)
- දින 15 චාරිකාව රු. 235000.00 (කොළඹ-චෙන්නයි , දිල්ලි-කොළඹ සාංචි ඇතුලත්ව)
- තායිලන්ත චාරිකාව පිටත්වීම 2023 අප්‍රියෙල්
- බුරුම චාරිකාව පිටත්වීම 2023 ජුනි

## නැගෙනහිර ඉන්දියාව සහ එයින් එහා බුද්ධ භූමි වන්දනාව

පිටත්වීම 2023 ජනවාරි (දින 11) සම්පූර්ණ ගාස්තුව රු. 210000.00

සාම්ප්‍රදායික දඹදිව වන්දනා ක්‍රම වලින් බැහැරව මහා භාරතයේ නැගෙනහිර ඉන්දියාව, මධ්‍ය ඉන්දියාව සහ බටහිර ඉන්දියාවේ සුප්‍රකට ඓතිහාසික බෞද්ධ වන්දනා භූමි දැකබලා ගැනීම සඳහා

අජන්තා, එල්ලෝරා බෞද්ධ ලෙන් විහාර, අමරාවතී බුද්ධ ප්‍රතිමා හා කලා නිර්මාණ, නාගර්ජුන කොණ්ඩා, සච්චබද්ධ(තිරුපති), සාංචි සහ චෙන්නායි සාප්පු සවාරි ඇතුලත්ව

## දකුණු ඉන්දියානු චාරිකාව

පිටත්වීම 2023 (දින 07/රාත්‍රී 06) සම්පූර්ණ ගාස්තුව රු. 190000.00

තිරුපති, බැංගලූර්, මයිසූර්, ඌටි සහ චෙන්නායි සාප්පු සවාරි ඇතුලත්ව

**වැඩි විස්තර සඳහා,**

ප්‍රධාන සංවිධායිකා : එම්. චන්දිමාලි ප්‍රනාන්දු

072 2803454 / 075 6343377 / 071 0632025
011 2657222 /077 7425726 / 077 7307851
0777413031

**නො. 14/4A, මෝසස් පටුමග, කටුකුරුන්ද, මොරටුව**



# Visit CANADA

- WE CAN GET VISAS TO CANADA , AUSTRALIA , NEW ZEELAND AND THE USA.
- WE ARE A SRI LANKAN FOREIGN EMPLOYMENT BUREAU REGISTERED CHARITY.

- YOU DO NOT NEED TO PAY ADVANCE MONEY.
- NO NEED TO PAY SHOW MONEY-WE ARRANGE THEM ALL FREE OF CHARGE.
- YOU ONLY PAY OUR CHARGES ONCE THE VISA IS READY FOR YOU TO TRAVEL UP ON ARRIVAL AT THE DESTINATIONS.
- WE PROVIDE ACCOMMODATIONS.
- WE ARRANGE FOR YOU TO SETTLE DOWN IN CANADA PEACEFULLY BY LEGAL MEANS.
- WE PROVIDE LEGAL SUPPORT TO OBTAIN SETTLEMENT STATUS /PR.





Please call on:-
-0044 7444759509
-0044 7405784773
-011 2562900
-076 3485446
-070 2560056


## තුන්දොර සංවර කරගෙන ශීලයෙහි පිහිටා රහතන් වහන්සේ කෙනෙකු වන්න.

දැනට අපි භාවිතා කරන පන්සිල්, අටසිල්, දසසිල් වල සහ සාමණේර බණ දහම් පොතේ ඇති සිල්පද වලද දස කුසල කර්ම පථවත්, දස අකුසල කර්ම පථවත් ඇතුළත් කර නැත.

ශීලයෙහි පිහිටීමට මෙම අකුසල කර්ම පථ දහයෙන් මිදිය යුතුය. අකුසල කර්ම පථ දහයෙන් මිදෙන්නේ නැතුව ශීලයෙහි පිහිටීමක්වත්, ධර්මය අවබෝධවීමක්වත් වන්නේ නැත. එසේම සිත කය වචනය සංවර වීමක්වත් නැත. තුන්දොර සංවර කරගැනීමට කය, වචනය සංවර කරන සිල්පද හතක් ඇත. සිත සංවර කරගැනීමට කුසල් තුනක් ඇත. කය, වචනය, සිත සංවර කරගෙන ශීලයෙහි පිහිටා රහත් ඵලයට පැමිණෙන්න.

වැඩි විස්තර දැනගැනීමට ජාතක කතා පොතේ පනස්හය (56) වන ජාතක කතාව කියවන්න.


මෙය දැන්වීමකට වඩා දහම ගැන දැනගැනීමට සලස්වන දහම් පණිවිඩයකි.
ඒ. පී. ද සොයිසා මහතා සරල බසට නැගූ ත්‍රිපිටකය කියවා දහම් දැනුම ලබාගන්න.

- පින් සහ පව් කුසල් සහ අකුසල් - 120/-
- චිත්ත නියාම ධර්ම - 125/-
- ලොව සැමට සිත නිවාගන්න දහම් දැනුම - 125/-
- සිත මනස සහ ආගම් 80/-
- පින සහ කුසලය දෙකක්ද? එකක්ද? - 200/-
- සිතිවිලි සහ සිතින් සිතීම - 150/-
- කය වචන දෙකින් පින් - පව් සිතින් කුසල් - අකුසල් 250/-
- බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය - 350/-
- සිත ගැන දැනගන්න - 125/-
- පංච උපාදානස්කන්ධය 250/-
- සිතෙහි සතුට ඇතිකර ගැනීමට කුසල් කරන්න අකුසලෙන් මිදෙන්න - 125/-
- සිත සහ මනසින් කුසල් අකුසල් - කය සහ වචනින් පින් පව් - 100/-
- බැමිණිතියා මහා සාගතය දැනගැනීමට ඉතිහාසය පිළිබඳ ගෞරව ශාස්ත්‍රවේ දී රාජකීය පණ්ඩිත කවුඩාගම්මන රතනසාර හිමි ලියන ලද පොත- 550/-

**සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම**

661, 665, 675 පී.ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10. දුරකථන: (011) 2685369, 2686925 ෆැක්ස්: 2674187

# ඓතිහාසික කැලණිය රජමහා විහාරයේ දුරුතු මහා පුණ්‍ය පූජෝත්සවය





සම්බුදු පා පහස ලද උතුම් කැලණිය පින්බිමේ දුරුතු මහා පෙරහර පූජෝත්සවය මෙවරත් අති උත්කර්ෂවත් ලෙස පැවැත්වේ. සදහම් දේශනා පිරිත් සජ්ඣායනා, පරිවාර පෙරහර ඇතුළු වටිනා ආගමික හා සංස්කෘතික අංගයන්ගෙන් අර්ථවත්වන, අලංකාරවන කැලණිය දුරුතු පෙරහර ලාංකේය බොදු දනන්ගේ අභිමානවත් පුණ්‍ය මහෝත්සවයකි.

ඓතිහාසික කැලණිය රජමහා විහාරයේ දුරුතු මහා පුණ්‍ය පූජෝත්සවය හා මහා පෙරහර ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරාධිපති ගෞරවාර්හ මාපිටිගම ධම්මරක්ඛිත නා හිමිපාණන් වහන්සේගේ අනුශාසකත්වයෙන් හා කැලණිය රජමහා විහාරයේ අභිනව විහාර මන්දිරය කරවා සසුනට පූජා කළ හෙලේනා විජයවර්ධන මැතිණිය ප්‍රධාන දායක පින්වතුන්ගේ ශාසනික අනුග්‍රහයෙන් 1927 දී ආරම්භ විය.

එතැන් පටන් අඛණ්ඩව පැවති මෙම පෙරහර මහෝත්සවය මෙවර ශ්‍රී කල්‍යාණි උභය රාජමහා විහාරාධිපති, කැලණිය විශ්වවිද්‍යාලයේ කුලපති, අග්ගමහා පණ්ඩිත, උපාධ්‍යාය ධුරන්ධර, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගෞරවාර්හ කොල්ලුපිටියේ මහින්ද සංඝ රක්ඛිත නා හිමියන්ගේ හා ශ්‍රී කල්‍යාණි රජමහා විහාරයේ දායක සභාව, ශ්‍රී කල්‍යාණි ධර්ම විද්‍යාලය හා කල්‍යාණි තරුණ සංවිධානය ආදි සංවිධාන සමූහයේ සහභාගිත්වයෙන් මෙන් ම ගම්පහ මහ දිසාපතිතුමන් ඇතුළු රාජ්‍ය ආයතනයන්ගේ සහයෝගයෙන් රටපුරා හා ලෝකය පුරා දායක පින්වතුන්ගේ ශාසනමාමක දායකත්වයෙන් ඉතා උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට යෙදුණි.

පසුගිය වසරවල රටේ පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් මෙම පින්කම් මහෝත්සවය ඓතිහාසික චාරිත්‍ර හා උඩමළුවේ පෙරහරට සීමා වුව ද මෙම වසරේ අංග සම්පූර්ණව පැවැත්වීමට අවස්ථාව සැලසීම සියලු දෙනාට මහා ආශිර්වාදයක් ලෙස ප්‍රදේශවාසී පින්වත්හු මත පළ කරති.

පුරා තෙමසකට ආසන්න කාලයක් පැවති ධර්මදේශනා පින්කම් හා පරිවාර පෙරහර පින්කම් අවසානයේ දෙසැම්බර් 30 දින ආරම්භ වූ සත්වරුවේ පිරිත් දේශනය නව වසරට ආශිර්වාද පතමින් 2023 ජනවාරි 02 දින නිමාවට පත් විය.

ඉන් අනතුරුව 2023 ජනවාරි 03 දින උඩමළුවේ පෙරහර ද, 04 දින දෙවන මළුවේ පෙරහර හා ජනවාරි 05 දින දුරුතු මහා පෙරහර පැවැත්විණි. එහි දී සධාතුක පෙරහර, විෂ්ණු දේවාල පෙරහර, කතරගම දේවාල පෙරහර හා කැලණියට සුවිශේෂ වූ විභීෂණ දේවාල පෙරහර අති උත්කර්ෂයෙන් පැවැත්විණි.

දුරුතු පුරපසළොස්වක පෝය දින පැවැත්වෙන ආශිර්වාදාත්මක පින්කම් මාලාවෙන් සමාප්තියට පත් වන මෙම මහා පින්කම් මාලාවේ ආශිර්වාද බලයෙන් රටවාසී සැමට සියලු යහපත, අභිවෘද්ධිය, වාසනාව, දියුණුව හා සෞභාග්‍යය උදාවේවා'යි යනු කැලණිය රජමහා විහාරයේ, කැලණියේ හා රටවාසී ජනතාවගේ පරම පැතුමයි.

ඓතිහාසික කැලණිය රජමහා විහාරවාසී

**දෙනියායේ පඤ්ඤාලෝක බුද්ධරක්ඛිත හිමි**



# පැහැදිලි ආරම්භයේ අවසානය යහපත් ය

**අගාරික ජීවිතයේ පදනම අඹු සැමි සබඳතාවයි. යුතුකම් හා වගකීම්වලින් පිරි සමාජයක් බුදු දහම පෙන්වා දී තිබේ. අඹු සැමි සබඳතාව දරුවන් බිහි කිරීම නිසා මවුපිය සබඳතාවක් බවට පත්වේ. අනික්, සියලු බන්ධනවලට වඩා මවුපිය දූ දරු සබඳතාව ඉතා ප්‍රබලයි.**

“රාහුලෝ ජාතො බන්ධනං ජාතං” රාහුල පුතුගේ උපත සිදුහත් කුමරුට දැනුණේ බන්ධනයේ ප්‍රබල බව හොඳ ම සාධකයයි. මවුපිය දූ දරු සබඳතාව සිඟාලෝවාද සූත්‍රය ඉතාම ඉහළින් පෙන්වා දී තිබේ.

එසේම ස්වාමි භාර්යා සබඳතාව, විශ්වාසය, සුහදශීලි ව, කාරුණිකබව, සංග්‍රහශීලි බව පවුල් දිවිය සාර්ථක කරවන සාධක වේ. පාලක හා පාලිකා දෙපක්ෂය ආයතනයක් පවත්වාගෙන යාම පිණිස ඉවහල් වේ. ඔවුනොවුන් කෙසේ ස්වාමි සේවක සබඳතා මත කටයුතු කළ යුතු ද යන්න මනාව සූත්‍ර දේශානුසාරයෙන් දක්වා ඇත.

සාර්ථක ගිහි ජීවිතයක් ගත කරන්නකු මනා අධ්‍යාපනයක් ලැබිය යුතු වේ. ගුරු ශිෂ්‍ය සබඳතාව සමාජය තුළ සුරක්ෂිත විය යුතු ය. ශිෂ්‍යයා මනාව හික්මිය යුතු වේ. අධ්‍යාපනයේ ප්‍රධාන කාර්ය වන්නේ එයයි. “විද්‍යා ද දාති විනයං” මනා විනයක් නැති අධ්‍යාපනයෙන් සමාජයට වැදගත් සේවාවක් ඉටු නොවේ. අධ්‍යාපනය, වෘත්තීය මට්ටමෙන් සිදු වුව හොත් චරිත සංවර්ධනය සිදු නොවේ. අද බොහෝ සෙයින් සිදුව ඇත්තේ එයයි. “අපදානසෝභිනී පඤ්ඤා” චරිතය ශෝභමාන කරවීම ප්‍රඥාවේ කාර්යභාරය යි. මෙසේ චරිත සංවර්ධනය කර ගත් පුද්ගලයා පෞරුෂත්වය ගොඩනඟා ගනී. අනතුරුව සමාජ සබඳතා සුරක්ෂිත කරගනී. නිලධාරින්, හිතමිතුරන්,

“යථාපි බඹරෝ පුප්ඵං” ආදී ලෙස සමාජ ජීවිතය සුරක්ෂිත කරගෙන සිය චරියා රටා සංවර්ධනය කරගත් පසු නැණවත්, සිල්වත්, ගුණවත් පුරුෂයකු, ස්ත්‍රියක, ලෙස සමාජයට බරක් නොවී පීඩාවක් නොවී මල නොතලා රොන් ගන්නා සේ කටයුතු කරයි. වේයා තුඹස බඳින්නාසේ උට්ඨාන වීර්යෙන් යුක්තව සිය ආර්ථිකය ද ගොඩනඟා ගනී. පංචශීල ප්‍රතිපදාව සුරක්ෂිත වේ. සමාජගත පුද්ගලයා අවබෝධයෙන් ජීවන රටාව ගෙනයයි. පැවැත්ම සුරක්ෂිත කරගනී. අනලස්ව වෙහෙස මහන්සි වී සීත, උෂ්ණ නොතකා කටයුතු කරයි. එම පුද්ගලයාට සැපය දුරු නොවේ. පවුල් ජීවිතය සාර්ථක වේ. ප්‍රියමනාප වේ. සමාජය තුළ උසස්, ගුණවත්, නැණවත් සද්ධාවෙන් පිරි ප්‍රඥාවෙන් පිරි පුද්ගලයකු වශයෙන් ආත්ම තෘප්තියෙන් අගාරික ජීවිතය ගෙවන්නට හැකිවනු ඇත.

දහම් අධ්‍යාපනය හා දහම් පාසල් අධ්‍යාපනය පුද්ගල සංවර්ධනයට සෘජුව ම සම්බන්ධ වේ. ආචාරශීලි ගුණගරුක දරුවකු නිර්මාණය කර සමාජයට දායාද කිරීම මූලික අරමුණ වේ. එය බෞද්ධ ප්‍රතිපදාවේ මූලික අරමුණකි. මාපියන් තම දූ දරුවන් හැදියාවෙන් හා යහපත් චරියාවෙන් යුක්ත ආචාරශීලිව ගොඩනඟන්නට කැප වේ. එහෙත් අද තරගකාරි අධ්‍යාපන රටාවට ගොදුරු වූ දරුවන් අධ්‍යාපන මාෆියාවකට හසුවී තිබේ. ඉරිදා දිනය දහම් අධ්‍යාපනය ලබන්නට නියමිත වුවද දූ දරුවන් ටියුෂ න්වලට යාම මහත් වූ අභාග්‍යයකි. ඉරිදා දහම් පාසලත්,පෝදා ශීල සමාදානයත් මඟින් බෞද්ධ දර්ශනයට අයත් මූලික දැනුම ධර්ම ඥානය විනය හා ශික්ෂණය වර්ධනය වේ. ඔවුනොවුන් කෙරේ අවෛරී බව, කරුණාව, මෛත්‍රීය දායාද වන්නේ දහම් අධ්‍යාපනයෙන් බව අමතක නොකළ යුතුයි. සුන්දර පවුල් ජීවිතයකට උරුමකම් කියන්නට නම් අම්මා, තාත්තා, වැඩිහිටියන්, සහෝදර සහෝදරියන් ඥතීන් කෙරේ ගරු බුහුමන් කිරීම, අවවාද උපදෙස් පිළිගැනීම, සුවචකීකරු බව, සැහැල්ලු දිවි පැවැත්ම පුරුදු පුහුණු කළ යුතු ය.

බෞද්ධ සාහිත්‍ය සංස්කෘතිය තුළින් ගොඩනැඟුණ ආචාර ධර්ම සිය ජීවිතය හා අනුබද්ධ වීම බෞද්ධ දරුවන්ගේ ජීවිතයේ පැහැදිලි ආරම්භයකි. හැදියාව, සහජත්වය, චර්යාව, වැරැදි කරන්නට ලජ්ජා භයවීම මූලික අරමුණකි. එපමණක් නොව ඇඳුම් පැලඳුම්, යාම් ඊම් ආදි සතර ඉරියව් පවා බුදු දහමින් පෙන්වා දී ඇත. මේ අනුව බලනකල බුදුදහම ලෝකෝත්තර ජීවිතය පමණක් නොව අගාරික වූ ලෞකික දිවිය සාර්ථක කිරීමට මඟ පහදා දුන් නිර්මල දර්ශනයක් බව පෙන්වා දිය හැක.

ශාස්ත්‍රවේදී පූජ්‍යපාද

**වැලිපත ධම්මාරාම හිමි**

## ගෝතම දඹදිව වන්දනා

පෙබරවාරි මස දින 15 යි
චෙන්නායි දුම්රිය චාරිකාව
මිළ ගණන රු 200,000

ජනවාරි මස දින 11 යි
දිල්ලි ගුවන් චාරිකාව
මිළ ගණන රු 250,000

අතිශයින්ම සුඛෝපභෝගී ආරක්ෂාකාරී චාරිකාවන්ය.

පූජ්‍ය කෝට්ටගල ගෝතම හිමි
විමසීම : 0718 320 285
WhatsApp : 0769 470 568

## අඩු මිලට බෙඩ්ෂීට්

රටින් ගෙන්වන ලද ඩිසයින් 50කින් යුත් අලුත් සින්ගල් ඩබල් බෙඩ්ෂීට් මිල 490/- සිට ට්‍රිපල් බෙඩ්ෂීට් 790/- සිට තවත් බෙඩ්ෂීට් වර්ග 70ක් කොට්ට 690/- සිට ඉන්දියන් නයිටි 630/- සිට තුවා 290/- සිට 1800/- දක්වා තොගමිලට අපෙන් ලබාගත හැක

**සැම්ර්විටා ක්ලොතින්** 0117902278
ගුරුගේ නේචර් පාර්ක් අසල, ජා-ඇල 0771964341

## හිමිනමකට ඇරයුම

**නිරෝගී විවේකයෙන් කල්ගත කරන හිමිනමක් මා අමතන්න.**

**(නිවේදන හැකියාව විශේෂයි)**

0703085555

**භාවනා යෝගී තරුණ මෙහෙණින් වහන්සේ දෙනමක් වැඩ සිටින ආරාමයේ පැවිදි වීමට උපස්ථානයට, කුටියක් හා වැසිකිළියක් සෑදීමට ඔබට අවස්ථාව ඇත**

2023 වර්ෂයේ පැවතෙන ප්‍රබල ග්‍රහ මාරුවට විශේෂ අශිර්වාද ලග්නය අනුව 2023 ජනවාරි 17 දින ආරාමයේ සිදුවේ. පැමිණීමට නොහැකි පිංවතුන් දුරකථනයට කථාකර නම ලිපිනය දී ආශිර්වාදය ලබා ගන්න. (කිසිදු මුදලක් අය නොකෙරේ)

**ගෝතමී මෙහෙණින් වහන්සේ - 071-6058777**

## අභිනන්දනාරාමය

**යක්කටුව, කරන්දෙණිය**

මෙම ප්‍රජාපති අභිනන්දනාරාමය ග්‍රාමය මැද පිහිටි ආරාමයකි. ප්‍රසිද්ධ වී තිබෙන භූමියකි. බොහෝ දෙනා බෝධි පූජා, බුද්ධ පූජා බොහෝ සතුටින් වඳින පූදන ස්ථානයකි. මෙම ස්ථානයට කුල දූරියන් දෙපලක් තුන් පලක් අවශ්‍යයි.

මාර්ගය කිට්ටුව පිහිටා තිබේ.

මීට,
**ආරාමාධිපති, මෑණියන් වහන්සේ**

**දුරකථන අංකය : 091 2290084**

## පාරම්පරික ශාන්ති කර්ම

**අධ්‍යයන පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි කිරීම**

සුරසරණ ගුරුකුලය මගින් පවත්වන මෙය ගුප්ත ශාස්ත්‍ර ඉගෙනීමට කැමැත්තක් දක්වන සියලු දෙනාට වැදගත් පාඨමාලාවකි. නැති වී යන ශිල්ප රැක ගැනීම මූලික අරමුණයි. මෙහිදී මන්ත්‍ර ශාස්ත්‍ර මූලධර්ම විග්‍රහය සහ මන්ත්‍ර භාවිතය, අංග සම්පූර්ණ දේව පූජා, බහිරව පූජා, ගෙවල් ආරක්ෂා කිරීම, දෙහි කැපීම, යන්ත්‍ර නූල් දැම්ම, අමනුෂ්‍ය දෝෂ දුරලීම, කොඩිවිණ, සූනියම් බන්ධන දුරු කිරීම, ශරීර ගත වූ වස විෂ ඉනා බේත් ඉවත් කිරීම, මල්වර හා තනිකම් දෝෂ, කළුකුමාර දෝෂ හරණය, ඇස්වහ කටවහ ග්‍රහ දොස් නිවාරණය, යන්ත්‍ර ඇඳීම, කුඩා දරුවන්ගේ රෝග නිවාරණය ආදී වූ ශාන්ති කර්ම රැසක් එහි නීති රීති සිද්ධාන්ත වලට අනුව ප්‍රායෝගික වැඩමුළු සහිතව උගන්වනු ලැබේ. ගැහැණු/ පිරිමි වයස් භේදයක් නොමැත. මසකට එක් දිනකි. අවුරුදු එකකි. මසකට පන්ති ගාස්තුව රු.3000/-කි. පහත සඳහන් නගර ආශ්‍රිත සිසුන්ගෙන් ඉගෙනීමට බලාපොරොත්තු වන අය පමණක් අමතා දුරකථන අංකය ලබා දී ලියාපදිංචි වන්න. පෙබරවාරි මස පහත දිනයන්හි දී ඇරඹෙන පන්ති පහත පරිදි වේ.

| දිනය | දවස | නගරය | දිනය | දවස | නගරය | දිනය | දවස | නගරය |
|---|---|---|---|---|---|---|---|---|
| 01) | බදාදා | අවිස්සාවේල්ල | 08) | බදාදා | පොළොන්නරුව | 20) | සඳුදා | ගාල්ල |
| 03) | සිකු. | කුරුණෑගල | 10) | සිකු. | ගම්පහ | 21) | අඟ. | මාතර |
| 04) | සෙන. | පානදුර | 11) | සෙන. | අම්බලන්ගොඩ | 22) | බදාදා | අනුරාධපුර |
| 05) | ඉරිදා | රත්නපුර | 12) | ඉරිදා | කඩවත | 24) | සිකු. | මහියංගනය |
| 06) | සඳුදා | දඹුල්ල | 13) | සඳුදා | කෑගල්ල | 25) | සෙන | මහරගම |
| 07) | අඟ. | කුලියාපිටිය | 14) | අඟ. | බොරැල්ල | 26) | ඉරිදා | මහනුවර |

විමසීම්: **සුරංග සිරිමෙවන්** 0776378184

**හිමිනමක් සතු පර්චස් 11.5 ක් වැවට මායිම්ව ගංගොඩවිල පන්සලකට ඉතා සුදුසුයි. විකිණීමට.**

074-3153366, 071-6908746

## නිවන පිණිස

තාවකාලික පැවිදි වීම, නේවාසික භික්ෂුවක් වීමට,

**පිනට කැමති 60 ට අඩු අය අමතන්න.**

දීර්ඝවද සිටිය හැක.

070-1918928, 076-1781455

කලුමහතෙකුට දේවාලයක් ඉදිකර ගැනීමට හෝ ස්වාමීන් වහන්සේ නමකට විහාරස්ථානයක් ඉදිකර ගැනීම සඳහා

**සුදුසු ඉඩමක් කළුතර දිස්ත්‍රික්කයේ ඇත.**

**සුමිත්ත හිමි**

**අමතන්න : 075-9174374**

**සීල භාවනා ශාලාවක වහලය සෙවිලි කර ගැනීම**

සඳහා

**අඩි 12 සීට් 100 අවශ්‍යයි.**

ඔබේ සැදැහැති දායකත්වය බලාපොරොත්තු වෙමු.

කරුණාකර දැනුම් දෙන්න.

0768649192

# දඹදිව චාරිකා

2023 චාරිකා : පිටත්වීම - පෙබරවාරි/මාර්තු/අගෝස්තු සිට නොවැම්බර්

**දින 18 චාරිකාව - 178,000/=**

සාංචි හා කොසඹෑනුවරද ඇතුලත්ව සියලුම සිද්ධස්ථාන වන්දනා කෙරේ
(සුවපහසු දුම්රිය ගමන් 2 සහිත)

**දින 12 චාරිකාව - 228,000/=**

දිල්ලියට ගුවනින් /ඉන්දියාව ඇතුලත අධිසුඛෝපභෝගී බස් රථයෙන්
(සාංචිය හැර අනෙකුත් ස්ථාන වන්දනා කෙරේ)

**දින 23 චාරිකාව - 198,000/=**

චෙන්නායි සිට සම්පූර්ණ චාරිකාවම බස් රථයෙන්
(තිරුපති, අජන්තා-එල්ලෝරා, අමරාවතී, නාග්පූර්, හයිද්‍රාබාද්, සාංචි ඇතුලු දඹදිව සියලුම සිද්ධස්ථාන)

Watsup Hotline
077 195 74 20

## මෙත්සිසිල ටුවර්ස්

මෙත්සිසිල
Methsisila Tours

කාර්යාලය : නො 04, මහමෙත්ගම, රඹුක්කන, බණ්ඩාරගම.
නිවස : නො 295/1, දැල්කඩ, පරගස්තොට,බණ්ඩාරගම.
විමසීම් : 038 22 89 880 / 077 72 91 189 / 077 19 57 420

## "සදහම් යාත්‍රා" දඹදිව වන්දනා චාරිකා

**ඒ.සී.බී.සී. ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස්, ලි. අංකය - ආ.ක./ සේ 02/ වන්දනා/ 17**

**බුදුන් උපන් දේශය වන දඹදිව වන්දනා මාන කිරීම සඳහා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය සමග ඔබත් එක්වන්න.**

- බරණැස සහ බුද්ධගයා වන්දනාව සහ සිල් සමාදන් වීම
- කුසිනාරා නුවර, රජගහනුවර සහ විශාලා මහනුවර
- කපිලවස්තු, ලුම්බිණිය වන්දනාව
- සැවැත්නුවර කිරිපිඩු පූජාව සහ
- සාංඝික දානය සහ ධාතු වන්දනා
- ජේතවනාරාමය සහ ආනන්ද බෝධි වන්දනාව
- දඹදිව වැඩසිටින ස්වාමීන් වහන්සේලා විසින් සියළුම වන්දනා කටයුතු සිදු කරයි

යාබද නාන කාමර සහිත සුවපහසු නවාතැන්
සුඛෝපභෝගී බස් රථ වල ගමනාගමනය

**පිටත් වීම**
පෙබරවාරි, මාර්තු, අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර්

**දුම්රිය ගමන් සහිත චාරිකාව දින 17 යි**

**දුම්රිය ගමන් රහිත චාරිකාව දින 13 යි**

සැබෑ වන්දනාවක වෙනස අත්විඳින්න අදම අමතන්න...!

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
නො 380 බෞද්ධාලෝක මාවත, කොළඹ 07
WEB - www.acbc.lk
Email : buddhistinfo380@gmail.com

071 481 2656
071 864 5554
011 266 5047

SL PROMO



# තමන්ගේ මතයට නොව නිවැරැදි මතයට ඉඩදෙන්න

**වසරක් ගෙවී නව වසරක උදාව සිදුව පවතී. ගිය වර්ෂය තුළ අප බොහෝ ප්‍රශ්නවලට මුහුණ දුන්නෙමු. ආර්ථික අභියෝග මැදින් ගලා ආ ප්‍රශ්න සමාජයීය හා දේශපාලනික අර්බුද දක්වා ගමන් කළ ආකාරය අප දුටුවෙමු.**

එම අභියෝග මැදින් වසරක් ගෙවී නව වසරකට අප පා තබා ඇත්තෙමු. නව වසරක ආරම්භය අලුත් අත්දැකීම් සමූහයකට මඟ පාදන අතර, ජීවිතයේ නව බලාපොරොත්තු ඇති කර ගැනීමටත්, ඒවා සඵල කර ගැනීමටත් අධිෂ්ඨාන කර ගැනීමටත් අවස්ථාව සලසයි.

අද අප වෙනදා මුහුණ දුන් අභියෝගයන්ට වාගේම ඊටත් වඩා සංකීර්ණ අභියෝගයන්ට මුහුණ දෙමින් සිටින්නෙමු.

විශේෂයෙන් මුළු මහත් සමාජය ම වෙළාගෙන සිටින මත් උවදුර අපේ අනාගත පරම්පරාව විනාශ මුඛයට ඇද දමන ආකාරය ඛේදනීය ය. එය තරුණ පරම්පරාව පමණක් නොව පාසල් දරුවන් පවා ගොදුරු කරගෙන තිබීම භයානක සමාජ පරිහානියක ලක්ෂණයකි. මත්ද්‍රව්‍ය එම ස්වරූපයෙන් ම නොව ටොෆි, චොකලට් වශයෙන් ද පාසල් තුළට ඇතුල්වීම විනාශකාරී සමාජයක් නිර්මාණය වීමේ අසුබ පෙර නිමිත්තකි.

පසුගිය වර්ෂයේ මත්ද්‍රව්‍ය වැටලීම්වලින් අත්අඩංගුවට පත් සංඛ්‍යාව අනූදහසකට අධික බව වාර්තා වේ. නීතියේ රැහැනට හසු වූ ප්‍රමාණය එතෙක් වුවත් සත්‍ය වශයෙන් හසු නොවූ ප්‍රමාණය කොතෙක්'දැයි කිව නොහැකි ය. එබැවින් මේ තත්ත්වය මනාව වටහාගෙන විශේෂයෙන් තරුණ හා බාල පරම්පරාව මතින් නිදහස් කර ගැනීමට අවශ්‍ය විධි විධාන ගත යුතු ය.

එමෙන්ම මවුපියන් ඇතුළු වැඩිහිටියන්ගේ අවධානයත්, පාසල්වල දී ගුරුවරුන්ගේ අවධානයත් දැඩි ලෙස යොමු විය යුතු ය. එසේම දරුවන් සමාජයට වැඩි වශයෙන් නිරාවරණය වන තැන් පිළිබඳ හා ඔවුන් ඇසුරු කරන්නන් පිළිබඳ මවුපියන්ගේ දැඩි අවධානය යොමු විය යුතු ය.

එමෙන්ම සමඟි සම්පන්නවීම ද රටේ යහ පැවැත්මට ප්‍රමුඛ හේතුවකි. ජාති වශයෙන්, ආගම් වශයෙන් හා කුල මල වශයෙන් බෙදී ජීවත් වන තාක් අප රට ඉදිරියට පවත්වා ගෙන යාමට නොහැකි ය.

සමගිය ඇති කර ගත යුත්තේ පළමුව සිය පවුල තුළින් ම ය. එකිනෙකාට ගෞරව කිරීමත්, එකිනෙකාගේ අදහස්වලට ඇහුම්කන් දීමත් සමඟි සම්පන්න බව වර්ධනය වීමට හේතු වේ. අන්‍ය මතයට ගරු නොකරන තාක් සාමකාමී පරිසරයක් ගොඩනොනැඟෙනු ඇත.

එබැවින් සැමියා, බිරිඳ අතරත්, මවුපිය දූදරුවන් අතරත්, ගුරු ශිෂ්‍යයන් අතරත්, පාලක පාලිතයන් අතරත්, ගිහි පැවිද්දන් අතරත්, සමඟි සම්පන්න බව වර්ධනය කර ගැනීමට කටයුතු කිරීමෙන් යහපත් සමාජයක් නිර්මාණය කර ගැනීමට අවස්ථාව නිර්මාණය වනු ඇත.

ස්වයං හික්මීමක් ඇති කර ගැනීම ද අතිශය වැදගත් කරුණකි. අප හැමවිටම පැන නඟින ප්‍රශ්නවල දී ඇඟිල්ල දිගු කරන්නේ වෙනත් පාර්ශ්වයකට ය. තමන්ගේ අතින් සිදුවූ හෝ සිදු වන අඩුපාඩු දෙස බලන්නේ කලාතුරකිනි. සෑම විටම ආත්ම ප්‍රත්‍යවෙක්ෂණයක නිරතවීම ජීවිතය නිවැරැදි මාවතට යොමු කර ගැනීමට ඉවහල් වේ.

එමෙන්ම තමන් කවුදැයි හඳුනාගෙන කටයුතු කිරීමත් සාර්ථක දිවියකට මඟ පාදයි. අඥනයා තමන් අඥන බව දන්නේ නම්, එය ඥනවන්තභාවේ ලක්ෂණයක් බව බුද්ධ දේශනයයි. එහෙත් අඥනයා තමන් ඥනවන්ත යැයි සිතන්නේ නම්, එය අඥනභාවේ ලක්ෂණයක් බව වටහා ගත යුතු ය.

තමාගේ තත්වය හා ප්‍රමාණය හඳුනාගෙන කටයුතු කිරීම වැදගත් ය. එවිට තමන්ගේ අඩුපාඩු නිවැරැදි කර ගැනීමට අවස්ථාව සැලසෙයි.

අද ගිහි පැවිදි දෙපාර්ශ්වයේ ම පවතින අඩුපාඩුවක් ලෙස වැඩිහිටි උපදේශයන්ට සවන් නොදීම සඳහන් කළ යුතු ය. තම මතයම නිවැරැදි යැයි සිතන තරුණ පරම්පරාව නොදැනම ගමන් කරන්නේ විශාල පරිහානියකට බව ඔවුහු නොදනිති.

අතිගරු මහා නායක මාහිමියන් වහන්සේ ඇතුළු වැඩිහිටි මහා යතිවරයන් වහන්සේ පවා විවේචනය කරමින් සමහර භික්ෂූන් වහන්සේ පවා ගමන් කරන අලුත් මාවත විශාල පරිහානිකර සමාජයකට අතවනන බව අප තරයේ සිහි තබා ගත යුතු ය. ප්‍රශ්න දෙස එකිනෙකා බලන ආකාරය වෙනස් ය. තරුණ ප්‍රජාව තම කායික ජවය හා මානසික ආවේගයන් තුළින් ප්‍රශ්න දෙස බලන ආකාරයට වැඩිහිටියන්ට එම ප්‍රශ්න දෙස බැලිය නොහැකි ය. වැඩිහිටි මහා යතිවරයන් වහන්සේ ප්‍රශ්න දෙස බලන්නේ ඊටත් වඩා උපේක්ෂා සහගතව ය. එහෙයින් තම මතය අන්‍යයන්ගේ ද මතය විය යුතු ය.

ඉවසීම, අන්‍ය මතයන්ට සවන් දීම, එකිනෙකාට ගෞරව දැක්වීම, තම අඩුපාඩු කවුරුන් හෝ විසින් පෙන්වාදීමේ දී මෙත් සිතින් එම උපදෙස් පිළිගැනීම තුළින් සන්තෘෂ්ටිදායක සමාජයක් සකස් කර ගැනීමටත්, සන්තෘෂ්ටිදායක මානසික තත්ත්වයක් නිර්මාණය කර ගැනීමටත් හැකි බව සිතට ගත යුතු ය.




කෝට්ටේ ශ්‍රී නාග විහාරාධිපති
කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහා සංඝ සභාවේ කර්මවාගාචාර්ය කෝට්ටේ සිරි පැරකුම්බා පරිවේණාධිපති

**මහියංගණයේ පඤ්ඤානන්ද හිමි**


---

සිදුරු නැතිව එකට තදව
තිබෙන ගල් කන්දක් සතර දිගින්
හමන සුළඟින් යම් සේ කම්පා
නොවන්නේ ද, එසේම නුවණැති
පුද්ගලයා නින්ද, ප්‍රශංසා දෙකෙහි
දී ම කම්පා නොවන්නේ ය.

---

## පැල්පතේ අරුණැල්ල



සේපාලිකා පලස
මතින් පියවර තබන
පිපෙන සියපතක් සේ
දොරින් දොර පිඬු සිඟන
අපේ පොඩි සමිඳුණේ
දන් පිඬක් පුදන්නට
බලා ඉමි අරුණැල්ලෙ

කුසපිරෙන්නට අහර
ලැබගන්න පින් නැතත්
සෝ සුසුම් වගුරලා
උපයනා කඳුළු බිඳු
මුසුව පිසු හීල දන
මහමෙරකි සමිඳුණේ
පාරමී දම් පුරන

මහ පිනක් කර ගන්න
බැරිඋනත් මේ බවේ
අපරිමිත සැදැහැයෙන්
පිසු හීල දන් ටිකක්
පිළිගන්න සැමිදිනේ
වඩිනු මැන සමිඳුණේ
රුදු සසර නිමවන්න


ආචාර්ය
**රත්නපාල වික්‍රමසිංහ**




# කැන්ගාරා හෝල්ඩින්ග්ස් අනුග්‍රහයෙන්

# “සර්ව රාත්‍රික භාවනාමය බුදුගුණ දේශනාව”

## ජනවාරි 21 වැනිදා



කාබනික පොහොර නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතනයක් වන කැන්ගාරා හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමේ අනුග්‍රහයෙන්, 'අමා දෙර විවර විය' සදහම් පදනම සංවිධානය කරන, 'සර්ව රාත්‍රික භාවනාමය බුදුගුණ දේශනාව' ජනවාරි 21 වැනිදා සවස 5.00 සිට පසුදා උදෑසන 7.00 දක්වා ඓතිහාසික කැලණි රජමහා විහාරස්ථානයේ දී පැවැත් වේ.

මේ පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීම පසුගිය දා බත්තරමුල්ල මොනාව් හෝටලයේ දී පූජ්‍ය තිල්වල ආනේජ ස්වාමීන් වහන්සේ, පූජ්‍ය බෙලිහුල් ඔය සාර සමාහිත ස්වාමීන් වහන්සේ, කැන්ගාරා හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂිකා, මෙම පුණ්‍ය කර්මයේ පූර්ණ දායිකා සහ ප්‍රධාන සංවිධායිකා තාරකා ජයතිලක මහත්මිය, 'අමා දෙර විවර විය' ජාතික සංවිධායක ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ උදය ශාන්ත ගුණසේකර, රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය - ජ්‍යෙෂ්ඨ උපදේශක (අමා දෙර විවර විය සදහම් පදනම), වෛද්‍ය මංජුල හෙට්ටිආරච්චි, 'අමා දෙර විවර විය' නීති උපදේශක රාජා ගුණරත්න සහ third eye vision පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ ජයන්ත කුලසේකර යන අය ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මෙහිදී කැන්ගාරා හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂිකා සහ ප්‍රධාන සංවිධායිකා තාරකා ජයතිලක මහත්මිය අදහස් දක්වමින් මෙසේ පැවසුවා ය.

"කැන්ගාරා හෝල්ඩින්ග්ස් කියන්නේ වසර හයක් පුරා කාබනික පොහොර නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියැළෙන දේශීය සමාගමක්. අපේ ආරම්භක යුගයේ එක් දවසක ගොවිබිම සොයා අප ගිය ගමනකදී අහඹු ලෙස අපිට ගොවි මහතෙක් මුණගැහිලා ඔවුහු සහ නිවැසියන් අපව පිළිගත්තේ ඉතාමත් ම ලබැඳි ව අප හට තේ පැන් සංග්‍රහයක් ලබා දී ඔවුන්ට හැකි උපරිම ලෙස සංග්‍රහ කළා. නමුත් ඒ ගෙදර ගොවි මහතාට කිසිවෙක් කිසිවක් බොන්නට වත් කන්නට වත් දුන්නේ නැහැ. ඒ පිළිබඳ විමසීමේ දී අප දැන ගත්තේ ඉතාම ඛේදනීය කතාවක්.

'මට වතුර බොන එකත් සීමා කරලයි තියෙන්නේ නෝනා. ඇඟ ඇතුළෙ තියෙන්නේ පුංචි වකුගඩු දෙකක් වුණාට ඒකෙන් ලොකු දෙයක් කරනවා. ඒ වකුගඩුවලට හානි කරගන්න අපිත් ලොකු වැරැද්දක් කරගෙන කියලා තේරුණේ පැරදුනාට පස්සේ. රටටම බත දීපු මට අද වතුර උගුරක්වත් බොන්න බැහැ. ගොවියෝ වෙච්ච අපිත් ඒ තරමටම පසට හානි කරලා. රසායනික පොහොර, පස විතරක් නෙවෙයි මගේ වකුගඩුත් විනාශ කරලා තියෙන්නේ. මතු පරම්පරාවට අයිති පිත් බිමක් වස විස පමණ විනාශ කරල ද කියලා මගේ හිත වද දෙනවා. ආසා හිතෙන දෙයක් කනවා තියා වතුර උගුරක්වත් වැඩිපුර බොන්න බැරි තැනකට අද මං පත් වෙලා...'

සිය දරුවන් රකින්නට, රටට බත සපයන්නට මහ පොළවත් එක්ක ඔට්ටු වූ ඔහු අද මහා කලකිරීමකින් පසුවන සහ ශාරීරිකව බොහෝ දුක් පීඩා උහුලන ගොවි මහතෙක්. අද අපි මේ ගමන් කරන, 'රට සුවපත් කරනා- පස සරු කරනා' ගොවි අස්වැන්නකට වෙහෙසෙන මග විවර වුණේ, ඒ ගොවි මහතා වැනි ගොවි රජුන් සිය ගණනකට අත්ව ඇති ඛේදනීය ඉරණම දුටු නිසයි. අද ඔහු ගේ ඉදිරි පරම්පරාවේ බහුතරය වස විස සහිත රසායන ද්‍රව්‍ය සහ කෘමිනාශකවලින් මිදී, කාබනිකකරණයට අවතීර්ණ වී ගමන් කරනු දැකීම සතුටට කරුණක්. පසට මිතුරු- අපට මිතුරු කාබනික නිවැරැදිව සපයන කාර්ය අප විවිධ අයුරින් ඉතා වෙහෙසකාරීව පිරික්සා බලා සොයා ගත්තේ, මේ ජාතික ව්‍යසනය තව දුරටත් සිදු නොවිය යුතු නිසයි.

කාබනික පොහොරින් සරු වූ එම අස්වැන්න පළමුවෙන් ම නුවරඑළිය ප්‍රදේශයෙන් මතු කරගන්නට අපට හැකි වුණා. අද රට හතර අතේ දිස්ත්‍රික්ක 13ක අප කාබනික පොහොර පසට මුසු කරන ගොවීන් රැක ගනිමින්, ඉතා සරු අස්වැන්නක හිමිකරුවන්ව සිටීම ඇත්තටම විශාල ජයග්‍රහණයක්.

වසර හයක පමණ කාලයක සිට අප ආ ගමන වූයේ කැන්ගාරා සමූහයේ ගමනයි. ඒ ගමන තුළ අත්වැල් බැඳ ගත් බොහෝ පිරිසක් අද දියුණුවට පත් කාබනික පොහොර ගොවීන් බවට පත්ව තිබෙනවා. ඔවුන් සිතින් සහ ආර්ථිකයෙනුත් පොහොසත් ගොවි පරපුරක්.

දේශීය ආයතනයක් ලෙස අප නිවැරැදිව උපයන මුදල්වලින් කොටසක් තවත් උතුම් දෙයක් වෙනුවෙන් යොදවන්නට ලැබීම අප සලකන්නේ භාග්‍යයක් ලෙසයි. යහපත්ව උපයන ධනයෙන් කොටසකින් පොදු සුබසාධන කටයුතු සිදු කරන්නේද ඒ නිසයි. ජාති ආගම් භේදයකින් තොරව, ඉගෙන ගන්නා දරුවන්ට ඉගෙනීමට අවශ්‍ය පොතපත ලබා දීමත්, බංකු පුටු ලබා දීමත් මෙතෙක් සිදු කර ඇති අතර, හැකි උපරිම අයුරින් ඉදිරියේදී ද අප එම කටයුතුවල නියැළෙනවා. ඒ වගේම දුසිරිතෙන් හා නොදන්නා කමින් නොමගට යොමු වූ තරුණ පරපුරේ යම් කොටසක් හෝ ඉන් ඈත් කර තර්ක බුද්ධියෙන් කටයුතු කරන පිරිසක් බවට පත් කිරීමත් අප ලද තවත් ජයග්‍රහණයක්. අද ඔවුන් අප හා අත්වැල් බැඳ අලෙවි ක්ෂේත්‍රයේ විශාල සේවයක් ඉටු කරනවා.

එසේම, ඉතා ශීඝ්‍රයෙන් රසායනික හා කෘමිනාශක භාවිතය අඩු කර, කෘමි උවදුරු නැති කර සොබාදහමට මිතුරු ගොවි පිරිසක් බිහිකිරීමට දායක වීම අප ලද විශාලම ජයග්‍රහණයයි. 30%ක් රසායනික භාවිතය අවම කොට, අපගේ කාබනික පොහොර සමඟ වී වගාව සාර්ථක කරගත හැකි බවට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලද සහතිකයද අපගේ ඉදිරි ගමනට මහත් රුකුලක්. එමගින් ඉතා සරු අස්වැන්නක් නෙළන පරපුරක් අප හා එක් වී තිබෙනවා.

සොබාදහමට මිතුරුව ගමන් කරනා අපගේ තවත් අරමුණක් වන්නේ, දහම සුරකින පරපුරක් බිහි වනු දැකීමයි. මහ පොළොවට ආදරය කරන පිරිසක් කිරීමයි. ඒ අරමුණ පෙරදැරිව බුදු සිරිපා පහස ලද උතුම් කැලණි විහාරයේ දී, අති පූජ්‍ය බලංගොඩ රාධ ස්වාමීන් වහන්සේ වැඩම කිරීමෙන් තුන්යම් රාත්‍රියක් පුරා සියලු ලෝවැසියන්ට සෙත්පතා සර්ව රාත්‍රික මහා භාවනාමය බුදු ගුණ දේශනාව ලබන ජනවාරි 21 වැනි සෙනසුරාදා සවස 5.00 සිට පසු දා උදෑසන 7.00 දක්වා සිදු කරන්නේ එම උතුම් අරමුණ පෙරදැරිවයි.

මේ සඳහා ශ්‍රී ලාංකීය ජනතාවට අපි බොහෝම බැති සිතින් සහ ගෞරවයෙන් ආරාධනා කරනවා.."

**ඉනෝකා පෙරේරා බණ්ඩාර**

**කවිබණ, ධර්ම දේශනා විරිඳු, පිරිත්**
**අඩුම මිලට Recordings කරනු ලැබේ.**
ස්වර්ණ මධුරාගී :
077-3253010

විහාරස්ථානයේ සියලු කටයුතු සොයා බලා ගැනීමට උසස් පෙළ (කලා) සමත්
(වයස 25 - 50 අතර පමණී)
වැටුප පැමිණ සාකච්ඡා කරගන්න.
විමසීම්
0776523441

**මෙහෙණි ආරාමයකට**
නිසංසල පරිසරයක
**පර්චස් 30-40 ඉඩමක් මිලදී ගැනීමට උවමනාය.**
බස්නාහිර පළාත, කුරුණෑගල, කෑගල්ල දිස්ත්‍රික්ක විශේෂයි.
0702290519

# විශේෂ දැනුම් දීමයි

## "බුද්ධ දේශය දැකීම - බුදුන් දුටුවා වැනිය"

සනාථ කරමින් දඹදිව වන්දනා චාරිකා 142 ක් ඉතා උසස් ලෙස සංවිධානය කර ගෞරව සම්මාන අටකින් පිදුම් ලබා වන්දනා බැතිමතුන්ගේ ප්‍රසාදය දිනාගත්
**මීගමුව ශ්‍රී ලංකා භාරත සංචාරක ආයතනයේ අධිපති**
**රාජ්‍ය සේවා විශ්‍රාමික ඉංජිනේරු විජයසිංහ වත්තේවැව මහතා**
**වන්දනා බැතිමතුන්ගේ බලවත් ඉල්ලීම මත කොරෝනා උවදුරින් වසර තුනකට පසු නැවත**
**2023 වසරේ අගෝස්තු මාසයේ සිට**
**දඹදිව වන්දනා චාරිකා ආරම්භ කිරීමට තීරණය කර තිබේ.**

ආර්ථික උද්ධමනය නිසා තෙගුණයිකත් පමණ වැඩිවූ ගුවන් ප්‍රවේශ පත් ගාස්තු සහ අනෙකුත් වැය පාර්ශවය සළකා බලා සංශෝධනය කර අය කිරීමට නියමිත චාරිකා මුළු මුදල යථා කාලයේදී සෑම පසළොස්වක පොහොය දිනයකදීම බුදු සරණ පුවත්පත මගින් ඔබ වෙත දැනුම් දෙන්නෙමු. අපගේ 143 වෙනි දඹදිව වන්දනා චාරිකාව 2023 වසරේ අගෝස්තු සහ නොවැම්බර් මස ඇතුළත ආරම්භ කිරීමට සැළසුම් කර තිබේ.

ජීවිතය තණ අග රැඳි පිනි බිඳුවක් සැයි සිතා වැඩි වැඩියෙන් පිං රැස් කර පවතින දුක් කරදර බාධක කම්කටොළු වලින් මිදී නිවන් මග සාක්ෂාත් කර ගන්න.

**ශ්‍රී ලංකා භාරත සංචාරකයෝ තෙල්වත්ත හන්දිය මීගමුව/**
**53ඒ, 4 වන පටුමග, ගොඩගේ මාවත, අනුරාධපුර.**
**ටෙලි. 0777-876241/ 070-3829009/025-2222392**





# 99 වන දඹදිව චාරිකාව

**මාලබේ විමල් ට්‍රැවල්ස් සමග 2023 මාර්තු මැද**
**(ශීතල නැත) A/C බස් එක දින 14 යි.**

පිරිස 35 යි. ගුවන් යානයෙන් දිල්ලියටම ආපසු දිල්ලියේ සිට ගුවනින් සංකස්ස, සැවැත්නුවර කපිලවස්තුව, නේපාල ලුම්බිනිය, කුෂිනාරා, විශාලා, බුද්ධගයා, රජගහ, කොසඹෑනුවර, බැරණෑස, අග්‍රා

**සම්පූර්ණ වියදම රු. 235,000/- යි.**

මිල වැඩිවීම ගැන බලවත් කණගාටුව වෙනදමෙන් සියලු විස්තර කියා දී වන්දන්නේ මමමයි.
නයනා සියලුම සුභසාධන සලසයි.
ඉතා සුරක්ෂිතයි, හොඳින් වන්දනා කර ගැනීමට අඩුම පිරිසක් (35) අප හා එකතු වන්න.

**ළඟම දිනවල විස්තර අසා දැනගෙන ස්ථිර උනොත් ඔබ දිනුම් !**

**සංවිධායකවරු,**
**විශ්‍රාමලත් විදුහල්පති ශාස්ත්‍රපති විමලරත්න කොහොඹන්**
**නයනා මුතුකුමාරණ,**
**විමල් ට්‍රැවල්ස්, 865/2, සුසිතපුර, මාලබේ.**
**0112762039, 0770185807**

# සංස්කෘතික උරුමයට ජීවය ලබා දෙන වයඹ සත්කෝරළයේ බෞද්ධ කලා මංගල්ලය

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නායක අග්ග මහා පණ්ඩිත
අතිපූජ්‍ය මකුලෑවේ විමල මහා නාහිමි



මීට දශක තුනකට පමණ පෙර චාම් ලෙස ඇරඹි ඇස්සැද්දුම ශ්‍රී ශාසනාලංකාර මහා විහාරස්ථ දුරුතු පෙරහර ක්‍රමයෙන් වැඩි දියුණු වෙමින් අද වන විට ඉතාම දර්ශනීය පෙරහරක් බවට පත්ව ඇති බව සතුටින් සඳහන් කළ හැකි ය. එම පෙරහර මෙම වසරේත් ජනවාරි 27 දින පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බව දැන ගන්නට ලැබීමෙන් ඉමහත් සතුටට පත්වීමි.

පනස් තුන්වැනි ජන්ම දිනය ද සමරමින් 28 වැනි වරටත් කුලියාපිටිය දුරුතු මහා පෙරහර පවත්වන ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ පරියත්ති ලේඛකාධිකාරි ශාස්ත්‍රපති පූජ්‍යතර පල්ලේකාගම රතනභාරතී ස්ථවිරපාදයන් වහන්සේ පුරාතන සිංහල පෙරහර සංස්කෘතික උරුමයට ජීවය ලබා දෙන වයඹ සත්කෝරලයේ බෞද්ධ කලා මහා මංගල්‍යය වූ කුලියාපිටිය දුරුතු මහා පෙරහරේ පුරෝගාමියාණෝ වෙති.

තම ගුරුදේවයන් වහන්සේ වන මහාචාර්ය අතිපූජ්‍ය කබලෑවේ පියබාරති අනුනායක මහා ස්වාමිපාදයන් වහන්සේ "සංඝමිත්තා" පෙරහර නමින් ආරම්භ කළ පුංචි පෙරහර අද මහියංගණය, කැලණිය, ගංගාරාම පෙරහර ආදී මහා පෙරහර මංගල්‍යයන් මෙන් වයඹට ද මහ පෙරහරක් ලෙස දායාද කිරීමට පල්ලේකාගම රතනභාරති ස්ථවිර පාදයන් වහන්සේ සමත් ව සිටිති.

අප නිකායික පිළිවෙත් ආරක්ෂා කරගෙන තරුණ භික්ෂුවක් ලෙස ප්‍රශංසනීය ආගමික, ජාතික, සාමාජික මෙහෙවරක් සිදු කරන අපේ රතනභාරති ස්ථවිරපාදයන් වහන්සේ නිකාය තුළින් ද පැවරෙන රාජකාරි නිසි අයුරින් ඉටු කිරීම ද සතුටට කරුණකි.

මෙවර 28 වැනි වරට පැවැත්වෙන මෙම දුරුතු පෙරහර තවත් චිරාත් කාලයක් අඛන්ඩව පවත්වාගෙන යෑම සඳහා පල්ලේකාගම රතනභාරති ස්ථවිරපාදයන් වහන්සේට හා පෙරහර සංවිධාන කමිටුවේ සියලු සාමාජිකයන් වෙත ශක්තිය ධෛර්යය වාසනාව ලැබේවා'යි ප්‍රාර්ථනා කරම්හ.

# බෞද්ධ සංකල්ප ප්‍රායෝගික කරවීම මහඟු ආදර්ශයක්

දියවඩන නිලමේ
ප්‍රදීප් නිලංග දෑල



කුලියාපිටිය දුරුතු මහා පෙරහර වෙනුවෙන් සකස් කරනු ලබන සමරු කලාපය සඳහා සුභපැතුම් පණිවිඩයක් ලබාදීමට හැකිවීම අතිශය සතුටට කාරණයකි.

වර්තමාන විහාරාධිපති ධුරය හොබවන ශාස්ත්‍රපති පල්ලේකාගම රතනභාරතී නාහිමියෝ ආගමික, සාමාජික හා ප්‍රජා සේවාත්මක වශයෙන් සිදුකරගෙන යනු ලබන සිය ශාසනික කාර්යභාරය අවිච්ඡින්නව පවත්වාගෙන යාම ගැන සමස්ත බෞද්ධ ජනතාවගේ ම කෘතවේදීත්වය විහාරාධිපති ස්වාමීන්ද්‍රයන් වහන්සේට හිමි විය යුතු ය.

ප්‍රදේශවාසීන් ඇතුළු රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල ද, දානපතියන් සහ අවට ආගමික සිද්ධස්ථානවල ද සහභාගීත්වය ලබාගෙන පෙරහර කටයුතු සංවිධානය කිරීමෙන් අප නායක හිමියන් ගම සහ පන්සල එකට යා විය යුතු ය යන බෞද්ධ සංකල්පය ප්‍රායෝගික කරවීම රටේ සෑම බෞද්ධ විහාරස්ථානයකට ම මහඟු ආදර්ශයක් යැයි මම විශ්වාස කරමි.

මෙම අසිරිමත් පෙරහර වඩාත් උත්කර්ෂවත් අයුරින් පවත්වා ගැනීමට ගරුතර නායක හිමියන් ඇතුළු සියලුම දායක කාරකාදීන්ට ශ්‍රී දළදා සමිඳුන්ගේ ආශිර්වාදය ලැබේවා'යි මම ප්‍රාර්ථනා කරමි.







# කුලියාපිටිය අස්සැද්දුම ශ්‍රී බුද්ධ ශාසනාලංකාර මූල මහා විහාරස්ථ දුරුතු මහා පෙරහර

ශ්‍රී ලාංකික ජනතාවගේ චිරාගත සංස්කෘතික අගයන් අතර බෞද්ධ පෙරහරට හිමිවන්නේ අති විශේෂ ස්ථානයකි. මහින්දාගමනයත් සමඟ මෙරට ජනතාවගේ දිවි පෙවෙතේ විශාල පරිවර්තනයක් ඇති විය. බෞද්ධ දර්ශනයට අනුව හැඩගැසුණු ජන ජීවිතයේ සෑම කාර්යයක් ම බෞද්ධ ඉගැන්වීම්වලට අනුව සිදුවිය. එයින් බෞද්ධ ශිෂ්ටසම්පන්න සමාජයක් ගොඩනැගුණු අතර විනෝදාස්වාදය සඳහා උපයෝගී කර ගත්තේ බෞද්ධ උරුම තුළින් ගොඩනැගුණු කලාත්මක අංග සමූහයකි.

චිත්‍ර, මූර්ති, කැටයම්, ජනකවි ආදී අංශ කෙරෙහි මෙන් ම විශේෂ අවධානයක් යොමු කළ කලාත්මක අංගයක් වූයේ බෞද්ධ පෙරහර සංස්කෘතිය යි.

නැටුම් කලාව උපයෝගී කර ගනිමින් වර්ණවත් කළ බෞද්ධ පෙරහර ත්‍රිවිධ රත්නයට උපහාර පූජා පිණිසත්, බුදුරජාණන් වහන්සේගේ නවඅරහාදී බුදු ගුණවලටත් බුද්ධ චරිතයටත් උපහාර දැක්වීම සඳහා පවත්වන මහා සංස්කෘතික මංගල්‍යයකි.

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ආදී කර්තෘ හා ප්‍රථම මහානායක පදවිය හෙබවූ අති පූජ්‍ය අඹගහවත්තේ සරණංකර ඉන්ද්‍රසභවර ඤාණසාමි සරණංකර මාහිමිපාණන් වහන්සේගේ සඟ පරපුරෙන් පැවත එන ධූතාංගධාරී උලාංකුලමේ සරණංකර හිමි, ධූතාංගධාරී අතිගරු ශාස්ත්‍රවෙල්ලියේ උපසේන හිමි, ධූතාංගධාරී අතිගරු කට්ටමුරිච්චානේ දීපාලංකාර හිමි, ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙන් පැවත එන අතිපූජ්‍ය මහෝපාධ්‍යාය කට්ටමුරිච්චානේ සිරි සුභාරතී මාහිමිපාණන් වහන්සේ 1926 වර්ෂයේ සිට මෙම කුලියාපිටිය අස්සැද්දුම ශ්‍රී බුද්ධ ශාසනලංකාර මූල මහා විහාරය කේන්ද්‍ර කරගෙන එහි වැඩ විසූ ආරම්භක විහාරාධිපති ස්වාමීන් වහන්සේ විය.

එවකට පැවති ඉංග්‍රීසි ආණ්ඩුවේ විවිධාකාර බාධක හමුවේ පසුනොබා ප්‍රදේශයේ බෞද්ධ ජනතාවගේ අවශ්‍යතාවන් ඉටු කර ගත්, ප්‍රදේශයේ සැදැහැවතුන්ගේ පරිශ්‍රමයෙන් විහාරස්ථානය ගොඩනැඟීමට අප්‍රමාදීව කටයුතු කළ, සීලයත්, ගුණයත්, පරාර්ථචර්යාවත් ආත්මහිත ප්‍රතිපත්ති සාධනයත් එකතැන දිස්වූ අපේ මහෝපාධ්‍යාය කට්ටමුරිච්චානේ සිරි සුභාරතී මාහිමිපාණන් වහන්සේ 1969 වර්ෂයේ දී අපවත් වීමෙන් පසු උන්වහන්සේගේ ශිෂ්‍ය මහාචාර්ය කබලෑවේ පියභාරතී මාහිමිපාණන් වෙත විහාරස්ථානයෙන් සිදුවන අමිල වූ ජාතික ආගමික හා නිකායික සමාජයීය සේවාවන් පැවරුණි.

මෙම විහාරස්ථානය කුඩා පන්සලක් ලෙස 1921 දී ආරම්භ කරනු ලැබිණි. වසරින් වසර විහාරස්ථානය ප්‍රදේශයේ ජනතාවගේ ගෞරවය දිනාගත් වැදගත් පූජනීය ස්ථානයක් බවට පත්විය. මෙම විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ සමයේ ඉතා සරල හා චාම් අයුරින් ආරම්භ කළ සංඝමිත්තා පෙරහර වෙනුවට පසු කාලයේ (වර්තමානයේ) එය ඓතිහාසික කුලියාපිටිය දුරුතු මහා පෙරහර ආරම්භ වීමට හේතු විය.

මෙම පෙරහර ආරම්භ වන්නේ 1994.12.17 වෙනි උඳුවප් පොහොය දිනයේ දී ය. එනම්

මීට වසර 28 කට පෙර ය. ආරම්භ වීමට මුල් වූයේ විහාරස්ථ අනුලා කුළඟන සමිතියේ යෝජනාවක් අනුව එවකට විහාරාධිපති මාහිමිපාණන් වහන්සේගේ අවවාද අනුශාසනා පරිදි ය. ඒ අනුව විහාරස්ථ දායක සභාවට අනුබද්ධ පෙරහර කමිටුවක් පිහිටුවා සංවිධානය කර සරල කුඩා නමුත් සාර්ථක පෙරහරක් පවත්වා තිබේ. මෙහි දී අවට විහාරස්ථාන, සමිති, සංවිධාන හා ප්‍රදේශවාසීන්ගේ උනන්දුව හා කැපවීම ලැබුණු බව විහාර වංසකතාවේ සඳහන් වේ.

ත්‍රිවිධ රත්නය විෂයේ ආමිස පූජාමය පින්කමක් ලෙස සිදු කෙරෙන පෙරහර ආගමික ප්‍රබෝධය, සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම හා සර්ව ආගමික සහජීවනය සඳහා කටයුතු කිරීම, අපගේ ඉපැරණි කලා හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම, වැඩිදියුණු කිරිම හා මතු පරපුරට ඒවා රැකදීම සඳහා කටයුතු කිරීම, ප්‍රදේශයේ ජනතාවට උසස් සංස්කෘතික පෙරහරක් දැකබලා ගැනීමට අවස්ථාව සැලසීම, ප්‍රදේශයේ කලා ශිල්පීන්ගේ දක්ෂතා එළිදැක්වීමට අවස්ථාව සලසා දීම තුළින් ඔවුන්ගේ අනන්‍යතාව ය හා කුසලතා වැඩිදියුණු කිරීම, විහාරස්ථානයේ භෞතික සම්පත් වැඩිදියුණු කරමින් ප්‍රදේශයේ බෞද්ධ පුනර්ජීවනයක් ඇති කිරීම, ගම සහ පන්සල එකට යාවිය යුතු ය යන බෞද්ධ සංකල්පය ප්‍රායෝගික කරවීම රටේ සැම විහාරස්ථානයකටම මහඟු ආදර්ශයක් වීම සඳහා මෙම පෙරහර වාර්ෂිකව පැවැත්වීමේ අරමුණු වේ.

කෙසේ නමුත් වර්ෂ 100කට වඩා පැරැණි මෙම විහාරස්ථානයේ විහාරස්ථ දායක සභාව, හා කුළඟන සමිතිය, විහාරස්ථ දුරුතු මහා පෙරහර කමිටුව සමඟ එකමුතු ව විහාරස්ථ සමිති සමාගම් සංවිධාන සියල්ල ද ඒ ඒ පමණින් දායකත්වය සපයමින් ප්‍රදේශය අවට වෙහෙර විහාරස්ථාන පමණක් නොව මුස්ලිම් හා කතෝලික දේවස්ථාන ද හින්දු ආගමේ භක්තිකයන්ගේ කෝවිල ද ආදී වශයෙන් ආගමික එකමුතුව ද රාජ්‍ය අනුග්‍රහය, වයඹ පළාත් සභාවේ අනුග්‍රහය හා නගරයේ මූල්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන, ප්‍රදේශයේ පාසල් හා පුද්ගලික ආයතන සහ දානපතියන් ආදී වශයෙන් පුළුල් මහජන දායකත්වයක් හා සහභාගිත්වයක් ඇතුව මෙම ඓතිහාසික කුලියාපිටිය දුරුතු මහා පෙරහර 28 වැනි වරට පැවැත්වෙන්නේ ජනවාරි 27 වැනි දා ය.

**අයි.එම්.ඩී.ඉලංකෝන්**
**(දායක සභාව සහ දුරුතු පෙරහර කමිටුව)**



# බුද්ධාදී සූවිසි ගුණ බලයෙන් සියලු රැකවරණ වේවා

කුලියාපිටිය අස්සැද්දුම ශ්‍රී බුද්ධ ශාසනාලංකාර
මූල මහා විහාරයේ
විහාරාධිපති හා ප්‍රධාන අනුශාසක පරියත්ති ලේඛකාධිකාරි
ශාස්ත්‍රපති පල්ලේකාගම රතනභාරතී නාහිමි



බුදු දහමේ ආභාසයෙන් මෙරටට උරුම වූ කලා ශිල්ප අතර පෙරහර සඳහා හිමිවන්නේ සුවිශේෂි ස්ථානයකි. සංඝ මිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ වැඩම කරවූ තැන් පටන් ඒ සඳහා විවිධ පුද පූජා, පෙරහර පැවැත්වූවා සේ ම ශ්‍රීමත් දළදා වහන්සේ වැඩම කරවූ අවස්ථාවේ සිට ඒ සඳහා ද ඊටත් වඩා උසස් අයුරින් පුද පූජා හා පෙරහර පවත්වන ලදී. පසු කල දළදා වහන්සේ ලක්දිව රාජ්‍ය සංකේතය ද වූහ.

වංසකතා තොරතුරුවලට අනුව දළදා පෙරහර ආරම්භ වී ඇත්තේ ක්‍රි.ව. 4 වන සියවසේ දී ය. කිත්සිරිමෙවන් රජ දවස රාජකීය දළදා මැදුරේ සිට අභයගිරි විහාරයට දළදා වහන්සේ පෙරහරින් වැඩම කරවා පුද පූජා පවත්වා ඒ සඳහා පුද පූජා විධි නියම කළ බව ද සඳහන් වේ. එතැන් සිට දළදා වහන්සේ අරමුණු කරගෙන වාර්ෂිකව පෙරහර පැවැත්වීම සිදු කළ බව ඉතිහාස තොරතුරුවල සඳහන් වේ.

වර්තමානය වන විට මහනුවර ඇසළ පෙරහරට අමතරව ලක්දිව විවිධ ඓතිහාසික සිද්ධස්ථානවල පළාත් මට්ටමින් විවිධ විහාරස්ථානවල ද, වාර්ෂිකව පෙරහර පැවැත්වීම අප රටේ සම්ප්‍රදායක් බවට පත්ව ඇත. ඒ අතරට වයඹ සත්කෝරලය කේන්ද්‍ර කරගෙන "කුලියාපිටිය ඇස්සැද්දුම ශ්‍රී බුද්ධ ශාසනාලංකාර මූල මහා විහාරීය, ඓතිහාසික කුලියාපිටිය දුරුතු මහා පෙරහර" එක් වී තිබීම ද අතිශයින් අගය කළ යුතු ය.

වාර්ෂිකව පවත්වනු ලබන ඓතිහාසික කුලියාපිටිය දුරුතු මහ පෙරහර 28 වන වරටත්, 2023 ජනවාරි මස 27 වන දින මහා විහාරවංශික ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නායක අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය මකුලෑවේ විමලාභිධාන මාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රදේශයේ සම්භාවනීය මහා සංඝරත්නයේ ද, අන්‍ය ආගමික පූජ්‍ය ප්‍රසාදීන් වහන්සේලාගේ ද, ප්‍රදේශයේ දේශපාලන අධිකාරියේ ප්‍රධානීන්ද ආයතන ප්‍රධානීන් ඇතුළු සම්භාවනීය අමුත්තන්ගේ සහභාගිත්වයෙන් මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ මියන් රාජා මංගල හස්තියා මත සධාතුක කරඬුව තැන්පත් කිරීමෙන් පසු පෙරහර වීථි සංචාරය කෙරේ. එය සාර්ථක කර ගැනීම සඳහා ඔබ සැමගේ දායකත්වය ශාසන දයාවෙන් අපේක්ෂා කරමු.

බුද්ධාදී සූවිසි ගුණ බලයෙන්, සිරි දළදා වහන්සේගේ ආශිර්වාදයෙන් ජය ශ්‍රී මහා බෝ හාමුදුරුවන්ගේ පිහිටෙන් වර්තමානයේ මේ රටේ ඇති වී තිබෙන විවිධ වූ අර්බුද හා උවදුරු දුරු වී ලැබුණා වූ නව වසර නීරෝගිමත් හා සමෘද්ධිමත් වසරක් වේවා'යි ප්‍රාර්ථනා කරමි.









බුදුසරණ

# මෙත් සිත් අරණ අන්තර්ජාල විකාශය ඇරඹුණ වගයි

බුදුදහම නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් නූතන ලෝකයට ලබා දීමට කටයුතු කිරීම ඉතාමත් කාලෝචිත ක්‍රියාවක් බව කොළඹ ශ්‍රී සම්බුද්ධාලෝක විහාරස්ථාන ප්‍රමුඛ චතුර් විහාරස්ථානාධිපති පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයේ හිටපු මහෝපාධ්‍යාය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඉත්තදෙමළියේ ඉන්දසර නාහිමියෝ පැවසූහ. උන්වහන්සේ මේ බව ප්‍රකාශ කළේ ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ බුදුසරණ "මෙත් සිත් අරණ" අන්තර්ජාල විකාශය ආරම්භ කිරීමේ අවස්ථාවට එක්වෙමිනි.

ලේක්හවුස් ආයතනය අන්තර්ජාලයේ සුවිශේෂී කඩඉමක් පසුකරමින් "මෙත් සිත් අරණ" යූ ටියුබ් නාළිකාව සහ ටික් ටොක් මාධ්‍යයට එක් කිරීම මහා සංඝරත්නයේ ආශිර්වාද මැද පසුගියදා සිදු කෙරිණි.

මාස කිහිපයක් පුරා සිදුකරන ලද අත්හදා බැලීම් ඉතා සාර්ථක වීමත්, බොහෝ ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීමත් නිසා බුදුසරණ "මෙත් සිත් අරණ" අන්තර්ජාල විකාශය ආරම්භ කෙරිණි. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඉත්තදෙමළියේ ඉන්දසර නාහිමියෝ මෙසේ ද පැවසූහ.

ලේක්හවුස් ආයතනයේ ආදි කර්තෘ ඩී.ආර්. විජයවර්ධන මැතිතුමන් මෙම ආයතනය ආරම්භ කළේ අරමුණු රැසක් පෙරදැරිවයි. බෞද්ධ පවුල් පසුබිමකින් පැමිණුනු එතුමා අපේ භාෂාව, සංස්කෘතිය , සභ්‍යත්වය ආදි මේ සියලු දේ ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පුවත්පත් මුද්‍රණ කර බුදුදහම ප්‍රචළිත කිරීම සඳහා වැඩි නැඹුරුවක් දැක්වූවා. එතුමා ඒ අරමුණ පෙරදැරිව බුදුසරණ පුවත්පත ආරම්භ කළා. එය වසර ගණනාවක් පුරා බෞද්ධයන් අතර ප්‍රචළිත විශ්වාසය දිනා ගත් පුවත්පතක්. බෞද්ධ විශ්ව කෝෂයක්.




ලේක්හවුස් ආයතනය මේ උතුම් සද්කාර්යය වර්ෂ ගණනාවක් මුළුල්ලේ සිදුකරමින් සිටිනවා.

නූතන ලෝකයේ අවශ්‍යතාව පිළිබඳ මනා දැනුමක් තිබෙන ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, ලේක්හවුස් සභාපති අනූෂ පැල්පිට මහතාත්, කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ සිසිර පරණතන්ත්‍රි මහතාත් නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් බුදුදහම මේ ආකාරයෙන් ප්‍රචළිත කිරීමට කටයුතු කිරීම ඉතාමත් කාලෝචිත ක්‍රියාවක් හැටියට අපි දකිනවා.

මෙම අවස්ථාවට සහභාගි වූ අනුරාධපුර පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය පාතේගම ඤාණිස්සර නාහිමියෝ මෙසේ අදහස් දැක්වූහ.

වර්තමාන සමාජයේ සන්නිවේදන මාධ්‍ය අතර පුවත්පතට වඩා තාක්ෂණික සන්නිවේදන මාධ්‍ය ඉදිරියෙන් සිටිනවා. සමාජ විපරිනාමයත් සමඟ ඇතිවන්නා වූ නව ක්‍රම අනුව අපේ සමාජයට ධර්ම සන්නිවේදන විධි ක්‍රම අවශ්‍ය වෙලා තිබෙන කාලයක්.

"තථාගතප්ප වේදිතෝ ධම්ම විනයෝ ඉධකෝ
විරෝචතී නෝපටිච්චන්නෝ" කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

තථාගතයන් වහන්සේ දේශනා කළ ශ්‍රී සද්ධර්මය විවෘත වෙන්න, විවෘත වෙන්න, ඒ ධර්මයට අනුගතව මිනිසුන් ජීවත් වෙන්න, ජීවත් වෙන්න, ධර්මයේ ආලෝකය ප්‍රභාවය මතුවෙනවා කියන එකයි ඒ පාලි පාඨයේ තේරුම.

මේ නව ධර්ම සන්නිවේදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම ලේක්හවුස් ආයතනයේ නවමු අත්දැකීමක්.

මේ අන්තර්ජාල වැඩසටහන සියලු දෙනාගේම සහයෝගය ඇතිව ඉතාම සාර්ථකව ඉෂ්ට සිද්ධ කරන්න කියන දේ මම සියලු දෙනාටම මේ මොහොතේදී මතක් කරනවා. එහිදී දේශපාලන ක්ෂේත්‍රයේත්, සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේත් බොහෝ අත්දැකීම් තිබෙන ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, ලේක්හවුස් සභාපති අනූෂ පැල්පිට මහතාගේත්, ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ මහා අත්දැකීම් සම්භාරයක් තිබෙන කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ සිසිර පරණතන්ත්‍රී මහතාගේත් අවවාද අනුශාසනා ලබාගෙන මේ අන්තර්ජාල වැඩසටහන කරගෙන යාමේ අවශ්‍යතාව මම දකිනවා.

මෙම අවස්ථාවට එක්වූ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සභාපති අනූෂ පැල්පිට මහතා දැක්වූ අදහස් මෙසේය

බුදුසරණ පුවත්පත 1965 දී ආරම්භ කළ පුවත්පතක්. පසුගිය පාලනාධිකාරිය විසින් ඇති වී තිබූ කඩදාසි ප්‍රශ්නය නිසා සතිපතා මුද්‍රණය කළ පුවත්පත් පහක් මාසිකව නිකුත් කිරීමට තීරණය කළා. මම එහි වැරැද්දක් දකින්නේ නැහැ. නමුත් ලබන වසරේ සිට බුදුසරණ පුවත්පත සතර පෝයටම මුද්‍රණය කිරීමේ මගේ ආශාවක් තිබෙනවා. අපි බලනවා ඒක කොහොමද කරන්නේ කියලා.

මම 2007 දී ගුවන්විදුලි සංස්ථාවේ සභාපති ලෙස සේවය කළා. ඒ අවස්ථාවේ දී මම දිනපතා උදේ සවස බණ විකාශනය කිරීමට පටන් ගත්තා. එහිදී මට ලොකු විරෝධයක් ආවා. "මේවා කරන්න පුළුවන් වැඩද?" කියලා. ඇතැම් හැමුදුරුවරු පවා මට කෑ ගැසුවා. නමුත් අද සියලුම චැනල් ඒ ක්‍රමය අනුගමනය කරනවා.

ටික් ටොක් කිව් සැණින් අපේ මතකයට එන්නේ මහා ජුගුප්සාජනක හැඟීමක්. නමුත් අපට ඒ තාක්ෂණය යහපත් දේ සඳහා පාවිච්චි කරන්න පුළුවන්. සිංහල භාෂාවෙන් දේශනා කර තිබෙන ධර්මය ඉංග්‍රීසි,දෙමළ භාෂා මඟින් ද අන්තර්ජාලයට එක් කරන්න පුළුවන්.

රැකියාවෙන් විශ්‍රාම ගිය අයකුට දවසකට පැය හතරක් පහක් විවේකය තියෙනවා. නමුත් කාර්ය බහුල අයට එවැනි නිදහසක් නැහැ.නමුත් බුදු දහමේ ඉතාමත් නිවැරැදි පණිවිඩයක් ඔළුවට දාගන්න විනාඩි දෙකතුනක් ප්‍රමාණවත්. ඒ අවස්ථාව තමයි මේ නිර්මාණය කර තිබෙන්නේ.

අපේ ආදි කර්තෘ ඩී.ආර්.විජයවර්ධන මැතිතුමා බෞද්ධ පරිසරයකින් ආපු නායකයෙක්. අපට ලොකු වගකීමක් තියෙනවා ඒ බෞද්ධකම ආරක්ෂා කර ගන්නට. මේ රටේ අනෙකුත් ජාතීන්ට තමන්ගේ අයිතිය ලබා දෙන ගමන්ම සිංහල බෞද්ධකම ආරක්ෂා කරගෙන ඉදිරියට යන්නට අවශ්‍යයි.

අද ආරම්භ කළ මෙත් සිත් අරණ අන්තර්ජාල විකාශය ව්‍යාපාරික පරමාර්ථයෙන් තොරව සමාජ සේවාවක් සිදු කිරීමේ පරමාර්ථයෙන් සිදුකරන්නක් නිසා එය සාර්ථක වේවා'යි මම ප්‍රාර්ථනා කරනවා.

සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ සිසිර පරණතන්ත්‍රි, මූල්‍ය අධ්‍යක්ෂ මහාචාර්ය හරේන්ද්‍ර කාරියවසම්, සාමාන්‍යාධිකාරි සුමිත් කොතලාවල, රාජ්‍ය සබඳතා ප්‍රධානී හා කළමනාකරණ කර්තෘ සමන්ත කරුණාසේකර, බුදුසරණ කර්තෘ රමණී සුබසිංහ, නියෝජ්‍ය කර්තෘ හේමමාලා රන්දුනු යන මහත්ම මහත්මීන් මෙන්ම ආයතනයේ නිලධාරීන්, කර්තෘ මණ්ඩල සාමාජික සාමාජිකාවන් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

**රක්ෂණ ශ්‍රියන්ත**

**ඡායාරූපය – සුදත් නිශාන්ත**

# බෞද්ධාලෝක පදනමේ ප්‍රථම වාර්ෂික මහා සභා රැස්වීම

ජාතික, ආගමික, සමාජයීය සුභ සාධන සේවාවන් සිදු කිරීම සඳහා ඒ වෙනුවෙන් උනන්දුවක් දක්වන විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීනයන් ඒකරාශී කරමින්, ආයතනයක් ලෙස ක්‍රියා කිරීම පරමාර්ථ කර ගනිමින් බෞද්ධාලෝක පදනම 2020 ඔක්තෝබර් 03 ආරම්භ කර ඇත. එහි සාමාජිකයින්ගේ ප්‍රථම වාර්ෂික මහා සභා රැස්වීම පසුගිය දා බෞද්ධාලෝක පදනමේ සභාපති ජගත් සුමතිපාල මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙම අවස්ථාවට සද්ධර්ම කීර්ති ශ්‍රී චන්ද්‍රජෝති, දක්ෂිණ ලංකාවේ උප ප්‍රධාන සංඝනායක මහාචාර්ය ඉත්තදෙමලියේ ඉන්ද්‍රසර ස්වාමීන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නය, මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මාලිංග අමරසිංහ, වෛද්‍ය අනුලා විජේසුන්දර මහත්මිය ඇතුලු සාමාජික, සාමාජිකාවෝ සහභාගි වූහ.

**- මහේෂ් සේනාධිර -**



ගම්පහ අස්ගිරි වල්පොල මෙහෙණින් වහන්සේ නමකට

**කුටියක් ඉදිකර ගැනීමට ඉඩමක් සහ ආධාර උපකාර අවශ්‍යයි.**

076-3751207 / 071-3893426

**ධම්ම උත්තරා මෙහෙණින් වහන්සේ**

---

## සුරක්ෂා නිවහන

දිලිඳු මාපියන් රැකබලා ගැනීමේ වැඩසටහන යටතේ මවක් හෝ පියෙක් කැපකරු දූ දරුවන් ලෙස භාරගෙන ඔවුන්ගේ නිවාස තුළම රැකබලා ගැනීමේ වැඩසටහනට දායක වන්න.

070 1123781, 071 8197445.

---

**අවු. 62 විශ්‍රාමික ගුරුහිමිනමකට වැඩසිටීමට වැසිගිය පිටිසර පන්සලක් හෝ රැකියාවක නියුතු එක් හිමිනමක් පමණක් සිටින පන්සලක් සොයයි.**

076-9488433

---

## වකුගඩුවක් අවශ්‍යයි

B+ හෝ O+

වර්ගයේ වකුගඩුවක් පරිත්‍යාගශීලී අයෙකුගෙන් අවශ්‍යයි.

**0713246313 / 0715524303**

---

**භාවනානුයෝගී හිමිනමකට වැඩසිටීමට කාගෙන්වත් බලපෑම් විරෝධතා නැති වැසිගිය ස්ථානයක් ඇතොත් රාත්‍රී 8.00 ට පසු දන්වන්න. ආගමික කටයුතු සියල්ලම කරදෙමි.**

දු.ක.අ. 071-0409033

---

**අලුත්ගම වැඩිහිටි නිවාසයට නේවාසිකයන් බඳවා ගනු ලැබේ.**

ඇතුළත්වීමේ ගාස්තු නොමැත.

034-2296400 / 0778995369

---

## පෙනීම පූජා කර ගැනීමේ විශේෂ පින්කමක්

සුපින්වත් දුප්පත් විහාරස්ථානයක වැඩසිටින ස්වාමීන් වහන්සේ නමකට ඇස් දෙකට කාච දෙකක් සවිකර ගැනීමේ වටිනා පුණ්‍ය කර්මයට පිංවත් ඔබත් උදව් උපකාරයක් කිරීමට කැමති නම් පහත සඳහන් දුරකථන අංකවලට කතා කර ඇස් දන් දීමේ මෙම උතුම් පිංකමට දායක වන්න.

**දුරකථන අංක**

0274901963/ 0743840502

---

## පිරිවනක

**සිංහල විෂය ඉගැන්වීම**

සඳහා

**පැවිදි ගුරුවරයෙක් අවශ්‍යයි.**

076-1547215

---

## නේවාසික අධ්‍යාපනය

බලගල්ල සරස්වතී පිරිවෙන් අනුබද්ධිත ප්‍රාචීන භාෂෝපකාර උසස් අධ්‍යාපන ආයතනයෙහි නේවාසිකව අධ්‍යාපනය ලැබීමට කැමති පැවිදි/ ගිහි ශිෂ්‍යයන්ට ඉල්ලුම් කළ හැකිය.

**කෘත්‍යාධිකාරී හිමි**

0774498975

---

**හෙයියන්තුඩුව, මාබිම,**

(කැලණිය - බියගම පාර)

**තායි - ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ.**

**පැවිදිවීමට**

**වයස 15-60 අතර (පිරිමි)**

අය භාරකරුවන් සමග පැමිණ හමුවන්න.

**විමසීම් : 0776523441**

---

**පැරණි ආරණ්‍ය සේනාසනයකට බාහිර ප්‍රශ්නවලින් තොර කැපකරු මහතකු අවශ්‍යයි.**

**විමසන්න**

**ගනේගොඩ මහතා**

0728113472 / 0716508227

---

## සාසන මාමක ඇරයුමයි !

බුද්ධ සාසනයට ඇතුළුවීමට කැමති අවු. 15-20 අතර පිංවත් පුතුන්ට සහ බණ භාවනා ප්‍රගුණකළ පිංවත් ස්වාමීන්වහන්සේලාටද කරන ගෞරවනීය ආරාධනාවයි. මනරම් සේනාසනයක හිඳ බණ භාවනාවේ යෙදී උතුම් නිර්වාන මාර්ගය සාක්ෂාත් කර ගැනීමට කැමති අය හා ස්වාමීන්වහන්සේලා අප විහාරස්ථානයේ ගරු නායක ස්වාමීන්වහන්සේලා හා සම්බන්ධවන්න.

**0783388464, 0760016323**

---

## මෙහෙණින් වහන්සේ නමකට කුටියක් සාදා ගැනීමට අවශ්‍යයි.

**පිං කැමති ඔබත් සහයවන්න.**

072-0702746

---

## A හෝ O වර්ගයේ වකුගඩුවක් ඉතා ඉක්මණින් අවශ්‍යයි.

**පරිත්‍යාග කළ හැකි කාරුණික කෙනෙකු වෙතොත් හැකි ඉක්මණින් අමතන්න.**

0777518775/ 0718496425

(බදුල්ල වික්‍රමසිංහ)

---

## මහා පින්

මරණයට කැපවී සිටින දහස් සංඛ්‍යාත අහිංසක සතුන්ට අභය දානය දීමේ මහා පිංකමට ඔබත් දායක වන්න. **"ඔබත්, නිර්මාංශික"** උතුම් බුද්ධ ශ්‍රාවකයෙක් වීමට කැමැති නම් දහම් පත් නොමිලේ ලබාගන්න.

071-7679254

---

## සෙනෙහස වැඩිහිටි නිවාසය - හොරණ

**දැනට නොමිලේ පවත්වාගෙන යන හොරණ පිහිටි පුණ්‍යායතනයට අසරණ වැඩිහිටියන් සඳහා නේවාසික පහසුකම් ඇත.**

**දානමය කටයුතු සහ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා පිංකැමති ඔබත් දායකවීමට කැමති නම් විස්තර සඳහා අමතන්න.**

**විමසන්න - 071 - 8011656**

---

**ස්වාධීනව වැඩ සිටිය හැකි විහාරස්ථානයක් සහනශීලීව ලබාදීමට කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ඇත.**

**අමතන්න**

077-6657163

---

## නොමිලේ

බුද්ධ ශාසනයට අනුපමේය සේවයක් කළ අපවත් වී වදාළ අතිපූජනීය නා උයනේ අරියධම්ම මහා ස්වාමීන් වහන්සේ දේශනා කළ **පරමාර්ථ ධර්ම ග්‍රන්ථය** ලබාගැනීමට ඔබගේ ලිපිනය පහත සඳහන් ලිපිනයට ලැබෙන්නට සලස්වන්න. මෙම ග්‍රන්ථය විදර්ශනා භාවනා කරන අයට ඉතාමත් යෝග්‍ය ග්‍රන්ථයකි.

**සුමනදාස සෙන්දනායක**

**17/14, ගාමිණී මාවත, මතුගම.**

---

## කඩවත නගරයට ආසන්න

**විශ්‍රාමික වැඩිහිටියන්ට නවාතැන් පහසුකම්.**

**සාධාරණ මිලකට ලබා ගැනීමට විමසන්න.**

0762303375

0718449559

---

## අමිල පිංකමක් . . .

වයස 46 වන මා කිසිම සතෙකුගේ මස් කැමෙත් හා මස් වෙළඳාමෙන් වැළකී පන්සිල් සුරකින පිරිමි අයෙක්මි.

නිවසක් නැති මා හට ඉතා කුඩා ඉඩමක ඉතා කුඩා නිවසක් - එක කාමරයක් සාද දිය හැකි පිංවතෙකු වේ නම් කථා කරන්න. ප්‍රති උපකාර වශයෙන් යහ මග සුගතිය පෙන්වා දෙමි.

**දුරකථනය : 0784294631**

---

## 2023 ඉසිවර දිනපොත

- දවසට පිටුව
- දවස් දෙකට පිටුව
- සතියට පිටු දෙක

**විහාරස්ථාන සඳහාත් වඩාත් සුදුසුයි**

පෝය ලබන ගෙවෙන වේලාවන්, පොහෝ පැවැරුණු පිළිවෙළ, සිංහල අවුරුදු චාරිත්‍ර, ලග්න අයවැය ආදී ජ්‍යෝතිෂ්‍ය කරුණු ද අමාත්‍යාංශ විස්තර ඇතුළු පොදු කරුණු අඩංගු වර්ණ පිටුවලින් සමන්විත වේ.

දිවයින පුරා පොත් සාප්පු මගින් ලබාගත හැකිය.

0771147235, 0112796048, 0112773226

---

**අවුරුදු 47 ක ගුරුවරියක් සඳහා**

**B+,B-, O+,O- වර්ගයේ වකුගඩුවක් හැකි ඉක්මනින් අවශ්‍යයි.**

පරිත්‍යාගශීලී අයෙකු ඇත්නම් කරුණාකර පහත දුරකථන අංක වලට අමතන්න.

072 4608911

071 3735782

---

**අලුතින් ගොඩනගන ලද සිල්මෑණියන් වහන්සේගේ ආරාමයේ කුටියක් සාදා දීමට හැකි පිංවතුන්**

කාරුණිකව දැනුම් දෙන්න.

**072 - 3148836**

---

## වැසී ඇති විහාරස්ථානයක්, කුටියක් හෝ නිවසක්

අපවත් වන තෙක් වැඩ සිටීමට ලබාදීමට හැකිනම් නිවසක් තනාගැනීමට උපකාර කළ හැකි පිංවත් ස්වාමීන් වහන්සේ නමක් හෝ පිංවතුන් කථා කරන්න.

**0711736138**

---

## විහාරස්ථානයක

**නිවේදන, ගිණුම් කටයුතු, ලිපිකරු සේවයට දැනුමැති විශ්‍රාමික සුරාවෙන් දුම්පානයෙන් තොර අය අමතන්න.**

0703085555

---

## ඉඳුම් හිටුම් තිබේ

සුන්දර මාවක් ඔයට මායිම්වූ නිස්කලංක පරිසරයක පිහිටි

**වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථානය**

**ඔබගේ මව / පියාට සුවපහසු නවාතැන් ඇත.**

විශ්‍රාමිකයින් සඳහා විශේෂයි.
ටයිල් ඇතිරූ යාබද නාන කාමර,
උණු වතුර ඇතුළු
සියලු පහසුකම් සහිතයි.

**දේශීය හා විදේශීය සංචාර සඳහාද අමතන්න.**

307, මාපුටුගල, හඳපාන්ගොඩ.

011-3458842, 071-4059199,

070-6962550

---

## කාරුණික ඉල්ලීමයි!

**ඕ පොසිටිව් මවට (O+) හෝ ඕ නෙගටිව් (O-) වකුගඩුවක් අවශ්‍ය කර තිබේ.**

**පරිත්‍යාග කිරීමට කැමති පිංවත් මහත්මයෙකු/ මහත්මියක වෙතොත් කරුණාකර පහත දුරකථන අංකයන්ට ඇමතුමක් ලබා දෙනමෙන් ඉල්ලා සිටින්නෙමු.**

0777-201666 (ප්‍රදීප්)

0766-468432 (සිසිර)

මෙම දාන පාරමිතාව පූර්ණය වනු පිණිස ඉදිරිපත් වන පුණ්‍යවන්තයෙකු හට උපකාරයක් කළ හැක.

---

## පැවිදි කිරීමට දරුවන් වැඩිහිටියන්

කුරුණෑගල මැල්සිරිපුර සියම් නිකායට අයත් විහාරස්ථානයක පැවිදි කිරීමට කුල දරුවන් දෙදෙනෙක් සහ වැඩිහිටියෙක් අවශ්‍ය වී ඇත.

**පූජ්‍ය දම්බරාවේ ධම්මාලංකාර හිමි**

**පොල්කටුව විහාරස්ථානය, මඩහපොළ.**

---

## පැවිදි වීමට කැමති අවුරුදු 15 ට වැඩි කුල දරුවන් සොයමි.

**අමතන්න**

0768649192

# සිත දවා හළු කරන කෙලෙස් ගින්නක අරුමය

**රාගය ගින්නක් හා සාමාන ය. එහෙත් අප දන්නා ගින්නට වඩා එය බෙහෙවින් වෙනස් ය.**

සාමාන්‍ය ගින්නක දී ගිනිදැල් දුම හා පිළිස්සෙන විට අඟුරු ද දැකගත හැකි ය. කෙනකුගේ සිතේ හට ගන්නා රාග ගින්නෙහි එවැනි දෑ දකින්නට නැත. එහෙත් සිත දැවෙන විට දැනෙන වේදනාව හා එහි ඇති නොඉවසිය හැකි බව මුළු ශරීරයට ම දැනෙනු ඇත.



රාගය නමැති ගින්නෙන් පුළුස්සා විනාශ කර දමන්නේ මනුෂ්‍ය ජීවිතයක ඇති යහපත් ගුණයයි. එහිදී සීලය ප්‍රධාන ය. බවුන් වඩන තවුසන්ගේ සමාධිය පවා රාගයෙන් විනාශ කොට දමා ඇති බව ධර්මයෙහි සඳහන් වේ.

ඒ වගේ ම ධ්‍යාන ලබා සෘද්ධි බල ලැබූ තවුසෝ ද රාගය නිසා එයින් පිරිහී ගියහ.

**නත්ථි රාගසමො අග්ගි –**
**නත්ථි දොසසමො ගහො**
**නත්ථි මොහසමං ජාලං –**
**නත්ථි තණ්හාසමා නදී**

රාගයට සමාන ගින්නක් නැත. තරහව, ද්වේෂය කරයි විපතක්. මෝහය දැලකි. ලෝකයේ සැබෑව නොපෙනෙන තණ්හාව නිමාවක් නැති නදියකි.

යම් අරමුණක් අපගේ සිතට ගැටුණු විට සිත ඒ අරමුණ ලෝභයෙන් අල්ලා ගන්නේ නම්, එහි බැඳීම් හෙවත් උපාදානය හට ගනී. ඉන් අනතුරුව ඒ බැඳුණු අරමුණ සමඟ එකතු වී ඇස, කන, නාසය, දිව, ශරීරය ඔස්සේ රස විඳීමට සිත වෙහෙසෙයි. මේ වෙහෙසීම කාම තෘෂ්ණාවයි.

මේ ආකාරයෙන් විස්තර කරන "රාගය" බොහෝ අවස්ථාවක පහළ වන්නේ සවිඤ්ඤානික වස්තූන් මුල් කරගෙන ය. නිදසුනක් ගෙන බලමු. යම් පුරුෂයකුගේ සිතෙහි කාන්තාවක් කෙරෙහි ඇති වන රස තෘෂ්ණාව "රාගය" ලෙස විස්තර කෙරේ.

ඒ වගේ ම කාන්තාවකගේ සිතෙහි පුරුෂයෙක් පිළිබඳ පහළ වන රස තෘෂ්ණාව ද එවැනි ම සිතිවිල්ලකි. එලෙස රාගයෙන් දැවෙන විට මව් පදවිය, පිය පදවිය, ස්වාමි දියණි, ස්වාමි පුත්‍ර, සොහොයුරෙක්, සොහොයුරියක් බව ද අමතක වෙනවා. ඒ වගේ ම තමා මනුෂ්‍යයකු බව ද අමතක විය හැකි ය.

ඒ වගේ ම යම් කෙනෙක් රට තුළ, සමාජය තුළ ගෞරවයෙන් සැලකෙන අයෙක් වුව ද මේ රාග සිතිවිල්ල පාලනය කර ගත නොහැකි වුවහොත් ඒ පාලනයක් නැති රාගය විසින් ඇයගේ හෝ ඔහුගේ සියලු හොඳ ගුණයන් හා එම ගුණ හා බැඳී පවත්නා සම්මාන, කීර්ති, ප්‍රශංසා ද පිළිස්සී විනාශ වෙනු ඇත.

සාමාන්‍යයෙන් හටගන්නා ගින්නකට කිසිදු වෙනසක් නැතිව හසුවන්නේ කුමක්ද, ඒ සියල්ලම පුළුස්සා දමන්නාක් මෙන් රාග ගින්නට ද "හොඳ නරක" කිසිවක් නොදැනේ. සියල්ල විනාශ කර දමයි.

යම් තැනක පිය කෙනකුගේ සිත තම දියණියන්ට කරදර කරන්නට නැමුණේ ද ඒ නිසා ය. තම මවටත් වඩා වැඩිහිටි මව් කෙනකුට කරදර කරන්නට රාග, සිත තරුණයකුගේ පොළඹවන්නේ ද ඒ නිසා ය.

තරහව හෙවත් ව්‍යාපාදය ද මනුෂ්‍ය සන්තානය අයහපතෙහි ම යෙදවීමට සමත් වෙයි. තරහව ඉතා ඉක්මණින් මනුෂ්‍ය සිත විනිවිද ගොස් සියලු ගුණ මකා දමයි. "ඔබට තරහ ආවාම මොකවත් පේන්නේ , දැනෙන්නේ නැහැ" යැයි පවසනු අසා ඇත.

කරුණාව හා මෛත්‍රිය වැනි කුසල අරමුණක් සමඟ චේතනාවක් පහළවීමට වඩා වැඩි වේගයකින් ව්‍යාපාදය නැතිනම් තරහව සිතට පැමිණේ. ඒ වගේ ම සිතට දැනේනට පටන් ගනී.

තරහව පැමිණි විට යම් මනුෂ්‍යයකු "අමනුෂ්‍යයකු මෙන් හැසිරෙනු ඔබ දැක ඇත."

ඒ වගේ ම තවත් සමහරු පවසන්නේ "මට යකා ආරූඪ වුණා" යනුවෙනි. එහි භයානක බව ඔබට දැනෙනු ඇත.

මෝහය හෙවත් ලෝකයෙහි පවතින්නා වූ සියල්ලෙහිම අස්ථිර බව නොදැනීම, නොදැකීම හෝ අමතක කිරීම දුකට හා විපතට හේතුවකි. යමක් ඇතිවීම මෙන් ම නැතිවීම හෙවත් විනාශයට යෑම සෑම වස්තුවකම ගැබ්ව ඇති මූලිකම සිද්ධාන්තයයි.

මේ කරුණ අමතක වීමෙන් හෝ අමතක කිරීමෙන් සිදුවන්නේ තමා සතු කරගත් දේ එහි සැබෑ ස්වභාවයම අනුව වෙනස් වී යන විට හැඬීමට හා දුකට පත්වීමයි. බොහෝ ලෞකික වස්තූන් අල්ලා ගැනීමට මෙන් ම තමන් සතු කර ගැනීමේ දී දුක් විපත්වලට මුහුණදීමට සිදුවේ.

අපි අපගේ ම ශරීරය කොපමණ නම් සෝදා පිරිසුදු කොට සරසවා කෑම,බීම දී පවත්වා ගන්නට උත්සාහ කළත් එහි සැබෑ පාලනයක් අපට නැති බව වැටහෙනවා නේද? ලෙඩ දුක් පැමිණෙන විට හා දිරාගෙන යන විට අපි අපගේ ම ශරීරය නිසා අසරණ බවට පත්වෙමු. මේ නිසා සම්මුතිය හෙවත් ලෝක ව්‍යවහාරය අනුව,

"මම මගේ කියා සිතුවත්, පරමාර්ථ ධර්මය හෙවත් ලොව පවත්නා සැබෑව අනුව මම හා මගේ යනු වචනයක් පමණි.

ගලාගෙන යන ගංගාවක් සේ තණ්හාවේ ද කෙළවරක් හෝ සීමාවක් දකින්නට නැත. ධර්මය පිළිබඳ අවබෝධය මඟින් ඇති කරගත් සිතෙහි පාලනයක් නොවේ නම්, මේ සිතට කොපමණ අරමුණ ලබා දුන්නද සෑහීමකට පත් නොවේ. ජීවිත ගමනේ ඔබ අප කොපමණ නම් ඇස, කන, නාසය, දිව, ශරීරය නම් වූ ඉන්ද්‍රියයන්ගෙන් සිත ඉල්ලා කරදර කළ දෑ දී ඇත් ද? එහෙත් තවමත් මට දැන් ඇතැයි සතුටු වී අවසන් නැත.

නිරතුරුව ම තව තවත් අරමුණු සොයා යමින් හා ගැටෙන අරමුණුවල බැඳෙමින්, තවත් විටෙක අකමැතියි කියමින් අමනාප ඇති කර ගනිමින් සිත කොපමණ නම් පීඩා විඳින්නේ ද? ඒ අතෘප්ති කර තෘෂ්ණාව නිසා බව පැහැදිලියි.

මේ සීමාවක් නැති තෘෂ්ණාවේ අහිතකර හා පීඩාකාරී ප්‍රතිඵල ගැන ඔබට ම සිතෙනු ඇත. ඒ මොනවා ලැබුවත්, කළත් මගේ සිතට නම් සතුටක් නැහැ" යනුවෙනි.

දාන ආදී පාරමී ගුණයන්ගෙන් ම මේ තෘෂ්ණාව තුනී කිරීම හා දුරුකිරීම කළ යුතු ය.

**දීපා පෙරේරා**

---

*දුහුවිලි*
*ටිකක් ගෙන උඩු*
*සුළඟට විසි කරන්න.*
*ක්ෂණයෙන් ඒවා තමන් වෙතම*
*පැමිණෙනවා. අනුන්ට ද්වේෂ*
*නොකරන, වැරැදි නොකරන,*
*පිරිසුදු අයකුට යම් කෙනෙක්*
*අපරාධයක් කළේ නම් එහි විපාක*
*ඔහු වෙත පැමිණෙනවා. හරියට*
*උඩු සුළඟට දැමූ දුහුවිලි ආපසු*
*තමන් වෙතම පැමිණෙනවා*
*වගෙයි.*

---



**මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අධ්‍යාපනය ලබන ශිෂ්‍ය පිරිසට වන්දනා කිරීම සඳහා මෙතෙක් පැවැති අඩුපාඩුවක් සම්පූර්ණ කරමින් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් රෝපණය කිරීම පසුගියදා විදුහල්භූමියේ දී සිදු කෙරිණි. කථිකාචාර්ය ගාල්ලේ ඤාණාලෝක හිමියන් සහ කථිකාචාර්ය ඩී.ආර්. ගමගේ මහත්මියගේ මූලිකත්වයෙන් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ කොටනෙළුවේ පුඤ්ඤනන්ද හිමියන් ඇතුළු මහා සංඝරත්නයේ ආශිර්වාදයෙන් කාර්ය මණ්ඩලය සහ සිසුන්ගේ සහභාගිත්වයෙන් මෙම පින්කම සිදු කෙරිණි.**

---

## මා දුටු ගුරුවරයා

*උගන්නන්න පුළුවන් වුණාට*
*ගුරුවරයෙක් වන එක ලේසි නැහැ.......*
*සැබෑ ගුරුවරයකුට තියෙන්න ඕනේ*
*මහාමේරු පර්වතයක් වගේ*
*දැවැන්ත පෞරුෂත්වයක්*
*හිම කන්දක් වගේ උණු වන හදවතක්*
*කුරුලු පිහාටුවක් වගේ සැහැල්ලු මනසක්*
*දැනුම සොයා යමක්*
*ඒ වාගේම*
*තමන්ගේ වෘත්තිය පිළිබඳ*
*ආඩම්බර වන ........*
*ආදරණීය මිනිසෙක්*
*ඔහු.....*
*ගුරුවරයා නොව......*
*පරිණත......*
*වූ ගුරුතුමා ය.........*

**ඩබ්ලිව්. ඇම්. නිහාල් සෙනෙවිරත්න**
පඤ්ඤලංකාර දහම් පාසල
මාපලාන කඹුරුපිටිය

---

## මගෙ ආදර අම්මා

අඩ සියවසක් ගෙවුණා අම්මේ ඔබ නැතිව
ළඟ ඉන්නවා වාගෙයි මට තවම
ඔබ ගුණ වරුණ සිහිකොට සැමදා මල් පිදුව
තවමත් සිහිවෙනවා ඔබෙ සොඳුරු දිවිමතක

**ඇල්.ජේ.ආනන්දශිලි පෙරේරා**

# පරිහානිය - අපරිහානිය හැදියාවේ හා ශික්ෂණයේ තරමට යි

**තථාගත බුදුදහම තුළ ඇති පරම සැපය, පරමනිෂ්ඨාව වනුයේ නිවන් සැපය ම වේ. වරක් තථාගත සම්බුද්ධෝත්තමයන් වහන්සේ සමඟ චාරිකාවේ වැඩිය 500ක් භික්ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයට බුදුරජාණන් වහන්සේ විඩනතුරු සාකච්ඡා කරමින් සිටියේ චාරිකාවේ විස්තර ය.**

මෙය අසා දැනගත් භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, ඔබලා දැනගත යුත්තේ මේ භෞතික මහපොළොව, කඳු පල්ලම්, පාරවල් ගැන නොව ඔබගේ සිත හා සිත්පරම්පරාව ගැන ය. සුගති දුගති හා ආත්මය යනු කවරේ'දැයි සිය නුවණින් දත යුතු යැයි දහම් දෙසා 500 ම රහත්ඵල පිහිටවූ සේක. (ධම්ම පද ගාථා 44 -45 අටුවා කතා)

තවත් වරෙක දම්සභා මණ්ඩපයට රැස්වූ බොහෝ භික්ෂූන් වහන්සේ මෙවන් අතුරු කතාවක යෙදී සිටියහ. මගධාධිපති සේනිය බිම්බිසාර හා කෝසලාධිපති පසේනදි කොසොල් යන මහරජුන් දෙදෙනාගෙන් වඩා බලවත් කවුරු ද යනුවෙනි.

පාඨක දැනුම සඳහා බලවත් යන්නට අටුවා විස්තර මෙසේ ය. **මහත්ධන :–** පොළොවෙන් සාරාගන්නා රන් ,රිදී, මුතු, මැණික් **මහත් භෝග :–** පරිභෝජනයට මහත් වස්තු තිබීම, **මහා භාණ්ඩාගාර :–** නිතිපතා විශාල ආදායම් ලැබීම **මහත් විජිත :–** දිනාගත් යටත් විජිත ඇති බව **මහත් වාහන :–** ඇත්, අස්, ගවාදී වාහන (එදා) **මහත් බල :–** ඇත්, අස්, රිය, පාබල චතුරංගනී සේනා ඇති බව **මහත් ඍද්ධි :–** තමන් කැමති කැමති දේ ලැබීම ( මෙම ස්වභාවය පූර්ව පුණ්‍ය කර්ම සම්පත් ලෙස සැලකේ) **මහත් අනුභාව :–** දානය – ප්‍රිය වචනය. අත්ථචරියා – සමානාත්මතා යන සතර සංග්‍රහ වස්තූන්ගෙන් ජනයා සතුටු කිරීමයි.

දම් සභා මණ්ඩපයට වැඩි භාග්‍යවතුන් වහන්සේ ඔබලා කවර නම් කථාවකින් යුක්තව හුන්නහු'දැයි කළ විමසීමට ඉහත විස්තර කීහ.

මහණෙනි, ඔබලා ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම ශාසනයට පැමිණි කුල පුත්‍රයෝ ය. රජුගේ දඬුවමකින් බේරීමට, සොරුන්ගේ දඬුවමක් නිසා, ණයකින් බේරීම සඳහා හෝ ජීවත්වීම සඳහා පැවිදි වූවෝ නොවෙති. මෙවැනි කතා නොහොබී, ඔබලා යම් තැනකට රැස්වූවෙහි ද එහිලා ඔබ විසින් දෙකරුණක් කටයුතු ය.

ඒ දැහැමි කථා හෝ ආර්ය වූ තුෂ්ණිම්භාවයයි. (අවබෝධයෙන් නිහඬව සිටීමයි)

මේ භික්ෂූන් වහන්සේට පමණක් නොව ආර්ය මාර්ගයට (සාසන බ්‍රහ්මචරියාවට) පිළිපන් පැවිදි – ගිහි සියල්ලට ම කැප දෙසුමකි.

බෞද්ධ අපි "සියලු සත්ත්වයෝ සුවපත් වේවා"යි යම් අදිටනක් කරයි ද, ඒ තුළ ඇත්තේ තම ගෙදර, තම ඥාතීන්, තම රට, මුළු ලොව පමණක් නොව නව සත්තා වාස හා එක්තිස් ලෝකය පමණක් නොව දස සහශ්‍රී ලෝක ධාතුව ම එහි ඇතුළත් වේ.

ඒ තුළ ජාතියක්, ආගමක්, රටක් සීමා නොවේ. මෙවන් දහමක් අදහනඩි බෞද්ධයන් යැයි කියා ගන්නා මෙරට ඇතැම් පුද්ගලයන්ගේ, මෙරට ආර්ථිකයේ ප්‍රධාන ආදායම් මාර්ගය අපනයනයයි.

ඇතැම් අපනයනකරුවෝ උපයන ආදායමින් අඩකටත් වැඩි ප්‍රමාණයක් මෙරටට නොගෙන්වා විදේශ බැංකුවල පෞද්ගලික සැප විහරණයට තැන්පත් කරති. විදෙස්හි රැකියා කර මුදල් උපයන ඇතැම්හු මෙරටට මුදල් එවන්නෝ මත්කුඩු ලෙසින් ය.

මේ කරුණු තුළින් මේ රට හෝ වෙනත් රටක් භෞතික වශයෙන් සංවර්ධනය වන්නට ඉඩකඩක් ඇත්තේ යැයි සිතිය හැකි ද? මේ එක් අංශුවක් පමණි.

මෙරට ගොවිතැන්, වෙළඳාම්, ආයෝජන ව්‍යාපෘති වුව ද එසේ ම ය. වෙනත් කාටවත් ඇඟිල්ලක් දිගු කිරීමට හෝ බැරි තරමට බොහෝ ජනයා දූෂිත වී ඇත. එහෙයින් සමස්තය ම ආකල්ප වෙනසකට දැඩි තීරණ ගත යුතු ය.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මහත් භික්ෂු පිරිසක් සමඟ චම්පාවෙහි ගග්ගරා පොකුණ තෙර වැඩහුන් සේක.

පෙස්ස නම් ඇත්ගොව්වා කන්දරක පරිබ්‍රාජකයා සමඟ බුදුරජුන් සමීපයට ගොස් වැඳ එකත් පසෙක සිටියහ. කන්දරක මෙසේ කීය.

'ස්වාමීනි. ඔබ වහන්සේ මෙතරම් විශාල ශ්‍රාවකයන් හික්මවන අයුරු පුදුම සහගත ය. අසිරිමත්'ය.

එයට පිළිතුරු දුන් බුදුරජාණන් වහන්සේ කන්දරක, මේ මහත් භික්ෂු පිරිස රහත් ඵලයට හා අනෙක් මඟපලයන්ට පත්වූවෝ ම වෙති. ඔවුහු සතර සතිපට්ඨාන ධර්මයන්හි මනාකොට පිහිටියෝ වෙත්.

එහිදී පෙස්ස ඇත්ගොව් පුත්‍රයා ද ඉදිරිපත්ව

ස්වාමීනි, ගිහි අපිදු සතර සතිපට්ඨානය ඔබ වහන්සේ දෙසූ ආකාරයෙන් මනාකොට පිළිපදින්නට වෙර දරමු. ස්වාමීනි එහෙත් සුදුවත් අඳින්නාවූ අපි අතර සඟවා ගත් අදහස් ඇති, කෙලෙස් කසටින් කිලිටි වූ මිනිස් සමාජයක් පවතිද්දී කෙලෙස ඒ උතුම් දහම් රකින්නෙමු ද?

"පෙස්ස, ඔබ නිවැරැදි ය. මිනිස්සු සඟවා ගත් අදහස් ඇත්තෝ ය සිවුපාවෝ ප්‍රකට ගති ඇත්තෝ ය. ස්වභාවික ගති ප්‍රකට කරන්නෝ ය. උදා :– කොටියා , වලසා නපුරු ය, නරියා කපටි ය. සාවා – මුවා අහිංසක ය, බූරුවා බූරුගති ඇත. මෙහිදී සතර පුද්ගලයෝ පිළිබඳ බණක් ඇසූ දෙදෙනා සතුටු සිත් ඇතිව භාග්‍යවතුන් වහන්සේට වැඳ නික්ම ගියෝ ය. (මජ්ඣිම නිකාය 51 - කන්දරක සූත්‍රය)

මෙලෙස පෞද්ගලික න්‍යායපත්‍ර තම සිතෙහි සඟවාගෙන නිකෙලෙස් පුද්ගලයන් ලෙස සමාජයෙහි, පෙනී සිටින මිනිස් සත්ත්වයා කෙතරම් කුහක වේ ද? මේ රටත්, මෙලොවත් මෙ නිසාම පිරිහෙන්නේ ය. ස්වභාවධර්ම සම්පත්වලින් පිරි අපේ රට වැනි මෙවැනි රටක් ලොව වෙන කොහේ තිබේද? හානිය පිරිහීම ඇත්තේ කුඩා තැන පටන් මහා තැන දක්වා ඇති සිතෙහි සඟවා ගත් කිලිටි ගති ඇති මිනිසුන්ගේ ආධ්‍යාත්මික පිරිහීම තුළ ය.

මරණින් මතු පරලොවක් ඇති බව හා කර්ම පල විශ්වාස කොට ආකල්පමය වශයෙන් අපි වෙනස් විය යුත්තේ වෙමු.

සැවැත්නුවර එක් ගෙහිමියෙක් ඉසුරෙන් පිරී ආඪ්‍යය. ධනයෙන් හා මහත් භෝගයෙන් පිරිපුන් ය. ඒවගේම තෙරුවන කෙරෙහි පැහැදුණු ශ්‍රද්ධාවෙන් ද මහත් වූවෙකි. දිනක් බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ නිවසට කැඳවා මහා දනක් දෙන්නේ ය. එකල්හි රජුට හිදිසියේ ධනය අවශ්‍යතාවක් විය. ඒ අනුව මේ ගෙහිමියා කැඳවාගෙන ඒමට රාජ පුරුෂයකු යැවීය.

"ගෘහපතිය, රජ නුඹ කැඳවයි" යැයි රාජ පුරුෂයා කීවේ ය. ශ්‍රද්ධාවෙන් සිත පුරවා දානය දෙමින් සිටි ඔහු "පුරුෂය, ඔබ යන්න. මම පසුව එන්නෙමි. දැන් මම නිධානයක් තැන්පත් කරමින් සිටින බව රජුට පවසන්න, කියා දානයේ කටයුතුම කළහ.

දන් වළඳා අවසන භුක්තානුමෝදනාව වශයෙන් බුදුන් වහන්සේ දේශනා කරන ලද්දේ ඛුද්දක නිකායෙහි ඛුද්දක පාඨ දේශනාවෙහි 8 වැන්නවූ "නිධිකණ්ඩ" සූත්‍ර දේශනාවයි.

*ධර්මානුකූලව ධනය උපයා ගන්න. නිවැරැදි ලෙස තමන්ගේ පරිහරණයට ගන්න. අවශ්‍ය විටෙක දී උදව්වක්, උපකාරයක් ලෙස අන් අයට ද පරිත්‍යාග කරන්න. සියලු දෙනාගේ ම ප්‍රශංසාවට ලක් ව මරණින් මතු සුගතියට යන්න.*


ජනයාගේ නිධාන තැන්පත් කිරීම ලෙසින් වදාළ මේ සූත්‍ර දේශනාව ගාථා 16කින් සංගෘහිත වන අතර, එයින් ලෞකික පාරලෞකික හා ලෝකෝත්තර අභිවෘද්ධිය ලබා ගත හැක. ලිපියේ මාතෘකාවට පිළිතුරු සපයාගත හැකි, වර්තමානයේ අපේ රටේ පවතින සියලු ගැටලුවලට විසඳුම් සඳහන් වන 6 වැනි ගාථාව පමණක් මෙසේ පැහැදිලි කරගමු.

මතු විපතක දී පිහිටට ගනු පිණිස ජනයා තැන්පත් කරන ධනය නිධාන නම් වෙති. ඒවා සතරාකාර වෙත්. 1.ථාවර නිධානය, (රන්, රිදී, ගොඩ, මඩ ඉඩම්, භූමිගත දේපොළ යනාදිය රැක ගැන්ම) 2.ජංගම නිධානය (ඇත්, ගව, අස්, වෙළඹ, එළු කුකුල්, දැසි දස් ආදීන් ය) 3.අංගසම නිධානය ( සිත, කය නිපුණකොට ලබා ගන්නා ශිල්ප. ශාස්ත්‍ර කර්මාන්ත ආදි විද්‍යා දැනීම්ය) 4. අනුගාමික නිධානය – දාන, ශීල, භාවනා, බණකීම බණ ඇසීම ආදී දසපින් හා දස කුසල්හි යෙදීම වැනි තම ශාස්තෘන්ගේ අනුශාසනා අනුගමනය කිරීම අදහස් කෙරේ. මේ සතර නිධි අතර මුල් 3 ම විශේෂ වන අතර, 4 වැන්න සුවිශේෂ නිධියක් වන්නේ ම ය.

යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ විසින් දානයෙන් (දීමෙන්) ද ශීලයෙන් ද (කය වචන සංවරයෙන්) චිත්ත සංයමයෙන් ද (සමාධියෙන්) කෙලෙස් ක්ෂය කළ ප්‍රඥාව ද තමා තුළ නිධන් කොට ගත්තේ ද ඔහු මෙලොවත් පරලොවත් දිනුවේ ය. සසරින් ද එතෙරට ගියේ ම ය. මේ සතර ධර්මයන්ට උපකාර වන තවත් සතර කරුණක් අටුවාවේ හා සුත්ත නිපාතය ආළවක සූත්‍ර 190 ගාථාවේ පිට 58 මෙසේ දක්වයි.

පරිත්‍යාගය හා ඉවසීම යන සතර කරුණට වඩා ලෞකික ලෝකෝත්තර ධනය ලබා දෙන අන් කිසිවක් ලොව නැත. මේ තමා බෞද්ධ ආර්ථික න්‍යාය. ලෝකෝත්තර න්‍යාය ද මෙයට ය.

පිරිහීමෙන් මිදීමට නම් සත්‍යය ගරුක බව, භෝජනයේ පමණ දැනීම, ඉන්ද්‍රිය හික්මවා අල්පේච්ඡ වූයේ ද, ඇති අය නැති අයට පරිත්‍යාග කරයි ද, ඉවසීමෙන් සියලු දෙනා එකට එකතු වී ගැටලුවලට විසඳුම් තීන්දු ගනී ද, සමෘද්ධිය සංවර්ධනය ක්‍රමයෙන් රටට ම ළඟාවන්නේ ම ය.





ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලයේ ලේකම් ( බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව බුද්ධශාසන අමාත්‍යාංශය)
**කේ.කේ. සුගතපාල**

# බෙලිඅත්ත කහවත්ත රාජමහා වෙහෙර

මහනුවර යුගයට අයත් මෙම කහවත්ත රාජමහා වෙහෙර මහානාග රජු විසින් ඉදිකලා යයි සැලකේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් කහවත්ත නම් වූ ග්‍රාමවරයෙහි මෙම පුදබිම පිහිටා ඇත.

දකුණු ගිරුවා දනව්ව හරහා ගලා බසින රමණීය නදියක් වන කිරමඔය අසබඩ මෙම පින්බිම පිහිටා ඇත. අක්කර 08ක පමණ වූ පරිසරය තුළ විශාල ගල්කණු - වෙහෙර, විහාර, ගොඩනැඟිලි බෝධි ප්‍රාකාර වැනි ඉදිකිරීම්වල නටබුන් පොළවට යටවී ඇත. විවිධ ස්ථානවල එම පාදම් මතුවී ඇත. එකල රජ දවස ඉදිකල ගරා වැටී ඇති චෛත්‍ය මත වසර 2000ක් පමණ ඉපැරැණි ඉතා අනුහස් බලැති බෝධිය පිහිටා ඇත.



මෙම ස්ථානයෙහි මහරහතුන් වහන්සේ පන්සියයක් පමණ වැඩ සිට ඇති අතර, උන්වහන්සේ කිරම ඔයෙන් සිවුරු සෝදා වේලෙන්නට ප්‍රදේශය පුරා අතුරා තිබූ බැවින් කසා වස්ත්‍රයෙන් බැබළුණු ප්‍රදේශයක් හෙයින් "කහවත්ත" යැයි නම් ලැබී ඇත. 1800 දී පමණ මෙම ස්ථානයට මුල්ගිරිගල සඟ පරපුරේ මහනුවරින් පළමු උපසම්පදාව ලද වටරක්ගොඩ ධම්මපාල හිමියන්ගේ ශිෂ්‍යනමක් වන ගල්වැවේ සෝභිත හිමි පැමිණ කුටියක් තනා අතිදුෂ්කර දිවියක් ගෙවමින් භාවනානුයෝගීව වැඩ සිට ඇත. අනතුරුව කහවත්තේ බුද්ධරක්ඛිත හිමිගෙන් පසු වඩින පුදන ස්ථානයක් බවට පත්කරමින් වැඩ සිට ඇත. ඉන්පසු අකුරුගොඩ සුදස්සී, කහවත්තේ පියරතන, ගලගම රතනජෝති, ඌරුගමුවේ ධම්මාලෝක යන හිමිවරුන් යටතේ ජනතාවගේ ආගමික කටයුතු ඉටුකර ගැනීම සඳහා සුදුසු ලෙස පරිසරය සකස් කර ඇත.

වත්මන් විහාරාධිපතීන් වහන්සේ වන්නේ කහවත්ත මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ශාස්ත්‍රවේදී වටරක්ගොඩ ඥාණසිරි හිමියන් ය. විහාරාධිකාරී හිමියන් වහන්සේ, නුගේගොඩ ශ්‍රී සුභද්‍රාරාම විද්‍යායතන පිරුවෙනේ විශ්‍රාමික නියෝජ්‍ය පරිවේනාධිපති ඕමාරේ පුඤ්ඤසිරි හිමියන් ය.

මෙම බුද්ධ පුත්‍රයන් වහන්සේ දෙනමගේ අප්‍රතිහත ශක්තිය මත කහවත්ත පුරාණ රාජමහා විහාරය ආගමික කටයුතු සඳහා විහාරස්ථානයකට තිබිය යුතු අංගෝපාංගයන්ගෙන් සමන්විත විහාර පින්බිමක් ලෙස සංවර්ධනය කර ඇත.



විහාරාධිපති ශාස්ත්‍රවේදී වටරක්ගොඩ ඥාණසිරි හිමි



විහාරාධිකාරී ඕමාරේ පුඤ්ඤසිරි හිමි



# ගොඩගසන තරමට ධනය වැනසී යයි සතුට

**බුදු දහම යනු සෘණාත්මක අදහස් තිබෙන දර්ශනයක් නො වේ. ආධ්‍යාත්මික ව මෙන් ම ලෞකිකව ද දියුණු වීමේ මාර්ගය උගන්වන දර්ශනයකි.**

රට්ඨපාල සූත්‍රයට අනුව ද කොපමණ සම්පත් තිබුණත් මිනිසා නිතර ම සිටින්නේ නොතිත් අසාවෙනි.

ඌනො ලොකො අතිත්තො තණ්හාදාසො එනිසා ම මිනිසා මිය යන්නේ ම සම්පූර්ණ නොවූ මනදොළ සහිත ව ය. ධනය මිය යන්නා පසු පස නො යන බවත්, ධනයෙන් දීර්ඝායුෂ නො ලැබෙන බවත් සිහි එළ වා ගෙන ලද දෙයින් සතුටවීම තරම් ධනයක් නැති බව අවබෝධ කර ගත යුතු ය.

ධනය ඉපැයීම සිදු කරන්නේ කෙසේ ද? යන ප්‍රශ්නය මෑතක ඇති වූවක් නො වේ. වරක් බුදුන් වහන්සේගෙන් ම ආළවක යක්ෂයා මේ ගැන විමසා ඇත.

සෘජු පිළිතුරක් ලබා දෙන බුදුන් වහන්සේ පෙන්වා දෙන්නේ උත්සාහයෙන් ධනය උපදවා ගත යුතු බව යි.

අංගුත්තර නිකායේ රථකාර වග්ගයේ නමවැනි සූත්‍රය අනුව උදේ, දහවල් හා සවස මහන්සියෙන් කටයුතු කරන්නේ නම්, නො ලැබූ භෝග සම්පත් ලබන්නට ද, ලැබූ භෝග සම්පත් වැඩි දියුණු කර ගැනීමට ද හැකි වෙයි.

දියුණු වන පුද්ගයා මෙම උදාසීන චෛතසිකයන්ගෙන් මිදුණු අයකු විය යුතු ම ය.

එසේ ම උපයන ධනය වියදම් කළ යුතු අංශ කිහිපයක් පිළිබඳ සිඟාල සූත්‍රයේ දැක්වේ.

එක් කොටසක් ආහාර සඳහා ද, දෙකොටසක් ආයෝජන සඳහා ද, එක් කොටසක් විපතක් පැමිණි විටක ප්‍රයෝජන සඳහා ගත හැකි පරිදි ඉතුරු කිරීමට ද එහි උගන්වා ඇත.

ධනයෙන් කළ යුතු කටයුතු කිහිපයකි. පළමුව තමන් සතුටු විය යුතු ය. (අත්තානං ච සුඛෙති පිණෙති) කොපමණ ධනය තිබුණ ද සතුටක් නැති මිනිස්සු කෙතරම් නම් වර්තමාන සමාජයේ සිටිත් ද? එය යහපත් වූ දෙයක් නොවේ. දෙමාපියන්ගේ සුඛවිහරණය සෑදීම ද අඹුදරුවන්, දැසිදස් කම්කරුවන්ගේ සුඛවිහරණය සෑදීම ද මිත්‍රයන්ගේ සුඛවිහරණය සෑදීම ද කළ යුතු ය.

මින් පෙනී යන්නේ ධනය ලැබෙන විට දෙමාපියන්, මිත්‍රයින් හා තමා යටතේ පෝෂණය වන්නන් අමතක කිරීම ගුණමකුකමක් සේ ම, එය ඉක්මන් ආර්ථික පරිහානියකට ද පාර කපා ගැනීමකි.

ඉතා දුක් මහන්සියෙන් උපයා ගත් ආර්ථික ශක්තිය කඩා වැටීමට හේතු වන ක්‍රියා කීපයක් පිළිබඳ සිඟාල සූත්‍රයේ දැක්වේ. රහමෙර පානය, නො කල්හි වීථිසංචාරය, සංදර්ශන බැලීමට ලොල්වීම, සූදු ක්‍රීඩාව, පාපමිත්‍ර සේවනය, අලස බව යනු එම ලක්ෂණයෝ ය. මේවා තුළින් උපයා ගත් ධනය බලා සිටිය දී ම විනාශයට පත්වේ. උපයා ගත් ධනය රක්ෂණයට හා කළමනාකරණයට අදාළ වූ උපදෙස් මාලාවක් ද බුදුදහම තුළින් ලබා දී ඇත. මේ පිළිබඳ අගනා විග්‍රහයක් අංගුත්තර නිකායාගත කුල සූත්‍රයේ දැක්වේ. නැසෙන සම්පත් හා උපකරණ එසේ වූ විගස ම නැවත සොයා තැබීම, දිරාපත් වන දේ යුහුසුළුව ප්‍රතිසංස්කරණය කිරීම, උපයන සීමාව දැන ඊට සරිලන සේ පරිහරණය කිරීම, සිල්වත් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් ගෙදර හෝ ආයතනයේ ප්‍රධානියා කිරීම එම කරුණු ය.

ධනය ඉපැයීම කෙසේ සිදු කළ යුතු ද යන්නත් බුදුන් වහන්සේ පත්තකම්ම සූත්‍රයේ දී පෙන්වා දුන්හ. උත්සාහයෙන්, වීර්යයෙන්, බාහුබලයෙන් දහදිය හෙළා ධාර්මිකව ඉපයිය යුතු බව එහි දැක්වේ.

ධනඤ්ජානි සූත්‍රයේ දී ධනඤ්ජානි බමුණාට බුදුන් වහන්සේ පෙන්වා දෙන්නේ පව් නො කොට, පින් කොට හැකි වූ ද කය පිනවිය හැකි, වැඩිය හැකි කර්මාන්ත තිබෙන බව යි.

ලොව ඇති බලවත් ම දේ මුදල් යැයි සිතා මුදල්වලට කළ නොහැක්කක් නැතැයි යනුවෙන් එන හාස්‍යොත්පාදක කතා සමාජය ගිලගෙන ඇත. මේ නිසා ඇතැම් අවස්ථාවල මුදල සමඟ මනුස්සකම යටපත් ව ඇත. පසුගිය කොරෝනා වෛරසය ව්‍යාප්තව පැවැති කාලයේ දී මහ ධන කුවේරයන් තම අවසන් හුස්ම පොද වාතලයට මුසු කළේ මුදල් නැතිකම නිසා නොවන බව රහසක් නොවේ.

ගුණධර්ම පිරි ආර්ථිකයක් ඇති කර ගැනීමට අප උත්සුක විම තව ප්‍රමාද නො කළ යුතු බව ස්වභාව ධර්මය මෙන් ම නූතන මිනිස් ක්‍රියාකාරකම් ද මේ වන විට අපට ඒත්තු ගන්වා ඇත.

මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙණේ ආචාර්ය,
රාජකීය පණ්ඩිත,
**ශාස්ත්‍රපති වල්පොල සිරි පියරතන හිමි**

# බෝධීන් වහන්සේ තුන්නමක් වැඩ වෙසෙන දෙකටන නාමළුව පුරාණ විහාරය



**හෙළ වංශකථාවලට අනුව දෙකටන නාමළුව පුරාණ විහාරස්ථානය මෙරට බෞද්ධ අබෞද්ධ ජනතාවගේ නොමද ගෞරවයට ලක් වු පුද බිමක් වන්නේ ශ්‍රී නාගපතිණි මෑණියන් බුදු බව පතා භාවනායෝගිව වැඩ හිටි ස්ථානය ලෙස ප්‍රකට බැවිනි.**

දඹදෙණි යුගයට අයත් මෙම විහාරස්ථානය පිළිබද ඉකුත් සමයේ ජනතාවගේ අවධානය යොමු වන්නේ වසර 200 කටත් අධික කාලයක් එහි වැඩසිටි දඹදිව ආනන්ද බෝධි ශාඛාව අපවත්වීමත් සමඟ ය . ආනන්ද බෝධි ශාඛාව අපවත් වීම පිළිබඳ අප එම විහාරස්ථානයේ විහාරාධිකාරී විශ්ව කීර්ති ශ්‍රී ධම්මභාණී ප්‍රණීධි පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ශාස්ත්‍රපති විද්‍යා විශාරද වෙන්නවත්තේ රතන ජෝති හිමියන් සමඟ කතාබහ කළෙමු. එහිදී උන්වහන්සේ මෙසේ වදාළහ.

"දෙකටන නාමළුව පුරාණ විහාරස්ථානය මෙරට බෞද්ධ ජනතාවගේ නොමද ගෞරවයට ආදරයට පත් වු පුද බිමක්. මෙම විහාරස්ථාන පිහිටීම අනුව නැගෙනහිර දිශාව බැලු විට ශ්‍රී පාදස්ථානය දැක ගන්න පුළුවන්. ඒ වගේම බටහිර පැත්තෙන් බලන විට අපිට පෙනෙන්නේ කැලණිය රාජමහා විහාරය යි. දොම්පේ මැතිවරණ කොට්ඨාශය තුළ පිහිටා තිබෙන සියවස් ගණනාවක් බෞද්ධ ජනතාවගේ වැඳුම් පිදුම්වලට ලක් වු මෙම පුදබිම ලන්දේසි, පෘතුගීසි හා ඉංග්‍රීසි ජාතිකයන් මෙරට පාලනය කරන සමයේ විවිධ බලපෑම්වලට ලක් වුවත් මෙහි වැඩසිටි දඹදිව ආනන්ද බෝධි ශාඛාව වසර දෙසීයකට අධික කාලයක් විරාජමානව තිබ්බා. නමුත් ඉකුත් සමයේ විවිධ හේතු මුල් කර ගෙන මෙම බෝධීන් වහන්සේ අපවත් වුණා. එය බෞද්ධ, අබෞද්ධ කාගේත් කනස්සල්ලට හේතුවක් ද වුණා. මේ අපවත් වූ බෝධීන් වහන්සේගේ ආදාහන කටයුතු අපි ඇසළ මස පෝය දින සියලුම චාරිත්‍රානුකූලව අවසන් කෙරුවා. ඉන්පසු බෝධීන් වහන්සේ තුන් නමක් විහාරස්ථානයට වැඩමවීම සිදු කෙරුවා. ඒ අනුව දඹදිව ආනන්ද බෝධියේ ශාඛාවක්, දඹදිව ජය ශ්‍රී මහා බෝධි ශාඛාවක්, අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධි ශාඛාවක් අද මෙම විහාරස්ථානය තුළ වැඩ හිඳිනවා.

මෙම බෝධීන් වහන්සේ නාමළුව පුරාණ විහාරස්ථානය තුළ රෝපණය කිරීම බෞද්ධ අප කාගේත් සිත් සතන් මෙත් සිසිලෙන් පුරාවාළු කාරණයක්. මේ බෝධීන් වහන්සේ ලා රෝපණය කිරීමේ ඓතිහාසික මොහොත හරිම වැදගත්. මෙහිදී අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ශාඛාව මමත්, සජන සංහිත ගංගාධර කුමරුවාත්, දඹදිව ආනන්ද බෝධි ශාඛාව සනත් නන්දන මහතාත්, දඹදිව ශ්‍රී මහා බෝධි ශාඛාව අනුර ජයවර්ධන මහතාත් උඳුවප් මස හෙවිසි හොරණෑ පිරිත් සජ්ඣායනා මධ්‍යයේ රෝපණය කෙරුවා. අද අප විහාරස්ථානය සුවිශේෂී විහාරස්ථානයක් බවට පත්වෙලා කාගේත් ගෞරවයට ආදරයට ලක් වන ස්ථානයක් වෙලා".

සියවස් ගණනාවක් ඈතට දිවෙන ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන දෙකටන නාමළුව පුරාණ විහාරස්ථානය අද බෝධීන් වහසේ තුන් නමකගේ සිසිලෙන් නැහැවී සැදැහැවත් සිත් සතන් පහන් කරන බෞද්ධ උරුමයක් බව නොරහසකි.

ජාඇල සමූහ
**ප්‍රසංග පෙරේරා**

# තෙල්ලඹුර ශ්‍රී බෙත්තාරාම පුරාණ විහාරස්ථ දුරුතු මහ පෙරහර

**තෙල්ලඹුර ශ්‍රී බෙත්තාරාම පුරාණ විහාරය ලුණුගම්වෙහෙර ශ්‍රී අශ්වත්තාරාම විහාරය ඇතුලු විහාර ගණයේ ආධිපත්‍ය දරන ස්‍යාමෝපාලි මහා විහාරවංශික මල්වතු විහාර පාර්ශවයේ කර්මවාගාචාර්ය ස්වරභඤ්ඤ විශාරද ලේල්වල ඉන්ද්‍රජෝති ලොකු හාමුදුරුවන් වහන්සේගේ අනුශාසකත්වයෙන් තෙල්ලඹුර දුරුතු පෙරහර හා පින්කම් මාලාව 2023 ජනවාරි 01 වැනි දින සිට 06 දින දක්වා උත්කර්ශවත් ලෙස පැවැත්වේ.**



තෙල්ලඹුර ශ්‍රී බෙත්තාරාම පුරාණ විහාරය නුවර යුගයට අයත් ඉපැරැණි විහාරයකි. මෙහි ආදි කර්තෘන් වහන්සේ වන්නේ සිරිමල්වත්තේ ගුණරතන මා හිමියන් ය. උන්වහන්සේගෙන් පසු කාලයත් සමඟ විහාරාධිපතීන් වහන්සේ කිහිපනමක් වැඩසිට ඇත. ඉන්පසු වැලිගම් කෝරලයේ ප්‍රධාන සංඝනායක කොක්මාදුව ශ්‍රී පූර්වාරාමාධිපති තෙල්ලඹුරේ ආරියවංස නා හිමි, සද්ධර්මවාගීශ්වර කර්මාචාර්ය කොක්මාදුව සරණපාල නා හිමි, බෙත්තාරාම පුරාණ විහාරයේ විහාරාධිපති පදවිය දරන ලද අතර ප්‍රදේශයට සම්බුද්ධ ශාසනයට විශාල සේවයක් උන්වහන්සේ විසින් සිදු කරන ලදහ.

උන්වහන්සේගේ අපවත්වීමෙන් පසු විහාරාධිපති පදවියට පත් ස්වරභඤ්ඤ විශාරද කර්මවාගාචාර්ය ලේල්වල ඉන්ද්‍රජෝති මා හිමියන් වහන්සේ තෙල්ලඹුර බෙත්තාරාම පුරාණ විහාරය දර්ශනීය රමණීය විහාරයක් බවට පත් කිරීමට දිවා රාත්‍රී නොබලා ක්‍රියා කළහ.

තෙල්ලඹුර දුරුතු මහා පෙරහර ලේල්වල ඉන්ද්‍රජෝති මා හිමියන්ගේ අප්‍රතිහත ධෛර්යයෙන් බුදුන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිහිපත් කරමින් 1969 දුරුතු පෝය දින මල් පෙරහරක් ලෙසින් ආරම්භ කර වසරින් වසර උඩරට, පහතරට නැටුම් ගැයුම් සහිත, අලි ඇතුන් සහිතව දුරුතු පෙරහර අලංකාරවත්ව වීථි සංචාරය කරන්නට විය. සතර දේවාල පෙරහර ද ඒ සඳහා එක්වීමෙන් තවත් එය අලංකාර වන්නට හේතු විය.

තෙල්ලඹුර දුරුතු මහා පෙරහර ආරම්භ කර වසර 53 කි. මේ සා විශාල කාල පරාසයක් තුළ මෙම සංස්කෘතික මංගල්‍යය වර්ෂයෙන් වර්ෂය සාර්ථකත්වයට පත්වන්නට විහාරාධිපති පූජ්‍යපාද ලේල්වල ඉන්ද්‍රජෝති ලොකු හාමුදුරුවන්ගේ නොසැලෙන ශක්තියත්, අනුශාසකත්වයත් තෙල්ලඹුර දුරුතු මහා පෙරහර කමිටුවේ කැපවීමත්, මෙහිදී අගය කළ යුතු වේ.

වැලිගම් කෝරළයේ ප්‍රධාන සංඝනායක කොක්මාදුව පූර්වාරාම පුරාණ විහාරාධිපති ශාස්ත්‍රපති කැටවල ඉන්දසාර නා හිමි, අකුලහේන සරණගිරි ආරණ්‍ය සේනාසනයේ වටරැක නාගිත හිමි, උඩුමලගල ගංගාරාම පුරාණ විහාරාධිපති ශාස්ත්‍රවේදී පනන්ගල චන්ද්‍රවංස හිමි, වලවේ ශ්‍රී ශ්වේත බිම්බාරාම විහාරාධිපති ශාස්ත්‍රවේදී බඹරවානේ රතනජෝති හිමි, කොට්ටවගම ශ්‍රී සුමනාරාම පුරාණ විහාරාධිපති ශාස්ත්‍රවේදී තල්ගම්පල සද්ධානන්ද හිමි, අලුත්වත්තේ ශ්‍රී ගුණානන්ද විද්‍යාලයේ විදුහල්පති ශාස්ත්‍රපති හම්මැලියේ මහින්ද හිමි, සූරියවැව නන්දජෝති හිමි, කැලණිය කිත්සිරිමෙවන් රාජමහා විහාර කෘත්‍යාධිකාරී අඹේපුස්සේ අමරජෝති හිමියන් ඇතුළු හිමිවරුන්ගේ තෙල්ලඹුර පෙරහර සාර්ථක කර ගැනීමට දක්වන කැපකිරීම ද ප්‍රශංසා කටයුතු වේ.

***මෙවර තෙල්ලඹුර දුරුතු මහා පෙරහර අද දුරුතු පෝය ද පස්වරු 1.30 ට උඩරට පහතරට සබරගමු නැටුම් හා ගැයුම් සහිත අලි ඇතුන් සමඟ වීථි සංචාරය කරනු ලබයි.***

***පෙරහර ගමන් මාර්ගය වන්නේ තෙල්ලඹුර ඉහළ මීගහවිල, නැවුන්ගල, කොට්ටව, මාකුඹුර, දඩපිටියවත්ත, තෙල්ලඹුර මංසන්දියෙන් සතර දේවාල මාවත ඔස්සේ ශ්‍රී බෙත්තාරාම පුරාණ විහාරයට පස්වරු. 6.30 ට ගෙවදීමට නියමිත ය.***

***තෙල්ලඹුර දුරුතු මහා පෙරහර අනුහසින් මුළුමහත් ලෝකවාසීන්ට උදා වූ නව වසර සෞභාග්‍යමත් වේවා'යි ප්‍රාර්ථනය කරමු.***

ශාස්ත්‍රපති
**පලල්ලේ සරණජෝති හිමි**



# සඟ සුසන එකලු කළ සංඝ සාමග්‍රිය

**ශාසන ඉතිහාසයෙහි දැක්වෙන කරුණු අනුව බුදුරදුන්ගේ ශ්‍රාවක භික්ෂු පිරිස පඨමාභිසම්බෝධි යුගයෙහි හෙවත් බුද්ධත්වයෙන් පසු මුල් විසි වසර තුළ සමඟි සම්පන්නව හා විනයගරුකව විසූහ.**

බුදුරදුන් බැහැදැකීමට ගිය කොසොල් මහ රජු භික්ෂූන් වහන්සේගේ සමගිය පිළිබඳ කළ ප්‍රකාශයක් මජ්ඣිම නිකායේ ධම්මචේතිය සූත්‍රයෙහි දැක්වෙයි.

“මම මේ සස්නෙහි සමඟි වූ, සතුටින් වෙසෙන, විවාද නොකරන, කිරි හා දිය සේ එක් වූ, ඔවුනොවුන් ප්‍රියමනාප ඇසින් දකිමින් වෙසෙන භික්ෂූන් වහන්සේ දකිමි. මම මේ සස්නෙන් බැහැර මෙසේ සමගි වූ අන් පිරිසක් නොදකිමි.”

එකල විවිධ ජනපදවලින්, විවිධ කුලවලට අයත්, විවිධ ඇදහීම් ඇති පිරිස් පැවිදිබිමට පත්ව එකම භික්ෂු පිරිසක් වූයේ නොයෙක් ගංගාවන්හි ජලය මුහුදට ගලාවිත් එකම සමුද්‍රයේ ජලය බවට පත්වන්නාක් මෙනි.

මෙසේ භික්ෂූන් වහන්සේ සමඟි බවෙන් යුක්ත වුව ද බුදුරදුන් ජීවමාන සමයෙහි ම භික්ෂූන් අතර යම් යම් මතභේදාත්මක කරුණු හටගත් බව ද පැහැදිලිව ම දැකිය හැකි දෙයකි. භික්ෂූන් වහන්සේ අතර පැහැදිලි නිකාය භේදයක් පිළිබඳ තොරතුරු හමුවන්නේ දෙවැනි ධර්ම සංගායනාවෙන් පසුව වුව ද නිකාය භේදයෙහි මූල බීජ හෙවත් විවිධ ආචාර්යවාද බුදුරදුන් ධරමාන සමයෙහි දී ම දක්නට ලැබුණි. එකී මූල බීජ අනුක්‍රමයෙන් සංවර්ධනය වී විකාශයට පත්වීමට ශත වර්ෂ ගණනාවක් ගත විය. ඒ අනුව පශ්චාත් කාලීනව ආචරියවාදය බිහිවීමට බලපෑ මූලික සිද්ධාන්ත බුදුරදුන් ධරමානයෙහි දී ම රෝපණය වන්නට වූ බව පැහැදිලි ය.

පඨමාභිසම්බෝධි යුගයෙහි භික්ෂු ශික්ෂණයෙහිලා බුදුරදුන්ට එතරම් දුෂ්කරතාවනට මුහුණපෑමට සිදු නොවූ බව පෙනේ. එම යුගයෙහි භික්ෂු සංස්ථාව තුළ වූයේ ආචාර ධර්මයන්හි අනුශාසනාවක් ලැබීමට තරම් දුර්වල පිරිසක් නොවීම එයට හේතුවයි.

භික්ෂූන් වහන්සේ අතින් නොදැන සුළු සුළු වැරැදි සිදුවුව හොත් එහිලා බුදුරජාණන් වහන්සේ වරද ප්‍රමාණකොට නීතියක් නොපැන වූහ. එම වරද සිහිගන්වා ධර්මය යටතේ ම සංග්‍රහ වන අනුශාසනාවක් පමණක් ඉදිරිපත් කිරීම බුදුරදුන්ගේ සිරිත විය.

මෙම වරද අත්හළ යුතු ය. මේ මේ ශික්ෂාවන්හි පිහිටිය යුතු යැ’ යි, ශික්ෂාපද යටතේ භික්ෂු ආචාරය සීමා කිරීමට තරම් පඨමාභිසම්බෝධි යුගයෙහි බුදුරජාණන් වහන්සේ උත්සුක නොවූහ.

ස්වකීය ආචාර ශික්ෂණයෙහිලා බුද්ධ දේශිත ධර්මය ම ප්‍රමාණ කොටගත් භික්ෂූන් වහන්සේ ශීලය යටතේ ඉතා සරල වූත්, ලිහිල් වූත් ජීවන පැවැත්මක් ඇතිව වැඩ විසූහ. මේ අනුව පඨමාභිසම්බෝධි යුගයෙහි භික්ෂු ශික්ෂණය සකස් වූයේ ධර්මය යටතේ සංග්‍රහ වූ ශීලය ඇසුරෙන් බවත්, විනය යන ශීර්ෂය යටතේ පැවති ශික්ෂණයක් මෙම යුගයෙහි භික්ෂූන් වහන්සේ තුළ නොතිබුණු බවත් පැහැදිලි ලෙසම ප්‍රකාශ කළ හැකි ය.

එහෙත් ධර්මය යටතේ සංග්‍රහ වූ ශීලය ඇසුරෙන් සකස්ව පැවති භික්ෂු ජීවිතය පැවතියේ පඨමාභිසම්බෝධි යුගය තුළ පමණෙකි. එසේ වසර විස්සක් පමණ වූ කෙටි කාලයකට පසුව භික්ෂු ශික්ෂණය සඳහා ශීලය පමණක් ප්‍රමාණවත් නොවීමත්, ඒ සඳහා ශික්ෂා පද ප්‍රඥප්තියක් අවශ්‍යවීමත් ශාසන ඉතිහාසය පිළිබඳ විමසීමේ දී දැඩි අවධානයක් යොමුවිය යුතු කරුණකි.

භික්ෂු සංස්ථාවෙහි ශික්ෂා පද බහුලව පැවති යුගයක් ගැන මජ්ඣිම නිකායේ භද්දාලි සූත්‍රයෙහි සඳහන් වෙයි. එහි ශික්ෂා පද බාහුල්‍යයට මෙසේ හේතු දක්වයි.

“සත්තෙසු හයමානෙසු සද්ධම්මෙ අන්තරධායමානෙ බහුතරාන් චේව සික්ඛාපදානි හොන්ති. අපරතරා ච භික්ඛු අඤ්ඤාය සණ්ඨහන්ති.” සත්ත්වයන් පිළිවෙතින් ගිලිහී ගිය කල්හි පිළිවෙත් සදහම් නැසෙන කල්හි ඉතා බොහෝ ශික්ෂා පදයෝත් වෙති.

ඉතා අල්ප වූ භික්ෂු කෙනෙකුත් රහත් පෙළෙහි පිහිටත්. මෙහි සත්ත්වයන් වශයෙන් විශේෂයෙන් ගෙන ඇත්තේ භික්ෂු පිරිස ය.

භික්ෂු සමාජය තුළ ආසවට්ඨානීය ධර්මයන් පහළවීම ශික්ෂා පද ප්‍රඥප්තියට හේතු වූ බව පාරාජික පාළියෙහි දැක්වෙයි.

ඒ මෙසේ ය.

සංඝො රත්තඤ්ඤුමහත්තං පත්තො හොති

භික්ෂු සමාජය යම්තාක් චිරරාත්‍රඥයන්ගෙන් (පැවිදිව බොහෝ කල් ඉක්මගිය අය) රහත් බවට පැමිණීම

සංඝො වෙපුල්ලමහත්තං පත්තො හොති

භික්ෂු සමාජය ස්ථවිර, මධ්‍යම හා නවක වශයෙන් විපුලත්වයට හෙවත් මහත් බවට පැමිණීම.

සංඝො ලාභග්ගමහත්තං පත්තො හොති

භික්ෂු සමාජය ලාභයෙන් මහත් බවට පැමිණීම.

සංඝො බාහුසච්චමහත්තං පත්තො හොති

භික්ෂු සමාජය බහුශ්‍රැතියෙන් (බොහෝ උගත් බවින්) මහත් බවට පැමිණීම.

භික්ෂු සමාජයේ විපුලත්වය අනුව සසුන් බඹසර හැසිරීමෙන් පිටස්තර ක්‍රියාවන්ට නැඹුරු වූ භික්ෂූන් වහන්සේ ඇති වූහ. මෙම පසුබිම තුළ සමාජ අවශ්‍යතා මත පිහිටා විනය නීති පැනවිණි. භික්ෂු සමාජය තුළ පමණක් නොව, කවර සමාජ සංවිධානයක වුව ද පූර්වෝක්ත කරුණු හට ගැනීම පොදු ලක්ෂණයක් සේ දැකිය හැකි ය.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ඒ ඒ භික්ෂු සංස්ථා අතර මතභේද උද්ගතවීමට පෙර බුද්ධකාලීනව ම භික්ෂූන් වහන්සේ අතර විවිධ මතභේද ඇති වූ බව ත්‍රිපිටක සාහිත්‍ය විමසීමේ දී පැහැදිලිව ම දත හැකි ය.


දේවදත්ත, සාතිය, ඡබ්බග්ගීය, සත්තරස, වග්ගීය ආදී භික්ෂූන් ගේ ක්‍රියා කලාපයන් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මෙය වටහා ගැන්ම ඉතා පහසු ය.

මුල් වකවානුවෙහි අගාරික ජීවිතය කෙරෙහි කළකිරී අනගාරික ජීවිතයට ඇතුළත් වූ, ප්‍රඥාවෙන් මුහුකුරා ගිය පුද්ගලයන් විමුක්ති සාධනයෙහි උත්සුක වූ අතර, පසුකල පැවිදි වූ ඡබ්බග්ගීය වැන්නෝ විමුක්ති සාධනයෙහි උත්සුක නොවූහ. ඔවුන්ගේ නොමනා හැසිරීම් රටාව පිළිබඳ විස්තරයක් චුල්ලවග්ග පාළිය තුළ මෙසේ විස්තර වෙයි.

සමයෙහි වනාහි ඡබ්බග්ගීය භික්ෂූහු මුතු වැල් ආදී කර්ණාභරණ දරත්, එල්ලෙන නූල් පළඳිත්. ගෙල පළඳනා දරත්. ඉඟ පළඳනා දරත්. වළලු දරත්. හස්තාභාරණ දරත්, ඇඟිලි මුදු දරත්, දික් කෙනෙ දරත්. පණයෙන් කෙස් පීරත්, ඉටි තෙලෙන් කෙස් මටසිලුටු කොට තබත්. දිය මුසු තෙලින් කෙස් මටසිලිටි කෙරෙත්. කැඩපතෙහි ද, දිය බඳුනෙහි ද මුහුණෙහි සටහන් බලත්. මුහුණ ආලිප්ත කෙරෙත්. මුහුණෙහි දියමුසු පිටි බලත්, ඇඟ පැහැ ගන්වත්. මුහුණ වත්සුණුයෙන් තවරත්, තිලක තැබීම් ආදී වශයෙන් මුහුණ ලකුණු කෙරෙත්. නැටුම් ද, ගැයුම් ද, වැයුම් ද දක්නා පිණිස යත්. දික් වූ ගී හඬින් දහම් ගයත්. ලොම් පිටතට ඇති පොරෝනාවන් දරත්.

බුද්ධ කාලය තුළ ම විෂමාචාර ඇති භික්ෂූන් සිටි බවට ඉහත විස්තරය උදාහරණයකි. පශ්චාත් කාලීනව විවිධ ආචාර්යවාද බිහි වූයේ එහි මූල බීජ අනුක්‍රමයෙන් සංවර්ධනයට පත්වීමෙන් බව නිගමනය කළ හැකි ය.

***මෙම ලිපියේ ඉතිරි කොටස දුරුතු අව අටවක පෝදා (15) අන්තර්ජාල කලාපයේ පළවේ.***



**උඳුරුගමුවේ අස්සජී හිමි**

මිනිසත් බව
දුර්ලභ ය. ඒ දුර්ලභ
සම්පත පිරිසුදු කර ගන්නෝ
ද, අපිරිසුදු කර ගන්නෝ ද, වෙති.
මිනිසා කිලිටි කරන ක්ලේශ කර්ම
සතරකි. ඒ සතුන් මැරීම ය. අන් සතු
දෙය සොර සිතින් ගැනීම ය.
කාමයෙහි වරදවා හැසිරීම ය.
ඇති දෙය වසා නැති දෙය
මතු කොට බොරු කීම ය.

---

## බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුන - පෝදා පින්කම්

පෙරවරු 6.00 - 7.00 සීල සමාදානය හා අනුශාසනාව 7.00 - 7.30 තෙරුවන් වන්දනාව, 8.15 - 10.00 භාවනාව, 10.00 - 11.00 ධර්ම දේශනාව, 11.00 - 11.30 තෙරුවන් වන්දනාව, ආචාර්ය මිරිස්සේ ධම්මික නා හිමි, පස්වරු 12.30 - 1.00 සූත්‍ර සජ්ඣායනය, 1.00 - 2.00 ධර්ම දේශනය දොරොව්වේ ඤාණරතන හිමි, 2.00 - 3.30 ධර්ම සාකච්ඡාව මඩවල ධම්මික ජිනවංශ හිමි, 4.00 - 5.00 ධර්ම දේශනය තල්පත්කන්දේ සිරිනන්ද හිමි, පස්වරු 7.00 - 8.00 බෝධි පූජාව.

## නාවිමන ගිරිකන්දරාරාමය - පෝදා පින්කම්

පෙ.ව. 6.00 - 7.00 සීල සමාදාන, මල් පහන්, ගිලන්පස උදෑසන කිරි ආහාර බුද්ධ පූජාව හා අනුශාසනාව (මාතර කඩවත් සතර ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති, නාවිමන ගිරිකන්දරාරාම විහාරාධිපති, ශාස්ත්‍රපති, යටලමත්තේ විපස්සී හිමි, 8.00 - 9.00 ධර්ම දේශනය, කඹුරුගමුව ඇත්කඳ රජමහා විහාරාධිපති හික්ගොඩ ඉන්ද්‍රරතන නාහිමි, 9.45 - 10.45 භාවනා වැඩසටහන ශාස්ත්‍රපති, යටලමත්තේ විපස්සි හිමි, ප.ව. 1.00 - 1.30 සෙත් පිරිත් සජ්ඣායනය විහාරස්ථානයේ පොඩි හාමුදුරුවන් වහන්සේ, 2.00 - 3.00 ධර්ම දේශනාව හතරලියද්දේ මංගල හිමි, 3.00 - 5.00 විශේෂ ආයුර්වේද වෛද්‍ය සාකච්ඡාව, 6.00 සිල් පවාරණය, 7.00 - 8.00 ආශිර්වාද බෝධි පූජා පින්කම.

# අනගාරික ධර්මපාලතුමාගේ දේශනා නූතන සමාජයට නැවත සිහිපත් කළ යුතුයි

සීලය යනු ජීවිතයට සැපයකි, පිහිටකි, බලයකි, විශාල ආරක්ෂාවකි. ඔබගේ ජීවිතයට සීලයෙන් ආරක්ෂාව නැතිනම් ඔබ අනාරක්ෂිතයෙකි.

උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ

**ශ්‍රී ලංකා පැරිස් බෞද්ධ විහාරාධිපති**

**පූජ්‍ය කෝ ආනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේය**



උදාර දිවියක පිය සටහන්

**පුංචි දරුවකු සිත තුළ බිහිවූ පැවිදි වීමේ ආසාව මල්ඵල ගන්වමින් උතුම් පැවිදිබිමට පත්ව විශේෂයෙන් 70 දශකයේ දී සාහිත්‍ය ලෝකයේ අතිශයින් ජනාදරයට පාත්‍රවෙමින් බහුශ්‍රැත ව්‍යක්ත පඬිරුවනක් වශයෙන් පැමිණි ගමන්මඟ සිහිපත් කරමින් අපේ සාකච්ජාවට දෙරටු විවර කරන්න නායක හාමුදුරුවනේ.**

වස්කාලය තුළ ගමේ විහාරස්ථානයේ තිබුණු දැවැන්ත අධ්‍යාපනික පරිසරය අපේ සිත පැවිදි වීමේ පැත්තට නැඹුරු කළා. වෙනත් විහාරස්ථානවල දැන උගත් බහුශ්‍රැත පඬිවරු ගමේ විහාරස්ථානයට වැඩම කරමින්, වස් තුන් මාසය පුරා දිනපතාම සවසට පින්කම් පැවැත්වීමේ සිරිතක් තිබුණා. ඔය කියන 50 දශකය කාලයේ සරල ගැමි සමාජ පරිසරය තුළ තිබුණ ගැඹුරු බව නිසාම අපට ලැබුණු මහා විශාල දැනුම් සම්භාරය අපේ අධ්‍යාපනයටත් බලපෑවා. ඒ පින්කම් කාලය තුළ අපේ ගම්වල ස්වාමින් වහන්සේලා දාන සඳහා ගෙවල්වලට වැඩම කරනවා. කුඹුරුයාය පිරුණු පරිසරය මැදින් එක පෙළට දනට වඩින ස්වාමින් වහන්සේලාගේ දර්ශනය පුංචි දරුවන්ගේ සිත් තුළට අමුතුම හැඟීමක් ඇතිකරනවා. මහණ වෙලා අපටත් මෙහෙම යන්න ඇත්නම් කියලා හිතෙනවා. ඒ හැඟීම තුළ තමයි මහණ වීමේ මුල් බීජය මගේ සිතේ රෝපණය වුණේ.

පසුව ගමේ විහාරස්ථානයේ වැඩ සිටි වියත් පඬිවරුන්ගේ දැන හැඳුනුම්කම් මත මාස ගණනක් බොහොම සාරගර්භ පන්සල් අධ්‍යාපනයකට යොමු වෙලා 1954 වර්ෂයේ දී නොවැම්බර් මස 26 වැනි දා කෝන්ගස්දෙනියේ ආනන්ද යන උතුම් ශාසනික නාමයෙන් පැවිදිබිමට ඇතුළත් වුණා.

කැලණිය විද්‍යාලංකාර පරිවේණාධිපති, එම විශ්වවිද්‍යාලයේ ම පළමු උපකුලපති ධුරය හෙබ වූ ලංකාවේ අතිවිශිෂ්ට පඬිරුවනක් වුණ කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් හංවැල්ල ගිරිදර කපුගොඩ පුරාණ විහාරයේ දී පැවිදි පුණ්‍යෝත්සවය සිදු වුණා. ඒ වගේම ගිරිදර පුරාණ විහාරාධිපති, ලුණුගම ගුණානන්ද, කපුගොඩ ඥාණානන්ද යන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ආචාර්යවරුන් හැටියට කටයුතු කළ බවත්, සිහිපත් කළ යුතුයි. තිහාරියේ වාරණ මංගලගිරි පිරිවෙන, කෑගල්ල නාපේ ශ්‍රී සීලානන්ද පිරිවෙන, හොරණ විද්‍යාරතන පිරිවෙන ආදී දීප්තිමත් පරිවේණාස්ථානවල වැඩ සිටි ඇස්වත්තේ ධම්මතිලක කොටියාපිටියේ සුමන නාහිමි යන අග්‍රගණ්‍ය ශාසනමාමක යතීන්ද්‍රයන් වහන්සේ සෙවණේ පිරිපුන් අධ්‍යාපනයක් ලැබීමත් භාග්‍යයක් කොට සලකන්න පුළුවන්. ඒ වගේම හොරණ වජිරඥාණ නාහිමි, හොරණ පඤ්ඤාසේකර නාහිමි වැනි භාෂා සාහිත්‍ය සාර්ව භෞම පඬිවරුන් යටතේ ලැබූ අධ්‍යාපනයත්,
ශික්ෂණයත් පැවිදි ජීවිතයට ආසා හිතෙන අධ්‍යාපන රටාවත් නිසා වෙනත් පැතිවලට යොමුවීමේ අවශ්‍යතාවක් තිබුණේ නැහැ.

1962 වර්ෂයේ දී උසස් අධ්‍යාපනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණා. එවකට විශිෂ්ට පඬිවරුන් වැඩ සිටි විද්‍යාලංකාර පිරිවෙන විශ්වවිද්‍යාලයක් බවට පත්වීමේ මහා සම්භාවනීය අවස්ථාව සියැසින් දැකබලා ගැනීමට ලැබීමත් ජීවිතේ විශිෂ්ට අවස්ථාවක් ලෙස සැලකිය හැකියි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබූ කාලයේ දී යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමියන් දෙවැනි උපකුලපතින් වහන්සේ බවට පත් වුණා.

පළමු උපකුලපතින් වහන්සේ යටතේ පැවිදි වෙලා, දෙවැනි උපකුලපතින් වහන්සේ යටතේ අධ්‍යාපනය ලැබුවා.

1966 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයෙන් සාමාන්‍ය උපාධිය ලබා ගත්තා.

**"හේ සිද්ධාර්ථ නම් වෙයි." යන කෘතියට 1978 වර්ෂයේ දී රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලැබූ ඔබ වහන්සේ එදා මෙදා තුර සිදු කළ ශාස්ත්‍රීය සේවය මෙන්ම ජාතික ආගමික ශාසනික කාර්යභාරය පිළිබඳ පටුනක් සපයන්න අපේ හාමුදුරුවනේ**

ලංකාවේ විශ්වවිද්‍යාල ඉතිහාසයේ මුල්වරට ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණ නිබන්ධනයක් 1976 වර්ෂයේ දී පිළිගැනීමට ලක් වුණා. ඒ නිර්මාණ කිරීමේ වාසනාව මතුවුණේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යෝදය මණ්ඩපයේ සිංහල අංශය නිසයි. මහාචාර්ය විමල් බලගල්ලේ, මහාචාර්ය ඒ.වී. සුරවීර, මහාචාර්ය තිස්ස කාරියවසම්, මහාචාර්ය ටී.බී. කන්ගහආරච්චි , මහාචාර්ය නන්දසේන රත්නපාල, මහාචාර්ය ගතාරේ ධම්මපාල හිමියන් පුරෝගාමී වුණා. භික්ෂු ජීවිතය රමණීය ලෙසත්, හෘදයංගම ලෙසත් විවරණය කළ ප්‍රථම නවකතාවක්.

1966 වර්ෂයේ දී සාමාන්‍ය උපාධිය ලබා ගැනීමත් සමඟ පැපිලියාන සුනේත්‍රාමහාදේවි පැරැණි පිරිවෙනේ ආරම්භක ආචාර්යවරුන් බවට පත් වෙලා 1984 මුල් පරිච්ඡේදය දක්වා අධ්‍යාපන කටයුතුවල නිරතවුණා. ආචාර්ය, නියෝජ්‍ය පරිවේණාධිපති, වැඩබලන පරිවේණාධිපති ආදි වශයෙන් සම්බුද්ධ ශාසනයේ උන්නතිය සඳහා සුපේශල ශික්ෂාකාමි භික්ෂු පරපුරක් දායාද කිරීමට කටයුතු කළා. පසුකාලීනව දශක 3,4 සිට ලෝක ආගමික සේවය කෙරෙහි කටයුතු ආරම්භ කළා. එම බුදුදහම ජාත්‍යන්තර ලෝකයට දායාද කිරීමේ උදාර අරමුණ තවදුරටත් ඉදිරියට සිදු කරගෙන යනවා.

ඒ වගේම මගේ ප්‍රථම නවකතාව නිර්මාණය වුණේ 1959 දී ලියූ හොල්මන් කතාවක්. එය ලියවුණේ බණ්ඩාරනායක හිටපු අගමැතිතුමාගේ "මහහේනේ ඊරියකා" කතාවේ ආභාසය ලැබීමෙන් දැයි සැකයක් මට හැඟුණා.

**බුදුදහම පිළිබඳ ප්‍රාමාණික දැනුම් සම්භාරයකින් හෙබි දෙස් විදෙස් කීර්තිධර ඔබ වහන්සේ නූතන ලාංකේය සමාජයේ බිඳවැටීම් පිළිබඳ දරන මතය පැහැදිලි කරමින් අපේ සාකච්ජාව අවසන් කරමු නායක හාමුදුරුවනේ,**

ධර්මයෙන් තොර වන විට සමාජය අධාර්මික වෙනවා. බුද්ධ කාලයේත් දුර්වලකම් තිබුණා. අනගාරික ධර්මපාලතුමාගේ දේශනා සමාජගත කළ කරුණු නූතන සමාජ පරම්පරාවට නැවත සිහිපත් කළ යුතුයි.

හේමමාලා රන්දුනු

## පෝදා පින්කම්

### තලවතුගොඩ සංඝමිත්තාරාමය

අලුයම 5.30 අටවිසි බුදුරජාණන් වහන්සේ සහ අසූමහා ශ්‍රාවිකාවන් වහන්සේ උදෙසා පවත්වනු ලබන ප්‍රණීත ක්ෂීරපායාස පූජාව, පෙරවරු 6 -7 සීල සමාදානය සහ සම්බුද්ධ පූජාව, 8 -9 ධර්ම දේශනාව, කැලණියේ අජිත හිමි, 9.30 -10.30 ධර්ම දේශනාව පුහුල්වැල්ලේ සාරද හිමි, 10.30- 11.00 සම්බුද්ධ පූජාව, පස්වරු 12.30 -1.30 දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව, 3.00 - 4.00 ධර්ම දේශනාව මිරිස්සේ ධම්මික හිමි, 4.00 -5.00 ධර්ම දේශනාව, තලගල ධම්මගවේෂී හිමි සහ අසූමහා ශ්‍රාවිකාවන් වහන්සේ උදෙසා ප්‍රණීත ගිලන්පස පූජාව, මෙවර ධර්ම දානය පිණිස බුදුසරණ පුවත්පත බෙදා දෙන්නේ බිමල් මහතාට පින් පිණිස ය.

## වේහැල්ලේ වේළුවනාරාමය

දික්වැල්ල වේහැල්ලේ තෝරපිටියේ වේළුවනාරාම මහා විහාරය ආරම්භ කොට 2022 වර්ෂයට තුන්සිය වසරක් සපිරීම නිමිත්තෙන් විහාරාධිපති, විශ්‍රාමලත් විදුහල්පති, හම්බන්තොට මාගම්පත්තුව සහිත ගාලු මාතර දෙපළාතේ උපප්‍රධාන සංඝනායක, ශාස්ත්‍රපති අබේසේකරගම ගුණරතන නාහිමිගේ අනුශාසනා පරිදි පින්කම් මාලාවක් පැවැත්වේ.

## බුදුසරණ

සම්බුදු හිමිගේ ගුණෙන් නව වසරක් උදා වෙලා
තිසරණ බලෙන් හැම සිත් සතුටින් පිරිලා
බුදු ගුණ කියන බුදුසරණට බුදු සරණයි කියලා
පැතුම් පතන්නට මම දෑතම එකතු කළා

**පානදුර අරුක්ගොඩ**
**ඩබ්.පී. ඉන්ද්‍රානි**
අලුබෝමුල්ල

# උඩරට අමරපුර මහා නිකායේ බස්නාහිර පළාතේ උප ප්‍රධාන සංඝනායක ධුරයෙන් පිදුම් ලැබූ

# දකුණු කැබිල්ලේවෙල නන්දාලෝක හිමි

**පන්නිපිටිය - දෙපානම සිරි දම්මින්ද විහාරය, හපුතලේ යහලබැද්ද බෝධිරාජාරාමය සහ බෝඹුහින්න අභිනවාරාමය යන විහාරත්‍රයාධිපති දකුණු කැබිල්ලේවෙල නන්දාලෝක හිමිපාණන් වෙත වසර දෙසීය දහයක ඉතිහාසයකට උරුමකම් කියන උඩරට අමරපුර මහා නිකායේ බස්නාහිර පළාතේ උප ප්‍රධාන සංඝනායක ධුරය සමඟින් "ශ්‍රී සුමනවංශ ධම්මින්ද වංශාලංකාර, ධර්ම කීර්ති ශ්‍රී ශාසන සෝභන " ගෞරව නාමය පිරිනැමීම නිකායේ මහා නායක නුවරඑළියේ චන්ද්‍රජෝති නාහිමියන් ප්‍රමුඛ කාරක සංඝ සභාව ඉදිරියේ දී පසුගියදා සිදුකෙරිණ.**



බණ්ඩාරවෙල නගරයට ආසන්න දකුණු කැබිල්ලේවෙල ග්‍රාමයේ දී 1966 වසරේ මැයි මස 05 වැනිදා උපත ලැබූ පින්වත් කුමරා නමින් නන්දදාස නම් විය. මූලික අධ්‍යාපනය බණ්ඩාරවෙල සීවලී මහා විදුහලෙන් ලබා 8 වන ශ්‍රේණියේ දී පැවිදිවීමේ අරමුණින් බණ්ඩාරවෙල දකුණු කැබිල්ලේවෙල ශ්‍රී සුධර්මෝදය පිරිවෙනට ඇතුළත් වෙන ලදී. 1980 වසරේ මාර්තු මස 19 වන දින රාජකීය පණ්ඩිත කන්දෙගෙදර සුමනවංශ නාහිමිපාණන්ගේ ශිෂ්‍යභාවයෙන් දකුණු කැබිල්ලේවෙල නන්දාලෝක නමින් ප්‍රව්‍රජා භූමියට ඇතුළත් වූ උන්වහන්සේ 1987 වසරේ ජුනි මස 27 වෙනි දින ඓතිහාසික කැප්පෙටිපොල - විදුරුපොල ශ්‍රී සුමංගලාරාම මහා විහාරස්ථ විශුද්ධ බද්ධ සීමාමාලකයේ දී අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලබා ගන්නා ලදී.

දකුණු කැබිල්ලේවෙල නන්දාලෝක හිමිපාණන්ගේ ශාසනික මෙහෙවර ඇරඹෙන්නේ හපුතලේ යහලබැද්ද බෝධිරාජාරාමය කේන්ද්‍ර කර ගනිමිනි.1992 දී වසරේ දායක කාරකාදීන් එකමුතු කර ගනිමින් ප්‍රදේශයේ ජනතාවගේ එදිනෙදා බෞද්ධාගමික කටයුතු මෙන්ම සමාජ සේවා කටයුතු ද ආරම්භ කළ උන්වහන්සේ සාමණේර ස්වාමීන් වහන්සේලාගේ අධ්‍යාපනයට මඟ පෙන්වන ශ්‍රී ධම්මානන්ද මූලික පිරිවෙන පිහිටුවීම 1993 ජුනි මස දෙවෙනිදා සිදු කරන ලදී. එතැන් පටන් බෞද්ධ අධ්‍යාපනයේ පුනර්ජීවනය උදෙසා බොහෝ නිහඬ සේවාවක් ඉටුකළ උන්වහන්සේ දිවයිනේ නන් දෙසින් පැමිණි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා විශාල සංඛ්‍යාවක් වෙත ධම්මානන්ද මූලික පිරිවෙන හරහා දැනුම ලබා දෙන ලදී.

2003 වසරේදී හොරදොරොව්වේ ධම්මින්ද නාහිමියන්ගේ හදිසි අපවත් වීමෙන් පසු දෙපානම සිරි ධම්මින්ද විහාරය, බෝඹුහින්න අභිනවාරාමය සහ යහලබැද්ද බෝධිරාජාරාමය යන විහාරස්ථානයන්හි අධිපතිධූරයන් ලැබූ උන්වහන්සේගේ අල්පේච්ඡ ජීවිතයට හොඳම උදාහරණය වශයෙන් එම විහාරස්ථානවල පාලන කටයුතු හා අධිපතීත්වයන් තම ශිෂ්‍යයන් වෙත පවරාදීම දැක්විය හැකිවේ.

දශක තුනක කුරිරු ත්‍රස්තවාදී යුද්ධයෙන් පීඩාවට පත්ව සිටි ජනතාව වෙත සහ රට ජාතිය වෙනුවෙන් දහඩිය - ශ්‍රමය මෙන්ම තම ජීවිතය ද කැප කළ වීරෝධාර රණවිරුවන් වෙත නොයෙක් ආකාරයේ ව්‍යාපෘතීන් හරහා සේවය ලබා දෙන්නට උන් වහන්සේ නායකත්වය ලබා දෙන ලදී.

2009 වසරේදී වසර 30 කට පසුව ත්‍රිකුණාමලය දිසාපතිතුමන්ගේ මූලිකත්වයෙන් සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනයක් ත්‍රිකුණාමල දිසාපති මැදුරේදී සංවිධාන කළ උන්වහන්සේ එදා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය පුරා ඉතා දුෂ්කර ජීවිතයක් ගත කරමින් අඩුපාඩු සහිතව වැඩ වාසය කළ මහා සංඝරත්නය 140 නමක් වැඩම කරවා උන්වහන්සේ වෙත අවැසි සියලු පිරිකර පූජාකර මහා පින්කමක් සංවිධාන කිරීම විශේෂයෙන් අගය කළ යුතුව තිබේ.

ඉන් අනතුරුව රුධිර පරිත්‍යාග කිරීම්, වෛද්‍ය කඳවුරු ඇතුළු වැඩසටහන් රැසක් සංවිධාන කරන්නට මූලිකත්වය ගත්හ. සෑම වසරක දී ම තම ගුරු හාමුදුරුවන්ගේ අනුස්මරණය වෙනුවෙන් දිවයිනේ දුෂ්කර ප්‍රදේශයක විහාරස්ථානයක්, පාසලක් හා ගම්මානයක් තෝරා ගනිමින් ඔවුන් වෙත උපරිමයෙන් උදව් උපකාර කිරීම නන්දාලෝක හිමියන් විසින් දියත් කරනු ලබන තවත් විශේෂ වැඩසටහනකි.

අම්පාර දිස්ත්‍රික්කයේ ලාතුගල වව්නියාව දිස්ත්‍රික්කයේ ඈත එපිට නන්දිමිත්‍ර ගම්මානය සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් පාසල් දරුවන් , මහා සංඝරත්නය හා ගැබිණි මාතාවන් වෙනුවෙන් වියළි ආහාර පාන, සනීපාරක්ෂක උපකරණ, ඇඳුම්, පාසල් උපකරණ, පොත්පත් හා පාසල් නිල ඇඳුම් ප්‍රදානය කිරීමේ දැවැන්ත වැඩසටහන් වාර්ෂිකව සංවිධාන කළ උන්වහන්සේ එම ගම්මානවල විහාරස්ථාන සියල්ලටම පාහේ ගිරිභාණ්ඩ පූජාවන් ද සිදුකරන ලදී.

කොරෝනා ව්‍යසනය හමුවේ ජීවත්වීමේ අරගලයක යෙදුණු ප්‍රදේශයේ දායක පින්වතුන් වෙනුවෙන් තමන්ට ලැබෙන පිරිකර සියල්ල සහ වියළි ආහාර එක්රැස් කර බෙදාදීමේ නිහඬ සේවාවක් උන්වහන්සේ වසර දෙකක කාලයක් මුළුල්ලේ සිදු කළේ අප්‍රසිද්ධියේ වීම විශේෂත්වයකි. උපසම්පදාවෙන් පසු ගෙවී ගිය දශක තුන හමාරක තම පැවිදි ජීවිතයේ දී ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ හතළිස් දෙනෙකුගේ ගුරු හාමුදුරුවන් ලෙස උන්වහන්සේ සිදු කරමින් සිටින්නා වූ ශාසනික මෙහෙවර මෙතෙකැයි කිව නොහැකි ය.

මෙවැනි සුවිශේෂී ගුණයන් රැසක් සහිත දකුණු කැබිල්ලේවෙල නන්දාලෝක හිමිපාණන්ගේ ආගමික- ශාසනික හා සමාජීය සේවාවන්, පරිත්‍යාගශීලීත්වය මෙන්ම නායකත්ව ගුණාංග හඳුනාගනිමින් මීට වසර හතරකට පෙරාතුව උඩරට අමරපුර මහා නිකායේ විනයවාදිනී කාරක සංඝ සභාවට උන්වහන්සේ තෝරා ගත් අතර, එම නිකායේ බස්නාහිර පළාත් උපප්‍රධාන සංඝනායක ධූරයට උන්වහන්සේ පත් කිරීමත් "ශ්‍රී සුමනවංශ ධම්මින්ද වංශාලංකාර, විචිත්‍ර භාණක, ධර්ම කීර්ති ශ්‍රී ශාසන සෝභන" ගෞරව නාමය පිරිනැමීමත් පසුගිය දෙසැම්බර් මස 25 වැනි දින ඓතිහාසික කැප්පෙටිපොල - විදුරුපොල විශුද්ධ බද්ධ සීමාමාලකයේදී සිදු කෙරිණ. උන්වහන්සේ පිළිගැනීමේ උළෙල ජනවාරි 08 වෙනිදා අගමැති තුමාගේ ප්‍රධානත්වයෙන් පන්නිපිටියේ දී සිදු කෙරේ.

සිය ජීවිතයම බුදු සසුනේ චිරස්ථිතිය සඳහා කැපකළ පූජ්‍ය දකුණු කැබිල්ලේවෙල නන්දාලෝක හිමිපාණන්ට තවදුරටත් සසුන් කෙත බබළවන්නට නිදුක් නිරෝගී චිරජීවනය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**නුවන් උදාර කරුණාරත්න**

# අනුන් ගැන නොසොයා තමන් ගැන සොයන්න

**ලෝකයේ ජීවත් වන මනුෂ්‍ය, තිරිසන් ආදී සියලු සත්ත්වයෝ බැණුමට, ගැරහුමට, කර්කශ වචනවලට අකැමැති වෙති. ඒවා ප්‍රතික්ෂේප කරති. යමෙක් තමන්ට බණින විට දෙස් පරොස් කියන විට තමන්ගේ හදවතෙහි ඇති වන්නේ දුකකි. ශෝකයකි. වෛරයකි. කළකිරීමකි.**

මෙ හැම කරුණකින් ම සිදුවන්නේ තමන්ගේ සිත අපිරිසුදු වීමයි. මෙ ලෙසින් සමාජයේ ජීවත්වන උපාසක, උපාසිකා, ළමා, තරුණ, භික්ෂු, භික්ෂුණී, සේවක, සේව්‍ය, ගුරු-සිසු, ස්වාමි-භාර්යා, ගිහි-පැවිදි යනාදී පිරිස් විවිධ අවස්ථාවල විවිධ හේතු නිසා වාචික විරසකවීම්වලට පත් වෙයි. ඇතැම් විට එක වචනයකින් මුළු ජීවිත කාලය ම විරසකවීම් සහිතව ජීවත් වෙයි.

ඒ වගේම චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍ය යන සිවුපසයෙන් කිසිවක් නො දෙන බව පවසමිනුත්, අසවල් පුද්ගලයා මසුරු ය, වෛර කරන්නෙක්, ක්‍රෝධ කරන්නෙක්, දන් නොදෙන්නෙක්, ශ්‍රද්ධා මාත්‍රයක්වත් නැත්තෙක්, කම්මැලියෙක්, ආගන්තුක සත්කාර නො දන්නෙක්, සිල් නො රකින්නෙක් යනුවෙන් පවසමිනුත් බැණුම් දෙඩුම් කරයි. මෙ වැනි අවස්ථාවල දී ඇතැම් පුද්ගලයින් ධර්මය අනුව සිත සකසා ගන්නා නමුත්, අයෙක් කෝපයෙන් පිරී යත්. පළිගැනීම් කරත්. ඇතැම් විට ඔවුනොවුන්ගේ කටුක වචන නිසා ජීවිත හානි පවා සිදු වෙයි. කොපමණ රළු වචන අසන්නට ලැබුණත් තමන්ගේ බුද්ධිය මෙහෙයවා ඒවා නිසරු බව වටහාගෙන ඒවා ප්‍රතික්ෂේප කළ යුතු ය. එවිට වෛර බැඳීම් හෝ ජීවිත හානි වීම් හෝ සිදු නො වෙයි. තමන් අන් අයට කළ යහපතවත්, කළ අයහපතවත් සිතීම නො කළ යුතු ය. ඔහුට හෝ ඇයට හෝ යම් පිරිසකට හෝ යම් යහපත් දෙයක් කළේ යැයි සිතා පෙරළා සැලකිලි ලැබීම් අපේක්ෂා නො කළ යුතු ය. තමන්ගේ කටයුතු අතපසුවීමට ද එය බලපෑම් කරයි. එවැනි පුද්ගලයින්ට චිත්ත පීඩාවක් නැති බවත්, සන්තුෂ්ටියෙන් තම ජීවිතය පවත්වාගෙන යා හැකි බවත් බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙති.

අනුන්ගේ බැණුම් දෙඩුම් මෙනෙහි නො කළ යුතු බව ද, අනුන් කළ දේ හෝ නො කළ දේ මෙනෙහි නො කළ යුතු බව ද, තමන් කළ දුශ්චරිත හා සුචරිත නිතර සිහි කරමින් සුචරිත කටයුතු වර්ධනය කර ගත යුතු බව ද මෙයින් පෙන්වා දේ.

බැණුම් දෙඩුම්වල දී සිතේ සහ සතුට පවත්වාගෙන යාමේ මාර්ගය මෙයයි.



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

# Happy Married Life



Senior Lecturer, Pandit,
Faculty of Humanities and
Social Sciences
University of Sri Jayewardenepura
**Dr. Ven. Dodamgoda SumanasaraThero**

The strong pillars of a marriage are husband and wife. They can bring happiness to the family through their mutual concordance. According to the Buddhist perspectives, a married couple can lead a blissful life if they have these qualities such as tolerance, trustworthiness, mutual understanding, selflessness, respect, virtue, fulfilling obligations, honesty, security, good verbal conduct, companionship and so on.

The Buddha's discourses (Suttas) regarding married life are now included in canonical texts (Pali Nikayas) which might be helpful to the laities to maintain their lives happily. The sermons particularly connected to marriage are Singalovada Sutta, Uggaha Sutta, Sanvasa Sutta, Samajivi Sutta, Mallika Sutta, Sattabhariya Sutta in the Digha Nikaya and the Anguttara Nikaya. In addition to these suttas, the Buddhist story of 'Nakula Mata and Nakula Pita' can be deemed as good role models to emulate for lay married couples, in order to live in harmony, loving kindness and mutual understanding with each other. As the Buddha shows, both husband and wife should bear equal friendly qualities in their family life sans without being superior or inferior.

Further, He has mentioned that marriage is a partnership of equality, gentleness, generosity, calmness and dedication. Moreover, if there is mutual understanding and faith between spouses it will bring happiness to the whole family and enable them to live in peace and harmony throughout their life and after life.

As the Buddha reveals through his experience, both husband and wife have to abide by rights (duties) and responsibilities towards each other respectively. This has been mentioned by the Buddha in the Singalovada Sutta. According to this Sutta, the husband's responsibilities are categorized as follows,

1. Being respectful to the wife
2. Not disparaging the wife
3. Not do any misconduct and malpractice
4. Giving priority to domestic work
5. Providing ornaments and garments

On the other hand, as mentioned in the same Sutta, the wife should be mindful of five responsibilities towards her husband such as:

1. Properly organizing domestic work
2. Being kind to servants
3. Not do any misconduct and malpractice
4. Protecting the income and wealth of the husband
5. Being skillful at each and every task at domestic work

Thus, by following these Buddhist concepts, anyone can get guidance in order to develop their moral character and thereby benefit in life. Consequently, moral thoughts will lead to protect the bondage and enrich relationships between the spouses and family members and create a peaceful environment.

In the discourse of the seven wives (Satta Bhariya Sutta), the Buddha has categorized wives into seven types according to their characters as follows.

1. A wife equal to a prosecutor
2. A wife equal to a thief
3. A wife equal to a dictator
4. A wife equal to a mother
5. A wife equal to a sister
6. A wife equal to a friend
7. A wife equal to a slave

As mentioned above, the first three of these seven wives cannot be accepted as good and virtuous wives due to their bad behaviour and deeds towards their husbands and other family members.

According to their characteristic thoughts, they do not have mercy, engage in illicit affairs, do not respect their husbands, and always try to discard the husband's relations, steal the husbands' earnings and valuable things, dictate bad, rough and hurtful words and try to control the husbands in every situation. These three wives of prosecutor, thief and dictator always bring unhappiness to the family which create issues among the family members.

On the other hand, the other four wives like motherly wife, sisterly wife, friendly wife and slave wife possess good qualities, do good deeds, conduct themselves well and act as friends towards their husbands in their daily lives.

Accordingly, these moralistic and good wives develop their mercy, sympathy and kindness, constantly protect their husbands, provide good food for them, take care of their husbands as their own elder brothers, stay close to them, develop friendly manners as friends, smiles and share jokes with understanding, use kind words, do not get angry, try to fulfill needs of husbands, do every domestic work cooperatively and willingly, always try to keep the family happy and are sincere, genuine to each and every relative of both families. Hence, the Buddha has advised to associate those wives because they are able to maintain and sustain the happiness among their children and husbands.

As stated above, in this society, there are some husbands who ill-treat their wives like the first three wives. On the other hand, we can find friendly husbands who protect their wives as fathers and elder brothers and uphold their happiness at home sharing and caring, leading a harmonious life.

The discourse of the Sanvasa Sutra in the Anguttara Nikaya elucidates spouses in four ways. The Buddha has divided husbands and wives according to their wholesome and unwholesome thoughts, virtues, behaviour and deeds. Accordingly, the categorized spouses are:

1. A dead man with a dead woman
2. A dead man with a Goddess
3. A God with a dead woman
4. A God and a Goddess

The last category 'A God and a Goddess' is the most wholesome, ideal pair as the husband and wife cooperate with everyone due to their good will and good conduct in society. They do not harm anyone and perform their duties and obligations to each other respectfully. They possess good qualities, manners, believe in merits, demerits and karmic power (actions) according to religion, and they avoid committing wrong deeds or unwholesome acts at all times.

In brief, these diverse Buddhist teachings elaborate on how laymen and women can live harmoniously together enjoying marital bliss and lead a contented life in this short life span.

> "As the Buddha reveals through his experience, both husband and wife have to abide by rights (duties) and responsibilities towards each other respectively. This has been mentioned by the Buddha in the Singalovada Sutta."



# විචිත්‍රභාණී වලවේ හේමසිරි ලොකු හාමුදුරුවන් වහන්සේ



කරාගොඩ ගල්ලමුල්ල මහානාගවනාරාමාධිපති සංඝ ශෝභන ගුණ පූජිත වලවේ හේමසිරි ස්වාමීන්ද්‍රයන් වහන්සේ මිදිගම සිරිසුමන පිරිවෙනේ පුරා වසර 15ක් කෘත්‍යාධිකාරී ධුරය දරමින් කළ අපරිමිත සේවය ප්‍රශංසා කටයුතු ය.

1965 දී වලවේ ගල්ගේකන්ද සිරිසුමන චේතිය ලෙන් විහාරයේ විහාරාධිපතිත්වය දරමින් බෞද්ධ ප්‍රබෝධය සඳහා කටයුතු කළහ. 1998 සිට නබදව ගල්ලමුල්ල මහානාගවනාරාමාධිපති පදවියට පත්ව ශ්‍රී ධම්මදින්න දහම් පාසල ආරම්භ කරමින් ගුණ නැණ දෙකෙන් පිරිපුන් දරු පිරිසක් සමාජගත කරමින් කළ මෙහෙවර උදාර ය.

හේමසිරි ලොකු හාමුදුරුවන් වහන්සේ ආගමික සමාජ මෙහෙවරයෙහි යෙදෙමින් පරෝපවාද රහිත පැවිදි දිවියක් ගත කරමින් විචිත්‍රවත් පිරිත් දේශකයන් වහන්සේ නමක් ලෙසත්, ගිහි පැවිදි සැමගේ චිත්තාරාධනයට ලක් වූහ.

පසුගියදා 70වැනි වියට පා තැබූ පූජ්‍යපාද විචිත්‍රභාණී වලවේ හේමසිරි ලොකුහාමුදුරුවන්ට ශත වර්ෂාධි කාලයක් ලෝ සසුන් වැඩ වඩන්න දිරිය ශක්තිය බලය තුණුරුවන් සරණින් සියලු දෙවි රැකවරණයෙඅඹ න් ලැබේවා'යි ප්‍රාර්ථනා කරමු.

ශාසන කීර්ති

**ශ්‍රී පලල්ලේ සරණජෝති හිමි**

# කොත්මලේ පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක පදවියෙන් පිදුම් ලබන

## සිවුරුපිටියේ සිරිසීවලී නාහිමි

කොත්මලේ, නවතිස්පනේ, තිස්පනේ කන්ද ශ්‍රී සම්බෝධි විහාරාධිපති විශ්‍රාමලත් නියෝජ්‍ය පරිවේණාධිපති ශාස්ත්‍රපති සිවුරුපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ වෙත මහා විහාරවංශික ස්‍යාමෝපාලී මහා නිකායේ අස්ගිරි පාර්ශ්වයේ අතිගරු මහා නායක මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ගරුතර සානුනායක කාරක සංඝ සභාව මඟින් පිරිනමන ලද ධර්මකීර්ති ශ්‍රී ආනන්ද වනරත ගෞරව නාමය සහිත කොත්මලේ පළාතේ ප්‍රධාන සංඝ නායක පදවිය පිළිබඳ



අක්තපත්‍රය ලබා ගැනීමේ ශාසනික උත්සවය මෙම 21 දින සවස 2.30ට මහනුවර අස්ගිරි මහා විහාරයේදී සිදුවන අතර, අභිනව නාහිමිපාණන් වහන්සේට ආශිර්වාද කිරීමේ හා අභිනව විහාර මන්දිරය විවෘත කිරීමේ පුණ්‍ය මහෝත්සවය වේඩරුවේ ශ්‍රී උපාලි අනුනායක මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන සම්භාවනීය ගිහි පැවිදි විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් ජනවාරි මස 29 දින සවස 2.00 ට ශ්‍රී සම්බෝධි විහාරස්ථානයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

උන්වහන්සේ ගම්පොළ ජාත්‍යන්තර ධර්මදූත මහ පිරිවෙන මඟින් පිරිවෙන් ගුරු සේවයට ඇතුළත්ව දක්ෂ ගුරුවරයකු හා නියෝජ්‍ය පරිවේණාධිපතිවරයකු වශයෙන් වසර 30ක් පිරිවෙන් අධ්‍යාපනයට කරන ලද සේවාව සුළු පටු නොවේ. සිරිසීවලී හිමියන් ප්‍රදේශයේ ගිහි පැවිදි සෑම දෙනාගේම ගෞරවය දිනාගෙන සිටින සුපේෂල ශික්ෂාකාමී දැන උගත් පැවිදි පඬිරුවනකි.

අප නාහිමිපාණන් වහන්සේට දිගාසිරි ලැබේවා.

වැලිගම කොක්මාදුව ශ්‍රී පූර්වාරාමාධිපති කනංකේ රාජමහා විහාර පරිවේණාධිපති වැලිගම් කෝරලේ ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රපති

**කැටවල ඉන්දසාර නාහිමි**




# ශාසනික අභිවෘද්ධියට කැප වූ

## වැත්තෑවේ පඤ්ඤාරාම හිමි

වැත්තෑවේ පඤ්ඤාරාම හිමිපාණන් වහන්සේ, අපවත් වී වදාළ අතිගෞරවාර්හ දෙදියවල තිලකසිරි අනුනායක මාහිමිපාණන් වහන්සේගේ ජ්‍යේෂ්ඨතම ශිෂ්‍ය පුත්‍රයන් වහන්සේ යි.

පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනෙහි කීර්තිධර ආචාර්යවරයකු වශයෙන් දීර්ඝ කාලයක් විශිෂ්ට සේවාවක නිරත වූ මුන් වහන්සේ සමකාලීනව ම කැලණිය ගුරුකුල විද්‍යාලයේ ආචාර්යවරයෙකු සහ නියෝජ්‍ය විදුහල්පතිවරයා වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදු කරන ලද සේවය අතිවිශිෂ්ට ය.

වැලම්ටියාවේ කුසලධම්ම නායක මාහිමිපාණන් වහන්සේගේ මඟ පෙන්වීම මත ගණේමුල්ල, ගලහිටියාව ශ්‍රී සුගත සුභද්‍රාරාමය විහාරස්ථානය උන් වහන්සේට භාර කෙරිණි. එතැන් පටන් උන්වහන්සේ එම විහාරස්ථානය ස්වකීය විහාරස්ථානයක් ලෙසටම සලකා සුවිශේෂ ආගමික ස්ථානයක් බවට පත් කළහ.

ප්‍රදේශයේ බෞද්ධ උරුමය ආරක්ෂා කිරීම වෙනුවෙන් මෙන්ම ශාසනික අභිවෘද්ධිය ඇති කිරීම වෙනුවෙන් ද උන්වහන්සේ සිදු කර ඇති සේවාව ඉතා විශිෂ්ට වූවකි.

දෙදියවල ශ්‍රී සුදර්ශනාරාම ධර්මාරාම පිරිවෙන් විහාරය ඇතුළු විහාර ගණයේ අධිපති ධුරයට පත් වැත්තෑවේ පඤ්ඤාරාම හිමිපාණන් වහන්සේට නිදුක් නිරෝගී සුවය



සහ චිර ජීවනය ඉත සිතින් ප්‍රාර්ථනා කරන අතර, උන්වහන්සේ විසින් සිදු සිදුකරන සියලු ජාතික, ආගමික, ශාසනික කටයුතු චිරාත් කාලයක් යෙහෙන් කරගෙන යන්නට ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය ලැබේවා'යි ප්‍රාර්ථනා කරමු.


කැලණිය විශ්ව විද්‍යාලයේ වාග්විද්‍යා අංශයේ කථිකාචාර්ය, දර්ශනපති,

**කුරුපිට අස්සජිතිස්ස හිමි**

# ගිහි පැවිදි කිත් යසස් ලබමින සසුනඹර පෑයූ සුපුන් සඳ

## ශාස්ත්‍රපති ගෝනදූවේ ගුණානන්ද නාහිමි

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ හිටපු ප්‍රධාන ලේඛකාධිකාරී බස්නාහිර පළාතේ ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රපති ගෝනදූවේ ගුණානන්ද නාහිමි 80 වැනි ජන්ම දිනය නිමිත්තෙන් පුරා දශක අටක් තරම් තම දිවිය සසුනේ උන්නතියටත්, ඉන් හරි අඩකටත් වැඩියෙන් පමණ ම දහම් පාසල් අධ්‍යාපනයේ පුනර්ජීවනයටත් කැප කළ මහා යතීන්ද්‍රයන් වහන්සේ නමක ලෙස වාද්දුව කොරොස්දූව වජිරකොත් පුරාණ විහාරය, බණ්ඩාරගම කිම්මන්තුඩාව දීපාරාමය යන උභය විහාරාධිපති, සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ හිටපු ප්‍රධාන ලේඛකාධිකාරී, ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ බස්නාහිර පළාතේ ප්‍රධාන සංඝ නායක ශාස්ත්‍රපති ගෝනදූවේ ගුණානන්ද නාහිමිපාණන් වහන්සේ අවිවාදයෙන්ම සිහිපත් කළ හැකි ය.



ගෝනදූවේ ගුණානන්ද හිමියෝ හම්බන්තොට, නාකුළුගමුව, ගාල්ල, කළුතර ඇතුළු ප්‍රදේශවල විද්‍යාල රැසක ආචාර්ය ස්වාමීන්වහන්සේ ලෙස කටයුතු කළහ.

සමස්ත දිවයිනේ ම දහම් අධ්‍යාපනයේ නියමුවාණන් වහන්සේ වීමට වරම් ලබන උන්වහන්සේ 1978 වසරේ දී කළුතර ශාසනාරක්ෂක මණ්ඩලයේ ලේඛකාධිකාරී ලෙස පත් වූහ. 1979 වසරේ දී කළුතර දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලයේ සභාපති ලෙසින් ළාබාලතම සභාපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ ලෙස පත්වීම් ලබන ගුණානන්ද නාහිමියෝ එවකට දහම් අධ්‍යාපනය ලද දරුවන් සංඛ්‍යාව විසි පන්දහසක් පමණ වූවත් 1986 වසර වන විට එය ලක්ෂය පමණ දක්වා වර්ධනය කරන්නේ දිසාවේ නව දහම් පාසල් දෙසීයක් පමණ ද දහම් පාසල් පද්ධතියට එක්කාසු කරමිනි.

1982 වසරේ පටන් දහම් පාසල් සිසු දරු දැරියන්ට නොමිලේ පොත් ලබාදීම, දිස්ත්‍රික් දහම් පාසල් අරමුදල හඳුන්වා දීම, දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පාර්ලිමේන්තු මන්ත්‍රී විමධ්‍යගත අයවැයෙන් දහම් පාසල් අධ්‍යාපනයට ප්‍රතිපාදන ලබා ගැනීම, දහම් පාසල් සතිය ක්‍රියාත්මක කිරීම, දහම් පාසල් කොඩි දිනය ක්‍රියාත්මක කිරීම, දහම් සරසවිය, සසුනෙන් සෙවණ වැඩසටහන ආදිය ඒවායින් කිහිපයක් පමණි.

2002 වර්ෂයේ දී සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ ප්‍රධාන ලේඛකාධිකාරී ධුරයට උන්වහන්සේ පත් වූයේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි.

උන්වහන්සේගේ ශාසනික, සමාජයීය මහා මෙහෙවර අගයමින් මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශවයේ මහා නායක මහා ස්වාමීන්ද්‍රවර ප්‍රමුඛ කාරක සංඝ සභාවේ අනුමැතියෙන් බස්නාහිර පළාතේ ප්‍රධාන සංඝනායක පදවියෙන් පිදුම් ලදහ.

නූතනයේ සසුන් කෙත ප්‍රභාවත් කරමින් පැවිදි ගිහි සැමගේ කිත් යසස් ඇතිව වැඩවසන මහා සංඝ නේතෘ අපේ ගෝනදූවේ ගුණානන්ද බස්නාහිර පළාතේ ප්‍රධාන සංඝනායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට තවත් චිරාත් කල් ලෝ සසුන් වැඩ වඩන්නට උතුම් තෙරුවන් සරණ මෙන්ම සියලු දෙවි රැකවරණ වේවා.

වාද්දුව

**ජනක ජීවන්ත හෙට්ටිආරච්චි**

## උදාර යුග මෙහෙවරක අත්‍යුදාර යතිවර නාමය

# ආචාර්ය පන්නිල ශ්‍රී ආනන්ද නාහිමි






**දැයේ දරුවන් ගුණ නැණ බෙලෙන් පෝෂණය කිරීමේ උදර අරමුණෙන් හා මනා පෞරුෂ ත්වයකින් යුත් පිරිසක් බවට පත් කිරීමේ අත්‍යුදර අදහසින් පාසල් ගොඩනැඟිලි ඉදිකිරීමේ ව්‍යාපෘතියක් මෙයට දහනව වසරකට පෙර ආරම්භ කෙරිණි.**

ඓතිහාසික අත්තනගල්ල ශ්‍රී අරහන්ත රාජමහා විහාරාධිපති, අමෙරිකාවේ හියුස්ටන් බෞද්ධ විහාරයේ සහ තායිවානයේ ථෙරවාද බෞද්ධ විහාරයේ අධිපති, මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ සීනාදි සිවිකෝරළයේ ප්‍රධාන සංඝනායක මහෝපාධ්‍යාය ආචාර්ය පන්නිල ශ්‍රී ආනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ එම පාසල් ගොඩනැඟිලි ඉදිකිරීමේ ව්‍යාපෘතියේ නියමුවාණන් වහන්සේ ය.

දැයේ දරුවන් ලක්ෂ ගණනක් දෛනිකව අකුරු කරන විදුබිම් රැසක මේවන විට පාසල් ගොඩනැඟිලි 36ක් පමණ ඉදිකර ඇත.

උන්වහන්සේගේ අනුස්මරණීය ඓතිහාසික සේවාවන් නිසා යුග ගණනාවක් පුරා අපමණ ජනතාව සැනසීමට පත්වනු ඇත. පන්නිල ශ්‍රී ආනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ උදාර මෙහෙවර එක් අංශයකට පමණක් සීමා නොවීම ද සුවිශේෂී ය. එමෙන්ම එම ආදර්ශවත් මෙහෙවර තුළ ජාති ආගම් ආදී පටුවාද භේද කිසිවකට සීමාවී නොතිබීම ද සුවිශේෂී වෙයි.






ස්වභාවික විපතක්, උවදුරක්, කරදරයක්, පැමිණි සෑම මොහොතකම පන්නිල ශ්‍රී.ආනන්ද නාහිමියන් ඒ මොහොතෙහිම ඉදිරිපත්වී ශක්ති පමණින් ඔවුනට පිහිටවීම උන්වහන්සේගේ දිවිමග පුරා දුටු මහඟු මෙහෙවරකි. සුනාමි උවදුර පැමිණි මොහොතේ තෙල්වත්තේ පල්ලිය ඇතුළු ප්‍රදේශ රැසක නිවැසියන් වෙත දහසකට ආසන්න නිවාස ඉදිකරදීමට පියවර ගත්තේ ඒ මහඟු ගුණ සමුදාය නිසා ය. ප්‍රදේශයේ රෝහල්වල දෛනික පහසුකම් වර්ධනයට ද සහාය වෙමින් රෝහල් උපකරණ පිරිනැමීම ද උන්වහන්සේගේ තවත් මහඟු මෙහෙවරකි. මහරගම අපේක්ෂා රෝහල ඇතුළු රෝහල් කීපයක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් වෙත ගිලන් සංග්‍රහ සිය දහස් ගණන් පිදීමට මුල්වී ක්‍රියා කිරීම ද තවත් සුවිශේෂී මෙහෙවරකි.

දැයේ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ආර්ථික වශයෙන් ඔවුන් දිරි ගැන්වීමට ද පන්නිල ශ්‍රී ආනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ පිහිටවීමට අමතක නොකිරීම ද ආදර්ශවත් තවත් එක් මෙහෙවරකි. ඒ අතර මාසිකව එක් දහස් පන්සියයකට ආසන්න වෛද්‍ය හා පාසල් සිසු පිරිසක් වෙත මූල්‍යමය ශිෂ්‍යාධාර ප්‍රදානය අගනා උදාර මෙහෙවරකි.

මහායුග මෙහෙවරක නිරතව වැඩ සිටින පන්නිල ශ්‍රී ආනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සම්බුදු සසුන්කෙත ආලෝකවත් කරනු පිණිස අත්තනගල්ල, රාජමහා විහාරස්ථ පතිරාජ පිරිවෙන ස්ථාපිත කළහ. ඊට අවශ්‍ය තෙමහල් ශිෂ්‍ය නේවාසිකාගාර ඇතුළු විවිධ පහසුකම් සලසා එහි අධ්‍යාපනය ලබන හිමිවරුන් වෙත ත්‍රිපිටක දහම මෙන්ම විදේශීය භාෂා ඥාණයන් ලබාදීමට පුරෝගාමී මෙහෙවරක් ඉටු කරනු ලැබේ.

ආචාර්ය පන්නිල ශ්‍රී ආනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ජාතික, ආගමික, අධ්‍යාපනික හා සෞඛ්‍ය ආදී විවිධ සේවාවන්ට උදව් උපකාර ලබාදෙති.

මෙබඳු යුග මෙහෙවරක නිරතව ආචාර්ය පන්නිල ශ්‍රී ආනන්ද නාහිමි නමින් පාසල් ගොඩනැඟිලි ඉදිකරවීම පමණක්ම මෙරට දරුවන්ගේ අධ්‍යාපනයට සිදු කළ හා දැනුදු සිදුකරන අත්‍යුදාර මෙහෙවරකි. මෙවන් උදාර යුග පුරුෂයන් වහන්සේ නමක් වන ආචාර්ය පන්නිල ශ්‍රී ආනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ 76 වැනි ජන්ම දිනය නිමිත්තෙන් උන්වහන්සේට තව තවත් ලෝ සසුන් වැඩ සලසන්නට තෙරුවන් සරණින් නීරෝගි චිර ජීවනය පතමු.

බුදුසරණ හිටපු කර්තෘ
බෞද්ධ පත්‍රකලා විශාරද
**සීසර් සුදුසිංහ**

**0+ වකුගඩුවක් අවශ්‍යයි**
**මුදල් ත්‍යාගයක් පිරිනමනු ඇත.**
0776328987
0773313888

**සියලු පහසුකම්වලින් යුක්ත සේනාසනයක වයස අවුරුදු 20-50 අතර පැවදි වීමට කැමති අය විමසන්න.**
ආගමික වතාවත් කිරීමට හැකි ස්වාමීන් වහන්සේලා දෙනමකට නේවාසික පහසුකම් ඇත.
**විමසන්න :**
**0783388464, 0757004550**


**පොල්ගස්ඕවිට ප්‍රදේශයේ විහාරස්ථානයක කටයුතුවලට උදව්දීමට ආවතේවකරුවකු අවශ්‍යයි.**
0112704546
0772729890

තිදරු පියෙකු වන
**එන්.ඒ.කේ. තුෂාර මහතාට**
හදිසි වකුගඩු බද්ධ කිරීමක් සඳහා
**B+ වර්ගයේ වකුගඩුවක්**
ඉක්මණින් අවශ්‍ය කර තිබේ.
පරිත්‍යාගශීලී පින්වතෙක් සිටිනම් ඉක්මණින් අමතන්න.
0763590977, 0769873489
**එන්.ඒ.කේ. තුෂාර අලුත්ගෙදර, 8 ඇල, දියසෙන්පුර, පොළොන්නරුව.**

## ප්‍රහේලිකා අංක 32

බුදුසරණ
ත්‍යාග අනුග්‍රහය බෞද්ධාලෝක පදනම
බෞද්ධාලෝක පදනම BAUDDHALOKA FOUNDATION

**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් සම්මානිත ආචාර්ය කේ. එල්. ඒ. රණසිංහ මහතා විසිනි.**




**හරහට**

01. කඨින පින්කම පැවැත්වෙනුයේ මෙම කාලය අවසානයේදී ය.
04. ඉන්දියාවේ දිල්ලි ප්‍රදේශය පුරාණයේ දී මෙනම් රට ලෙස නම් වීයැයි පැවසේ.
05. මරණින් නිදහස් කිරීම මෙම දානයයි.
07. පහනට ද යෙදෙන නමකි.
09. අටවිසි බුදුවරුන් අතරින් එක් බුදුවරයකුගේ නමයි.
11. බෙංගාලයේ විසූ නොබෙල් ත්‍යාගලාභි සාහිත්‍යධරයෙකි.

**පහළට**

01. අනුරාධපුරයේ රජ කළ මෙතුමා වැව් සහ ජලමාර්ග රාශියක් ඉදි කළ අයෙකි.
03. බෞද්ධ සාහිත්‍යයේ සඳහන් ආදර්ශවත් මව්පිය යුවළකගේ නාමයයි.
05. ඉන්දියාවේ ඇති චිත්‍ර සහිත ලෙන් විහාර සංකීර්ණයකි.
06. තම අවශ්‍යතා අන් අයගෙන් ඉල්ලීම යන අරුත් ඇති පදයකි.
08. සුලභව ආහාරයක් ලෙස ද, ඉදුණු පසු පලතුරක් ලෙස ද ගන්නා මෙරට ඇති භෝගයකි.
10. ඉදුණුවිට කහ පැහැති මෙම පලතුරු වර්ගයෙහි ප්‍රභේද රාශියක් මෙරට ඇත.

**පිරුවානා පොත් වහන්සේ ඇතුළු වටිනා ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**

# උතුම් පින් කෙත මෙසේ ඇසුරු කරමු

**අපගේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් මංචකයේ වැඩ සිටිද්දී ආනන්ද තෙරුන් වහන්සේ අසා වදාළා "ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස, කාන්තාවන් සම්බන්ධයෙන් භික්ෂුවක් කටයුතු කළ යුත්තේ කෙසේද?" කියා. ඒ වෙලාවේ භාග්‍යවතුන් වහන්සේ වදාළා**

"පින්වත් ආනන්ද, කාන්තාවක් සමඟ කතාබහ කරන්නට සිදු වෙනවා නම්, ඒ වෙලාවට බලන්න. මේ තැනැත්තිය අම්මාගේ වයස කෙනෙක් ද කියලා. අම්මාගේ වයස කෙනෙක් නම් මව් චිත්තය, උපදවාගෙන "මගේ මව් හා සමානයි නේ" කියා ගෞරවයෙන් කතා කරන්න යැයි වදාළා.

ඇය තමන්ගේ නැගණිය වගේ නම්, "මගේ නැගණිය වගේනේ" කියා සිහිය උපදවාගෙන කතා කරන්න.

තමන්ගේ දියණියගේ වයස කෙනෙක් නම් "දියණිය වගේනේ" කියා සිහිය පිහිටුවාගෙන කතා කරන්න යැයි වදාළා.

මේ ආකාරයටයි භාග්‍යවතුන් වහන්සේ වදාළ බුද්ධ වචනය මහා සංඝ රත්නය හිස් මුදුනින් පිළිගෙන තිබෙන්නේ. එනිසා කාන්තාවක් ඒ බුද්ධ වචනයට ගරු කරන්න ඕන. තමන්ට භික්ෂුන් වහන්සේ නමක් ඇසුරු කරන්නට ලැබුණොත් ඇය " භාග්‍යවතුන් වහන්සේ සරණ ගිය ශ්‍රාවක පුත්‍රයන් වහන්සේ නමක්නේ කියන ගෞරවයෙන් ඇසුරු කරන්න ඕනේ.

උපසම්පදා සීලය රකින භික්ෂූන් වහන්සේ නමක් සිල්පද 227ක් ආරක්ෂා කරනවා. නිවසේ සිටින අපට සිල්පද පහ රකින්න කොතරම් නම් අමාරු ද? පෝයට උපෝසථ සීලය සමාදන් වෙලා පසුවැනි දා උදේ වෙනතුරු එය රකින්න කෙතරම් යුද්ධයක් කරන්න ඕනෑ ද? ඒ නිසා මවුපියන් අතහැර, ජීවිතය ශාසනයට කැප කර, ධන ධාන්‍ය, බෝග සම්පත්, ලාබ සත්කාර, උගත්කම් අත්හැර බුද්ධ ශාසනයට පැමිණ කසාවතක් දරාගෙන, සීලයක් රකින්නට කොතරම් නම් කැප කිරීමක් කරනවා ද?

කාන්තාව ඒ සෑම දෙයකට ම ගරු කරන්න ඕනේ.

එක දවසක් ස්වාමින් වහන්සේ මහත් වූ කරුණාවෙන් ඇය සමග කතා කරනවා. ඊට පස්සේ දිගින් දිගටම කතා කරන්න ගත්තා ම එය සාමාන්‍ය දෙයක් බවට පත් වෙනවා. අදාළ දේත් කියනවා, තමන්ගේ ප්‍රශ්නත් කියනවා. අදාළ නැති දේත් කියනවා. ඒ ප්‍රශ්න අසන භික්ෂුවට නැති ප්‍රශ්න ඇති වෙනවා.

ඒ නිසා තමන් දැන ගන්න ඕනේ ඒ උත්තමයෝ ඇසුරු කරන විට තමන්ට අවශ්‍යම දේ පමණක් ගරුසරු ඇතිව කතා කරලා එතැනින් ඉවත් වෙන්න. ඒ වගේම සංඝයා වහන්සේ හමුවෙන්න යන විටත් කාන්තාව සංවර ඇඳුමකින් යන්න ඕනේ. තමන් නිසා, තමන්ගේ කායික හැසිරීම නිසා, තමන්ගේ යම්කිසි ක්‍රියාවක් නිසා උන්වහන්සේ ගේ සිතේ අකුසලයක් ඇතිවුණොත් එහි විපාකය තමන්ටත් බලපානවා.

භාග්‍යවතුන් වහන්සේ සංඝ රත්නයට වදාළේ

"පින්වත් මහණෙනි ඔබ ගිහි පිරිස ඇසුරු කළ යුත්තේ කැඩුණු ළිඳක් අසලට ගොස් පරිස්සමට ළං කටට එබෙනවා වගේ" කියලා.

ඒ දේ කාන්තාව හොඳින් අවබෝධ කර ගන්න ඕනේ. සංඝයා වහන්සේගේ ගෞරවයට ගරු කරන්න ඕනේ. යාහලුවෝ වගේ සංඝ රත්නය ඇසුරු කරන්නේ නැහැ.

විනය පිටකයේ තිබෙනවා කාන්තාවක් කිසිම මොහොතක භික්ෂූන් වහන්සේ නමක් සමඟ තනිව කතා නො කළ යුතු බව. එසේ කතා කළොත් ස්වාමින් වහන්සේට එය වරදක් වෙනවා. එතැන වැඩිහිටි පිරිමි කෙනෙක් ඉන්න ඕනේ. ලෝකයේ සිටින පින් කෙතයි අපි රකින්නේ. ඒක කාන්තාවටත් පිනක්.

ගිහි ගෙදර ගිනි ගොඩක් වගේ නේ. නිතරම ප්‍රශ්න. අපේ සිතට කරදරයක්, දොම්නසක් ආ විට, ස්වාමියාගේ ප්‍රශ්නයක්, දරුවන්ගේ ප්‍රශ්නයක් ආ විට ඉක්මනටම දුරකතනයෙන් හෝ ස්වාමින් වහන්සේ නමකට කතා කරනවා. තමන්ගේ දුක් සියල්ලම උන්වහන්සේට කියනවා. ඒ වෙලාවට සංඝයා වහන්සේට ඒවා අසන්න වෙනවා. වචනයකින් දෙකකින් ස්වාමින් වහන්සේ පිළිතුරක් දී සිත සනසන්න හැදුවට ඒකට එතරම් කැමැති නැහැ. නැවත නැවත දුරකතන ඇමතුම් දී උපකාර ඉල්ලනවා. සමහර විට සංඝයා වහන්සේ ගිහි ගෙදර සිටිද්දීවත් ඒ වගේ ප්‍රශ්න අහලා නැහැ. මුහුණ දීලා නැහැ. විසඳුම් දන්නෙත් නැහැ. අහක තිබෙන ප්‍රශ්න කන්දරාවක් උන්වහන්සේගේ ඔළුවට දානවා. කවදාවත් එහෙම කරන්න එපා.

කාන්තාවන් වශයෙන් අප කළ යුත්තේ කියා දෙන බණ පදයක් අහලා එය පුරුදු කිරීම යි. අවශ්‍යම කාරණයක දී පමණක් ගෞරවයෙන් ගරුසරුව

"ලෝකයේ පින් කෙතයි මම මේ ඇසුරු කරන්නේ"

සිතා තමන්ගේ සිතත් අකුසලයකට වැටෙන්නට නොදී ආරක්ෂා කරගෙන ඇසුරු කළොත් සංඝයා වහන්සේ මේ ලෝකයේ බොහෝ කාලයක් රැකී සිටියි.

අපට මේ ප්‍රශ්න කියන්න එපා. අවේලාවේ එන්න එපා කියලා ස්වාමින් වහන්සේලාට කියන්න අපහසු වෙන්න පුළුවන්. සංඝ රත්නය කියන්නේ ලොවට අනුකම්පා කරන පිරිසක්. දුකක් කියාගෙන එන පිරිසකට දුක කියන්න එපා කියා එළවන්නේ නැහැ. ඒ නිසයි කාන්තාව සීමාව දැනගන්න ඕන.

ගරු කළ යුතු තැන අකුසල් උපදවා ගන්න එපා. අපි ස්වාමින් වහන්සේලාගේ ශාසන ප්‍රතිපදාවට අත්වැලක් වෙමු. විපත් එන තැන් වසාගෙන සංඝයා වහන්සේ ඇසුරු කරන්න සිතට ගනිමු.

ගින්දරේ අනතුර දන්න කෙනා ගින්දරයට ළං වෙන්නේ නැහැ. ඒ වගේ සංඝ රත්නයට සැප සේ වාසය කරන්න ඉඩ දෙන්න ඕනේ. උන්වහන්සේ අපහසුවට පත් කළොත් එහි විපාකය තමාට බව සිහි කරන්න. ඒ ගැන පේතවත්ථු කතාවල දී අපට මුණ ගැහෙනවා.

**නයනා නිල්මිණී**



මලක් මොනතරම් ලස්සන වුවද සුවඳ නොවේ නම් එහි වටිනාකම හීනය. ඒ වගේම මොනතරම් ධර්මය ඇසුවද ඒ දහම් කරුණු ජීවිතයට පුරුදු නොකරන්නේ නම් ඔබද සුවඳ නැති මලක් වගේය

## දුරුතු පෝය



බුදුරජාණන් වහන්සේ පළමු වරට ලංකාවට වැඩමවූයේ දුරුතු පුන් පෝ දිනයක දී ය. ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වූ බරණැස ඉසිපතනයෙහි පළමුවන වස් කාලය ගත කළ බුදුපියාණෝ අනතුරුව රජගහනුවර බලා ගමන ආරම්භ කළහ. අතරමඟ උරුවෙල් දනව්වෙහි වාසය කළ උරුවෙල් කස්සප, නදී කස්සප හා ගයා කස්සප යන ප්‍රධාන ජටිලයන් තිදෙනා ඇතුළු ඔවුන්ගේ දහසක් බැගින් වූ පිරිස හික්මවා ධර්මාවබෝධය ලබා ගැනීමට මඟ සැලසූහ. අනතුරුව උන්වහන්සේ ලක්දිව මහියංගනයෙහි පිහිටි රමණීය උයන වෙත වැඩම කළහ. මහියංගන ප්‍රදේශයේ විසූ යක්ෂ ගෝත්‍රිකයන් මුලදී උන්වහන්සේගේ වැඩමවීම පිළිබඳ විරුද්ධත්වය දැක්වූ නමුත් දහම් දෙසීමෙන් ඔවුන්ගේ සිත් දමනය කොට උපශාන්ත ස්වභාවයට පත් කිරීමට බුදුරදුන්ට හැකි විය. එදින බණ ඇසූ සමන්ගිරට අධිපති සුමන සමන් දෙවියෝ පැහැද සෝවාන් භාවයට පත්ව වැඳුම් පිදුම් කිරීම සඳහා යමක් දෙන මෙන්. උන්වහන්සේගෙන් ඇයැද සිටියහ. මේ අවස්ථාවෙහි සිය සිරස පිරිමැද ලබා දුන් කේශ ධාතු රන් කරඬුවකින් පිළිගත් සමන් දෙවියෝ බුදුරදුන් වැඩ සිටි ස්ථානයෙහි එම ධාතුන් වහන්සේ තැන්පත් කොට නිල් මාණික්‍යයක් මත සත්රියන් උසැති දාගැබක් කරවූහ. ශ්‍රී ලංකාවේ ප්‍රථම දාගැබ මහියංගන දාගැබ යි. එය දෙවියකු විසින් ඉදිකර තිබීම විශේෂ සිදුවීමකි.

**බෝගමුවේ නන්දසාර හිමි**
**3 වසර**
**ශ්‍රී සංඝබෝධි පරමානන්ද පුරාණ විහාරය**
**පොතුහැර**

# අමතර බල ඇණි නොලැබුණොත් අපේ පරාජය සිකුරුයි

## දුටුගැමුණු මහ රජතුමා

91 කොටස

නොකල්හි වීවී සංචාරය කළොත් තමන්ගේ ආරක්ෂාවට බාධා පැමිණේ. අඹුදරුවන් අනාරක්ෂිත වේ. වස්තුව ආරක්ෂිත නොවේ. තමන් වැරැදි කරන්නට මුල්වන කෙනකු ලෙස සමාජයේ සැකයට ලක්වේ. නොකළ වැරැදිවලට චෝදනා ලැබේ. අපමණ දුක් කරදරවලට මුහුණ දෙන්නට සිදුවේ.

"අද හෙටම එහි උපතිස්ස යවාවි."

"මම මෙහි පැමිණියේ මගේ කටයුතු සංවිධානය කොට විසිමහ යෝධයන් ඇතුළු සේනාංක අදාළ කඳවුරුවලට ඇතුළත් කොට" "අම්බතිත්ථයෙන් මොබට ගැමුණු රජුට එන්නට බැරිවේවි."

"ළිං මැඩියෙක් වෙන්නට එපා තුණ්ඩිල." "තිත්ථම්භ සෙනෙවියා ඝාතනය කොට, අම්බතිත්ථ බලකොටුවේ සියලුම සෙබළුන් කඩුගා දමා බලකොටුවෙහි ගිනිලා ඇති බව තොප දන්නේ නැද්ද?"

"කුමරියනි, ඔබේ සිහින ලෝකයට මට ළං වන්නට බැරි බව ඇත්ත. එහෙත් ගැමුණු බළ ඇණි පන්නා හැර අනුරාධපුර රාජධානිය ඔබේ පියතුමාට සුරක්ෂිත කොට දී ඉක්බිති මාත් සමඟ සොළී රටට යාමට සූදානම්ව ඉන්න."

"තුණ්ඩිල එය තොපේ සිහිනයක් විතරයි. සිහිනයක් කෙදිනකවත් සැබෑ නොවන බව සිතට ගනුව."

කුමරියගේ කෝප සහගත වචන හා දැඩි බව දුටු එතෙක් ඈතට වී සිටි දන්තීත් පුණ්ණාත් වහා එතැනට පැමිණියහ. ඔවුන් දෙස කෝපයෙන් බැලූ තුණ්ඩිල යන්නට සූදානම් වුණා පමණකි.

ප්‍රධාන දොරටුවෙන් ඇතුළුවන සිරිනාග මහසෙනෙවි දුටු ඔහු මදකට නතර විය. තුණ්ඩිල ගැන වැඩි සැලකිල්ලක් නොදැක් වූ සිරිනාග කුමරියට ආචාර කළේ ය. දන්තීත් පුණ්ණාත් දෙස බලා සිනාහවකින් සංග්‍රහ කළේ ය.

"කුමරිය රජතුමාගේ පණිවුඩයක් දොරමඬලාවට ලැබුණා. වහාම පැමිණෙන ලෙස දන්වා තිබුණා."

"කවදා?"

"අද දවල්" "අද සියලුම සෙනෙවිවරු යුද්ධ සම්මන්ත්‍රණ ශාලාවට කැඳවා තිබුණා. තුණ්ඩිල තොප ඒ බව දන්නවාද?"

"නැහැ. වට කැඳවීමක් කෙරෙන එකක් නැහැ. තවමත් මගේ රාජකාරිය මහවැලි ගං තීරයේ නිසා."

"අපූරුයි තොප තොපගේ වගකීම් ඉටුකරන විලාසය. එහෙන් තොටමුණු ගිනි ගන්නවා. තොප මෙහි පෙම් කෙළිනවා.

කුමරියගේ මුහුණේ ඇති වූ වෙනසත්, කෝප සහගත බැල්මත් දුටු සිරිනාග පශ්චාත්තාප විය.

"සමාවෙන්න කුමරිය"

"පෙම්කෙළිනවා නොවෙයි."

" පෙම අයැදිනවා. නමුත් කෙදිනකවත් ඔහුගේ සිතැගි ඉටුවෙන්නේ නැහැ. ඔහු මෝඩයෙක්. තිත්ථම්භ සෙනෙවියා ඝාතනය කළ බවත්, සත්බෑ කෝට්ටේ බිඳ ලූ බවත්, සියලුම කඳවුරු වටලා ගිනි තැබීමට සූදානම් බවත් මම මොහුට කීවා. ඒ මගේ, සිහිනයක් යැයි මොහු කියනවා."

සිරිනාග පුදුමයට පත්විය. විමතියෙන් ඇය දෙස මොහොතක් බලා සිටියේ ය.

"කුමරිය මේ සිදුවූ සියල්ල ඔබ දන්නේ කෙසේද?"

"තමන්ගේ රටටත් ජාතියටත් ආදරය ඇති කවුරුන් වුවත් විවෘත ඇස් කන් ඇතිව සිටිනවා නම් හොයා ගන්නට බැරි මොනවාද?

"මොහොතක් නොරැඳුණු තුණ්ඩිල තමාගේ අශ්වයා ගෙන්වා ගෙන වහා පිටත් විය. එහෙත් තමන් යා යුත්තේ කොතැනට දැයි ඔහුට අරමුණක් නොවීය.

සිරිනාග රජකුමරියගේ ඉල්ලීම අනුව රජතුමා බැහැ දකිනු පිණිස ඉහළ මාලයට නැඟුණේ ය. රජතුමා යුද්ධ සම්මන්ත්‍රණ ශාලාවට යාමට සූදානම්ව සිටියේ ය.

"යමු සිරිනාග, එනතෙක් බලාගෙන සිටියේ, අපි යන ගමන් කතා කරමු." "සිරිනාගගෙන් දැනගන්නා තොරතුරු මට යුද්ධ මණ්ඩල රැස්වීම සඳහා ප්‍රයෝජනවත් වේවි."

"දියණිය, අප නොදන්නා බොහෝ දේ සිදු වී ඇති බව පෙනේ. බැහැර නොගොස් මාලිගයේම රැඳෙන්න". එසේ කී රජතුමා අත්හළයා විසින් ගෙනෙන ලද පර්වත ඇතු පිට නැඟී පිටත් විය. සිරිනාග සිය අසු පිටට නැඟී රජුට එක්වනු ඇය බලා සිටියා ය.

මහවැලි ගං තීරයේ බලකොටු හා කඳවුරුවල විනාශය එළාර රජතුමාට දැනගන්නට ඉඩ නොතැබීම දීඝජන්තුගේ අදහස විය. විශාල බල සේනාවක් යොදවා රුහුණු සේනා මහවැලි නදියෙන් මෙතෙරට ඒම වැළැක්වීම ඔහුගේ අදහස විය. සිරිනාගගෙන්, විසිමහ යෝධයන්ගේ සහ එම සේනාංකවල විනාශය දැනගත් රජතුමා කෝපයටද බයට ද පත්විය."

"මේ විනාශය රාජ සභාවට හෝ මහ සෙනෙවි මණ්ඩලයට වාර්තා නොකළේ ඇයි?"

රජතුමා වේගයෙන් ඇසුවේ දීඝජන්තු මහ සෙනෙවිගෙනි. ඔහු පිළිතුරක් නැතිව බලා සිටියේ ය.

"මරජතුමනි, ඒ තොටමුණුවල බලකොටු විනාශය ගැන තුණ්ඩිල දන්නේ නැහැ. "තොප ඒ බව දන්නේ කෙසේද?"

"මහ රජතුමනි, ඔහු මට රාජාංගනයේ දී හමුවුණා.

"මහසෙනෙවි ඔහු මෙහි පැමිණියේ කවදාද? නොදනිමි මහ රජතුමනි."

"සිරිනාග තොපට ඔහු හමුවූයේ කොයි වෙලේද?"

" දැනට හෝරා දෙකකට පමණ පෙරදියි. විජිතපුර බලකොටුවේ මහසෙන්පති ලෙස ඔහු පත්කොට ඇති හෙයින් එහි යන ගමන් රාජ මාලිගයට පැමිණි බව කීවා. "කෝපයට පත් රජතුමා කිසිවක් නොකීය.

රජු දීඝාභය දෙස බැලුවේ ය.

උපතිස්ස යුද්ධ මණ්ඩල රැස්වීමට පැමිණ නැත. පසුගිය යුද්ධ මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණ කිසිවක් වෙනස් කිරීමට කැමැත්තක් මගේ නැහැ. එහි වගකීම් සියල්ල ඒ තීරණ ගත් අය දරන්නට ඕනෑ. සිදුවී ඇති විපතත්, පරාජයත් ගැන වගකියන්නේ කවුද?


"දුටුගැමුණු රජුගේ බල සේනා දවසින් දවස වර්ධනය වෙනවා. අපේ බලය දවසින් දවස අඩුවෙනවා. දුටුගැමුණු කසාතොටින් මෙතෙරට පැන්නොත් අපිට සොළී දේශයට යා ගන්නටත් ඉඩක් ලැබෙන එකක් නැහැ. අපි ඉල්ලා ඇති සේනාංක අපට අද හෙට නො ලැබුණොත් අපේ පරාජය සිකුරුයි."

" මහරජතුමනි කසාතොට බලසේනා තරකිරීම වෙනුවට විජිතපුර බලකොටුවෙහි ආරක්ෂා තර කිරීම රාජ්‍ය නගරයේ ආරක්ෂාවට වඩාත් වැදගත් බව මගේ හැඟීමයි."

"තොප කියන්නේ රුහුණු සේනාවට මේ රාජධානියට, ඇතුල්වීමට ඉඩදිය යුතුයි කියාද? රජු පුදුමයෙන් ඇසීය."

"නැහැ රජතුමනි, කසාතොට අපට රැකවල් කළ හැකියි. ඔවුන් වඩමන් තොටින් හෝ දමුන්නරුවෙත් මෙතෙරට පනීවි. එය අපට වළක්වනන්නට බැහැ." සිරිනාග කීය.


අයන්ති විතාන



# අමරපුර මහා සංඝ සභාවට නව නිලධාරි මණ්ඩලයක්

ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ 2023 /27 වර්ෂ පහක කාලය සඳහා නව නිලධාරි මණ්ඩලයක් තෝරාපත්කර ගැනීම පසුගියදා අභිධර්මහාරටිධගුරු දොඩම්පහල චන්දසිරි උත්තරීතර මහාස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැවති නියෝජිත මහා සංඝ සභාවේදී සිදුවිය.

එහිදී අභිනව සභාපතිධුරය සඳහා ශාස්ත්‍රපති කරගොඩ උයන්ගොඩ මෛත්‍රී මූර්ති මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ තේරිපත් විය.



කරගොඩ උයන්ගොඩ මෛත්‍රී මූර්ති මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ



බලපිටියේ සිරිසීවලී නායක ස්වාමීන්ද්‍රයන්වහන්සේ

බලපිටිය ශ්‍රී ලංකා ප්‍රාචීන භික්ෂු විද්‍යාලයේ මහෝපාධ්‍යාය, අමරපුර සද්ධම්මවංශ මහානිකායේ මහාලේඛකාධිකාරි, දර්ශනපති රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී නායක ස්වාමීන්ද්‍රයන්වහන්සේ ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ අභිනව මහාලේඛකාධිකාරි ධුරයට තේරිපත් වූහ.

**නව නිලධාරි මණ්ඩලයේ විස්තර නවම් පුර පෝදා පුවත්පතේ පළවේ.**

# සංඝනායක පදවි ලබති



ගාල්ල හික්කඩුව පතන ශ්‍රී ධර්මාරාම මහා විහාරාධිපති විශේෂ කර්මාචාර්ය වේරගොඩ ශ්‍රී කස්සප නාහිමියන් වෙත මල්වතු පාර්ශ්වයේ මහානායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහානායක ස්වාමීන්ද්‍ර වරප්‍රමුඛ සානුනායක කාරක මහා සංඝ සභාව විසින් ධර්ම කීර්ති ශ්‍රී සිද්ධාර්ථ මේධංකර යන ගෞරව නාම සහිතව දක්ෂිණ ලංකාවේ සමථ බල සම්පන්න උපප්‍රධාන අධිකරණ සංඝනායක පදවිය පිරිනමා ඇත.

## පෝය වරුණ

දුරුතු මහේ පෝ දින
දහම් රසය අරගෙන
බුදු සමිඳුන් වැඩි තැන
මුල් වර මහියංගන

සමනල කඳු මුදුනට
බුදු සිරිපා වැඳුමට
දුරුතු පොහොය මුල්කොට
ජනගඟ යති සිරිපාදෙට

ආකාසේ වැඩ සිට
යක් සේනා බිය කොට
දහම් දෙසුම මුල් කොට
සුමන සමන් දෙවිහට

*රුවිඳි ජයතිලක*
*3 ශ්‍රේණිය,*
*බෝසත් දහම් පාසල*
*නුගේගොඩ*

## පිහිට පතයි

නුගේගොඩ, ගංගොඩවිල, පැඟිරිවත්ත පාර, අංක 75/3 හි පදිංචි ඩබ්ලිව්.කේ. ගුණවර්ධන මහතා දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට "ඕ" පොසිටිව් හෝ "ඕ" නෙගටිව් වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය බවද කියයි. පරිත්‍යාගශීලියකු වේ නම් 0770707174 හෝ 0714909704 දුරකතන අංකයන්ට දන්වන ලෙස ඉල්ලීමක් කරයි.

## ගංගොඩවිල සෝම හිමි සමරා පින්කම්



අපවත් වී වදාළ ගංගොඩවිල සෝම හිමිපාණන්ගේ 19 වැනි ගුණ සමරු පින්කම පසුගියදා උන්වහන්සේ උපන්ගම වන ගංගොඩවිල දෙල්කඳ හයිලෙවල් පාර ඉදිරිපිට දී ඇති ගංගොඩවිල සෝම හිමිපාණන්ගේ පිළිරුව අභියස දී පැවැත්වුණි.

මෙම අවස්ථාවට ශාස්ත්‍රවේදී පල්ලේවෙල දේවරක්ඛිතහිමි, ගංගොඩවිල බොදු පදනමේ සභාපති ජයන්ත ජයමාන්න, සෝම හිමියන්ගේ සොයුරු පත්මසිරි වීරතුංග යන මහත්වරු ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ.

# පෝදා පින්කම්

### ඓතිහාසික ශ්‍රී කලයාණි රාජමහා විහාරය

පෙ.ව. 06.00 - 6.30 සීල සමාදානය 06.30 - 7.00 උදෑසන බුද්ධ පූජාව, ශ්‍රී කලයාණි රාජමහා විහාරයේ කෘත්‍යාධිකාරි ශාස්ත්‍රවේදී රන්දිලිගම මහින්ද හිමි , 08.00 - 9.00 ගුවන්විදුලි ධර්මදේශනාව කොලොන්නාවේ ශ්‍රී බෝධි විහාරාධිපති බොරැල්ලේ කෝවිද හිමි, 09.00 -10.00 භාවනා ශ්‍රී කලයාණි උභය රාජමහා විහාරාධිපති, කැලණිය විශ්වවිද්‍යාලයේ කුලපති අග්ගමහා පණ්ඩිත, උපාධ්‍යාය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමි, 11.00 -11.30 දිවා බුද්ධ පූජාව - ශ්‍රී කලයාණි රාජමහා විහාරවාසී, ඇතිමලේ සීලානන්ද හිමි, ප.ව. 12.15- 2.00 සීල භාවනා සමිතිය, 02.00 -3.00 විශේෂඥ වෛද්‍ය දේශනය, 03.00 -4.00 ධර්ම දේශනාව ශ්‍රී කලයාණි රාජමහා විහාරවාසී කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය දෙනියායේ පඤ්ඤාලෝක බුද්ධරක්ඛිත හිමි, 05.00 - 6.00 භාවනා - ශ්‍රී කලයාණි උභය රාජමහා විහාරාධිපති, කැලණිය විශ්වවිද්‍යාලයේ කුලපති, අග්ගමහා පණ්ඩිත, උපාධ්‍යාය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමි, 06.00 -7.00 ගිලන්පස බුද්ධපූජාව, ශ්‍රී කලයාණි රාජමහා විහාරවාසී, කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය දෙනියායේ පඤ්ඤාලෝක බුද්ධරක්ඛිත හිමි, 07.00 -8.00 සන්ධ්‍යා ධර්ම දේශනාව, ගම්පහ බැන්ඩියමුල්ලේ ශ්‍රී විද්‍යාශේකර පිරිවෙන් විහාරාධිපති ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත බැලුම්මහර ඉන්ද්‍රානන්ද හිමි.

### සිරි වජිරඤාණ ධර්මායතනය – මහරගම තරුණසීල සමාදනය

පෙ.ව. 06.00 -7.00 සිල් සමාදන් කරවීම, අනුශාසනාව හා බුද්ධ පූජාව, ශාස්ත්‍රපති පණ්ඩිත හක්මන සුමනසිරි නාහිමි 08.00 -9.00 භාවනාව – කොත්මලේ ඤාණවංස හිමි, 09.00 -10.00 ධර්ම දේශනාව, හැඳල දමිත හිමි, 10.00 -11.15 පරෝපකාර සංග්‍රහය – අනුශාසනාව හා බුද්ධ පූජාව, ශාස්ත්‍රපති පණ්ඩිත මහඔය අනුරුද්ධ හිමි

පස්වරු 12.30 -1.00 පිරිත් හා තෙරුවන් ගුණ – අකුරැස්සේ ධම්මරතන හිමි, 1.00 - 2.00 ධර්ම සාකච්ඡාව – ගල්කිස්සේ සෝමානන්ද හිමි, 2.00 - 3.00 වෙසෙසි දෙසුම – මහාචාර්ය නිමල් හෙට්ටිආරච්චි මහතා ,03.00 -4.00 ධර්ම දේශනාව – ගම්පහ පාසාදික හිමි, 4.15 - 5.00 ධම්මපදය – ශාස්ත්‍රපති පණ්ඩිත ගබ්බෙල වජිර හිමි, 5.00 -6.00 ධර්ම දේශනාව, දියතලාවේ පියදස්සි හිමි, 6.00 -6.30 බෝධි පූජාව මෙහෙයවීම – ශාස්ත්‍රපති පණ්ඩිත හක්මන සුමනසිරි නාහිමි

### සිරි වජිරාරාමය – බම්බලපිටිය

පෙ.ව. 06.00 -7.15 සිල් සමාදන් කරවීම අනුශාසනාව සහ බුද්ධ පූජාව, අග්ගමහා පණ්ඩිත ශාස්ත්‍රපති තිරිකුණාමලේ ආනන්ද මහානාහිමි, 08.00 - 9.00 ධර්මානුශාසනාව – ගෞරව ශාස්ත්‍රවේදී කැලණියේ සාසනවංස හිමි, පෙ.ව.9.00 -10.00 ධර්මානුශාසනාව මහානාම විද්‍යාලයේ ආචාර්ය කොලොන්නාව පුරාණ විහාරවාසී සියඹලාගොඩ ධම්මින්ද හිමි. පෙ.ව.10.00 - 11.15 භාවනාව, අනුශාසනාව හා සම්බුද්ධ පූජාව, සිරි වජිරාරාමවාසී රාජාංගනේ සීලවිමල හිමි, ප.ව. 12.30 -1.15 සතිපට්ඨාන සූත්‍ර දේශනාව – සිරි වජිරාරාමාධිකාරි සිරි වජිරාරාම දහම්පාසල් අධ්‍යක්ෂ , කඹුරුගමුවේ මහානාග හිමි,

පස්වරු 0.15- 02.30 ධර්ම සාකච්ඡාව, සිරි වජිරාරාම දහම් පාසල් ප්‍රධානාචාර්ය ගෞරව ශාස්ත්‍රවේදී මීගොඩ සුබිත හිමි, 03.00 -4.00 භාවනාව සහ අනුශාසනාව – සිරි වජිරාරාමවාසී විනයාචාර්ය පිටිපන සාසනරතන හිමි, ප.ව.4.00 -5.00 ධර්මානුශාසනාව කුඹුක සිරි වජිරඤාණ ධර්ම නිකේතන විහාරාධිපති ගෞරව ශාස්ත්‍රවේදී ගල්කිස්සේ සෝමානන්ද හිමි, ප.ව. 05.00 - 6.00 ධර්මානුශාසනාව – මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේ උප ප්‍රධානාචාර්ය ත්‍රිපිටකාචාර්ය රාජකීය පණ්ඩිත වේරදුවේ මහින්ද හිමි, ප.ව. 06.00 - 6.30 අටවිසි බුද්ධ වන්දනාව හා සිල් අලුත් කිරීම, සිරි වජිරාරාමවාසී ස්වාමීන් වහන්සේලා

### සිරි වජිරඤාණ ධර්මායතනය - මහරගම වැඩිහිටි සීල සමාදාන වැඩසටහන

පෙ.ව. 06.00 - 07.00 සිල් සමාදන් කරවීම සහ බුද්ධ පූජාව පැවැත්වීම, ත්‍රිපිටකාචාර්ය මලංගම පඤ්ඤාසාර හිමි, පෙ.ව. 08.00 - 09.00 භාවනාව - රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති හක්මණ සුමනසිරි නාහිමි, පෙ.ව. 09.00 - 10.00 ධර්ම දේශනාව - කොළඹ විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය මඩිහේ සුගතසිරි හිමි, පෙ.ව. 10.00-11.00 සූත්‍ර දේශනාව- රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පානදුර පසන්න හිමි, පෙ.ව. 11.00-11.15 බුද්ධ පූජාව - පොළොන්නරුවේ විමලසිහ හිමි, බුලත්සිංහල සුවචධම්ම හිමි.

ප.ව. 12.20-01.00 පිරිත් හා තෙරුවන් ගුණ - සෙල්ලකතරගම සන්තිඳ හිමි, වැලිගෙපොල සුගතවංස හිමි.

ප.ව. 01.00-02.00 ධර්ම සාකච්ඡාව - ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත වේරදුවේ මහින්ද හිමි,

ප.ව. 02.00-03.00 ධර්ම දේශනය - හෝමාගම ධම්සෙවණ මධ්‍යස්ථානාධිපති හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ආචාර්ය රාජකීය පණ්ඩිත ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය මාවතගම පේමානන්ද හිමි, ප.ව. 03.00-03.45 ධර්ම දේශනාව- කොබෙයිගනේ ධම්මදස්සි හිමි,

ප.ව. 04.00-05.00 ධර්ම දේශනාව - අතුරුගිරිය සම්මාසමාධි ජාත්‍යන්තර විපස්සනා භාවනා මධ්‍යස්ථානාධිපති ඇඹිලිපිටියේ ආනන්ද හිමි, ප.ව. 05.00-06.00 ධම්ම පදය- ශාස්ත්‍රපති පණ්ඩිත වතුරගම ධම්මජීව හිමි, ප.ව. 06.00-06.30 බෝධිපූජාව සහ සිල් අලුත් කිරීම, මෙහෙයවීම - රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති හක්මන සුමනසිරි නාහිමි.

### කොබවක ශ්‍රී සුමනාරාමය

පෙ.ව. 08.30 ට ධර්ම දේශනාව - බෝතලේගම ශ්‍රී ධර්මපාලාරාමය හා රැටියල සුධර්මාරාමය යන උභය විහාරාධිකාරි කුඩලිගම සෝරත හිමි, පෙ.ව. 09.30ට සදහම් වන්දනාව හා දහවල් බුද්ධ වන්දනාව , හොරණ ශ්‍රී අනුලාරාමවාසී ආදළුවේ සුබෝධනී මෙහෙණින් වහන්සේ.

ප.ව. 01.30ට භාවනා වැඩසටහන වෑකඩ හදා මෙහෙණින් වහන්සේ, 3.00 ට ධර්ම දේශනාව කළුතර නාගොඩ ශ්‍රී සුදර්ශනාරාම මහා විහාරය පහළ නාරගල ශ්‍රී සුවිශුද්ධාරාමය යන උභය විහාරාධිපති නාගොඩ ධම්මවංස හිමි. ප.ව.6.00 ට ගිලන්පස බුද්ධ පූජාව, බෝධි පූජා පින්කම කොබවක ශ්‍රී සුමනාරාම විහාරාධිකාරි රැටියල ශ්‍රී ධම්මාලෝක පිරිවෙණේ ධර්මාචාර්ය වීරියගම අනුරුද්ධ හිමි

# සිත නම් වූ ගෙවත්ත වල්බිහිවන්නට නොදෙන්න

**ලැබූ අලුත් අවුරුද්දේ අපි අධිෂ්ඨාන පූර්වක ගමනක් යමු. බෝසත්වරු බාධක මැඬගෙන ඉලක්කගත ගමනක් තුළින් බුදු බව ලබති. අධිෂ්ඨාන පූර්වක ඉලක්කගත ගමන විමුක්තියට පමණක් නොව අප ගතකරන සාමාන්‍ය ලෞකික ජීවිතය ද ජයකණුව කරා මෙහෙයවීමේ හැකියාවෙන් යුක්ත ය.**

මෙය මිනිසා සතු 'විභව' ශක්තියේ ප්‍රතිඵලයක්. විභව යනු පුළුවන් බව ය. එනම් පුද්ගලයා සතු හැකියාවයි. ඉලක්ක සපුරා ගැනීමේ දී අප තුළ ඇති සැඟවුණු ශක්තිය මල්ඵල ගැන්වීම අප සතු වගකීමකි. මෙලොව සිටින අනෙකුත් සියලු සත්ත්වයින්ට වඩා මිනිසා සතු විභව ශක්තිය ආශ්චර්යවත් ය. එමෙන්ම බලසම්පන්න ය. මෙයින් උපරිම ඵල නෙළා ගැනීමේ හැකියාව මිනිසා සතු ය. බුද්ධත්වය යනු මේ විභව ශක්තියේ උපරිම ප්‍රතිඵලයයි.

අනෙකුත් සත්ත්වයින්ට මෙන් නොව මිනිසාට තීරණ ගැනීමේ හැකියාව ඇත. හරි වැරැද්ද, කළ යුතු, නොකළ යුතු දේ වටහා ගැනීමේ හැකියාව ඇත. හැම පැත්තක්ම බලා යා යුතු මඟ තේරුම් ගැනීමේ ශක්තිය ඇත. මිනිසා ලබා ඇති මේ 'විභව' සම්පත මලානික වන්නට නොදී රැක ගත යුතුව ඇත.

දියුණුවක් බලාපොරොත්තු වන්නා තුළ සිහිනයක් තිබිය යුතු ය. උගතකු වීමට ධනවතකු වීමට, ව්‍යාපාරිකයකු වීමට, දේශපාලනඥයකු වීමට, වෛද්‍යවරයකු වීමට, ඉංජිනේරුවරයකු වීමට වැවිලිකරුවකු වීමට ආදි වශයෙන් තමා තුළ මවාගත් සිහිනය යථාර්ථයක් කර ගැනීම ඉලක්කය විය යුතු ය.

මෙහිදී අප වටා ඇති පරිසරය වැදගත් වනු ඇත. විශේෂයෙන් සමාජ ඇසුර ගැන ද අප සිතිය යුතු ය. හොඳ, බුද්ධිමත්, අවංක ඇසුර ජය කණුව කරා ඔබ ඉක්මනින් ළඟා කරවීමට මහඟු පිටිවහලක් වනු ඇත. වැරැදි ඇසුර ඔබ මොට්ට කරයි. මලානික කරයි. ඔබගේ වටිනා විභව ශක්තිය නිෂ්ක්‍රිය කරයි.

මුතු ඇටයක් සෑදෙන්නේ කෙසේද? වැලි කැටයක් වැනි දෙයක් මුතු බෙල්ලාගේ කටුව තුළට ඇතුළු වුවහොත්, කටුව තුළ තැවී තැවී කාලයක් පැවතුණහොත් වටේ ඇති කැල්සියම් නිසා ලස්සන මුතු ඇටයක් බවට පරිවර්තනය වෙයි.

මේ අයුරින් ම අපේ යටි හිත තුළ පවතින සිහින සිතිවිල්ල නිරන්තරව ඔප දමන විට එය ජයග්‍රාහී ඉලක්කයක් කරා යොමුවනු ඇත. මෙය ඕනෑම කෙනකුට කළ හැකි කාර්යයකි. ඒ සඳහා කළයුතු මූලිකම දෙය යටි හිත තුළ තම අධිෂ්ඨානය තැන්පත් කර ගැනීමයි. අප සිතන තරම් ඉක්මනින් ප්‍රතිඵල දැක ගන්නට නොහැකි විය හැකි ය. අප තුළ ඇති අධිෂ්ඨානය වැඩෙන්නට, පෝෂණය වන්නට, මෝරන්නට කාලයක් ගතවනු ඇත.

බුද්ධත්වය ප්‍රාර්ථනා කළ බෝසතාණන් වහන්සේගේ අධිෂ්ඨානය. ප්‍රාර්ථනය ඉටු වන්නට මොනතරම් කාලයක් ගත වුණා ද? සමහරු බලාපොරොත්තු වන්නේ ඉක්මන් ප්‍රතිඵලයකි. අපගේ ජීවිත ගමනේ යටි සිත තුළ පවතින අධිෂ්ඨානය මල්ඵල ගැන්වීම සඳහා ඊට අදාළ අනෙකුත් අවශ්‍යතා ද සමගාමීව සපුරාලිය යුතු ය. එසේ නොවුණහොත් සිහිනය සිහිනයක් ම වනු මිස යථාර්ථයක් බවට පත් නොවනු ඇත. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු කාරණයක් ඇත. එනම් ළමා ලෝකය තුළ හොඳ අධිෂ්ඨාන පූර්වක සිතිවිලි, ඉලක්ක ඔවුන්ගේ යටි සිත තුළ තැන්පත් කරලීමයි. මෙය මවුපියන්ගේ හා ගුරුවරුන්ගේ වගකීමකි.


තමා අනාගතයේ කෙබඳු ආකාරයක කෙනකු විය යුතු ද යන්න පිළිබඳ අදහස් යටි හිතේ තැන්පත් කර ඒ අරමුණු කරා ගමන් කරන දරුවකු ලෝකයාට දායාද කිරීම මවුපියන්ගේත් ගුරුවරුන්ගේත් වගකීමකි.

මට බැහැ කියන සිතිවිලි, අයින්කර මට පුළුවන්. හැකියාව තිබෙනවා යන හැඟීම ඇතිකර ගැනීම වැදගත් වනු ඇත.

කෙසේ වුවද දරුවාගේ හැකියාව හා කැමැත්ත තෝරා ගැනීම මෙහිදී අත්‍යවශ්‍යය.

අද ලෝකය දෙස බලනවිට බොහෝ දෙනෙක් දුවන්නන් වාලේ දුවන පිරිසක් බවට පත්ව ඇත. තම හැකියාවන් හා කුසලතාවන් ගැන සිතන පිරිස අඩු ය. බොහෝදෙනා තමා තුළ ඇති 'විභව ශක්තියෙන් නිසිඵල නොලබති.

මෙහි ප්‍රතිඵලය කුමක්ද? දෙලොවටම වැඩක් නැති සමාජයට වධ දෙන ළමා පිරිසක්, තරුණ පිරිසක් ලොවට බිහි වීමයි.



බළංගොඩ ශ්‍රී ධර්මානන්ද පිරිවෙන් විහාරාධිපති

**කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහා නා හිමි**

එක් අතකින් බලනවිට අපාය හා දිව්‍යලෝකය පවතින්නේ අප තුළ ම ය. සිතට දුකක්, කරදරයක්, ශෝකයක් ඇති වූ විට එය අපායකි. සිතට සතුටක්, ප්‍රීතියක් සැනසිල්ලක් ඇති වූ විට එය දිව්‍ය ලෝකයකි. හැම දෙනාගේම සිත් පිරිසුදුව පවත්වා ගත හැකි නම් මේ ලෝකය ලස්සන ය. පිවිතුරු ය. සුවඳවත් ය.

අපිරිසුදු මනසකින් අප ජීවත්වන්නේ නම්, මුළු ලෝකයම අපිරිසුදු ය. අප්‍රියජනක ය. වේදනාත්මක ය.

නුග ඇටය කුඩා බීජයක් වුවත්, පැළවීමට අවශ්‍ය සාධක එකතු වීමෙන් විශාල වෘක්ෂයක් බවට පත්වන්නා සේ අප උත්සාහවත් ව ක්‍රියා කරන්නේ නම්, ඒ සඳහා අවශ්‍ය සත්පුරුෂ ආශ්‍රය ඇත්නම්, බුද්ධත්වය පවා ලබා ගන්නට පුළුවන.

මේ අයුරින්ම සිත නිවැරැදිව හසුරුවමින්, ඒ සඳහා බුද්ධියත්, උත්සාහයත් යෙදවීම තුළින් ප්‍රමුඛ පෙළේ ධනවතකු වුව ද විය හැකි බව සමාජගත ජයග්‍රාහි චරිත අධ්‍යයනය කිරීම තුළින් දැක ගන්නට පුළුවන.

පරමාණුව කෙතරම් බලසම්පන්න වුව ද එයින් ලෝකයට ඵලදායි වටිනාකමක් ලබා ගත හැකි වන්නේ එය පාලනයකින් යුතුව හසුරුවා ගැනීම තුළිනි. මේ අයුරින් ඔබේ සිත ද නිවැරැදිව පාලනය කර ගන්න.

ඔබේ සිත ගෙවත්තක් යැයි සිතන්න. එහි ඇති නරක සිතිවිලි නමැති වල්පැළ ඉවත් කරන්න. සෑම දෙනාට ම ප්‍රයෝජනවත් මල් ගෙඩි හටගන්නා පැළ රෝපණය කරන්න. ජලය, පොහොර යොදමින් ඒ වටිනා පැළ පෝෂණය කරන්න. ඔබේ සිත නමැති ගෙවත්ත ඉතා වටිනා භූමියක් වනු නො අනුමාන ය.

> වහින කොට පුළුවන්
> තෙමෙන තැන බලාගන්න.
> වරදින කොට පුළුවන් මිනිසුන්
> හඳුනාගන්න
> වැරදුනාම ඕනෑවට වැඩිය දුක්
> වෙන්න එපා. එය ජීවිතයට වටිනා
> පාඩමක් කර ගන්න.

මේ අයුරින් අසහනකාරි, වධ දෙන සිතිවිලිවලින් තොර සුවදායක සිතිවිලිවලින් අලංකෘත මනස කොතරම් වැදගත් ද?

කෙනකුට දුප්පත් වන්නට හෝ පොහොසත් වන්නට එක්තරා මට්ටමකට කර්ම ශක්තිය හෝ බලපාන්නට පුළුවන. නමුත් කර්මයට ම ඉඩ දී පැත්තකට වී අක්‍රියව සිටීමෙන් ධනවතකු වන්නේ නැත.

ධනවත් වීමේ චේතනාව අධිෂ්ඨානය මෙහිදී ප්‍රමුඛ සාධකයක් වනු ඇත.

ධනවත් වීමට බලාපොරොත්තු වන අය අනුන්ගේ ධනයට ඊර්ෂ්‍යා නොකළ යුතු ය. එසේ වෛරී සිතිවිලි ඇතිකර ගැනීම ජීවන ගමනට බාධකයකි.

අන් අය වැරැදි විදියට ධනය උපයාගෙන ඇත්නම් එහි විපාකය ඔහු සතු ය. නරක සිතිවිලි ඇතිකර ගැනීමෙන් අපගේ දියුණුව වළක්වා නොගත යුතු ය.

මානසික පීඩනය හා අසහනය තේරුම් ගෙන අවබෝධයෙන් යුක්ත ව කටයුතු කිරීම තුළින් තමන්ටත්, අනුන්ටත් අහිතකර සිතිවිලි ඇති නොවන අයුරින් පවිත්‍ර වූ මනසක් ගොඩනගා ගැනීමට කටයුතු කරන්නේ නම් මේ සමාජය මොනතරම් ලස්සන ද?





ශ්‍රී බුද්ධ වර්ෂ 2566 - 67

# බුදුසරණ

රාජ්‍ය වර්ෂ 2023

## 2023 පෝය ලබන ගෙවෙන වේලාවන් සහ සිල් සමාදන් විය යුතු දවස්

| | | | | | |
|---|---|---|---|---|---|
| **දුරුතු මස පෝය** | | | | | |
| ජන. 06 | සිකුරා. පූ. භා. 02.16 න් | පුර පසළොස්වක ලබා | 07 සෙන. | පූ.භා. 04.39 න් ගෙවේ. | 06 සිකුරා. සිල් |
| ජන. 14 | සෙන. අ.භා. 07.19 න් | අව අටවක ලබා | 15 ඉරිදු | අ.භා. 07.41 න් ගෙවේ. | 15 ඉරිදු. සිල් |
| ජන 21 | සෙන. පූ.භා. 06.19 න් | අමාවක ලබා | 22 ඉරිදු | පූ.භා. 02.24 න් ගෙවේ. | 21 සෙන. සිල් |
| **නවම් මස පෝය** | | | | | |
| ජන. 28 | සෙන. පූ.භා. 08.48 න් | පුර අටවක ලබා | 29 ඉරිදු | පූ.භා. 09.09 න් ගෙවේ. | 28 සෙන. සිල් |
| පෙබ. 04 | සෙන. අ.භා. 09.31 න් | පුර පසළොස්වක ලබා | 05 ඉරිදු | අ.භා. 11.59 න් ගෙවේ. | 05 ඉරිදු. සිල් |
| පෙබ. 13 | සඳුදු පූ.භා. 09.44 න් | අව අටවක ලබා | 14 අඟහ. | පූ.භා. 09.03 න් ගෙවේ. | 13 සඳුදු සිල් |
| පෙබ. 19 | ඉරිදු අ.භා. 04.20 න් | අමාවක ලබා | 20 සඳුදු | අ.භා. 12.39 න් ගෙවේ. | 19 ඉරිදු සිල් |
| **මැදින් මස පෝය** | | | | | |
| පෙබ. 27 | සඳුදු පූ.භා. 01.04 න් | පුර අටවක ලබා | 28 අඟහ. | පූ.භා. 02.25 න් ගෙවේ. | 27 සඳුදු සිල් |
| මාර්. 06 | සඳුදු අ.භා. 04.17 න් | පුර පසළොස්වක ලබා | 07 අඟහ. | අ.භා. 06.09 න් ගෙවේ. | 06 සඳුදු සිල් |
| මාර්. 14 | අඟහ. අ.භා. 08.20 න් | අව අටවක ලබා | 15 බදුදු | අ.භා. 06.43 න් ගෙවේ. | 15 බදුදු සිල් |
| මාර්. 21 | අඟහ. පූ.භා. 01.50 න් | අමාවක ලබා | එදිනම | අ.භා. 10.57 න් ගෙවේ. | 21 අඟහ.සිල් |
| **බක් මස පෝය** | | | | | |
| මාර්. 28 | අඟහ. අ.භා. 07.07 න් | පුර අටවක ලබා | 29 බදුදු | අ.භා. 09.11 න් ගෙවේ. | 29 බදුදු සිල් |
| අප්‍රේ. 05 | බදුදු පූ.භා. 09.19 න් | පුර පසළොස්වක ලබා | 06 බ්‍රහස්. | පූභා. 10.04 න් ගෙවේ. | 05 බදුදු සිල් |
| අප්‍රේ 13 | බ්‍රහස්. පූ.භා. 03.45 න් | අව අටවක ලබා | 14 සිකුරා | පූ.භා. 01.35 න් ගෙවේ. | 13 බ්‍රහස්. සිල් |
| අප්‍රේ 19 | බදුදු පූ.භා. 11.28 න් | අමාවක ලබා | 20 බ්‍රහස්. | පූ.භා. 09.46 න් ගෙවේ. | 19 බදුදු සිල් |
| **වෙසක් මස පෝය** | | | | | |
| අප්‍රේ. 27 | බ්‍රහස්. අ.භා. 01.41 න් | පුර අටවක ලබා | 28 සිකුරා. | අ.භා. 04.03 න් ගෙවේ. | 27 බ්‍රහස්. සිල් |
| මැයි 04 | බ්‍රහස්. අ.භා. 11.42 න් | පුර පසළොස්වක ලබා | 05 සිකුරා | අ.භා. 11.02 න් ගෙවේ. | 05 සිකුරා. සිල් |
| මැයි 12 | සිකුරා. පූ.භා. 09.09 න් | අව අටවක ලබා | 13 සෙන. | පූ.භා. 06.53 න් ගෙවේ. | 12 සිකුරා. සිල් |
| මැයි 18 | බ්‍රහස්. අ.භා. 09.48 න් | අමාවක ලබා | 19 සිකුරා. | අ.භා. 09.28 න් ගෙවේ. | 19 සිකුරා. සිල් |
| **පොසොන් මස පෝය** | | | | | |
| මැයි 27 | සෙන. පූ.භා. 07.44 න් | පුර අටවක ලබා | 28 ඉරිදු | පූ.භා. 09.57 න් ගෙවේ. | 27 සෙන. සිල් |
| ජුනි 03 | සෙන. පූ.භා. 11.15 න් | පුර පසළොස්වක ලබා | 04 ඉරිදු | පූ.භා. 09.11 න් ගෙවේ. | 03 සෙන. සිල් |
| ජුනි 10 | සෙන. අ.භා. 02.07 න් | අව අටවක ලබා | 11 ඉරිදු | අ.භා. 12.10 න් ගෙවේ. | 10 සෙන. සිල් |
| ජුනි 17 | සෙන. පූ.භා. 09.15 න් | අමාවක ලබා | 18 ඉරිදු | පූ.භා. 10.10 න් ගෙවේ. | 17 සෙන. සිල් |
| **අධි ඇසළ මස පෝය** | | | | | |
| ජුනි 26 | සඳුදු පූ.භා. 00.25 න් | පුර අටවක ලබා | 27 අඟහ. | පූ.භා. 02.04 න් ගෙවේ. | 26 සඳුදු සිල් |
| ජූලි 02 | ඉරිදු අ.භා. 08.19 න් | පුර පසළොස්වක ලබා | 03 සඳුදු | අ.භා. 05.07 න් ගෙවේ. | 03 සඳුදු සිල් |
| ජූලි 09 | ඉරිදු අ.භා. 08.06 න් | අව අටවක ලබා | 10 සඳුදු | අ.භා. 06.51 න් ගෙවේ. | 10 සඳුදු සිල් |
| ජූලි 16 | ඉරිදු අ.භා. 10.11 න් | අමාවක ලබා | 18 අඟහ. | පූ.භා. 00.04 න් ගෙවේ. | 17 සඳුදු සිල් |
| **ඇසළ මස පෝය** | | | | | |
| ජූලි 25 | අඟහ. අ.භා. 03.06 න් | පුර අටවක ලබා | 26 බදුදු | අ.භා. 03.48 න් ගෙවේ. | 25 අඟහ. සිල් |
| අගෝ. 01 | අඟහ. පූ.භා. 03.53 න් | පුර පසළොස්වක ලබා | 02 බදුදු | පූ.භා. 00.02 න් ගෙවේ. | 01 අඟහ. සිල් |
| අගෝ. 08 | අඟහ. පූ.භා. 04.17 න් | අව අටවක ලබා | 09 බදුදු | පූ.භා. 03.55 න් ගෙවේ. | 08 අඟහ. සිල් |
| අගෝ. 15 | අඟහ. අ.භා. 12.45 න් | අමාවක ලබා | 16 බදුදු | අ.භා. 03.10 න් ගෙවේ. | 15 අඟහ. සිල් |
| **නිකිණි මස පෝය** | | | | | |
| අගෝ. 24 | බ්‍රහස්. පූ.භා. 03.31 න් | පුර අටවක ලබා | 25 සිකුරා. | පූ.භා. 03.10 න් ගෙවේ. | 24 බ්‍රහස්. සිල් |
| අගෝ. 30 | බදුදු පූ.භා. 11.00 න් | පුර පසළොස්වක ලබා | 31 බ්‍රහස්. | පූ.භා. 07.07 න් ගෙවේ. | 30 බදුදු සිල් |
| සැප්. 06 | බදුදු අ.භා. 03.45 න් | අව අටවක ලබා | 07 බ්‍රහස්. | අ.භා. 04.20 න් ගෙවේ. | 06 බදුදු සිල් |
| සැප්. 14 | බ්‍රහස්. පූ.භා. 04.51 න් | අමාවක ලබා | 15 සිකුරා. | පූ.භා. 07.11 න් ගෙවේ. | 14 බ්‍රහස්. සිල් |
| **බිනර මස පෝය** | | | | | |
| සැප්. 22 | සිකුරා. අ.භා. 01.32 න් | පුර අටවක ලබා | 23 සෙන. | අ.භා. 12.15 න් ගෙවේ. | 22 සිකුරා. සිල් |
| සැප් 28 | බ්‍රහස්. අ.භා. 06.52 න් | පුර පසළොස්වක ලබා | 29 සිකුරා. | අ.භා. 03.31 න් ගෙවේ. | 29 සිකුරා. සිල් |
| ඔක්. 06 | සිකුරා. පූ.භා. 06.37 න් | අව අටවක ලබා | 07 සෙන. | පූ.භා. 08.11 න් ගෙවේ. | 06 සිකුරා. සිල්. |
| ඔක්. 13 | සිකුරා. අ.භා. 09.50 න් | අමාවක ලබා | 14 සෙන. | අ.භා. 11.24 න් ගෙවේ. | 14 සෙන. සිල් |
| **වප් මස පෝය** | | | | | |
| ඔක්. 21 | සෙන. අ.භා. 09.52 න් | පුර අටවක ලබා | 22 ඉරිදු | අ.භා. 07.58 න් ගෙවේ. | 22 ඉරිදු සිල් |
| ඔක්. 28 | සෙන. පූ.භා. 04.19 න් | පුර පසළොස්වක ලබා | 29 ඉරිදු | පූ.භා. 01.57 න් ගෙවේ. | 28 සෙන. සිල් |
| නොවැ. 05 | ඉරිදු පූ.භා. 01.03 න් | අව අටවක ලබා | 06 සඳුදු | පූ.භා. 03.20 න් ගෙවේ. | 05 ඉරිදු සිල් |
| නොවැ. 12 | ඉරිදු අ.භා. 02.42 න් | අමාවක ලබා | 13 සඳුදු | අ.භා. 02.55 න් ගෙවේ. | 12 ඉරිදු සිල් |
| **ඉල් මස පෝය** | | | | | |
| නොවැ. 20 | සඳුදු පූ.භා. 05.23 න් | පුර අටවක ලබා | 21 අඟහ. | පූ.භා. 03.18 න් ගෙවේ. | 20 සඳුදු සිල් |
| නොවැ. 26 | ඉරිදු අ.භා. 03.58 න් | පුර පසළොස්වක ලබා | 27 සඳුදු | අ.භා. 02.51 න් ගෙවේ. | 26 ඉරිදු සිල් |
| දෙසැ. 04 | සඳුදු අ.භා. 10.02 න් | අව අටවක ලබා | 06 බදුදු | පූ.භා. 00.38 න් ගෙවේ. | 05 අඟහ. සිල් |
| දෙසැ. 12 | අඟහ. පූ.භා. 06.25 න් | අමාවක ලබා | 13 බදුදු | පූ.භා. 05.03 න් ගෙවේ. | 12 අඟහ. සිල් |
| **උඳුවප් මස පෝය** | | | | | |
| දෙසැ. 19 | අඟහ. අ.භා. 01.10 න් | පුර අටවක ලබා | 20 බදුදු | පූ.භා. 11.18 න් ගෙවේ. | 19 අඟහ. සිල් |
| දෙසැ. 26 | අඟහ. පූ.භා. 05.48 න් | පුර පසළොස්වක ලබා | 27 බදුදු | පූ.භා. 06.05 න් ගෙවේ. | 26 අඟහ. සිල් |

## දෙළොස් මහේ පොහොය වරුණ

### දුරුතු පසළොස්වක පොහොය

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදු වූයේ ඓතිහාසික දුරුතු පෝ දිනක ය. තුන් බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සව්වන් සදහම් මඟට හරවා ඔවුන් හැම අරි සඟ ගණ බවට පත්කොට වදළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළදිව බිම් තැන්නේ මහවැලි ගඟ අසබඩ මිනිපේ නම් සරු දනව් පියසට ගුවන් ගැබින් පහළව සවනක් බුදුරැස් මාලාවන්ගෙන් දිලිහී වැඩහුන් සේක.

### නවම් පසළොස්වක පොහොය

සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන ලද්දේ ද, සම්බුද්ධ ශාසනවංශ කතාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදුවූයේ ද නවම් පුන් පොහෝ දිනක ය.

### මැදින් පසළොස්වක පොහොය

ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු බුදුන් වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමඟ රජගහනුවර සිට තමන් වහන්සේගේ උපන් ගම වූ කිඹුල්වත් පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදක ය.

### බක් පසළොස්වක පොහොය

බුදුපියාණන් වහන්සේගේ මහා ගුණ කඳ මනසට නංවන අසිරිමත් දිනයකි, බක් පොහොය දිනය.මේ සුන්දර දිවයින දෙවැනි වරටත් බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත් වූයේ ද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කඳින් නාගදීපය ආලෝකවත් වූයේ ද, දහම් අමා මිහිරෙන් නොයෙක් දෙනා නිවී සැනසී ගියේ ද බක් පුර පොහෝ දිනක දී ය.

### වෙසක් පසළොස්වක පොහොය

තිලොවග සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ලොව පහළවීම, බුදුවීම, පිරිනිවන් පෑම යන අසිරිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත්වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පරම පූජනීය ආගමික දිනය යි.

### පොසොන් පසළොස්වක පොහොය

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළ දිව් තලයේ මිස්සක පව්වට සදහම් පණිවුඩය රැගෙන වැඩම කළ ඓතිහාසික දිනය පොසොන් පොහොය දිනය යි.

## දෙළොස් මහේ පොහොය වරුණ

### ඇසළ පසළොස්වක පොහොය

බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත්, නිවනත්, එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොව පළමුවරට දේශනා කළ දිනය යි, ඇසළ පෝද.

### නිකිණි පසළොස්වක පොහොය

ඇසළ අව පෑළවිය ද භික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයකි. නිකිණි පසළොස්වක පොහෝද පොහොය කොට නිකිණි අව පෑළවිය, පසුවස් එළඹීම යි,සසුන් පිළිවෙත වන්නේ.

### බිනර පසළොස්වක පොහොය

බුද්ධ නියමය අනුව භික්ෂූන් වහන්සේ විහාරාරාමයන්හි නිබඳව වස් වසමින් බණ භාවනාවල යෙදෙමින් සම්බුද්ධ ශාසන පරමාර්ථ ඉටු කර ගන්නා කාලයකි. මෙහෙණ සසුනේ ආරම්භය සිදුවිය.

### වප් පසළොස්වක පොහොය

වස්සාන සෘතුවේ මුල් තුන් මස භික්ෂූන් වහන්සේ වස් වසා වැඩ සිටින කාලය යි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසය යි. එය චීවර මාසය නමින් ද ව්‍යවහාර කැරේ.

### ඉල් පසළොස්වක පොහොය

ශාසනික ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කීපයකට මුල් වූ පොහොය දිනයකි. මෙතේ බෝසත්තුමා විවරණය ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම, පසු වස් පවාරණය කළ යුතු දිනය ද, සැරියුත් මහරහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීම ද යන කරුණු රැසක් අනුස්මරණය කැරෙන්නේ ඉල් පෝද ය.

### උඳුවප් පසළොස්වක පොහොය

උඳුවප් පොහොය දින සිදු වූ සංඝමිත්තා මහ රහත් මෙහෙණින් වහන්සේගේ ලංකාගමනය ගැන, ජය ශ්‍රී මහා බෝ සමිඳුන් ගැන, ලංකා මෙහෙණ සසුන ගැන සිහි කරන කවර අයකුට වුව ද ඇති වනුයේ මහා සැනසිල්ල කි.

අගෝ. 02 වැනි බදුදු පෙරවස් එළඹීම
අගෝ. 31 වැනි බ්‍රහස්පතින්ද පසුවස් එළඹීම
ඔක්. 28 වැනි සෙනසුරාද පෙරවස් පවාරණය
නොවැ. 26 වැනි ඉරිදු පසුවස් පවාරණය

සමන් ශ්‍රීකාන්ත

වර්ෂ 2023 ක් වූ ජනවාරි 06 සිකුරාද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.